# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම
## 2019 - 2030

පළමු වෙළුම



නාගරික සංවර්ධන අධිකාරිය
2019 ජූනි

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම

2019–2030

**වෙළුම I**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
නාගරික සංවර්ධන අධිකාරිය

# රත්නපුර නගර සංවර්ධන සැලසුම 2019 – 2030
රත්නපුර නාගරික බල ප්‍රදේශය සඳහා
පළමු වෙළුම

සියළුම හිමිකම් ඇවිරිණි.
© නාගරික සංවර්ධන අධිකාරය – ශ්‍රී ලංකාව  – 2019

මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

**ප්‍රකාශනය**

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන, 7 වන හා 9 වන මහළ, “සෙත්සිරිපාය”,
බත්තරමුල්ල, කොළඹ, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය – www.uda.gov.lk
විද්‍යුත් තැපෑල – info@uda.gov.lk
දුරකථන අංක - +94112873637

ප්‍රකාශනය 2019 - ජූනි

රත්නපුර නගර සංවර්ධන සැලැස්ම 2019 – 2030 ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමු වෙළුම හා දෙවැනි වෙළුම වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමුවන කොටස සහ දෙවන කොටස වශයෙන් සඳහන් කර ඇත. මෙහි එන පළමු වෙළුමේ පළමුවන කොටස මඟින් සංවර්ධන සැලැස්ම හැඳින්වීම, මූලික අධ්‍යයනය සහ සංවර්ධනය සැලැස්මේ අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර එහි දෙවන කොටස මඟින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ, සංකල්පිත සැලැස්ම,  සංවර්ධන උපාය මාර්ගික සැලසුම් යනාදිය අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මේ දෙවනි වෙළුම වෙනම ප්‍රකාශනයක් ලෙස සකස්කර ඇති අතර එහි 2019 – 2030 කාල පරිච්ඡේදය සඳහා බල පවත්වන සැලැස්මට අනුව ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි සහ කලාපීකරණ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

රත්නපුර නගර සංවර්ධන සැලැස්ම 2019 - 2030 නාගරික සංවර්ධන අධිකාරියේ සබරගමුව පළාත් අංශයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය විසින් සකස් කර ඇති අතර ඒ සදහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්ගේ හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මගපෙන්වීම පෙරදැරි  කරගෙන සිදුකර ඇත.

**අධීක්ෂණ කටයුතු : නාගරික සංවර්ධන අධිකාරිය**

**ආචාර්ය ජගත් මුණසිංහ** - *සභාපති*, **ඉංජිනේරු එස්.එස්.පී. රත්නායක** - *අධ්‍යක්ෂ ජනරාල්*, **නගර නිර්මාණ ශිල්පී කේ.ඒ.ඩී.චන්ද්‍රදාස** - *හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්*, **නගර නිර්මාණ ශිල්පී ඩී.එම්.බී.රණතුංග** - *අතිරේක අධ්‍යක්ෂ ජනරාල්*, **නගර නිර්මාණ ශිල්පී එම්.පී. රණතුංග** - *නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)* , **නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර** - *අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය)*, **නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න** - *හිටපු අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් අංශය)*. **නගර නිර්මාණ ශිල්පී සේනානි සෝමසේකර** - *අධ්‍යක්ෂ (භූගෝලීය සහ තොරතුරු පද්ධති අංශය)*

**සැලසුම් කණ්ඩායම :**

**නගර නිර්මාණ ශිල්පී සිසිර එම්. දිසානායක** - *අධ්‍යක්ෂ, සබරගමුව පළාත, නා. සං. අධි.*, **නගර නිර්මාණ ශිල්පී ඩී.ඒ.ඩී. අතුකෝරල** - *නියෝජ්‍ය අධ්‍යක්ෂ, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා. සං. අධි.*,  **නගර නිර්මාණ ශිල්පි හසිනි එන්. ආටිගල**, *උපායමාර්ගික සැලසුම් නිළධාරි, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා. සං. අධි.*, **කේ. ඒ. එස්. ගුණසේකර**, *බලාත්මක නිළධාරි, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා. සං. අධි.*, **එච්.කේ.ඩී.එම්.කේ. පතිරණ**, *බලාත්මක නිළධාරි, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා. සං. අධි.*, **එච්.එම්.පී.එච්. මැණිකේ**, *බලාත්මක නිළධාරි, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා. සං. අධි.*, **සන්ධ්‍යා බඹරැන්ද**, *භූගෝලීය තොරතුරු පද්ධති නිළධාරි, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා. සං. අධි.*, **ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්. මැණිකේ**, *සැලසුම් ශිල්පි, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා. සං. අධි.*

**සහය කණ්ඩායම්**

පර්යේෂණ සහ සංවර්ධන ඒකකය - නා.සං.අධි.
සංවර්ධන සැලසුම් අංශය - නා.සං.අධි.
භූගෝලීය සහ තොරතුරු පද්ධති අංශය - නා.සං.අධි.
පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අධි.

# ස්තුතිය

රත්නපුර නාගරික බල ප්‍රදේශය සඳහා වූ නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත සහයෝගය ලබාදුන් රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු සහ පළාත් සභා මැති ඇමතිවරුන්ටත් සබරගමු පළාත් ආණ්ඩුකාරතුමාටත් රත්නපුර මහ නගර සභාවේ නගරාධිපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රී කණ්ඩායමටත් ප්‍රථමව අපගේ ස්තුතිය පුදකර සිටිමු.

මෙම නගර සැලැස්ම සඳහා තොරතුරු සහ අදහස් ලබාගැනීමේදී රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා රත්නපුර මහ නගර සභාව ඇතුළු රාජ්‍ය ආයතන රැසක් සිය දායකත්වය ලබා දෙන ලද බැවින් දිස්ත්‍රික් ලේකම්තුමිය, ප්‍රාදේශීය ලේකම්තුමිය, නාගරික කොමසාරිස්තුමිය ඇතුළු අදාල ආයතනයන්හි සියළු කාර්ය මණ්ඩලයන්ටද අපගේ ස්තුතිය පුදකර සිටිමු.

රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සාර්ථකව නිම කිරීම සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමන්, අධ්‍යක්ෂ ජනරාල්තුමන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), පර්යේෂණ සහ සංවර්ධන අංශය, සංවර්ධන සැලසුම් අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය හා භූ දර්ශන සහ පාරිසරික අංශය වෙත ද රත්නපුර කාර්යාලයට අනුයුක්තව සේවය කරන සියලුම සේවක මහත්ම මහත්මීන්ට ද අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරන්නෙමු.

මෙම රත්නපුර නගර සැලැස්මෙහි සමාලෝචන කටයුතු සඳහා සහාය වූ නගර සැලසුම්කරණ ශිල්පි කණිශ්ක ගුළුවිට මහතාට ද ලේඛන කටයුතු සඳහා සහාය වූ ඕෂිනී කුලරත්න මෙනවියට සහ ප්‍රදීපා තෙන්නකෝන් මහත්මියට ද අපගේ ස්තුතිය පළ කිරීමට මෙය අවස්තාවක් කරගනු කැමැත්තෙමු.

එමෙන්ම, මෙම නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මූලික දත්ත රැස් කිරීමේ අදියරෙහි සිට ගැසට් පත්‍රයෙහි පළකිරීම දක්වා සියළු අදියරයන් වලදී සෘජුව සහ වක්‍රව සහයෝගය ලබාදුන් රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, විවිධ සම්පත් දායකයන් හා නාගරික ප්‍රජාව වෙත අපගේ ස්තුතිය අවසාන වශයෙන් පුද කරන්නෙමු.

# පෙරවදන

තිරසාර සංවර්ධන අරමුණු අතර එකොළොස්වන අරමුණ වන තිරසාර නගර නිර්මාණය කිරීම ඉලක්ක කරගනිමින් රත්නපුර නගර සංවර්ධන සැලැස්ම නිර්මාණය කර ඇත. ඒ අනුව, රත්නපුර නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ ඉදිරි දශකයක කාලය තුළදී සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශකත්වය ලබාදීමට අපේක්ෂිත ය. මෙම නගර සංවර්ධන සැලැස්මේ මූලික අරමුණ වන්නේ සබරගමුව පළාතේ අග නගරය වන රත්නපුර නගර වාසීන්ගේ ජීවන තත්ත්වය ක්‍රමිකව ඉහළ නැංවීමයි.

රත්නපුර නගර සැලැස්ම සකස් කරලීමේදී පවත්නා භූමි පරිහරණ රටාව, නේවාසික ප්‍රජාවන්ගේ ඝණත්වය හා ස්වභාවය, නගරයට පැමිණෙන සංක්‍රමණික ප්‍රජාව, නගරයේ ආර්ථික රටාව, ප්‍රවාහන පද්ධතිය, සෞඛ්‍ය සේවාවල ස්වභාවය සහ ආයතනික රටාවේ ස්වභාවය යනාදී ක්ෂෙත්‍ර ගණනාවක් අධ්‍යයනය කර ඇත. වැඩිදුර විශ්ලේෂණ කටයුතු ඉහත අධ්‍යයනයන්ට අනුකූලව සිදුකර ඇති අතර 2030 වසර සඳහා හඳුනාගත් දැක්ම ඉලක්ක කර ගනිමින් උපායමාර්ග හා ව්‍යාපෘති සකස් කර ඇත.

මැණික් සහ සංචාරක කර්මාන්තයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඇති මෙම නගර සැලැස්මෙහි අරමුණ රත්නපුර නගරය මිනිසුන්ගේ වාසයට යෝග්‍ය වූ සුසැදි, සුරැකි, සොඳුරු නගරයක් බවට පත් කිරීමයි. එබැවින්, නගරයේ ආර්ථික සංවර්ධනයට අමතරව භෞතික, සාමාජීය හා පාරිසරික සංවර්ධනය ඇති කිරීම කෙරෙහි ද නගර සැලැස්මේ අවධානය යොමු වී ඇත. රත්නපුර නගර සභා බල ප්‍රදේශය තුළ පවත්නා සම්පත් තුළින් නගරයට ප්‍රතිලාභ ළඟා කර දීම මෙහිදී අපේක්ෂා කරනු ලබන අතර ඒ තුළින් නාගරික ජනතාවට ජීවත්වීම සඳහා සුදුසු වටපිටාවක් හා පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් ඒ ආශ්‍රිත සොබා සෞන්දර්ය වැඩිදියුණු වූ ආකර්ෂණීය නගරයක් ඇතිකිරීම තවදුරටත් අපේක්ෂිතය.

# ගරු අමාත්‍යතුමාගේ පෙරවදන



1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් පුළුල් සංවර්ධන සැලසුම් සබරගමුව පළාතේ සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීම සඳහා කටයුතු සකස් කර ඇත.

මෙම සංවර්ධන සැලැස්ම තුලින් අපේක්ෂා කරනු ලබන්නේ රත්නපුර නාගරික බල ප්‍රදේශය (මහ නගර සභා සීමාව) සඳහා ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීමටයි. රත්නපුර නගරය වාණිජ හා පරිපාලනමය වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානම නගරයක් වන අතර එය විශාල ජන සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. තවදුරටත්, රත්නපුර හා ඒ අවට ප්‍රදේශය සතු මැණික් සම්පත සහ සංචාරක කර්මාන්තය කෙරෙහි ඇති අති විශාල විභවතාවයන්ද  සංවර්ධනය සඳහා යොදාගත හැකිය.

අපගේ උත්සාහය රත්නපුර දිස්ත්‍රික්කයට දිවයිනේ අනෙකුත් ප්‍රදේශ හා සමගාමීව සුදුස ලෙස භෞතික සංවර්ධනයකට අවශ්‍ය පහසුකම් සැලසීමය.

මාගේ අවබෝධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් යොදා ගනිමින් විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන් ද ලැබී ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයෙන් මෙම කාර්ය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුලින් රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

පාඨලී චම්පික රණවක
අමාත්‍ය තුමා
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

# ගරු සභාපතිතුමාගේ පෙරවදන



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමණාකරනය කිරීමේ වගකීම ද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය  ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. රත්නපුර සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම, සකස් කිරීම හා බලාත්මක කිරීම එම විධිවිධාන යටතේ සිදු කර ඇත. රත්නපුර ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය රත්නපුර හා ඒ අවට ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන රත්නපුර සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින්  අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේදී අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුලින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුලින් රත්නපුර නගරය හරිත වර්ණයෙන් වට වූ මැණික් නගරයක්  බවට පත් කිරීමටත් අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත්  බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

# ගරු නගරාධිපතිතුමාගේ පෙරවදන



රත්නපුර නගරය මැණික් සම්පත සහ ජල විභවයන් සහිත රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති සුවිශේෂිත නගරයකි. එබැවින් නගරයේ පවත්නා එම අනන්‍යතාවය මතුකරමින් උපායමාර්ගික ප්‍රවේශයක් සහිතව නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීම පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය වෙත අපගේ කෘතඥතාව පළ කරමු. රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශයට අදාලව 2030 වසර අරමුණු කොටගෙන “ශ්‍රී ලංකාවේ හරිත වර්ණ වූ මැණික් නගරය” යන දැක්ම මත පදනම්ව සැකසුන මෙම සැලැස්ම නීතිමය ලියවිල්ලක් වශයෙන් රත්නපුර මහා නගර සභාවට වැදගත් වන බව ද මෙහිදී ප්‍රකාශ කර සිටිමු.

මෙම සංවර්ධන සැලැස්ම තුළින් රත්නපුර නගර ආර්ථිකයේ ප්‍රධාන අංශයක් වන මැණික් කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා මෙන්ම මෙතෙක් විවරව නොපැවති සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ද ධනාත්මක වේදිකාවක් විවෘත කර ඇත. එමෙන්ම, පළාතේ ප්‍රධාන වාණිජ සහ ප්‍රවාහන මධ්‍යස්ථානය, පරිපාලන හා සෞඛ්‍ය සේවා සැපයුම්කරු වශයෙන් රත්නපුර නගරයට විශාල වටිනාකමක් එකතු කර ඇත. එබැවින්, මෙම ප්‍රයත්නය රත්නපුර නගරයට වැඩි ආයෝජකයින් ප්‍රමාණයක් පැමිණීම දිරිගැන්වීමට සහ පළාත තුල ස්වයංපෝෂිත නගර ආර්ථිකයක් නිර්මාණය කිරීමට හේතු වේ.

රත්නපුර නගර සැලැස්ම සකස් කිරීමේදී මහා ජනතාව වෙනුවෙන් අප විසින් ලබාදුන් නිර්දේශ, යෝජනා සහ විවේචන සැළකිල්ලට ගෙන සහභාගීත්ව ව්‍යායාමයක් වශයෙන් සැලසුම සකස් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය දැරූ උත්සාහය සැබවින්ම අගය කරමු. එබැවින්, එය අපගේ සැලැස්ම ලෙස ප්‍රකාශයට පත් කරමින් ඉදිරි එකොළොස් වසර තුළ රත්නපුර සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා අපගේ අනාගත සහයෝගිතාව සහතික කරමු. එසේම රත්නපුර නගර සංවර්ධන සැලැස්මේ දැක්මට අනුව 2019–2030 කාල පරිච්ඡේදය තුළ දී දර්ශනය වන නගරය කරා යාමට සහයෝගිතාවයෙන් කටයුතු කරන ලෙස රත්නපුර නගරයේ සියලු පුරවැසියන් හා පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටිමු.

විරෝන් අත්තනායක
නගරාධිපති
රත්නපුර මහ නගර සභාව

# පටුන


| | |
|---|---|
| ලෙඛන තොරතුරු | II |
| ස්තූතිය | III |
| පෙරවදන | IV |
| අමාත්‍යතුමාගේ පෙරවදන | V |
| සභාපතිතුමාගේ පෙරවදන | VI |
| නගරාධිපතිතුමාගේ පෙරවදන | VII |
| පටුන | VIII |
| පළමු කොටස | |
| පරිච්ඡේදය 01 : හැඳින්වීම | 01 |
| 1.1. සංවර්ධන සැලැස්මේ පසුබිම | 02 |
| 1.2. සැලසුම් කණ්ඩායම | 03 |
| 1.3. විෂය පථය | 06 |
| 1.4. සැලසුම් ක්‍රියාවලිය | 07 |
| පරිච්ඡේදය 02 : මූලික සමීක්ෂණ අධ්‍යයනය | 11 |
| 2.1. අධ්‍යයන ප්‍රදේශය | 12 |
| 2.2. සැලසුම් සහ අවස්ථා සන්දර්භය | 18 |
| 2.3. සැලසුම් සීමාව නිර්ණය කිරීම | 20 |
| පරිච්ඡේදය 03: සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය | 28 |
| 3.1. සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා ගැටලු | 28 |
| 3.2. සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා විභවතා | 39 |
| දෙවන කොටස | |
| පරිච්ඡේදය 04 : සංවර්ධන සැලසුම් රාමුව | 51 |
| 4.1. දැක්ම | 52 |
| 4.2. දැක්මේ ප්‍රකාශනය | 52 |
| 4.3. අරමුණු | 53 |
| 4.4.අභිමතාර්ථ | 53 |
| පරිච්ඡේදය 05 : ශක්‍යතා විශ්ලේෂණයේ සාරාංශය | 57 |
| පළමු අරමුණ | 58 |
| දෙවන අරමුණ | 66 |
| තෙවන අරමුණ | 75 |

පරිච්ඡේදය 06 : සැලැස්ම 81

6.1. සංකල්පිත සැලැස්ම 81
6.2. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 84
6.3. භෞතික හා සමාජයීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග 88

6.3.1. සේවා සැලැස්ම 88

6.3.1.1. නිවාස 88
6.3.1.2. අධ්‍යාපනය 93
6.3.1.3. සෞඛ්‍ය 97
6.3.1.4. පරිපාලන 99

6.3.2. ප්‍රවාහන සේවා සැලැස්ම 100
6.3.3. ජල සැපයුම් සැලැස්ම 109
6.3.4. විදුලි හා දත්ත රැහැන් පිළිබඳ සැලැස්ම 112
6.3.5. අපජලය හා මළාපවාහන සැලැස්ම 114
6.3.6. ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ සැලැස්ම 117

6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ග 128
6.5. තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග 145

6.5.1. සංරක්ෂණ සැලැස්ම 146
6.5.2. භූ දර්ශන කළමනාකරණ සැලැස්ම 149
6.5.3. ආපදා අවදානම කළමණාකරණ සැලැස්ම 157
6.5.4. පොදු අවකාශ සැලැස්ම 172

6.6. සංස්කෘතික සහ උරුමයන් පිළිබඳ උපායමාර්ග 179

6.6.1. උරුමයන්ට අයත් වන ස්ථාන 179
6.6.2. සංස්කෘතික උත්සව (සමන් දේවාල පෙරහැර) 180
6.6.3 පුරාවිද්‍යා සංරක්ෂණ ප්‍රදේශ 180

6.7. ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග 188

6.7.1. උපායමාර්ගික ව්‍යාපෘති 188
6.7.2. ප්‍රමුඛ ව්‍යාපෘති 194

# සිතියම් ලැයිස්තුව


| | | |
|---|---|---|
| සිතියම් අංක 2.1. | රත්නපුර නාගරික බල ප්‍රදේශය | 13 |
| සිතියම් අංක 2.2. | සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය | 19 |
| සිතියම් අංක 2.3. | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රදේශය | 23 |
| සිතියම් අංක 5.1. | නාගරික තාපය | 72 |
| සිතියම් අංක 6.2.1. | භූමි පරිහරණ සිතියම (2017) | 85 |
| සිතියම් අංක 6.2.2. | යෝජිත භූමි පරිහරණ සිතියම (2030) | 86 |
| සිතියම් අංක 6.3.1.1.1. | නිවාස ඝණත්වය | 89 |
| සිතියම් අංක 6.3.1.1.2. | වාසය කිරීමට වඩා සුදුසු ප්‍රදේශ | 91 |
| සිතියම් අංක 6.3.1.1.3. | යෝජිත නිවාස ව්‍යාපෘති | 92 |
| සිතියම් අංක 6.3.1.2.1. | පවත්නා අධ්‍යාපන පහසුකම් | 95 |
| සිතියම් අංක 6.3.1.2.2. | යෝජිත අධ්‍යාපන පහසුකම් | 96 |
| සිතියම් අංක 6.3.1.3.1. | සෞඛ්‍යය පහසුකම් | 98 |
| සිතියම් අංක 6.3.1.4.1. | පරිපාලන සේවාවන් | 99 |
| සිතියම් අංක 6.3.2.1. | යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සහ විකල්ප මාර්ගය | 103 |
| සිතියම් අංක 6.3.2.2. | යෝජිත ප්‍රවාහන සැලසුම | 106 |
| සිතියම් අංක 6.3.2.3. | යෝජිත සැලසුම් ප්‍රදේශයේ මාර්ග සම්බන්ධතාවයේ වර්තමාන තත්වය (2018) | 107 |
| සිතියම් අංක 6.3.2.4. | යෝජිත සැලසුම් ප්‍රදේශයේ මාර්ග සම්බන්ධතාවයේ අපේක්ෂිත තත්වය (2030) | 108 |
| සිතියම් අංක 6.3.3.1. | වසර 2030 වනවිට ජල සැපයුම් ව්‍යාප්තිය | 111 |
| සිතියම් අංක 6.3.4.1. | වසර 2018 වනවිට විදුලි සැපයුම | 113 |
| සිතියම් අංක 6.3.5.1. | රත්නපුර ජලාපවහන සැලැස්මට අදාළ ගලා යාමේ දිශාවන් | 115 |
| සිතියම් අංක 6.3.5.2. | රත්නපුර ජලාපවහන සැලැස්ම | 116 |
| සිතියම් අංක 6.3.6.1. | යෝජිත කසළ කළමණාකරන සැලැස්මට අදාළ කසළ බැහැර කිරීමේ ස්ථාන | 127 |
| සිතියම් අංක 6.4.1. | 2018 වසර වනවිට වාණිජ භාවිත ව්‍යාප්තිය | 129 |
| සිතියම් අංක 6.4.2. | සංචාරක ප්‍රවර්ධනය උදෙසා නීල හරිත ජාලයක් නිර්මාණය | 139 |
| සිතියම් අංක 6.4.3. | රත්නපුර නගරයේ දර්ශනීය ස්ථාන | 141 |
| සිතියම් අංක 6.4.4. | යෝජිත ආර්ථික සංවර්ධන සැලැස්ම | 144 |
| සිතියම් අංක 6.5.1. | රත්නපුර නගරයේ සංරක්ෂිත සැලැස්ම | 148 |
| සිතියම් අංක 6.5.2. | සංවර්ධනය කිරීම පිණිස හඳුනාගත් පටු මංමාවත් | 154 |
| සිතියම් අංක 6.5.3. | ගංවතුර උවදුර බලපාන ප්‍රදේශ | 161 |
| සිතියම් අංක 6.5.4. | පාරිසරික සංවේදී ප්‍රදේශ | 162 |
| සිතියම් අංක 6.5.5. | විවේක හා විනෝද කටයුතු සඳහා යෝජිත වෙරළුප කලාපය | 163 |
| සිතියම් අංක 6.5.6. | විවේක හා විනෝද කටයුතු සඳහා යෝජිත නගර මධ්‍යය කලාපය | 164 |
| සිතියම් අංක 6.5.7. | අභ්‍යන්තර ජලවහන රටාව | 168 |
| සිතියම් අංක 6.5.8. | ආපදා කළමනාකරණ සැලැස්ම | 169 |
| සිතියම් අංක 6.5.9. | ක්‍රියාකාරී විනෝදාස්වාද ස්ථාන | 176 |
| සිතියම් අංක 6.5.10. | ක්‍රියාකාරී නොවන විනෝදාස්වාද ස්ථාන | 178 |
| සිතියම් අංක 6.6.1. | ස්වරූප සංරක්ෂණය | 183 |
| සිතියම් අංක 6.6.2. | ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය | 186 |

# රූපසටහන් ලැයිස්තුව


| | | |
|---|---|---|
| රූප සටහන් අංක 1.1 | සැලසුම් ක්‍රියාවලිය | 8 |
| රූප සටහන් අංක 2.1 | රත්නපුර නගරයේ හරස් පැතිකඩ | 12 |
| රූප සටහන් අංක 2.2 | රත්නපුර නගරයේ කාලගුණික වෙනස්වීම (2018) | 14 |
| රූප සටහන් අංක 2.3 | සමන් දේවාලයේ පිහිටීම | 15 |
| රූප සටහන් අංක 2.4 | කලාපීය සම්බන්ධතා ජාලය | 16 |
| රූප සටහන් අංක 2.5 | රත්නපුර සංසරණ ජනගහනය | 16 |
| රූප සටහන් අංක 2.6 | රත්නපුර නගරය ද්විත්ව නගරයක් ලෙස පිහිටීම | 18 |
| රූප සටහන් අංක 2.7 | රත්නපුර ක්‍රියාකාරී සීමාව | 20 |
| රූප සටහන් අංක 2.8 | රත්නපුර නගරයේ භූගෝලීය පසුබිම | 21 |
| රූප සටහන් අංක 2.9 | ජන සංයුතිය - 2017 | 24 |
| රූප සටහන් අංක 2.10 | වයස පදනම් කරගෙන ජනගහනය බෙදී යාම - 2017 | 24 |
| රූප සටහන් අංක 2.11 | රැකියාව පදනම් කරගෙන ජනගහනය බෙදී යාම - 2017 | 25 |
| රූප සටහන් අංක 3.1 | සාමාන්‍ය මාසික වර්ෂාපතනය - 2016 | 29 |
| රූප සටහන් අංක 3.2 | රත්නපුර වෙළඳ කටයුතු වල පසුබිම - 2016 | 30 |
| රූප සටහන් අංක 3.3 | මැණික් වෙළඳම සහ පතල් කර්මාන්තයේ  සේවා නියුක්තිය | 32 |
| රූප සටහන් අංක 3.4 | මැණික් කර්මාන්තයේදී මුදල් ගලායාම පිළිබඳ උදාහරණය | 33 |
| රූප සටහන් අංක 3.5 | පොම්ප කැළේ නාගරික වනාන්තරයේ සිදුවන අනවසර ඉදිකිරීම් - 2017 | 34 |
| රූප සටහන් අංක 3.6 | රත්නපුර නගරයේ භූගෝලීය සැකැස්ම - පාලම් | 35 |
| රූප සටහන් අංක 3.7 | රත්නපුර නගරයේ භූගෝලීය සැකැස්ම - මාර්ග | 36 |
| රූප සටහන් අංක 3.8 | රත්නපුර නගරයේ අවකාශීය සැකැස්ම - පාසැල් වල පිහිටීම | 37 |
| රූප සටහන් අංක 3.9 | 2010 - 2016 අතර කාලය තුළ නිකුත් කර ඇති  කැණීම් බලපත්‍ර ප්‍රමාණය | 38 |
| රූප සටහන් අංක 3.10 | නගරය තුළ ඇති කැණීම් ප්‍රදේශ - 2017 | 39 |
| රූප සටහන් අංක 3.11 | අපනයන සංයුතිය - 2016 | 40 |
| රූප සටහන් අංක 3.12 | මැණික් ව්‍යාපාරයෙහි ධාරක ප්‍රදේශය | 41 |
| රූප සටහන් අංක 3.13 | පැරණි ශ්‍රී පාද මාවත (රජමාවත) | 42 |
| රූප සටහන් අංක 3.14 | කළු ගඟ | 45 |
| රූප සටහන් අංක 5.1 | ශ්‍රී  ලංකාවේ මැණික් නිධිවල පිහිටීම | 59 |
| රූප සටහන් අංක 5.2 | මැණික් කර්මාන්තයට අදාළ ක්‍රියාවලිය සහ ජාලය | 60 |
| රූප සටහන් අංක 5.3 | මැණික් බලපත්‍ර නිකුත් කිරීම | 61 |
| රූප සටහන් අංක 5.4 | මැණික් අපනයනය | 61 |
| රූප සටහන් අංක 5.5 | රත්නපුර සහ අවට කලාපය තුළ ගංවතුර බලපාන ප්‍රදේශ | 64 |
| රූප සටහන් අංක 5.6 | මැණික් වෙළඳාම | 65 |
| රූප සටහන් අංක 5.7 | සබරගමුව පළාතට පැමිණි දේශීය සහ විදේශීය සංචාරකයන් (2014 - 2015) | 69 |
| රූප සටහන් අංක 5.8 | 2007 වසර වනවිට වන ආවරණය | 70 |
| රූප සටහන් අංක 5.9 | 2017 වසර වනවිට වන ආවරණය අඩු වීම | 71 |
| රූප සටහන් අංක 5.10 | සබරගමුව පළාත් සංචාරක සිතියම - 2017 | 73 |
| රූප සටහන් අංක 6.1 | නිල් ආරනුල සංකල්පය | 82 |
| රූප සටහන් අංක 6.2 | සංවර්ධන සැලැස්මේ සංකල්පය | 83 |
| රූප සටහන් අංක 6.2.1 | දැනට පවතින අහස් රේඛාව - 2018 | 87 |
| රූප සටහන් අංක 6.2.2 | යෝජිත අහස් රේඛාව - 2030 | 87 |
| රූප සටහන් අංක 6.3.1.2.1 | ශිෂ්‍ය ව්‍යාප්තිය | 93 |
| රූප සටහන් අංක 6.3.1.2.2 | නගර මධ්‍යයේ ශිෂ්‍ය ජනගහනයේ ව්‍යාප්තිය | 94 |
| රූප සටහන් අංක 6.3.2.1 | මාර්ග තදබදයට හේතු | 100 |
| රූප සටහන් අංක 6.3.2.2 | වර්තමාන බස් නැවතුම්පොළ | 100 |
| රූප සටහන් අංක 6.3.2.3 | ප්‍රවාහන උපායමාර්ගය | 101 |
| රූප සටහන් අංක 6.3.2.4 | යෝජිත ගංගා තොටුපළවල් | 104 |
| රූප සටහන් අංක 6.3.2.5 | යෝජිත රථගාල් ස්ථාන | 105 |
| රූප සටහන් අංක 6.3.4.1 | යෝජිත සුහුරු වීදි ආලෝකකරණ පද්ධතිය | 114 |
| රූප සටහන් අංක 6.3.6.1 | දෛනිකව රැස් කරන කසල සංයුතිය - 2017 | 118 |
| රූප සටහන් අංක 6.3.6.2 | නාගරික අපද්‍රව්‍යය රැස්කිරීම - 2017 | 118 |
| රූප සටහන් අංක 6.3.6.3 | අපද්‍රව්‍යය උත්පාදනය කිරීමේ මූලාශ්‍ර අනුව නාගරික අපද්‍රව්‍යය | |

| | | |
|---|---|---|
| | රැස්කිරීම – 2017 | 119 |
| රූප සටහන් අංක 6.3.6.4 | වර්ග අනුව නාගරික අපද්‍රව්‍යය එක්රැස් කිරීම – 2017 | 119 |
| රූප සටහන් අංක 6.4.1 | රත්නපුර නගරයේ ආර්ථික ව්‍යුහය – 2017 | 128 |
| රූප සටහන් අංක 6.4.2 | ආර්ථික සංවර්ධන උපායමාර්ගය | 130 |
| රූප සටහන් අංක 6.4.3 | වර්තමාන මැණික් කේන්ද්‍රස්ථාන සහ වීදි – 2017 | 131 |
| රූප සටහන් අංක 6.4.4 | ෆ්‍රැන්ක් හෙට්ටිආරච්චි මාවත ස්වර්ණාභරණ මාවතක් ලෙස සංවර්ධනය කිරීම | 134 |
| රූප සටහන් අංක 6.4.5. | යෝජිත පහසුකම් සහිත මැණික් කේන්ද්‍රස්ථාන, විදි සහ චතුරශ්‍ර | 134 |
| රූප සටහන් අංක 6.4.6. | යෝජිත වෙරලුප වැව | 135 |
| රූප සටහන් අංක 6.4.7. | භාවිතය වෙනස්කලයුතු ඓතිහාසික ගොඩනැගිලි | 136 |
| රූප සටහන් අංක 6.4.8. | පල්ලිය පාර සංවර්ධනය | 142 |
| රූප සටහන් අංක 6.4.9. | දේශීය ආර්ථිකය ප්‍රශස්තිකරණ ව්‍යාපෘති | 143 |
| රූප සටහන් අංක 6.5.1. | තිරසාර පාරිසරික උපායමාර්ග | 146 |
| රූප සටහන් අංක 6.5.2. | පොම්ප කැළේ හරිත තිරය | 147 |
| රූප සටහන් අංක 6.5.3 | නාගරික හරිත ස්ථාන | 150 |
| රූප සටහන් අංක 6.5.4. | ගං ඉවුර සංවර්ධනයඩහා භූ දර්ශන අලංකරණය | 151 |
| රූප සටහන් අංක 6.5.5. | රත්නපුර නගර මධ්‍යයේ ඇති මාර්ග සහ මංසන්ධි | 152 |
| රූප සටහන් අංක 6.5.6. | හඳුනාගත් පටු මාර්ග මාදිලි | 153 |
| රූප සටහන් අංක 6.5.7. | නව නගරයේ භූමි අලංකරණය සඳහා තෝරාගත් අවකාශයන් | 156 |
| රූප සටහන් අංක 6.5.8. | වෙළඳ නගරයේ භූමි අලංකරණය සඳහා තෝරාගත් අවකාශයන් | 156 |
| රූප සටහන් අංක 6.5.9. | ආපදා කළමනාකරණ උපායමාර්ග | 158 |
| රූප සටහන් අංක 6.5.10. | කළු ගඟ හැරවීම | 160 |
| රූප සටහන් අංක 6.5.11. | ජල පාලක පැති බැම්ම | 165 |
| රූප සටහන් අංක 6.5.12. | යෝජිත ගුවන්යානා ගොඩබැස්වීමේ ස්ථාන | 166 |
| රූප සටහන් අංක 6.5.13. | යෝජිත ගුවන් මගී පාලම් | 167 |
| රූප සටහන් අංක 6.5.14. | පාරිසරික අවදානම | 170 |
| රූප සටහන් අංක 6.6.1. | සමන් දේවාලයේ පෙරහැර | 180 |
| රූප සටහන් අංක 6.6.2. | සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ උපාය මාර්ගය | 181 |

## වගු ලැයිස්තුව

| | | |
|---|---|---|
| වගු අංක 2.1. | සැලසුම් ප්‍රදේශය පිළිබඳ තොරතුරු සාරාංශය | 22 |
| වගු අංක 3.1 | රත්නපුරයේ ගංවතුර ආපදා ඉතිහාසය | 29 |
| වගු අංක 3.2 | 2017 වසරේ ඇති වූ ගංවතුර තත්ත්වයේ සංෂිප්තය | 31 |
| වගු අංක 3.3 | සමන් දේවාලයට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව (2017) | 43 |
| වගු අංක 3.4 | රත්නපුර කෞතුකාගාරයට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව (2017) | 43 |
| වගු අංක 3.5 | රත්නපුර කලාපයේ පවතින ජෛව විවිධත්වය (2017) | 47 |
| වගු අංක 3.6 | රුවන්පුර අධිවේගී මාර්ගය පිළිබඳ තොරතුරු | 46 |
| වගු අංක 5.1 | පළමු අරමුණ සඳහා වූ ශදුඅත විශ්ලේෂණය | 58 |
| වගු අංක 5.2 | දෙවන අරමුණ සඳහා වූ ශදුඅත විශ්ලේශණය | 66 |
| වගු අංක 5.3 | තෙවන අරමුණ සඳහා වූ ශදුඅත විශ්ලේශණය | 75 |
| වගු අංක 6.3.1.1 | නිවාස | 88 |
| වගු අංක 6.3.1.3 | රත්නපුර පළාත් මුලික රෝහල – පහසුකම් සහ සේවක සංයුතිය 2017 | 97 |
| වගු අංක 6.3.3.1. | ජල පරිභෝජනය – 2017 | 109 |
| වගු අංක 6.3.3.2. | ජල පරිභෝජන අවශ්‍යයතාවය – 2030 | 110 |
| වගු අංක 6.3.4.1 | විදුලි සැපයුම – 2018 | 112 |
| වගු අංක 6.3.6.1. | ඝණ අපද්‍රව්‍ය උත්පාදනයේ සංයුතිය | 117 |
| වගු අංක 6.3.6.2 | අපද්‍රව්‍යය උත්පාදන ප්‍රක්ෂේපනය – 2030 | 121 |

වගු අංක 6.3.6.3 ඝණ අපද්‍රව්‍යය කළමනාකරණ සැලැස්ම (2030) – රත්නපුර මහා නගර සභාව 126
වගු අංක 6.4.1 හඳුනාගත් දර්ශනීය ස්ථාන 140
වගු අංක 6.5.1 රත්නපුර නගරයේ පාරිසරික ව්‍යුහය 145
වගු අංක 6.5.2 දර්ශනීය ස්ථානයන්හි පවත්නා ආකර්ෂණීය අංග 147
වගු අංක 6.5.3. වර්තමාන උද්‍යාන සහ ක්‍රීඩාංගන – 2018 173
වගු අංක 6.5.4. යෝජිත පොදු එළිමහන් විනෝදාත්මක ප්‍රදේශ සැලැස්ම 175
වගු අංක 6.5.5. පොදු එළිමහන් විනෝදාත්මක අවකාශ සැලැස්ම – අවසර ලත් ක්‍රියාකාරකම් 175
වගු අංක 6.6.1. පුරාවිද්‍යා සංරක්ෂණ ස්ථාන 180
වගු අංක 6.7.1. කෙටිකාලීන ව්‍යාපෘති 188
වගු අංක 6.7.2. මධ්‍යකාලීන ව්‍යාපෘති 190
වගු අංක 6.7.3. දිගුකාලීන ව්‍යාපෘති 192

# ඇමුණුම් ලැයිස්තුව

ඇමුණුම 01 ජනගහන ව්‍යාප්තිය 2017 264
ඇමුණුම 02 පවත්නා භූමි පරිහරණ රටාව 265
ඇමුණුම 03 වාර්ෂික වර්ෂාපතන රටාව 266
ඇමුණුම 04 ගංවතුර සඳහා හඳුනාගත් හේතු 266
ඇමුණුම 05 නගර මධ්‍යය තුළ ගංවතුර ආපදාවට ලක්වන ස්ථාන 267
ඇමුණුම 06 නගර මධ්‍යයෙහි උදේ කාලයේදී පවතින රථවාහන තදබදය පිළිබඳ තොරතුරු 268
ඇමුණුම 07 නගර මධ්‍යයෙහි දහවල් කාලයේදී පවතින රථවාහන තදබදය පිළිබඳ තොරතුරු 268
ඇමුණුම 08 නගර මධ්‍යයෙහි සවස් කාලයේදී පවතින රථවාහන තදබදය පිළිබඳ තොරතුරු 269
ඇමුණුම 09 වාහන ප්‍රවාහයට අනුව රථවාහන තදබදය (නගරයට ඇතුළුවීම) 270
ඇමුණුම 10 වාහන ප්‍රවාහයට අනුව රථවාහන තදබදය (නගරයෙන් පිටවීම) 270
ඇමුණුම 11 වාහන වර්ග අනුව කොළඹ පාරේ රථවාහන තදබදය 271
ඇමුණුම 12 වාහන වර්ග අනුව කුරුවිට පාර තුළ රථවාහන තදබදය 271
ඇමුණුම 13 සැලසුම් ප්‍රදේශයේ පතල් කැණීම් ප්‍රදේශ 272
ඇමුණුම 14 රුවන්පුර අධිවේගී මාර්ගය පිළිබඳ තොරතුරු 273
ඇමුණුම 15 පොදු එළිමහන් විනෝදාත්මක අවකාශ සිතියම 274
ඇමුණුම 16 පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් විශ්ලේෂණය 275

# කෙටි යෙදුම්

| | |
|---|---|
| නා.සං.අධි. | නාගරික සංවර්ධන අධිකාරිය |
| ර.ම.ස. | රත්නපුර මහ නගර සභාව |
| ග්‍රා.නි.ව. | ග්‍රාම නිළධාරී වසම |



# පළමු කොටස

# පරිච්ඡේදය 01



# හැඳින්වීම

01 පරිච්ඡේදය
හැඳින්වීම

සංවර්ධන
සැලැස්මේ පසුබිම

# 1.1. සංවර්ධන සැලැස්මේ පසුබිම

නගරයක සමාජ, ආර්ථික, දේශපාලන සහ පාරිසරික අංශයන් අතර පවතින අන්‍යෝන්‍ය සබඳතා සහ ප්‍රවණතා නගරයක අනාගත සංවර්ධනය පුරෝකථනය කිරීම සඳහා ප්‍රබල පදනමක් සපයයි. එබැවින් නගරයට අනාගත සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ, සැලසුම් ක්‍රියාවලිය තුළ මෙම විචල්‍යයන් හඳුනා ගැනීම අවශ්‍යය වේ.

නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනය නියාමනය කරන ආයතනයයි. 1978 වසරේ අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියට බලය පවරා ඇත. අධිකාරියට පැවරී ඇති නීතිමය බලතල යටතේ, ප්‍රකාශිත නාගරික ප්‍රදේශයන් සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම මෙහි ප්‍රධාන අංගයයි. නගරයේ සැලසුම්ගත ඉදිරි දැක්ම ඉලක්කකර නව සංවර්ධන අවස්ථා ප්‍රයෝජනයට ගෙන නගරය දියුණු කිරීම සහ අපේක්ෂිත ප්‍රතිලාභ එහි වැසියනට ලබාදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් සංවර්ධන සැලසුම් සකස් කරනු ලැබේ.

රත්නපුර නගරයේ පරිපාලන හා කළමනාකරණ කටයුතු උදෙසා රත්නපුර නගරය පදනම් කරගත් ප්‍රාදේශීය මණ්ඩලය 1887 වසරේ දී පිහිටුවන ලද අතර 1922 වසරේ පළාත් පාලන කවුන්සිලයට අනුකූලව ස්ථාපනය කරන ලද පළාත් පාලන මහා මණ්ඩලය යටතට එම කටයුතු අනුයුක්ත කරන ලදි. පසුකාලීනව, නගරයේ ක්‍රමික වර්ධනය පිළිබඳව සැළකිළිමත් වෙමින් නාගරිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණ සහිතව 1968 වසරේ දී රත්නපුර මහා නගර සභාව පිහිටුවන ලදි. 1978 වසරේ දී අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ රත්නපුර මහ නගර සභා සීමාව නාගරික සංවර්ධන අධිකාරියට අයත් බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම 1979 වසරේ ජුනි මස 1 වන දින අංක 38/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ සිදු කරන ලදි.

මෙම නාගරික බල ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිපලයක් වශයෙන් රත්නපුර නගරයට ආපදා රහිත විකල්පයක් ලෙස නව නගරයක අවශ්‍යතාව නාගරික සංවර්ධන අධිකාරිය මගින් හඳුනාගත් අතර ඒ සඳහා අවශ්‍ය ඉඩම් 1981 වසරේ දෙසැම්බර් මස 23 දින අංක 172/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ පවරා ගන්න ලදී.

රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම මෙම 'ද්විත්ව නගර සංකල්පය' මත පදනම්ව 2006 වසරේ දී ආරම්භ කරන ලද අතර එය 2007 වසරේ පෙබරවාරි මස 07 වැනි දින අංක 1483/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ ගැසට් කර තිබේ. ආපදා කළමනාකරණ අංශය වැඩිදියුණු කිරීම පිළිබඳව සැළකිළිමත් වෙමින් එම සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය 2013 වසරේ දී ආරම්භ කරන ලද අතර මෙම යාවත්කාලීන කරන ලද සැලැස්ම 2014 වසරේ ඔක්තෝබර් මස 14 වන දින අංක 1884/25 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ ගැසට් කර ඇත.

වර්තමාන රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම 2017 වසරේ මුල් භාගයේ ආරම්භ විය. ඒ අනුව, රත්නපුර නගරයේ නැගී එන නාගරික සංසිද්ධි පිළිබඳව සැලකිළිමත් වෙමින් ඉදිරි දශකය තුළ භෞතික, පාරිසරික, ආර්ථික සහ සමාජ සුබසාධනය වැඩි දියුණු කිරීම පිළිබඳව මෙම සංවර්ධන සැලැස්ම අවධානය යොමුකර ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවර්ධන උපාය මාර්ග හා මාර්ගෝපදේශයන් ද හඳුන්වා දී ඇති අතර රත්නපුර නගර සංවර්ධන සැලැස්මට අදාළ සැලැසුම් ක්‍රියාවලිය 2017 වසරේ මාර්තු 15 දින ආරම්භ විය.

## 1.2. සැලසුම් කණ්ඩායම

*රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් ලෙස පුළුල් පරාසයක් නියෝජනය කරන පහත සඳහන් පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබාගෙන ඇත.*

### 1.2.1. ප්‍රධාන පාර්ශවකරු

- *රත්නපුර මහා නගර සභාව*

### 1.2.2. පරිපාලන කටයුතු සමබන්ධ උපදේශක ආයතන

- *සබරගමුව පළාත් සභාව*
- *දිස්ත්‍රික් ලේකම් කාර්යාලය*
- *ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*
- *රත්නපුර ප්‍රාදේශීය ලේකම් කර්යාලයට අනුබද්ධ ග්‍රාම නිලධාරීවරුන්*

### 1.2.3. ආර්ථික කටයුතු සමබන්ධ උපදේශක ආයතන

- *ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය*
- *කෘෂි සංවර්ධන දෙපාර්තමේන්තුව*
- *පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*
- *අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*
- *වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය*
- *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*
- *පළාත් සංචාරක අමාත්‍යාංශය*
- *පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව*
- *වෙළඳ සංගමය*
- *මැණික් වෙළඳ සංගමය*

### 1.2.4. පරිසර කටයුතු සමබන්ධ උපදේශක ආයතන

- *භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය*
- *වාරිමාර්ග දෙපාර්තමේන්තුව*
- *මිනින්දෝරු දෙපාර්තමේන්තුව*
- *කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව*
- *වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව*
- *මධ්‍යම පරිසර අධිකාරිය*
- *ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය*
- *ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය*
- *පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය*
- *ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව*

## 1.2.5. යටිතල පහසුකම් සමබන්ධ උපදේශක ආයතන

- *මාර්ග සංවර්ධන අධිකාරිය*
- *පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය*
- *රත්නපුර අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*
- *රත්නපුර ඩිපෝව*
- *මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය*
- *ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය*
- *ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතිය*
- *ලංකා විදුලිබල මණ්ඩලය*
- *ශ්‍රී ලංකා ටෙලිකොම්*
- *ජාතික නිවාස සංවර්ධන අධිකාරිය*
- *සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව*
- *පළාත් අධ්‍යාපන කාර්යාලය*
- *ශ්‍රී ලංකා පොලිසිය*

## 1.2.6. සමාජ උපදේශක ආයතන

- *ප්‍රදේශයේ ආගමික නායකයන්*
- *ප්‍රජා මූල සංවිධාන*
- *ෆේස්බුක් සමාජ මාධ්‍ය ජාලය*
- *විවිධ අංශයන්හි විශේෂඥ දැනුම සහිත පුද්ගලයන්*
- *සාමාන්‍ය ජනතාව (අහඹු ලෙස හා අරමුණක් සහිතව තෝරාගත්)*

## 1.2.7. නාගරික සංවර්ධන අධිකාරියේ සබරගමුව පළාත් කාර්යාලයේ රත්නපුර දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම

- *නගර නිර්මාණ ශිල්පි සිසිර එම්. දිසානායක මහතා – අධ්‍යක්ෂ, සබරගමුව පළාත*
- *නගර නිර්මාණ ශිල්පි ඩී. ඒ. ඩී අතුකෝරල මහත්මිය – නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), රත්නපුර දිස්ත්‍රික්කය*
- *නගර නිර්මාණ ශිල්පි හසිනි එන්. ආටිගල මෙනවිය – උපායමාර්ගික සැලසුම් නිළධාරී*
- *කේ. ඒ. එස්. ගුණසේකර මහත්මිය – බලාත්මක නිළධාරී*
- *එච්.කේ.ඩී.එම්.කේ. පතිරණ මහත්මිය – බලාත්මක නිළධාරී*
- *එච්.එම්.පී.එච්. මැණිකේ මහත්මිය – බලාත්මක නිළධාරී*
- *සන්ධ්‍යා බඹරැන්ද මහත්මිය – භූගෝලීය තොරතුරු පද්ධති නිළධාරී*
- *ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්. මැණිකේ මෙනවිය – සැලසුම් ශිල්පි*

## 1.2.8. සභය ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් අංශ

- *පර්යේෂණ හා සංවර්ධන අංශය*
- *සංවර්ධන සැලසුම් අංශය*
- *භූගෝලීය තොරතුරු පද්ධති අංශය*
- *භූ දර්ශන සහ පාරිසරික අංශය*

## 1.2.9. සභය ලබාදුන් අනෙකුත් අධ්‍යන කණ්ඩායම්

- *මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ (2006/2010) සිසුන් කණ්ඩායම රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් 2009 වසරේදී සිදු කළ ප්‍රාදේශීය අධ්‍යයනය*
- *එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන විසින් 2013 වසරේදී සිදුකරන ලද ආපදාප්‍රත්‍යා නගර සංවර්ධන උපායමාර්ග සකස් කිරීමේ අධ්‍යයනය*
- *කොළඹ වාස්තු විද්‍යා පාසැලේ ස්ටුඩියෝ 5 (2017/18) සිසුන් කණ්ඩායම රත්නපුර නගරය සම්බන්ධයෙන් 2018 වසරේදී සිදු කළ අධ්‍යයනය*

## 1.3. විෂය පථය

රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යනු රත්නපුර නගරයේ අනාගත සංවර්ධනය පිළිබඳ දැක්ම වේ. එමගින්, රත්නපුර නගරයේ වර්තමාන තත්ත්වය පිළිබඳව අදහසක් ලබා දෙන අතර නගරයෙහි අපේක්ෂිත ඉදිරි දර්ශනය කුමක්ද, එහි ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගන්නේ කෙසේද, අපේක්ෂිත වෙනස්කම් මොනවාද, අපේක්ෂිත වෙනස්කම් සිදු කිරීම සඳහා ගතයුතු විකල්පයන්, උපායමාර්ගයන් මෙන්ම මැදිහත්වීම් මොනවාද යන්න පිළිබඳව ද අදහසක් ලබා දෙයි. මෙහිදී අනාගත සංවර්ධනය සඳහා වන ඉදිරි දැක්ම සඳහා රත්නපුර නගරයේ වර්තමාන සංවර්ධන තත්ත්වය, එය වෙනස් කළයුතු දිශාව සහ සුදුසුතම ඉදිරි දැක්ම නගර සංවර්ධන සැලැස්ම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව, රත්නපුර නගර සංවර්ධන සැලැස්ම මගින් වසර 2030 වනවිට රත්නපුර නගරය ආර්ථික වශයෙන් ඵලදායී, කාර්යක්ෂම සහ සියලුම සමාජ ස්ථරයන්ට ප්‍රතිචාර දක්වන නගරයක් බවට පත් කිරීම පිණිස උපායමාර්ගයන් යෝජනා කර ඇත.

මෙම නගර සංවර්ධන සැලැස්ම ග්‍රාම නිලධාරී වසම් 18 කින් සමන්විත රත්නපුර මහා නගර සභාව සඳහා සකස් කර ඇති අතර වර්ග කි.මී. 22.2 ක වර්ග ප්‍රමාණයකින් සමන්විත එම භූමි ප්‍රමාණය තුළ 2018 වසර වනවිට 49,083 ක ජන සංඛ්‍යාවක් වාසය කරයි.

ඉතිහාසයේ සිටම මැණික් වෙළඳාම සහ මැණික් කර්මාන්තය සම්බන්ධ කේන්ද්‍රස්ථානය වශයෙන් රත්නපුරය ප්‍රසිද්ධ ය. එබැවින්, නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතම අංගයක් වශයෙන් ප්‍රදේශයේ මූලික පාරිසරික සහ සංස්කෘතික අංගයන් ආරක්ෂා වනසේ මැණික් වෙළඳාම සහ මැණික් කර්මාන්තය ව්‍යාප්ත කිරීමෙන් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම හඳුනාගෙන ඇත. රත්නපුර නගර සංවර්ධන සැලැස්මෙහි අවසන් ඉලක්කය වන්නේ ශක්තිමත් ආර්ථික, පාරිසරික සහ සංස්කෘතික වටිනාකමකින් යුතු වූ ජීවත් වීමට සුදුසු පරිසරයක් රත්නපුර නාගරික ප්‍රජාව සඳහා නිර්මාණය කිරීමයි.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය

රත්නපුර නගර සංවර්ධන සැලැස්මේ සැලසුම් ක්‍රියාවලිය පියවර දහයක් යටතේ සිදු වූ අතර පළමු පියවර යටතේ, පහත සඳහන් කරුණු උදෙසා භූගෝලීය දත්ත ගබඩාවක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පසුබිම් අධ්‍යයනයන් සිදු කරන ලදී.

- අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ මූලික දත්ත සොයා බැලීම
- දත්ත පරිනරය හඳුනාගැනීම
- ක්ෂේත්‍ර දත්ත සමීක්ෂණ සහ අනෙකුත් දත්ත මූලාශ්‍ර උපයෝගී කරගනිමින් මූලික දත්ත යාවත්කාලීන කිරීම
- විශ්ලේෂණය සඳහා අවශ්‍ය අනෙකුත් දත්ත රැස් කිරීම

මෙම සියලු දත්ත සහ තොරතුරු එක් රැස් කිරීමටත් භූගෝලීය දත්ත පද්ධතිය තුළ ගබඩා කිරීමටත් එම තොරතුරු ආධාරයෙන් විවිධ විශ්ලේෂණයන් සිදු කිරීමටත් 2017 වසරේ මාර්තු මස සිට 2017 වසරේ අගෝස්තු මස දක්වා කාලය වෙන් කරන ලදී.

දෙවන පියවර යටතේ රත්නපුර නාගරික ප්‍රදේශය පුළුල් පරාසයක් තුළ හඳුනා ගන්න ලදී. ඒ යටතේ ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සමාලෝචනය කිරීමත් ගමනාගමනය, ඉඩම්වල වටිනාකම් හා පදික වෙළඳාම ආදී කටයුතු පිළිබඳව විවිධ සමීක්ෂණ සිදු කිරීමටත්, ඒ වනවිට ක්‍රියාත්මක වූ සහ යෝජිත ව්‍යාපෘතීන්හි බලපෑම් පිළිබඳ ඇගයීමටත් කාලය වෙන් කරන ලදී. මෙම ක්‍රියාවලිය 2017 වසරේ සැප්තැම්බර් මස සිට 2017 වසරේ දෙසැම්බර් මස දක්වා සිදු කරන ලදී.

නෙවන පියවරේ දී රත්නපුර නගරයට අනන්‍ය වූ ගැටලු හා විභවතා හඳුනාගත් අතර මෙම අදියරේ දී රත්නපුර නගර සංවර්ධන සැලැස්මට අදාල සියලු පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම ද සිදුකෙරිණි. මෙම සියලු අධ්‍යයනයන් සහ අදහස් උපයෝගී කරගනිමින් දැක්ම, අභිමතාර්ථ සහ අරමුණු සැකසීම ඉන් පසුව සිදු කරන ලදි. එයට අනුකූලව සවිස්තරාත්මක දත්ත විශ්ලේශණය කිරීම ඉන් අනතුරුව සිදු වූ අතර මේ සඳහා පාරිසරික සංවේදීතා විශ්ලේෂණය (Sensitivity Analysis), සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය (Development Pressure Analysis), සම්බන්ධතා විශ්ලේෂණය (Connectivity Analysis), වාසයට සුදුසු පරිසර නිර්ණය කිරීමේ විශ්ලේශණ (Livability Analysis) ආදී විවිධ විශ්ලේෂණයන් සිදු කරන ලද අතර මේ සඳහා 2018 වසරේ ජනවාරි මස සිට 2018 වසරේ අප්‍රේල් මස දක්වා කාලය වෙන්වන ලදි.

ඉහත අධ්‍යයනයන් හා විශ්ලේෂණයන්ට අනුකූලව උපායමාර්ග සැකසීම අනතුරුව සිදුවිය. භූමි පරිහරණ සැලැස්ම, අපරව්‍යුහ පහසුකම් පිළිබඳ සැලැස්ම, ආර්ථික සංවර්ධන සැලැස්ම, පාරිසරික සැලැස්ම, උරුමයන් ආරක්ෂා කරගැනීම පිළිබඳ සැලැස්ම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සැලැස්ම ආදී සැලසුම් මෙහිදී සකස් කරන ලද අතර එම සැලැසුම් බලාත්මක කිරීමට අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම ද මෙම අදියරේ දී සිදු කෙරිණි. මෙම ක්‍රියාවලිය 2018 වසරේ මැයි මස සිට 2018 වසරේ සැප්තැම්බර් මස දක්වා සිදු කරන ලදි.

ඉහත සැලසුම් වලට අදාළව ව්‍යාපෘති සහ එම ව්‍යාපෘති සඳහා යෝග්‍ය භූමි ප්‍රදේශයන් හඳුනාගැනීම මීළඟ අදියරේ දී සිදු විය. එහිදී, රත්නපුර නගර සංවර්ධන සැලැස්මේ අනාගත දැක්ම සහ මූලික විශ්ලේෂණ කටයුතු මත එළඹි නිගමන මත පදනම්ව ප්‍රමුඛතාව ලබාදිය යුතු ව්‍යාපෘති ලැයිස්තුව සකස් කරන ලදි. මෙම සැලැස්මෙන් යෝජිත ඇතැම් ව්‍යාපෘති රත්නපුර නගරයේ පවතින ගැටලු සහ විභවතාවයන්ට සෘජුවම ප්‍රතිචාර දක්වන ආකරයටත් ඇතැම් ව්‍යාපෘති වක්‍රව ප්‍රතිචාර දක්වන ආකාරයටත් පෙළගස්වා ඇත. ව්‍යාපෘතීන්හි ප්‍රමුඛතාව තීරණය කිරීමේදී සමාජ, ආර්ථික, දේශපාලනික සංවේදීතාවයන් පිළිබඳව සළකා බලා පවත්නා විකල්ප අතරින් යෝග්‍යතම විකල්පය තෝරාගෙන ඇති අතර මෙම අදියර වෙනුවෙන් 2018 වසරේ ඔක්තොම්බර් මස සිට 2018 වසරේ දෙසැම්බර් මස දක්වා කාලය වෙන්වන ලදි.

අවසන් අදියරේ දී සැලැස්ම පිළිබඳව මහජන අදහස් ලබා ගැනීම සිදු විය. මූලික අදියරයන්හි දී සිදු කරන ලද අධ්‍යයනයන් උදෙසා මහජන අදහස් ලබා ගැනීම වාචිකව හා ලිඛිතව සිදු වූ අතර මෙම අදියරේ දී ද එලෙසින්ම අදහස් ලබා ගන්නා ලදි. මේ සඳහා රත්නපුර මහ නගර සභාව තුළ දින හැටක කාලයක් නගර සැලැස්ම තබා තිබූ අතර එම යෝජනාවන්ට අනුකූලව අවශ්‍ය වෙනස්කම් පසුව සිදු කරන ලදි. අනතුරුව සම්බන්ධීකරණ කටයුතු සහ සංශෝධන කටයුතු සිදු කෙරුණු අතර පාර්ශවකරුවන් හා සැලසුම් කමිටු සමග සම්බන්ධීකරණය හා උපදේශනය, අභ්‍යන්තර සමාලෝචන හා තත්ත්ව සහතික කිරීම, අමාත්‍යංශ අනුමැතීන් ලබා ගැනීම හා ගැසට් නිවේදනයට අදාළ කටයුතු වැනි කටයුතු සම්බන්ධීකරණ කටයුතු  සිදුවිය.  එමෙන්ම, මෙම කාලය ඇතුළත දී රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීමත් පිටු සැකසුම් සිදු කිරීමත් ආදී කටයුතු සිදු කරන ලදි. 2019 වසරේ ජනවාරි මස සිට 2019 වසරේ ජුනි මස දක්වා මෙම කටයුතු සිදුවන ලදි.

සැලසුම් ක්‍රියාවලිය




*රූප සටහන් අංක 1.1 : සැලසුම් ක්‍රියාවලිය*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය*

පරිච්ඡේදය 02



# මූලික සමීක්ෂණ අධ්‍යයනය

# 2.1. අධ්‍යයන ප්‍රදේශය

රත්නපුර නගරය සබරගමුව පළාතේ අගනගරය වන අතර එය කොළඹ නගරයට කිලෝමීටර් 100 ක් පමණ ගිනිකොණ දිසාවෙන් පිහිටා ඇත. රත්නපුර නාගරික සංවර්ධන සැලැස්ම සඳහා පාදක කරගන්නා ලද්දේ රත්නපුර නගර සභා බල ප්‍රදේශය යි. (සිතියම් අංක 2.1) ඓතිහාසික යුගයේ සිටම ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත්ව ඇති ආර්ථික ක්‍රියාකාරකම් සහ ජාතික වශයෙන් සැලකිය යුතු පාරිසරික පද්ධති හේතුවෙන් රත්නපුර නගරය රජවරුන් සහ ප්‍රාදේශීය පාලකයන් විසින් ආරක්ෂිත භූමියක් ලෙස ආරක්ෂා කර ඇත. යටත්විජිත යුගයේ දී පෘතුගීසීන්, ලන්දේසීන් මෙන්ම ඉංග්‍රීසින් ද තමන්ගේ බලකොටු රත්නපුරය පාදක කරගනිමින් ගොඩනගා තිබුනු අතර රත්නපුර නගරය සම්බන්ධයෙන් පාලකයන් තුල පැවති මෙම අවධානය යටත් විජිත සමය නිමා වන තුරුම පැවතී ඇත.

මධ්‍යම කඳුකරයේ නිරිත දිශානුගත වූ සමනළ කඳු වැටිය සහ රක්වාන කඳු වැටිය අතර පවතින නිම්නයක රත්නපුර නගරය පිහිටා ඇති අතර එම නගරයටම ආවේණික උපායමාර්ගික පිහිටීමත් පාරිසරික සංවේදීතාවයත් ආර්ථිකමය අනන්‍යතාවය සහ සංස්කෘතික පසුබිමත් හේතුවෙන් සුවිශේෂී නගරයක් බවට පත් වී ඇත. මේ අනුව, අනාගතයේ දී ශක්තිමත් ආර්ථික සහ පාරිසරික පදනමක් සහිත ප්‍රබල නගරයක් බවට පත්වීමේ හැකියාව රත්නපුර නගරය සතුව පවතී.

උතුරු අක්ෂාංශ 600–41 'හා 600–42' සහ නැගෙනහිර දේශාංශ 800–23 '– 800–24 අතර මුහුදු මට්ටමේ සිට මිටර් 18 ක් උසින් රත්නපුර නගරය පිහිටා ඇත. නගරය සහ ඒ අවට ප්‍රදේශය දළ බෑවුම් සහිත කඳුවැටි, ගංගා නිම්න, පහත් බිම් සහ තැනිතලා යනාදී විවිධ භූ විද්‍යාත්මක ලක්ෂණ වලින් සමන්විත වේ. (රූප සටහන් අංක 2.1) මීට අමතරව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා හතර (04) ට අයත් වන කළු ගඟේ ජලගැලීම් සඳහා හසුවන ප්‍රදේශයේ රත්නපුර නගරය පිහිටා ඇත. එබැවින්, මෙම සංකීර්ණ ස්වභාවික පරිසරයට අනුරූප වන ලෙස නගර සැලැස්ම සකස් කිරීම රත්නපුර නගරය සංවර්ධනය කිරීමේ දී අත්‍යාවශ්‍ය අංගයක් වේ.

*රත්නපුර නගරයේ හරස් පැතිකඩ*




***රූප සටහන් අංක 2.1 :*** *රත්නපුර නගරයේ හරස් පැතිකඩ*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*




**සිතියම් අංක 2.1 :** *රත්නපුර නාගරික බල ප්‍රදේශය*

## 02 පරිච්ඡේදය මූලික සමීක්ෂණ අධ්‍යයනය

### අධ්‍යයන ප්‍රදේශය

රත්නපුර නගරයට අදාළව සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 29.44 ˚C වන අතර උපරිම උෂ්ණත්වය මාර්තු මාසයේ දී ද අවම උෂ්ණත්වය ජනවාරි මාසයේ දී ද වාර්තා වේ. (රූප සටහන් අංක 2.2) නගරයේ සාමාන්‍ය වර්ෂාපතනය මිලි මිටර් 3,000 සහ මිලි මිටර් 4,000 අතර පරාසයක පවතින අතර වැඩිම වර්ෂාපතනයක් වාර්තා වී ඇත්තේ මෝසම් වර්ෂාව පවතින කාලසීමාව වන මැයි – ජූනි මාස තුළ සහ අන්තර් මෝසම් වර්ෂාව පවතින කාලසීමාව වන සැප්තැම්බර් – ඔක්තෝබර් මාස අතර කාලය ඇතුලත බව වාර්තා වේ.



*පෙ.ව. 6 - 23 ˚c* *දහවල් 12 - 35 ˚c* *ප.ව. 4 - 26 ˚c*

***රූප සටහන් අංක 2.2 :*** *රත්නපුර නගරයේ කාළගුණික වෙනස්වීම (2018)*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

බෞද්ධ ප්‍රජාව අතර ගෞරවාදරයට පාත්‍ර වන ආගමික සංකේතයන් අතුරින් වසර සියයකට වඩා පැරණි සබරගමුව මහ සමන් දේවාලය රත්නපුර නගර සීමාව තුළ පිහිටා ඇති අතර (රූප සටහන් අංක 2.3) පුරාවෘත්තයනට අනුව ශ්‍රී පාදස්ථානය වෙතට යන ප්‍රධාන මාවත "රජමාවත" ලෙසින් රත්නපුර නගරයෙන් ඇරඹී ඇත. එමෙන්ම, ශ්‍රී පාදස්ථානය කරා යාමට පැමිණි වන්දනාකරුවන් විසින් රත්නපුර නගරයට පිවිසීමේ නාවික මාර්ගයක් වශයෙන් කලු ගඟ භාවිතා කර ඇති බවත් ගොඩබිම් මාර්ගයන් ලෙස විවිධ පෙත්මං භාවිත කර ඇති බවත් අධ්‍යයනයන්ගෙන් හෙළි වී ඇත. (මූලාශ්‍රය : සබරගමුව වංශ කතාව) මීට අමතරව ඉහළ ගුණාත්මක බවින් යුත් මැණික් සහ මැණික් කර්මාන්තය හා සබැඳි සංස්කෘතිය සම්බන්ධව ද රත්නපුර නගරය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියක් ලබා ඇත.




***රූප සටහන් අංක 2.3 :*** *සමන් දේවාලයේ පිහිටීම*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ  වාස්තු විද්‍යා පාසැල*

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ ජාතික භෞතික සැලැස්මට (2030) අදාළව හඳුනාගත් අධි සංවේදී මධ්‍යම පාරිසරික කලාපය තුළ රත්නපුර නගරය පිහිටා තිබේ. ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කරගැනීමටත් පාරිසරික සමතුලිතතාව රඳවා ගැනීමටත් මෙමගින් අපේක්ෂිත ය. එබැවින්, රත්නපුර නගරයේ අනාගත සංවර්ධනය සැලසුම් කිරීමේ දී මෙම ජාතික ප්‍රතිපත්ති සහ ඒ සඳහා මූලික වූ අවශ්‍යතාවයන් පිළිබඳව සැළකිලිමත් විය යුතු වේ. මෙම ජාතික ප්‍රතිපත්තීන් සහ සැලසුම් වලට අනුව, රත්නපුර නගරය සබරගමුව පළාතේ අගනගරය වුව ද 2030 වසර වනවිට වාසය කළ යුතු උපරිම ජනගහනය 100,000 කට සීමාවිය යුතු ය.

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මාර්ග ජාලය තුල රත්නපුර නගරය ගමනාගමන කේන්ද්‍රස්ථානයක් වශයෙන් වැදගත් වන අතර බස්නාහිර, නැගෙනහිර, දකුණ සහ ඌව පළාත් එමගින් සම්බන්ධ වේ. (රූප සටහන් අංක 2.4) මේ අනුව, කොළඹ (බටහිර වෙරළ තීරය) සහ මඩකලපුව (නැගෙනහිර වෙරළ තීරය) අතර දිවෙන A 004 මාර්ගයේ මධ්‍ය ලක්ෂය ලෙස රත්නපුර නගරය බටහිර පළාත සහ නැගෙනහිර පළාත සම්බන්ධ කරයි. එමෙන්ම, රත්නපුර – කලවාන මාර්ගය මගින් එය දකුණු පළාත දක්වාත් සම්බන්ධ වේ. මෙම විශේෂිත පිහිටීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ජාතික භෞතික සැලැස්මෙන් රත්නපුර නගරය හරහා දිවෙන ලෙස කොළඹ සිට පැල්මඩුල්ල දක්වා අධිවේගී මාර්ගයක් යෝජනා කර ඇති අතර කහතුඩුව අන්තර් හුවමාරුවේදී මෙම යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය, පවත්නා අධිවේගී මාර්ග ජාලය හා සම්බන්ධ වීමට නියමිත ය.

## 02 පරිච්ඡේදය
## මූලික සමීක්ෂණ අධ්‍යයනය

අධ්‍යයන ප්‍රදේශය




***රූප සටහන් අංක 2.4 :*** *කලාපීය සම්බන්ධතා ජාලය*

***මූලාශ්‍රය :*** *මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ 2006/2010 සිසුන් කණ්ඩායම රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් 2009 වසරේදී සිදු කළ ප්‍රාදේශීය අධ්‍යයනය*




***රූප සටහන් අංක 2.5 :*** *රත්නපුර සංසරණ ජනගහනය*

***මූලාශ්‍රය :*** *මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ 2006/2010 සිසුන් කණ්ඩායම රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් 2009 වසරේදී සිදු කළ ප්‍රාදේශීය අධ්‍යයනය*

2018 වසර වනවිට රත්නපුර නගරයේ නේවාසික ජනගහනය 49,083 ක් වන අතර මෙහි පවත්නා සුවිශේෂිත්වය වන්නේ දෛනික සංසරණ ජනගහනය නේවාසික ජනගහනය මෙන් දෙගුණයකට ආසන්න වීමයි. එහෙයින්, ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් වශයෙන් පැවතීමත් සේවා පදනම් කරගත් පළාත් අග නගරයක් වීමත් හේතුවෙන් දෛනිකව රත්නපුර නගරයට 100,000 ක පමණ සංසරණය ජනගහනයක් පැමිණෙයි. (රූප සටහන් අංක 2.5) එමෙන්ම, පහත සඳහන් කරුණු හේතුවෙන් මෙම සංසරණ ජනතාව රත්නපුර නගරය වෙත පැමිණෙන බව හඳුනාගත හැකි වේ.

- රැකියා අරමුණු
- සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම්
- මැණික් ව්‍යාපාරය වැනි ආර්ථික අරමුණු
- ප්‍රවාහන සේවා
- කෘෂිකාර්මික සේවා
- බැංකු සහ මූල්‍ය පහසුකම්

රත්නපුර නගරයේ ආර්ථික කටයුතුවල අවකාශීය ව්‍යාප්තිය මැණික් කර්මාන්තය මත පදනම් වී තිබීමත් නිමි ඇඳුම් වෙළඳාම සහ තොග බඩු වෙළඳාම සම්බන්ධයෙන් රත්නපුර නගරය ඒ වටා පවත්නා ග්‍රාමීය ජනතාව අතර ප්‍රචලිතව පැවතීමත් මත රත්නපුර නගරයට දෛනිකව විශාල ජන සංඛ්‍යාවක් පැමිණෙයි. එලෙස පැමිණෙන ජනතාවට අමතරව නගරයට මධ්‍යගත වී ඇති පරිපාලන කටයුතු, අධ්‍යාපනික කටයුතු මෙන්ම මෑතක දී ඉහළ නැංවූ සෞඛ්‍ය පහසුකම් ද හේතුවෙන් සංසරණ ජනගහනය ඉහළ ගොස් ඇත. එමෙන්ම, ඉහත සඳහන් සේවාවන් වල ධාරක ප්‍රදේශය ඇතැම්විට රත්නපුර දිස්ත්‍රික්කයම ආවරණය කරනු දැකිය හැකි වේ. මේ අනුව, සබරගමුව පළාතේ පළමු පෙළ සේවා නගරය ලෙස සළකනු ලබන රත්නපුර නගරය යනු බොහෝ සමාජ හා ආර්ථික සේවාවන්වල කේන්ද්‍රස්ථානයක් වන අතරම ඉතා විශාල ප්‍රදේශයක් ආවරණය වන පරිදි සේවා සපයන මධ්‍යස්ථානයක් ද වේ.

## 2.2. සැලසුම් සහ අවස්ථා සන්දර්භය

රත්නපුර නගර සැලැස්ම සඳහා අධ්‍යයනය කරන ලද සමස්ත භූමි ප්‍රමාණය ග්‍රාම නිළධාරී වසම් 29 කින් යුත් වර්ග කි.මී. 70.43 ක ප්‍රදේශයකින් සමන්විත වන අතර වසර 2016 වන විට එහි වාසය කරන ලද ජනගහනය 69.994 කි. ජනගහන වර්ධන වේගය 1.0 % ක් ලෙස හඳුනාගත් එම ප්‍රදේශය තුළ වසර 2030 වසර සඳහා ප්‍රක්ෂේපිත අපේක්ෂිත ජනගහනය 77.925 කි.

රත්නපුර නගරය නිරන්තරයෙන්ම ආපදාවන්ට ලක්වීම හේතුවෙන් ආපදා රහිත ප්‍රදේශයකට නගරය විතැන් කිරීම අරමුණු කරගනිමින් 1980 – 2015 අතර කාලසීමාව තුළ භෞතික සැලසුම් සකස් වී තිබීම දැකිය හැකි වේ. මේ හේතුවෙන් රත්නපුර නගරය 'ද්විත්ව නගර' සංකල්පය යටතේ සංවර්ධනය වී ඇත. (රූප සටහන් අංක 2.6) මෙම නගර ද්විත්වය කි.මී. 5 ක පමණ දුරකින් පිහිටා ඇති අතර එම නගර ද්විත්වය සම්බන්ධ කෙරෙන මාර්ගය දෙපස පවත්නා බෑවුම් සහිත පිහිටීම හේතුවෙන් අතරමැදි සංවර්ධනයක් (Corridor Development) සිදු නොවේ. කෙසේ නමුත් 2018 වසර වනවිට, රත්නපුර නගරය හෙවත් වෙළඳ නගරය මැණික් කර්මාන්තය ප්‍රමුඛ වෙනත් වෙළඳ කටයුතු ද පවතින වෙළඳ මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියා කරන අතර නව නගරය පරිපාලන මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියා කරන අයුරු දැකිය හැකි වේ.




***රූප සටහන් අංක 2.6 :*** *රත්නපුර නගරය ද්විත්ව නගරයක් ලෙස පිහිටීම*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

වසර 2030 සඳහා සකස් කරන ලද රත්නපුර නගර සංවර්ධන සැලැස්මේදී ඉහත තත්ත්වයන් සළකා බලන ලද අතර සැලසුම් ප්‍රදේශය තුළ සංවර්ධනයේ ගලායාම හඳුනා ගැනීම සඳහා සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණයක් සිදු කරන ලදී. (සිතියම් අංක 2.2) එහිදී ප්‍රවේශකත්වය, සම්පත්වය, දේපළ වෙළෙඳපොළ සහ භූමි භාවිතයේ වර්ගීකරණය වැනි සාධක සලකා බලන ලද අතර සැලසුම්ගත සහ නිරායාස සංවර්ධන ප්‍රවණතාව මෙහිදී සළකා බලන ලදී. එයට අදාළ සංවර්ධන ප්‍රවණතා දර්ශකය යටතේ ප්‍රවේශකත්ව මට්ටම (Level of Accessibility), සම්බන්ධතාවන්ට අනුකූලව නාගරික විභවතාව (Urban Potential as a result of connectivity), වර්තමාන ජන ඝනත්වය සහ ඉඩම් පරිහරණ රටාව ආදිය සැලකිල්ලට ගන්න ලද අතර මෙම අධ්‍යයනයන්ට අනුව රත්නපුර නගරයේ සංවර්ධනයේ ගලායාම කුරුවිට සහ පැල්මඩුල්ල දිසාවන්ට පවතින බව හඳුනා ගන්නා ලදී. එම ප්‍රවණතාවය තවදුරටත් අධ්‍යයනය කිරීමේදී නාගරික සංවර්ධන ප්‍රවණතාවය නගරයේ සිට පර්යන්ත ප්‍රදේශ දක්වා ප්‍රධාන මහා මාර්ග පදනම් කරගනිමින් වර්ධනය වනු දක්නට ලැබේ.




**සිතියම් අංක 2.2 :** *සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය*

02 පරිච්ඡේදය
මූලික සමීක්ෂණ අධ්‍යයනය

සැලසුම් සීමාව නිර්ණය කිරීම

## 2.3. සැලසුම් සීමාව නිර්ණය කිරීම

පහත සඳහන් කරුණු ත්‍රිත්වයට අනුකූලව සැලසුම් මායිම නිර්ණය කරන ලදී.

### අ) ක්‍රියාකාරීත්ව කලාපය

රත්නපුර නගරයේ නේවාසික ජනගහනයට සාපේක්ෂව අතිවිශාල සංසරණ ජනගහනයක් එදිනෙදා කටයුතු සඳහා පැමිණේ. සමීක්ෂණවලට අනුව දෛනිකව පැමිණෙන සංක්‍රමණිකයින් අතර මැණික් වෙළෙඳුන් සහ වෙනත් ව්‍යාපාරිකයන් මෙන්ම පරිපාලන සේවාවන් සහ වාණිජ අවශ්‍යතා සපුරා ගැනීමට පැමිණෙන පිරිස ද වේ. රත්නපුර නගරය පරිපාලන අගනගරය මෙන්ම සේවා අගනගරය ද වශයෙන් එකිනෙකට වෙනස් ධාරක ප්‍රදේශ ද්විත්වයකට පහසුකම් සලසන බැවින් රත්නපුර නගර සංවර්ධන සැලැස්මේදී මෙම ආවරණීත ප්‍රදේශ ද්විත්වය පිළිබඳවම සළකා බලන ලදී.




***රූප සටහන් අංක 2.7 :*** *රත්නපුර ක්‍රියාකාරී සීමාව*
***මූලාශ්‍රය :*** *මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ 2006/2010 සිසුන් කණ්ඩායම රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් 2009 වසරේදී සිදු කළ ප්‍රාදේශීය අධ්‍යයනය*

## ආ) භූගෝලීය ලක්ෂණ

ශ්‍රී ලංකාවේ නිරිත දිග ප්‍රදේශයට වන්නට රත්නපුර නගරය පිහිටා ඇත. රත්නපුර නගරය නිම්නයක පිහිටිය ද නගරයේ උන්නතාංශ පිහිටීම මුහුදු මට්ටමේ සිට මීටර් 18 සහ මීටර් 305 අතර වෙනස් වන අතර නගර මධ්‍යයේ දී එය මීටර් 50 නොඉක්මවයි. මෙම අධ්‍යන ප්‍රදේශය තුළ කඳු බෑවුම්, ගංගා නිම්න, පහත් බිම් බිම් හා තැනිතලා ලෙස එකිනෙකට වෙනස් වූ භූගෝලීය ලක්ෂණ හතරක් හඳුනා ගත හැකිය. ගොඩිගමුව, කැටන්දොළ, මුද්දුව, මුවගම, වෙරළුප සහ රත්නපුර නගරය, මහ නගර සභා සීමාව තුළ පිහිටි අවම උන්නතාංශ සහිත ප්‍රදේශ වන අතර මහවල සහ තිරිවානකැටිය ඉහල උන්නතාංශයකින් යුක්ත වේ. කොස්පැලවින්න උතුර, ගල්කඩුව සහ මුද්දුව  බටහිර යන ප්‍රදේශ අධික දළ බෑවුම් සහිත කඳුකර ප්‍රදේශයකි. එබැවින් රත්නපුර නගර සංවර්ධන සැලැස්මේදී මෙම භූගෝලීය ලක්ෂණ පිළිබඳව සළකා බලන ලදි.




***රූප සටහන් අංක 2.8 :*** *රත්නපුර නගරයේ භූගෝලීය පසුබිම*

***මූලාශ්‍රය :*** *මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ 2006/2010 සිසුන් කණ්ඩායම රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් 2009 වසරේදී සිදු කළ ප්‍රාදේශීය අධ්‍යයනය*

**02 පරිච්ඡේදය**
**මූලික සමීක්ෂණ අධ්‍යයනය**

සැලසුම් සීමාව නිර්ණය කිරීම

## ඈ) පරිපාලන කොට්ඨාශ

නාගරික සංවර්ධන අධිකාරිය මගින් ස්වකීය නාගරික බල ප්‍රදේශය ලෙස රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශ සීමාව 1979 වසරේ දී ප්‍රකාශයට පත්කර ඇත. එම ප්‍රදේශය ග්‍රාම නිලධාරී කොට්ඨාශ 18 කින් සහ වර්ග කිලෝ මිටර් 22.2 ක ප්‍රදේශයකින් සමන්විත වේ. මේ අනුව, වසර 2016 වන විට රත්නපුර මහා නගර සභා සීමාව තුළ වාසය කරන 49,083 ක නේවාසික ජනගහනය ද විවිධ අවශ්‍යතා සඳහා දෛනිකව රත්නපුර නගරයට පැමිණෙන 100,000 ක සංසරණ ජනගහනය ද රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇත. (වැඩිදුර තොරතුරු සඳහා ඇමුණුම 01 බලන්න)

| | සැලසුම් ප්‍රදේශය (අධ්‍යයනය කරන ලද ප්‍රදේශය) | බලපැවැත්වෙන ප්‍රදේශය (නාගරික සංවර්ධන අධිකාරිය බලාත්මක කල ප්‍රදේශය/ මහ නගර සභා බලප්‍රදේශය) |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | 02 | 01 |
| ග්‍රාමසේවක කොට්ඨාශ ගණන | 29 | 18 |
| භූමි ප්‍රමාණය (වර්ග කිලෝ මිටර්) | 70.43 | 22.2 |
| නේවාසික ජනගහනය | 69,994 | 49,083 |
| 2030 වසරේ දී අපේක්ෂිත ජනගහනය | 77,824 | 64,340 |
| ජනගහන වර්ධන අනුපාතය | 1.0 | 1.0 |
| සංසරණ ජනගහනය | 100,000 | 100,000 |
| 2030 වසරේ දී අපේක්ෂිත සංසරණ ජනගහනය | 150,000 | 150,000 |

**වගු අංක 2.1 :** *සැලසුම් ප්‍රදේශය පිළිබඳ තොරතුරු සාරාංශය*
**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය*

රත්නපුර නගර සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂිත ප්‍රතිලාභ උපරිම වන ආකාරයෙන් සැලසුම් සීමාව නිර්ණය කර ඇති අතර එම සැලසුම් සීමාවට සෘජු ප්‍රතිලාභ ලැබෙන ආකාරයටත් යාබදව ඇති ප්‍රාදේශීය සභා 3 සඳහා වක්‍ර ප්‍රතිලාභ ලැබෙන ආකාරයටත් රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සකස් කොට ඇත.




***රූප සටහන් අංක 2.3 :*** *නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රදේශය*

## 02 පරිච්ඡේදය මූලික සමීක්ෂණ අධ්‍යයනය

සැලසුම් සීමාව නිර්ණය කිරීම

රත්නපුර නගර සංවර්ධන සැලැස්ම බලපැවැත්වෙන ප්‍රදේශය (නාගරික සංවර්ධන අධිකාරිය බලාත්මක කල ප්‍රදේශය/ මහ නගර සභා බල ප්‍රදේශය) තුල බහුතර ජනවාර්ගික කණ්ඩායම ලෙස සිංහල – බෞද්ධ ජනතාව වාසය කරන අතර අනෙකුත් ආගම් අදහන ජාතීන් ද නගර සීමා බල ප්‍රදේශය තුළ වාසය කරනු දැකිය හැකි වේ. එමෙන්ම, වයස අවුරුදු 18–60 අතර ශ්‍රම බලකාය 70% ක් පමණ වන බැවින් අනාගතයේ දී නගරයට විශාල ශ්‍රමික පිරිසක් හිමි වේ. කෙසේ නමුත්, අ.පො.ස. සා/පෙළ විභාගයෙන් පසු පාසල් හැර යාමේ අනුපාතයෙහි ඉහළ යාමක් දැකිය හැකි බැවින් නගර සංවර්ධන සැලැස්මෙහි දී ඒ පිළිබඳව අවධානය යොමු කර ඇත.

80% සිංහල

12% ශ්‍රී ලංකා යෝනක

7% ශ්‍රී ලංකා දෙමළ

1% ඉන්දියානු දෙමළ

0% වෙනත්

***රූප සටහන් අංක 2.9 :** ජන සංයුතිය – 2017*
***මූලාශ්‍රය :** සම්පත් පැතිකඩ - රත්නපුර (2016)*




***රූප සටහන් අංක 2.10 :** වයස පදනම් කරගෙන ජනගහනය බෙදී යාම - 2017*
***මූලාශ්‍රය :** සම්පත් පැතිකඩ - රත්නපුර (2016)*

රත්නපුර නගර සීමාව තුළ සමස්ත සේවා නියුක්තිය ප්‍රධාන ආර්ථික අංශ 8 ක විසිරී පවතින අතර ඉන් 30% කට ආසන්න ප්‍රමාණයක් රාජ්‍ය අංශයේ සේවය කරනු ලබයි. සමස්ත රැකියා නියුක්තියෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් පෞද්ගලික අංශයේ සේවය කිරීමත් ඉතිරි ප්‍රතිශතය ස්වයං රැකියාවල හෝ මැණික් කර්මාන්තය වැනි ක්ෂේත්‍ර වලට සම්බන්ධව සේවය කිරීමත් මෙහිදී දැකිය හැකි වේ.

**29 %**
*රාජ්‍ය අංශය*

**18 %**
*ස්වයං රැකියා*

**16 %**
*ව්‍යාපාරික අංශය*

**18 %**
*සමාගම්*

**11 %**
*කෘෂිකාර්මික අංශය*

**8 %**
*වෙනත්*

***රූප සටහන් අංක 2.11 :*** *රැකියාව පදනම් කරගෙන ජනගහනය බෙදී යාම - 2017*
***මූලාශ්‍රය :*** *සම්පත් පැතිකඩ - රත්නපුර (2016)*

නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගත් පරිදි ප්‍රදේශයේ භූමි පරිභෝගයෙන් 40% ක් නේවාසික භාවිතයන් වන අතර කෘෂිකාර්මික ඉඩම් ආශ්‍රිතව පොකුරු ජනාවාස සහ ප්‍රධාන මාර්ග දෙපස රේඛීය සංවර්ධනයක අකාරයට නේවාසික භාවිතය වර්ධනය වී ඇත. එමෙන්ම, නව නගරය ප්‍රදේශයේ ඉඩම් නේවාසික භාවිතයන් සඳහා පරිවර්තනය වීමේ ප්‍රවණතාවක් ද වර්තමානයේ දී දක්නට ලැබේ. භූමි පරිභෝගයෙන් 14% ක් පමණ වතුවගා වලින් ද 13% ක් පමණ වනාන්තර සහ ළඳු කැලෑ වලින් ද 11% ක් පමණ කුඹුරු ඉඩම් වලින් ද සමන්විත වන අතර මෙම කුඹුරු ඉඩම් බොහෝ විට මැණික් පතල් කැණීම් සඳහා භාවිත වේ. (වැඩිදුර තොරතුරු සඳහා ඇමුණුම 02 බලන්න)

රත්නපුර නගර සීමාව තුළ පවත්නා ආර්ථික කටයුතු පිළිබඳව සළකා බලන විට ඔරලෝසු කනුව අවට සහ අඹගහයට මැණික් කොටුව ද දෙමුවාවත වීදිය ද පදනම් කරගනිමින් මැණික් වෙළදාම ස්ථාපිතව පවතිනු දැකිය හැකි වේ. පුළුඟුපිටිය සිට මුද්දුව පාලම අතර ප්‍රදේශය තුළ තොග සහ සිල්ලර වෙළඳාම ද කුඩුගල්වත්ත ප්‍රදේශය තුළ හාර්ඩ්වෙයාර් වැනි දෑ ද පොකුරු වී ඇති අතර පල්ලිය පාර තුළ පදික වෙළඳාම ස්ථාපිතව තිබෙන අයුරු වැඩිදුර අධ්‍යයනයන්හි දී දැකගත හැකි වේ. සෞඛ්‍ය සේවා හා ඒ ආශ්‍රිත නොයෙකුත් අවශ්‍යතා පදනම් කරගනිමින් රෝහල් මංසන්ධිය ගොඩනැගී ඇති අතර උසාවි කටයුතු සහ වෙනත් පරිපාලන අවශ්‍යතා වෙනුවෙන් පැමිණෙන ප්‍රජාවගේ ආර්ථික අවශ්‍යතා සැපිරීම පිණිස උසාවි මංසන්ධිය ගොඩනැගී ඇත. එමෙන්ම, ප්‍රජා අවශ්‍යතා මත ගොඩනැගෙමින් පවත්නා මංසන්ධි ලෙස වෙරළුප සහ බටුගෙදර හඳුනාගත හැකි වේ.

ප්‍රාදේශීය ආර්ථිකය නංවාලීමට නව නගරය සහ පැරණි නගරය යන දෙකම දායක වුවද එම නගර ද්විත්වය සතු වපසරිය වෙනස් වේ. පැරණි නගරයේ සේවා සැපයීම නාගරික ජනතාව සහ නගර සීමාව අවට වෙසෙන ග්‍රාමීය ජනතාව අරමුණු කරගනිමින් සිදුවන අතර පළාත් පරිපාලන කේන්ද්‍රය ලෙස නව නගරයේ සේවා සැපයීම සබරගමුව පළාතම ආවරණය කරනු ලබයි. එබැවින්, රත්නපුර නගරයට අදාලව සැලසුම් සකස් කිරීමේදී මෙම සීමාවන් වෙන් වෙන්ව හඳුනා ගැනීමත් එම සේවා වපසරියට අනුකූලව රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සැකසීමත් අත්‍යාවශ්‍ය වේ.

පරිච්ඡේදය 03



# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

අධ්‍යයන ප්‍රදේශය තුළ හඳුනාගත් ගැටළු විසඳීම සහ විභවතාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් රත්නපුර නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. එහිදී සංවර්ධන ප්‍රවණතාවයන් ඇති ප්‍රදේශ සහ සංවර්ධනයට අවාසිදායක බලපෑම් ඇති ප්‍රදේශ හඳුනාගෙන ඇත. එබැවින්, එම ගැටලු සඳහා උපායමාර්ගික විසඳුම් සොයා ගැනීම සහ ප්‍රාදේශීය සැලසුම්කරණය මගින් හඳුනාගත් ප්‍රදේශයන් කෙරෙහි අනාගත සංවර්ධනය යොමු කරවීම මෙහි අරමුණයි. අධ්‍යයන ප්‍රදේශය තුළ හඳුනාගත් ගැටළු විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර ඒවායේ නිවැරදි බව පාර්ශවකරුවන්ගෙන් තහවුරු කරගෙන ඇත. අනතුරුව, මෙම ගැටළු වල ස්වභාවය, විශාලත්වය සහ වැදගත්කම අනුව ප්‍රමුඛතා ලබා දී ඇත. ඒ අනුව රත්නපුර නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය  පහත සඳහන් පරිදි හඳුනා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ අනෙකුත් අගනගර මෙන්ම ජාතික වැදගත්කමක් සහිත පරිසරයක් තුල රත්නපුර නගරය ද පිහිටා ඇත. දිවයිනේ මැණික් කර්මාන්තයේ කේන්ද්‍රස්ථානය ලෙස අනෙක් නගර අතර විශේෂ ස්ථානයක් රත්නපුර නගරයට හිමි වී ඇති අතර වර්තමානයේ දී රත්නපුර මහ නගර සභා ප්‍රදේශය තුළ නාගරිකයන් වාසය කරන නිර්මිත පරිසරයට අමතරව ස්වභාවික වටිනාකමින් යුත් පරිසරයක් ද දැකිය හැකි වීම මෙම පළාත් අග නගරයේ විශේෂත්වයකි. මධ්‍යම කඳුකරයට පිවිසෙන දොරටුවක් වන රත්නපුර නගරය ස්වභාවික වනාන්තර, නාගරික වනාන්තර, ඉහල ජෛව විවිධත්වයකින් යුතු කඳුකර ප්‍රදේශ හා ගංගා, ඇළදොළ සහිත සංකීර්ණ ජලවහන රටාවකින් ද සමන්විත වනු දැකිය හැකි වේ.

එසේ වුවද, මිනිසා විසින් නිර්මාණය කරගනු ලබන ව්‍යසනයන්ට අමතරව ස්වභාවිකව සිදුවන ව්‍යසනයන්ට ද නිරන්තරයෙන් හසු වීමට රත්නපුර නගරයට සිදුව ඇත. නාගරික ප්‍රදේශය තුළ සිදුවන ගංවතුර වැනි ස්වභාවික විපත් සහ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන වනාන්තර විනාශ කිරීම, නීති විරෝධී කැණීම් කටයුතු, අනවසර ඉදිකිරීම් වැනි ගැටළු මේ යටතේ හඳුනාගත හැකිය. මෙම තත්ත්වය සළකා බලන විට, ස්වාභාවික පරිසරය හා මානව අවශ්‍යතා අතර නිරතුරුවම පවතින ගැටුම්කාරී බවක් පැහැදිලි වන අතර රත්නපුර නගරයට අනන්‍ය වූ ගැටළු සහ විභවතා පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේශණයක් මෙම පරිච්ඡේදය මගින් සිදු කර ඇත.

# 3.1. සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා ගැටලු

- *ගංවතුර*

ඉතිහාසයේ සිටම රත්නපුර නගරයට ගංවතුර තත්වයන් මට්ටම් තුනකින් බලපා ඇත. එනම් දැඩි අවදානම්, මධ්‍ය අවදානම් සහ සුළු අවදානම් සහිත ජල ගැලීම් වශයෙනි. (වගු අංක 3.1) මෝසම් වර්ෂාපතනය හේතුවෙන් මැයි – ජූනි සහ ඔක්තෝබර් මාසයන්හි දී රත්නපුර නගරය ගංවතුරට ගොදුරු වීමේ ප්‍රවණතාවයක් පවතින අතර (රූප සටහන 3.1) සෑම වසර 10 කට ආසන්න කාලසීමාවකදී ම ඇතිවන විශාල ගංවතුර තත්වය හේතුවෙන් දේපල හා ජීවිත හානි ද සිදු වේ. ගංවතුර කාලසීමාවකදී සාමාන්‍යයෙන් රත්නපුර නගර මධ්‍යයෙන් 80% ක පමණ ප්‍රමාණයක් යටවන අතර මෙම තත්ත්වය දින 2–5 අතර කාලයක් පවතී. (වැඩිදුර තොරතුරු සඳහා ඇමුණුම් 03, 04, 05 බලන්න ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සපයන ලද සංඛ්‍යාලේඛනයන්ට අනුව, 2003 ට පසු ඇති වූ විශාල ගංවතුරට 2017 දී රත්නපුර නගරය මුහුණ දුන් අතර ඒ හේතුවෙන් පවුල් 206 ක් හා මිනිසුන් 1203 ක් පීඩාවට පත්ව තිබිණි. මෙහි පවතින විශේෂත්වය වන්නේ රත්නපුර නගරයට බලපාන ගංවතුර තත්ත්වය ප්‍රාදේශීය, කලාපීය මෙන්ම ජාතික මට්ටමින් ද ආර්ථික හා සමාජයීය බලපෑමක් සිදු කිරීමයි.

| ගංවතුර වර්ගය | නැවත පැමිණෙන කාලය | ගංවතුර මට්ටම | වාර්තාගත වර්ෂයන් |
|---|---|---|---|
| දැඩි අවදානම් ගංවතුර | වසර 50 කට වරක් | මුහුදු මට්ටමේ සිට අඩි 80 ට වඩා උස | 1913, 1947, 1989 , 2003 , 2017 |
| මධ්‍ය අවදානම් ගංවතුර | වසර 10 කට වරක් | අඩි 70 (MSL) – අඩි 80 (MSL) | 1857, 1872, 1893, 1924, 1957, 1969, 1978, 1982,1993, 2017 |
| සුළු අවදානම් ගංවතුර | වසරකට වරක් | අඩි 66 (MSL) – අඩි 70 (MSL) | 1939, 1940, 1966, 1967 , 2006 , 2017 |

**වගු අංක 3.1 :** *රත්නපුරයේ ගංවතුර ආපදා ඉතිහාසය (2018 වසර වනවිට)*
**මූලාශ්‍රය :** *වාරිමාර්ග දෙපාර්තමේන්තුව*




**රූප සටහන් අංක 3.1 :** *සාමාන්‍ය මාසික වර්ෂාපතනය - 2016*
**මූලාශ්‍රය :** *වාරිමාර්ග දෙපාර්තමේන්තුව*

ප්‍රාදේශීය වශයෙන් සිදුවන සෘජු හා වක්‍ර බලපෑම් සළකා බලන විට ප්‍රජාව සතු දේපළ ගංවතුරට හසුවීමෙන් කෙටිකාලීනව සහ දිගුකාලීනව ඇතිවන ආර්ථිකමය හානිය සහ මානසික ආතතිය ඉන් ප්‍රධාන වේ. මීට අමතරව, රත්නපුර නගරය මෙම කලාපයට අයත් ප්‍රධානතම සේවා නගරයක් වන බැවින් එය කේන්ද්‍රස්ථානය කරගත් තොග හා සිල්ලර වෙළඳාමක් පවතින අතර සංඛ්‍යාලේඛනයන්ට අනුව 700 කට වැඩි ලියාපදිංචි ව්‍යාපාර කටයුතු ප්‍රමාණයක් එයට අයත් වේ. (රූපසටහන 3.3) වාර්ෂික ගංවතුර තත්වය මෙම වෙළඳ ව්‍යාපාර වලින් 80% කට පමණ බලපාන අතර මෙම තොග හා සිල්ලර වෙළඳාම සති කිහිපයකයට බිඳ වැටීම නගරයේ මෙන්ම ප්‍රාදේශීයවද වාසය කරන ජනතාවගේ අහාර හා වෙනත් අවශ්‍යතා සැපයුම් ජාලය බිඳ වැටීමට හේතු වේ. එය මෙම සේවා ජාලය හරහා යැපෙන 70,000 පමණ වන ජනගහනයට බලපෑම් ඇති කරයි. එමෙන්ම, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මහාමාර්ග ජාලයටද රත්නපුරයේ ගංවතුර තත්වය බලපෑම් කරන අතර ගොඩනැගිලි හා වෙනත් නාගරික ස්ථාන පිරිසිදු කිරීමට හා පිළිසකර කිරීමට ද අදාළ ආයතන සහ පළාත් පාලන ආයතන වලට සැලකිය යුතු වාර්ෂික පිරිවැයක් දැරීමට හා අමතර මිනිස් ශ්‍රමයක් යෙදවීමට සිදු වේ.




***රූප සටහන් අංක 3.2 :*** *රත්නපුර වෙළඳ කටයුතු වල පසුබිම - 2016*
***මූලාශ්‍රය :*** *මහ නගර සභාව, රත්නපුර*

කලාපීය වශයෙන් සළකා බලන විට, කලාපීය ගමනාගමන ජාලයටත් පළාතේ පරිපාලන කටයුතු සඳහාත් දැඩි බලපෑමක් කිරීමට රත්නපුර නගරයට ඇතිවන ගංවතුර හේතු වේ. මෙම නගරය ශ්‍රී ලංකාවේ දකුණු දිග කොටසට අදාල මාර්ග ජාලයේ කේන්ද්‍රස්ථානයක පැවතීම මීට හේතුවයි. (රූපසටහන 2.4) කොළඹ සහ මඩකලපුව අතර දිවෙන A 004 මාර්ගයේ පිහිටා තිබීමත් දිස්ත්‍රික්ක නමයකට මැදිව තිබීමත් මෙම නගරය මග හැර යා හැකි විකල්ප මාර්ග ඒ ආසන්නයෙන් නොතිබීමත් හේතුවෙන් රත්නපුර නගරය ගංවතුරට ලක් වීම කලාපීය මාර්ග ජාලය බිඳ වැටීමට හේතු වේ. මීට අමතරව, රත්නපුර නගරය සබරගමු පළාතේ සහ රත්නපුර දිස්ත්‍රික්කයේ පරිපාලන අගනුවර වේ. එබැවින්, පරිපාලන කටයුතු සඳහා රත්නපුර වෙළඳ නගරයට සහ නව නගරයට පැමිණෙන පිරිස ඉතා ඉහළ අගයක් ගනී. සේවා ලබාදීම සඳහා පැමිණෙන පිරිස ද සේවා ලබාගැනීමට පැමිණෙන පිරිස ද මේ අතර වේ. අධ්‍යාපන, සෞඛ්‍ය, අධිකරණ කටයුතු, ව්‍යාපාරික අවශ්‍යතා හා වෙනත් කටයුතු සඳහා පැමිණෙන පිරිස ද අතුළුව දෛනිකව නගරයට පැමිණෙන ජනගහනය 100,000 කට අධික වන අතර ඒ හේතුවෙන් සතියකට වැඩි හෝ අඩු කාලයක් මෙම කටයුතු සඳහා බාධා වීම කලාපීය වශයෙන් අවාසිදායක තත්ත්වයකි.

ජාතික මට්ටමින් සළකා බලන විට රත්නපුර නගරය මුහුණ දෙනු ලබන ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් කෙටිකාලීනව සහ දිගුකාලීනව සහන සැපයීමට රජයට සිදු වේ. ආපදාවට පත් ජනතාව නැවත පදිංචි කිරීම, අපරවයුහ පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම, සේවා සහ පහසුකම් නැවත ලබාදීම, දූෂිත පරිසරය හේතුවෙන් සිදුවන ද්විතීයික බලපෑම අවම කිරීම, රෝග පැතිර යාම අවම කිරීම හා වැළැක්වීම ආදී කටයුතු මේ යටතේ සිදු කළ යුතු වේ. ඇතැම් අවස්ථාවන්හිදී ජාතික ආපදා තත්ත්වයක් රත්නපුර නගරය මූලික කරගනිමින් ප්‍රකාශයට පත් කිරීමට සිදු වීම ද සියලු පරිපාලන කටයුතු මෙම ආපදා තත්ත්ව පිළිබඳව සැළකිළිමත් වෙමින් සිදු කළ යුතු වීම ද දැකිය හැකි වේ. එබැවින්, මහජනතාවගේ සහ ආයතනයන්හි දේපල යථාතත්වයට පත්කිරීමට මෙන්ම ජීවන තත්ත්වය යළි නගා සිටුවීම වෙනුවෙන් රජයේ මුල්‍ය සහ අනෙකුත් සේවා ජාලයට, වාර්ෂිකව අතිරේක ප්‍රතිපාදන වෙන්කිරීමට සිදු වීම ජාතික මට්ටමේ මුල්‍ය ස්ථාවරත්වය බලපෑමක් ඇතිකරයි.

| දිස්ත්‍රික්කය | බලපෑමට ලක් වූ | | බලපෑම | | | අවතැන්වූවන් |
|---|---|---|---|---|---|---|
| | පවුල් | මිනිසුන් | මරණ | අතුරුදහන් | තුවාල ලැබූ | |
| කෑගල්ල | 1,437 | 5,250 | 2 | 2 | 6 | 2,261 |
| රත්නපුර | 4,815 | 18,031 | 47 | - | 2 | 4,844 |
| කළුතර | 8,606 | 37,492 | 37 | 72 | 22 | 4,829 |
| ගම්පහ | 4,41 | 19,535 | 2 | - | 1 | 7127 |
| මාතර | * | 6,003 | 11 | 17 | - | * |
| හම්බන්තොට | 1,860 | 4,405 | 1 | - | - | - |
| ගාල්ල | 32,215 | 128,047 | - | - | 2 | 1,218 |
| මාතලේ | 7 | 31 | - | - | 1 | - |
| කොළඹ | 2,672 | 10,849 | - | - | - | 772 |
| නුවර | 9 | 40 | - | - | - | - |
| මඩකලපුව | 4 | 20 | - | - | - | - |
| ත්‍රිකුණාමලය | 206 | 696 | - | - | | |
| වව්නියාව | 31 | 102 | - | - | | |
| මුලතිව් | 26 | 70 | - | - | | |
| එකතුව | 56,529 | 230,571 | 100 | 91 | 34 | 27,054 |

*වගු අංක 3.2 : වසරේ ඇති වූ ගංවතුර තත්ත්වයේ සංෂිප්තය*
*මූලාශ්‍රය : ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය*



මේ අනුව, රත්නපුර නගරය තුළ ඇති වන ගංවතුර තත්ත්වය තීරණාත්මක ගැටලුවක් වන අතර සංවර්ධන සැලසුම මගින් ඒ සඳහා උපායමාර්ගික විසඳුම් සකස් කළ යුතු වේ.

- ***නගරයේ අනන්‍යතාවය ගිලිහී යාම***

ලෝකයේ බොහෝ නගර සඳහා එකිනෙකට වෙනස් අනන්‍යතාවයන් ඇත. ඈත අතීතයේ සිටම රත්නපුර නගරය ප්‍රසිද්ධව පවතින්නේ "මැණික් නගරය" ලෙසිනි. මෙම නගරයෙන් හමු වූ සහ හුවමාරු වූ මැණික් වල පැවති ගුණාත්මකභාවය සහ ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පැවති ආකර්ෂණීය බව ප්ලිනි, හියුන්සන් සහ ඉබාන් බතූතා වැනි දේශ ගවේශකයන්ගේ ඓතිහාසික වාර්තා වලින් ද පැහැදිලි වේ. මැණික් බහුලව පැවතීම හේතුවෙන් ප්‍රථමයෙන් 'රුවන්පුරය' ලෙස ද අනතුරුව 'රත්නපුර' ලෙස ද මෙම නගරය හැඳින්වූ බව විශ්වාස කෙරේ. (මූලාශ්‍රය : සබරගමුව වංශ කතාව)

මීට අමතරව, රත්නපුර නගරය මැණික් වෙළඳාම සහ පතල් කර්මාන්තය කටයුතු යන දෙවර්ගය සඳහාම ප්‍රසිද්ධියක් උසුලයි. කැණීම් කටයුතුවල යෙදෙන ජනගහනයෙන් 30% ක් රත්නපුරයේ වාසය කරන පුද්ගලයන් වන අතර 70% ක් වෙනත් ප්‍රදේශවලින් පැමිණි පුද්ගලයන් වේ. මැණික් වෙළඳුන්ගෙන් 25% ක් රත්නපුර ව්‍යාපාරිකයන් වන අතර රත්නපුර මැණික් ව්‍යාපාරිකයන්ගේ ස්වර්ණමය දශකය වූ 70 දශකය තුළදී මෙම අගය ඉතා ඉහළ වූ බව සංඛ්‍යාලේඛන සහ ප්‍රජාවගෙන් ලබාගත් තොරතුරු වලින් පැහැදිලි වේ. නමුත් වර්තමානය වන විට මෙම ව්‍යාපාරික කටයුතු බේරුවල මැණික් වෙළඳපල විසින් උකහාගෙන ඇති බව පෙනී යයි. එමෙන්ම, තායිලන්ත මැණික් වෙළඳපල විසින් ද රත්නපුර නගරයේ වෙළඳ අධිකාරය අත්පත් කරගනිමින් පවතින බව දැකිය හැකි වේ.

**03 පරිච්ඡේදය**
**සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය**

සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා ගැටලු




***රූප සටහන් අංක 3.3 :*** *මැණික් ව්‍යාපාරය ආශ්‍රිත තත්ත්වය*
***මූලාශ්‍රය :*** *මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ 2006/2010 සිසුන් කණ්ඩායම*

මැණික් ව්‍යාපාරිකයන්ගෙන් බහුතරය සුළු පරිමාණ වෙළෙන්දන් වන අතර එම පිරිස අතර හුවමාරු වනු ලබන්නේ අඩු වටිනාකම් සහිත මැණික් වේ. මෙම ජාලය තුළ මැණික හුවමාරු වන අකාරය සහ එකිනෙකාට හිමිවන වටිනාකමේ ප්‍රමාණය පිළිබඳව දළ අදහසක් රූප සටහන 3.4 ආශ්‍රයෙන් ලබා ගත හැකි ය. කෙසේ නමුත්, මෙම පතල් කර්මාන්ත ජාලය තුළ පළමු ගැණුම්කරුගෙන් දෙවන ගැණුම්කරුට හුවමාරු වනවිට මැණික් වටිනාකම ආසන්න වශයෙන් දෙගුණයක් වීම සිදු වුව ද දේශීය ජනතාවට මැණික් වල ඇති සැබෑ වටිනාකම ඒ ආකාරයෙන්ම හිමිකර ගත නොහැකි වේ. එහෙයින්, නාගරිකයින් ඍජු ව මැණික් කර්මාන්තය හා සම්බන්ධ වීම අවම මට්ටමක පවතින අතර බහුතරයක් දෙනා වක්‍රාකාරයෙන් මෙම කර්මාන්තය හා සම්බන්ධ වී සිටිනු දක්නට ලැබේ. එමෙන්ම, මැණික් ව්‍යාපාරය තුළින් හිමිවන ආදායම නැවත ආයෝජනයක් ලෙස රත්නපුර නගරය තුළ සිදු නොවීම ද අවාසි සහගත තත්ත්වයක් වේ. එබැවින් මෙම ආදායම වෙනත් නගර හා රටවල ආයෝජනය වීම මත දේශීය මුදල් කාන්දු වීමේ තත්ත්වයක් දැකිය හැකි වීම ද රත්නපුර නගරයටම ආවේණික ගැටලුවකි.

ඉහත තත්වය වෙනස් කිරීම සහ යළිත් පෙර පැවති මැණික් අනන්‍යතාව නගරයට ලබා ගැනීම අභියෝගයක් වන නමුත් උපායමාර්ගික ප්‍රවේශයක් තුළ එය ළඟා කරගත හැකි වනු ඇතැයි අපේක්ෂිත ය.






***ඉතිරි මුදල වන රු. 500,000 ද්විත්ව හවුල්කාරිත්වයට හෝ බාසුන්නැහේ නමින් හැඳින්වෙන නම් ද්විත්ව හවුල්කාරිත්වයේ නායකයාට ලැබෙයි. මෙහිදී, සෑම ශ්‍රමිකයෙක්ටම තම සතිපතා වැටුප ගෙවීමට එක් භාරකරුවෙකු සිටී (එක් ශ්‍රමිකයෙක් වෙනුවෙන් රු. 1000). එබැවින් සෑම ශ්‍රමිකයෙක්ටම ඔහුගේ භාරකරු සමග ද්විත්ව හවුල්කාරිත්වයක් ඇත. එම අයට ඔවුන්ගේ කොටස භාගයක් (1/2) ලෙස ලැබෙනු ඇත.***

***රූප සටහන් අංක 3.4 :*** *මැණික් කර්මාන්තයේදී මුදල් ගලායාම පිළිබඳ උදාහරණය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

- ***වන ආවරණය අවම වීම***

ශ්‍රී ලංකාවේ පාරිසරික තිරසරභාවය පවත්වාගෙනයාම උදෙසා සංරක්ෂණය කළයුතු මධ්‍යම අධිසංවේදී කලාපයට රත්නපුර ප්‍රදේශය ද අයත් වන බැවින් ප්‍රාදේශීය මෙන්ම ජාතික අවශ්‍යතාවය ද සළකා රත්නපුර නගර සීමාව තුළ පවත්නා වනාන්තර සංරක්ෂණය කරගැනීම වැදගත් වේ.

කළු ගං මිටියාවත තුළ බිහි වී ඇති රත්නපුර නගරය සතුව පැවති වන ගහණය කාලයත් සමග ඉහළ ගිය මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් වර්තමානය වන විට අඩු වී ඇත. එමෙන්ම, ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ක්‍රියාකාරකම්ද, සංවිධානාත්මකව සිදුවන වාණිජ අරමුණු මත සිදුකරන ගස් කැපීම්ද හේතුවෙන් වර්ෂ 2017 වන විට සැලසුම් ප්‍රදේශයේ වනාන්තර ආවරණය 10% ක් පමණ අඩු වී ඇතැයි ඒ පිළිබඳව සිදුකෙරුණු අධ්‍යයනයන් පෙන්වා දී ඇත. මහනුවර උඩවත්ත කැලය, කෑගල්ල කුරුළු කැලය සහ ගාල්ල රූමස්සල යනාදිය හැරුණු විට නාගරික වනෝද්‍යානයක් පවතින එකම නගරය රත්නපුර ය වුවද අනවසර අල්ලා ගැනීම් හේතුවෙන් මෙම පොම්පකැලේ නාගරික වනාන්තරය (අරුණෝද උද්‍යානය) සතු වන ආවරණය මේ වනවිට 30% කින් පමණ අහිමි වී ඇත. (රූපසටහන 3.5)

එමෙන්ම, වන ආවරණය අඩුවීම නාගරික උෂ්ණත්වය ඉහළ යාමට ද බලපා ඇත. වියලි කාලවලදී (දෙසැම්බර් – මාර්තු ) රත්නපුර නගරයේ උෂ්ණත්වය දිවාකාලයේදී 31 ° C පමණ දක්වා ඉහළ යන අතර ආර්ද්‍රතාවයේ බලපෑම මත ශරීරයට දැනෙන උෂ්ණත්වය සෙල්සියස් අංශක 35 ° ක් පමණ වේ. නිම්නයක පිහිටීම හේතුවෙන් ක්‍රමානුකූල සුළං ප්‍රවාහයක් නොමැතිවීම ද මෙම අධික උණුසුමට හේතු වේ.

එබැවින්, උණුසුම් දිනවල දී දිවාකාලයේ ඇවිදීම සහ වැඩ කිරීම නගර මධ්‍යයට පැමිණෙන මිනිසුන්ට අපහසු වී තිබේ. මෙවැනි පාරිසරික ගැටලු විසඳා ගැනීම උදෙසා පර්යේෂණාත්මකව සිදු කරන ලද සැලසුම්කරණ මැදිහත් වීමක් අත්‍යවශ්‍ය වේ.




***රූප සටහන් අංක 3.5 :** පොම්ප කැළේ නාගරික වනාන්තරයේ සිදුවන අනවසර ඉදිකිරීම් - 2017*
***මූලාශ්‍රය :** ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

- ***රථවාහන තදබදය***

රත්නපුරය නගරය දිවයිනේ  නැගෙනහිර සහ බටහිර සම්බන්ධ වන කේන්ද්‍රස්ථානය වේ.  එසේම මෙම නගරය හරහා දිවෙන මාර්ගය කොළඹ, පානදුර (බටහිර කලාපය)  මෙන්ම  හම්බන්තොට (දකුණු පළාත) සහ මඩකලපුව (නැගෙනහිර පළාත)ද  සම්බන්ධ කරයි. මේ හේතුවෙන් කලාපිය ගමනාගමන ජාලය තුල සුමට ගමනාගමන පහසුකම් සහිත නගරයක් බවට රත්නපුර නගරය පත්විය යුතු වුව ද භූගෝලීය සාධක හා අවකාශීය සැකැස්ම හේතුවෙන් එය සිදු නොවේ.

රත්නපුර නගරයෙහි පවත්නා එක් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ එහි පිවිසුම් දොරටු තුනම පාලම් වීම යි. ඊට අමතරව ස්ථාන ද්විත්වයකදී ම එම ප්‍රධාන පිවිසුම් වලට ඉතා ආසන්නයෙන් ප්‍රධාන මාර්ග නගරයට සම්බන්ධ වී ඇත. (කටුගස් ඇළ පාලම අසළින් පානදුර මාර්ගය සහ වරකාතොට පාලම අසළින් මල්වල මාර්ගය) මෙම ප්‍රධාන මාර්ගයන්ගෙන් සහ A 004 මාර්ගය ඔස්සේ දිනකට විශාල වාහන ප්‍රමාණයක් නගරයට පැමිණෙන අතර එම තත්ත්වය පවතින උච්චතම අවස්ථාව වනවිට නගරයට වාහන 2500 ක පමණ ප්‍රමාණයක් ඇතුළු වේ. (ඇමුණුම් 6 – 12) එමෙන්ම, මංතීරු දෙකකට පවත්නා A 004 මාර්ගය සහ අනෙකුත් මාර්ග පළල් කිරීම කඳු සහ බෑවුම් හේතුවෙන් මෙන්ම නායයාම් හේතුවෙන් ද පහසු නොවේ.




***රූප සටහන් අංක 3.6 :*** *රත්නපුර නගරයේ භූගෝලීය සැකැස්ම - පාලම්*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

## 03 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා ගැටලු




***රූප සටහන් අංක 3.7 :** රත්නපුර නගරයේ භූගෝලීය සැකැස්ම - මාර්ග*
***මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය*

අවකාශීය ව්‍යුහය සළකා බැලීමේදී ප්‍රධාන පාසැල් 5ක් නගර මධ්‍යය තුළ A 004 මාර්ගය දෙපස පිහිටා ඇත. එබැවින්, පාසැල් ළමුන් 12,000 ක් පමණ සහ අමතර පන්ති සඳහා තවත් සිසුන් 10000 ක් පමණ දෛනිකව රත්නපුර නගරයට පැමිණෙන අතර ඒ වෙනුවෙන් පැමිණෙන වාහන හේතුවෙන් A 004 මාර්ගය අවහිර වනු දැකිය හැකි වේ. මීට අමතරව, නගරයේ පවත්නා වෙළඳ, බැංකු සහ වෙනත් කටයුතු අසංවිධිතව විසිරී පැවතීම හේතුවෙන් නාගරිකයනට යම් අවශ්‍යතාවක් ඉටුකර ගැනීමට අවශ්‍ය වූ විට නගරයේ විවිධ දිශාවන්ට යාමට සිදු වන අතර එක් දිශාවකට පමණක් ගමන් කරන මාර්ග ජාලයක් (one way system) නගර මධ්‍යයේ ඇති හෙයින් අනවශ්‍ය ගමන් වාර ප්‍රමාණයක් බොහෝවිට එක් අයෙක් විසින් සිදු කරනු ලැබීම ද මෙම තදබදයට හේතු වේ.

එසේම, නගරයට පැමිණීමේ අවශ්‍යතාවක් නොමැති, එහෙත් නගරය පසු කර යා යුතු රථවාහන බොහොමයක් දෛනිකව රත්නපුර නගරයට පැමිණෙනු දැකිය හැකිය. නගරය මගහැරීමට විකල්ප මාර්ග නොමැතිවීමත් නගර මධ්‍යය තුළ පවත්නා අතිරේක මාර්ග පිළිබඳව නිසි දැනුවත් කිරීමක් නොමැති වීමත් එම මාර්ග සංවර්ධනය වී නොතිබීමත් මේ සඳහා හේතු සාධක වේ. මේ හේතුවෙන් නගරය පසු කිරීමට දිවා කාලයේදී විනාඩි 15 ක් සහ වැසි දිනවලදී විනාඩි 20 කට ආසන්න කාලයක් ගත වන අතර එහි උච්චතම අවස්ථාවන්හි දී මෙම කාලය විනාඩි 30 ක් පමණ වේ.






***රූප සටහන් අංක 3.8 :*** *රත්නපුර නගරයේ අවකාශීය සැකැස්ම - පාසැල් වල පිහිටීම*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

රත්නපුර නගරයේ ප්‍රවාහන සැලැස්ම ජාතික සහ ප්‍රාදේශීය ප්‍රවාහන ජාලයට සෘජුවම බලපාන හෙයින් සුමට ගමනාගමන සැලැස්මක් ඒ වෙනුවෙන් සකස් කර දීම අත්‍යාවශ්‍ය වේ. එසේ නොවුණහොත් මෙම ප්‍රමාදය සමස්ථ මාර්ග පද්ධතිය තුළම ගැටලු රැසක් නිර්මාණය කිරීමට හේතු වේ. එබැවින්, භූගෝලීය පසුබිම සහ අවකාශීය පිහිටීම වෙනස් කිරීමට උපාය මාර්ගික මැදිහත්වීමක් රත්නපුර නගරයට අවශ්‍ය වේ.

- ***සැලසුම් ප්‍රදේශයේ ඇති දෝනා (තිරස් පතල්) හේතුවෙන් විශාල පරිමාණ සංවර්ධන කටයුතු සඳහා භූමිය ස්ථාවර නොවීම.***

රත්නපුර නගර සැලැස්මට අයත් සම්පූර්ණ භූමි ප්‍රමාණයම මැණික් නිධි මත පිහිටා ඇතැයි යන විශ්වාසයෙන් බොහෝ ස්ථානයන්හි මැණික් කැණීම් කටයුතු සඳහා මිනිසුන් පෙළඹී ඇත. මැණික් කැණීම් සඳහා වාර්ෂිකව 6000 කට අධික බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් කරන අතර නීතිවිරෝධීව සිදු කරනු ලබන කැණීම් ප්‍රමාණය එම අගයෙන් තෙගුණයකට පමණ ආසන්න බව විශ්වාස කෙරේ. මෙම කැණීම් කටයුතු “පතල්” හෙවත් සිරස් කැණීම් ආකාරයට සිදු වුවත් යම්තාක් දුරකට ළඟා වීමෙන් අනතුරුව “දෝනා” හෙවත් තිරස් කැණීම් සිදු වේ. කැණීම් ක්‍රියාවලියෙන් අනතුරුව පතල වසා දැමීම සිදු වුවත් දෝනා වසා දැමීමක් සිදු නොවන අතර එය ප්‍රායෝගිකව පහසු කටයුත්තක් ද නොවේ. එමෙන්ම, වසා නොදැමූ පතල් ද මේ අතර පවතින අතර සැලසුම් ප්‍රදේශය තුළ දෝනා කොපමණ ප්‍රමාණයක් පවතිනවාද යන්න පිළිබඳව දළ අදහසක් ලබා ගැනීම ද පවත්නා තත්ත්වය තුළ ඉතා දුෂ්කර ය.

ඉහත සඳහන් තත්ත්වය හේතුවෙන් භූමියේ ස්ථාවරත්වය පිළිබඳව ගැටලුවක් මතු වන හෙයින් විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති නගර සැලසුම් කලාපය තුළ සිදු කිරීමේ අවදානමක් පවතී. එබැවින්, භූමිය සහ මිනිසුන්ගේ ජීවන රටාව හඳුනාගත් සංවර්ධන ක්‍රියාවලියක් රත්නපුර නගරය සඳහා ලබා දිය යුතු වේ.




***රූප සටහන් අංක 3.9 :*** *2010 - 2016 අතර කාලය තුළ නිකුත් කර ඇති කැණීම් බලපත්‍ර ප්‍රමාණය*
***මූලාශ්‍රය :*** *මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය*




***රූප සටහන් අංක 3.10 :*** *නගරය තුළ ඇති කැණීම් ප්‍රදේශ - 2017*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

# 3.2. සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා විභවතා

## *මැණික් සඳහා ඇති ජාත්‍යන්තර පිළිගැනීම*

රාජතාන්ත්‍රික සහ වාණිජ අරමුණු පදනම් කරගනිමින් විශාලත්වයෙන් සහ ගුණාත්මක බවින් යුත් මැණික් වෙනත් රටවලට ලබාදීම හේතුවෙන් රත්නපුර නගරයට "මිණිපුර" ලෙසින් ජාත්‍යන්තරව හිමි වූ පිළිගැනීමක් ඇත. ඓතිහාසිකව සළකා බලන කල, මෙම කලාපයට අනන්‍ය සුවිශේෂී වූ භූගෝලීය පිහිටීම හේතුවෙන් රත්නපුර නගරය අවට ප්‍රදේශ වල මැණික් නිධි පිහිටා තිබී ඇති අතර ඒ හේතුවෙන් රාජධානි සමයේ සිට යටත් විජිත සමය දක්වා ම මෙම ප්‍රදේශය රාජ්‍ය පාලකයින්ගේ අවධානයට සහ ආරක්ෂාවට හසු වී ඇත. පසුකාලීනව යම් පසුබෑස්මකට ලක් වුව ද 2016 මහ බැංකු වාර්තාවට අනුව 2017 වසරේදීත් ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකය තුළ පස් වන ස්ථානයේ රැඳී සිටීමට මැණික් කර්මාන්තය සමත් වී ඇත. ඒ අනුව, වර්තමානයේදී දළ ජාතික නිෂ්පාදිතයට මැණික් කර්මාන්තයෙන් ලැබෙන දායකත්වය 3% ක් වේ.

## 03 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා විභවතා

### අපනයන සංයුතිය – 2016




**රූප සටහන් අංක 3.11 :** *අපනයන සංයුතිය - 2016*
**මූලාශ්‍රය :** *ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2016*

කෙසේ නමුත්, 2017 වර්ෂය වනවිට ද සැලසුම් ප්‍රදේශයෙන් 90% ක පමණ භූමි ප්‍රමාණයක් සතුව මෙම මැණික් සම්පත ඇතැයි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සතු දත්තයන් හා ප්‍රදේශවාසීන්ගේ දැනුම මත නිගමනයන්ට එළඹිය හැකි වේ. (ඇමුණුම 13 බලන්න) එමෙන්ම, ශ්‍රී ලංකාව තුළ හමුවන සෑම මිල අධික මැණිකක්ම ජාත්‍යන්තර ගැණුම් කරුවන් වෙතට යාමට පෙර රත්නපුර නගරයේ පවතින මැණික් වෙළඳපොළට පැමිණෙන බව මැණික් කර්මාන්තයේ යෙදෙන පිරිස විශ්වාස කරන බැවින් රත්නපුර මැණික් ව්‍යාපාරය සමස්ථ ශ්‍රී ලංකාවේම මැණික් ව්‍යාපාරය නියෝජනය කරනු ලබයි. (ඇමුණුම් 13)




***රූප සටහන් අංක 3.12 :*** *මැණික් ව්‍යාපාරයෙහි ධාරක ප්‍රදේශය*
***මූලාශ්‍රය :*** *මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ 2006/2010 සිසුන් කණ්ඩායම*

මැණික් කර්මාන්තය සම්බන්ධ ක්‍රියාවලිය සළකා බලන කල, එය ඉතා ඈත අතීතයේ සිටම රත්නපුර නගරය පදනම් කරගනිමින් ස්ථාපිත වී තිබී ඇති අයුරු හඳුනාගත හැකි වේ. ඒ අනුව වීදි, මංසන්ධි සහ විවෘත අවකාශයන් ව්‍යාපාරිකයින් විසින් ඒ සඳහා යොදාගෙන ඇති අතර වර්තමානයේදී ද එම ක්‍රියාවලිය එලෙසින් ම සිදු වේ. එක් එක් ස්ථානයන්හි ව්‍යාපාරික කටයුතු කෙරෙන කාල සීමාවන් පිළිබඳව ද නිශ්චිත සැකැස්මක් පවත්නා හෙයින් රත්නපුර නගරය පදනම් වී ගොඩනැගී පවතින මෙම මැණික් සංස්කෘතිය වෙනත් ස්ථානයකදී දැකිය නොහැකි වේ.

ඕනෑම නිෂ්පාදනයක අසීරුම කාර්යය වන අලෙවිකරණයේ දී ඓතිහාසිකව මෙම නගරයට හිමිව ඇති පිළිගැනීම හේතුවෙන් එම ක්‍රියාවලිය පහසු වී ඇත. ඒ අනුව මැණික් කර්මාන්තය සඳහා ඇති ජාතික සහ ජාත්‍යන්තර පිළිගැනීම පදනම් කරගෙන මැණික් පුරවරය යන අනන්‍යතාවය සංවර්ධන සැලැස්ම හරහා ලඟා කරගැනීමේ හැකියාව රත්නපුර නගරයට ඇත.

- ***නගරයේ ඇති ඓතිහාසික, ආගමික හා සංස්කෘතික අනන්‍යතාව***

රාජධානි යුගයේ සිටම රත්නපුරයට ශ්‍රීපාදය සහ සුමන සමන් දෙවියන් පාදක කරගත් සංස්කෘතික අනන්‍යතාවයක් පැවතී ඇත. පැරණිම ශ්‍රීපාද ගමන් මාර්ගය රත්නපුරයෙන් ආරම්භ වී ඇති අතර නවමත් මිනිසුන් විසින් එම මාර්ගය භාවිතා කරයි. සමන් දේවාලය යනු විශේෂ අවස්ථා වලදී වෙනස්කම් පැවතියද වසර පුරා පුද්ගලයන් ආකර්ෂණය කරවන ස්ථානයකි. සාමාන්‍යයෙන් 5,000 කට අධික පිරිසකට සමන් දේවාලයට පැමිණෙන අතර දිනපතා දේවල භූමිය තුල  හා කඩ සාප්පු 20 ක් පමණ ක්‍රියාත්මක වේ. පෙරහැර සමයේදී බැතිමතුන්ගේ සංඛ්‍යාව 100,000 ක්පමණ දක්වා ඉහළ යන අතර කඩ සාප්පු ප්‍රමාණය 150 ක් දක්වා ඉහළ යයි.




***රූප සටහන් අංක 3.13 :*** *පැරණි ශ්‍රී පාද මාවත (රජමාවත)*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

| සබරගමුව මහ සමන් දේවාලයට පැමිණෙන සංචාරකයන් සහ වෙළෙඳුන් | |
|---|---|
| දෛනිකව | 5000 - 6000 |
| සෙනසුරාදා, ඉරිදා සහ පෝය දිනවල | 9000 - 10,000 |
| පාසැල් නිවාඩු කාලයේදී (දෛනිකව) | 10,000 - 12,000 |
| ජනවාරි පළමුවෙනිදා | 200,000 - 400,000 |
| පෙරහැර කාලයේදී (දෛනිකව) - අගෝස්තු | 50,000 - 120,000 |
| ශ්‍රී පාද සමයේදී (දෛනිකව) | 15 - 20 |
| දේවාල පරිශ්‍රය තුළ වෙළෙඳුන් (දෛනිකව) | 80 - 150 |
| පෙරහැර කාලයේදී ආගන්තුක වෙළෙඳුන් | 80 - 150 |
| පෙරහැර කාලසීමාවට පසු ආගන්තුක වෙළෙඳුන් | 15 - 25 |

**වගු අංක 3.3 :** *සමන් දේවාලයට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව (2017)*
**මූලාශ්‍රය :** *2017 ක්ෂේත්‍ර සමීක්ෂණ - නාගරික සංවර්ධන අධිකාරිය*

මීට අමතරව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කෞතුකාගාර අතරට රත්නපුර ජාතික කෞතුකාගාරය ද එයට අයත් වේ.

| කෞතුකාගාරය | විදේශීය ප්‍රවේශපත්‍ර | | දේශීය ප්‍රවේශපත්‍ර | |
|---|---|---|---|---|
| | විදේශීය සංචාරකයන් ප්‍රමාණය | ආදායම (රු.) | දේශීය සංචාරකයන් ප්‍රමාණය | ආදායම (රු.) |
| කොළඹ ජාතික කෞතුකාගාරය | 46, 643 | 27, 419, 700 | 166, 092 | 3, 216, 990 |
| ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරය | 5, 303 | 3, 061, 800 | 64, 887 | 940, 245 |
| මහනුවර ජාතික කෞතුකාගාරය | 0 | 0 | 0 | 0 |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 135 | 38, 100 | 28, 327 | 348, 905 |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | 174 | 51, 000 | 1, 059 | 8, 090 |
| අනුරාධපුර ජන කෞතුකාගාරය | 164 | 50, 400 | 7, 305 | 94, 070 |
| ලන්දේසි කෞතුකාගාරය | 4, 090 | 2, 013, 000 | 5, 510 | 100, 280 |
| ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය | 2, 925 | 837, 000 | 40, 780 | 419, 325 |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 501 | 144, 000 | 26, 607 | 205, 696 |
| හම්බන්තොට ජාතික කෞතුකාගාරය | 42 | 21, 000 | 1, 987 | 26, 175 |
| එකතුව | 59, 982 | 33, 636, 000 | 342, 554 | 5, 359, 775 |

**වගු අංක 3.4 :** *රත්නපුර කෞතුකාගාරයට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව (2017)*
**මූලාශ්‍රය :** *ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව*

ඇහැලේපොල යුගයේ සහ යටත්විජිත යුගයේදී ඉදි කරන ලද ස්ථාන සැළකිය යුතු ප්‍රමාණයක් රත්නපුර නගරය ආශ්‍රිතව පවතිනු දැකිය හැකි වේ. මෙම ප්‍රදේශය, කුරුවිට – රත්නපුර සංචාරක කලාපයට අයත් වන අතර ප්‍රධාන සංචාරක කලාප හතරක් වන සීතාවක, සමනල, උඩවලව සහ සිංහරාජ කලාපයනට මැදිව පිහිටා තිබීම ද සුවිශේෂී වේ. මේ අනුව, රත්නපුර නගරය සතුව ඓතිහාසික, ආගමික හා

සංස්කෘතික අංශයන්ගෙන් නගරයටම ආවේණික අනන්‍යතාවයක් පවතින අතර සංචාරක පුරවරයක් වශයෙන් සංවර්ධනය කර ඒ මගින් නගර වැසියනට රැකියා අවස්ථා ලබාදීමේ හැකියාවක් පවතී.

- ***පුළුල් ජෛව විවිධත්වය***

රත්නපුර නාගරික සැලසුම් ප්‍රදේශය සතුව සාරවත් පස, ඉහළ ආර්ද්‍රතාවය, නිරන්තර වර්ෂාපතනය, වෙනස් වන උෂ්ණත්වය ආදිය තිබීම හේතුවෙන් ඉහළ ජෛව විවිධත්වයක් නිර්මාණය වී ඇත. ගස් වැල්, ගංගා ඇළ දොළ, කඳු වැටි, ඝණ වනාන්තර සහ නාගරික වනෝද්‍යාන ඇති බැවින් එකිනෙකට වෙනස් පරිසර පද්ධති රත්නපුර නාගරික සැලසුම් ප්‍රදේශය තුළ දැකිය හැකි වේ. රත්නපුර නගරයේ සාමාන්‍යය වාර්ෂික උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 27.1 ක් වන අතර වාර්ෂික සාමාන්‍යය වර්ෂාපතනය මිලිමීටර් 3760 ක් පමණ වේ. වර්ෂාපතනය වසර පුරාම දැකිය හැකි වන අතර පළමු අන්තර් මෝසම කාලය මාර්තු සිට අප්‍රේල් දක්වාත් (14.8%) නිරිතදිග මෝසම කාලය මැයි සිට සැප්තැම්බර් දක්වාත් (50.6%) දෙවැනි අන්තර් මෝසම කාලය ඔක්තොම්බර් සිට නොවැම්බර් දක්වාත් (21.55%) ඊසාන දිග මෝසම කාලය දෙසැම්බර් සිට පෙබරවාරි දක්වාත් (13.4%) දැකිය හැකි වේ.

| | රත්නපුර වෙසෙන ජීවී විශේෂ | ශ්‍රී ලංකාවේ වෙසෙන ජීවී විශේෂ | 100% | රත්නපුරට ආවේණික ජීවී විශේෂ | ශ්‍රී ලංකාවට ආවේණික ජීවී විශේෂ | 100% |
|---|---|---|---|---|---|---|
| **සමනලයන්** | 65 | 242 | 26.85% | 21 | 41 | 51. 21% |
| **මත්සයින්** | 10 | 64 | 15.62% | 7 | 17 | 41. 17% |
| **උභයජීවීන්** | 19 | 38 | 50.00% | 8 | 19 | 42. 10% |
| **සර්පයින්** | 29 | 90 | 32.22% | 14 | 39 | 35. 89% |
| **පක්ෂීන්** | 141 | 384 | 36.71% | 24 | 26 | 95. 00% |
| **ක්ෂීරපායීන්** | 40 | 85 | 47.05% | 7 | 12 | 58. 33% |

***වගු අංක 3.5 :*** *රත්නපුර කලාපයේ පවතින ජෛව විවිධත්වය (2017)*
***මූලාශ්‍රය :*** *ශ්‍රී ලංකාවේ තරුණ ජීවවිද්‍යාඥයන්ගේ සංගමය*

අධික වර්ෂාපතනය සහ අධික ආර්ද්‍රතාව රත්නපුර නාගරික ප්‍රදේශය තුළ නිරන්තරයෙන් දැකිය හැකි වන අතර මේ සියලු කරුණු හේතුවෙන් පුළුල් පරාසයක ශාක සහ සත්ත්ව ප්‍රජාවක් මෙන්ම ආවේණික සත්ත්ව විශේෂයන් ද රත්නපුර නගර සැලසුම් කලාපය තුළ දැකිය හැකි වේ.

## කළු ගඟ ඇතුළු ස්වභාවික ජලවහන පද්ධතිය

“කලු” ගඟ රත්නපුර නගරය පසෙකින් හෙමින් ගලා බසින අතර “වේ” ගඟ ද නගරය ආසන්නයෙන් කළු ගඟට සම්බන්ධ වේ. අතීතයේදී මෙම කලු ගඟ රත්නපුර සහ කළුතර අතර නාවුක වෙළඳ මාර්ගයක් ලෙස ක්‍රියාකර ඇති බවත් රත්නපුර නගරය ආශ්‍රිත ජලතලය විවිධ ජල ක්‍රීඩා සඳහා ප්‍රසිද්ධ වූ බවත් ජනකතා සාහිත්‍යයේ කියැවේ. කටුගස් ඇල්ල සහ වෙනත් දිය ඇළි ද ලොකු කුඩා අතිරේක ජලමාර්ග ද හේතුවෙන් සැලසුම් ප්‍රදේශයෙන් 80% ක පමණ ප්‍රමාණයක් සම්පූර්ණ වශයෙන්ම අභ්‍යන්තර ජලවහන පද්ධතියකින් යුක්ත වේ. එහෙයින්, නගරයේ අවශ්‍යතාවය ඉක්ම වූ ජල ප්‍රමාණයක් නගරය තුළ පවතින අතර මේ වන විට එම ජල සම්පතින් නිසි ප්‍රයෝජනයක් නොගෙන තිබීම අමතර ගැටලු නිර්මාණය කිරීමක් පමණක් වන අතර මෙම ජල සම්පත ආර්ථික හා සමාජයීය ප්‍රගමනය වෙනුවෙන් යොදා ගැනීම උදෙසා උපායමාර්ගික යොමුවීමක් අවශ්‍ය වේ.




***රූප සටහන් අංක 3.14 :*** *කළු ගඟ*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

## ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් වීම සහ රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම

රත්නපුරය නගරය දිවයිනේ නැගෙනහිර සහ බටහිර සම්බන්ධ වන කේන්ද්‍රස්ථානය වේ. එමෙන්ම, කොළඹ පානදුර (බටහිර කලාපය) මෙන්ම හම්බන්තොට (දකුණු පළාත) සහ මඩකලපුව (නැගෙනහිර පළාත) ද රත්නපුර නගරය හරහා සම්බන්ධ වේ. එනිසා මෙය බටහිර නැගෙනහිර මාර්ග ජාලය සහ බටහිර දකුණ මාර්ග ජාලය සම්බන්ධවන කේන්ද්‍රස්ථානයකි.

මීට අමතරව යෝජිත රත්නපුර අධිවේගී මාර්ගය සහ විකල්ප මාර්ගය හේතුවෙන් නුදුරු අනාගතයේදී රත්නපුර නගරයේ සංවර්ධන ප්‍රවණතාව වෙනස් විය හැකිය. මෙම මාර්ග හේතුවෙන් නගරයට ඇතුළුවීමට සහ පිටවීමට පහසු වන අතර සැලසුම් ප්‍රදේශයේ අනාගත සංවර්ධන ප්‍රවණතාව වෙනස් වීමට එය සෘජුවම බලපෑමක් සිදු කරනු ඇත.

| | | |
|---|---|---|
| ව්‍යාපෘතියේ නම | රුවන්පුර අධිවේගී මාර්ගය | |
| ව්‍යාපෘතියේ වර්ගය | අධිවේගී මාර්ග ඉදිකිරීම | |
| අරමුදල් සපයන ආයතනය | තීරණය කර නොමැත | |
| ස්ථානය | කහතුඩුව සිට රත්නපුර හරහා පැල්මඩුල්ල දක්වා.<br>අන්තර් හුවමාරු ස්ථාන - හොරණ, ඉංගිරිය, කිරිඇල්ල, කුරුවිට සහ රත්නපුර | |
| දුර (කි.මී) | 73.9 | |
| පළල (මී.) | 20.4 | |
| ආරම්භ වීමට නියමිත දිනය | තීරණය කර නොමැත | |
| අවසන් වීමට නියමිත දිනය | තීරණය කර නොමැත | |
| විස්තර | | 2017. 12. 31 වන විට ප්‍රගතිය |
| • ශක්‍යතා අධ්‍යයනය අවසන් අදියරේ පවතී<br>• පාරිසරික බලපෑම් තක්සේරුව<br>• ඉඩම් අත්පත් කර ගැනීම<br>• නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම<br>• සිවිල් වැඩ ප්‍රසම්පාදනය<br>• නැවත පදිංචි කිරීම<br>• දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය | | • 99%<br>• 95%<br>• 18%<br>• සකස් කර ඇත<br>• 40%<br>• ආරම්භ කර නැත<br>• නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගතව ඇත |

**වගු අංක 3.6 :** රුවන්පුර අධිවේගී මාර්ගය පිළිබඳ තොරතුරු
**මූලාශ්‍රය :** මාර්ග සංවර්ධන අධිකාරිය

මධ්‍යම කඳුකරයට, දකුණට සහ නැගෙනහිර වෙරළට විවර වූ දොරටුවක් වන හෙයින් විශාල සංසරණ ජනගහනයක් රත්නපුර නගරයට දෛනිකව පැමිණෙන අතර අධිවෙගී මාර්ගය නිම කිරීමෙන් පසුව පැයක පමණ කාලයක් ඇතුලත රත්නපුරයේ සිට කොළඹට ළඟාවිය හැකිවනු ඇතැයි අපේක්ෂිත ය. එබැවින්, රත්නපුර නගරය පදනම් කරගත් ප්‍රවාහන ජාලය උපායමාර්ගික ප්‍රවේශයක් යටතේ සැලසුම් සහගතව ගොඩනැගිය යුතු වේ.

රත්නපුර නගරයේ අනාගත සංවර්ධනය සඳහා එහි පවත්නා ගැටළු සහ විභවතා හඳුනාගැනීම සිදු කළ යුතු වේ. මේ වනවිට හඳුනාගෙන පවතින ගැටලු සඳහා හේතු සොයාගැනීමත් හඳුනාගන්නා ලද විභවතා නිසි පරිදි කළමණාකරණය කරගැනීමත් මෙතෙක් හඳුනා නොගන්නා ලද විභවතාවන් මෙම සැලැස්ම මගින් ඉස්මතු කර ගැනීමත් මගින් නගරයට මෙතෙක් හිමි නොවූ ප්‍රතිලාභ ලබා ගැනීම මෙහිදී අපේක්ෂිතය.

මෙම පරිච්ඡේදයේදී රත්නපුර නගරයට අනන්‍ය වූ ගැටලු සහ විභවතා හඳුනාගෙන ඇති අතර එම අධ්‍යයනයන් පදනම් කරගැනීම මත රත්නපුර නගරයේ අනාගත දැක්මත්, උපායමාර්ගික සැලසුම තුළින් එම දැක්ම ළඟා කරගන්නා ආකාරයත් තීරණය කිරීම පහසු වේ. පවත්නා තත්ත්වය මැනවින් වටහා ගැනීම අනාගතයේදී නගරය ආර්ථික සහ සමාජයීය වශයෙන් සමෘධිමත් කිරීමේ පළමු පියවරයි. මෙහිදී පවතින විශේෂත්වයක් වන්නේ රත්නපුර නගරය සතුව පවතින ගැටලු තත්වයනට සාපේක්ෂව විභවතාවන් ප්‍රමාණය ඉහළ අගයක් ගැනීමයි. එම විභවතාවයන් අතරින් මැණික් ව්‍යාපාරය හා සංචාරක ව්‍යාපාරය මත පදනම් වූ අනාගත ආර්ථිකය රත්නපුර නගරයේ අනාගතය සමෘධිමත් කරනු ඇත.



# දෙවන කොටස

**රත්නපුර මහ නගර සභා බල ප්‍රදේශයෙන් සමන්විත වන**

**රත්නපුර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ**

**සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 මැයි 28 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන රත්නපුර මහ නගර සභා බල ප්‍රදේශයෙන් සංයුක්ත වන රත්නපුර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

..................................................
පාඨලී චම්පික රණවක
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

**මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,**
**17 හා 18 වන මහල,**
**"සුහුරුපාය",**
**සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල**

2019 ...ජූනි............. මස 21... වන දින.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2129/95 - 2019 ජුනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**රත්නපුර මහ නගර සහා බල ප්‍රදේශයෙන් සමන්විත වන රත්නපුර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි.**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශයෙන් සමන්විත රත්නපුර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද රත්නපුර නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජුනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජුනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

රත්නපුර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද රත්නපුර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ජූනි මස 28 දින.

07 - 4554/7


1A - PG 4554 — 177 (2019/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පරිච්ඡේදය 04



# සංවර්ධන සැලසුම් රාමුව

# 4.1 දැක්ම

*"ශ්‍රී ලංකාවේ හරිත වර්ණ වූ මැණික් පුරවරය"*

# 4.2 දැක්මේ ප්‍රකාශනය

රත්නපුර නගරය "ශ්‍රී ලංකාවේ මැණික් පුරවරය" ලෙසට හඳුන්වන්නේ රත්නපුර නගරය සතු මැණික් අනන්‍යතාව හේතුවෙනි. මෙම දැක්මට අනුව රත්නපුර නගරය නැවත වරක් ජාතික සහ ජාත්‍යන්තර මැණික් ව්‍යාපාරයේ වෙළඳ ලකුණ බවට බවට පත් කිරීම නගර සංවර්ධන සැලැස්මේ අරමුණ වේ. ඒ අනුව, රත්නපුර නගරයට අනාගතයේ දී අනෙකුත් නගර හා තරඟ කිරීමටත් ආයෝජකයින් ආකර්ෂණය කරගැනීමටත් ව්‍යවසායකයින් ධෛර්යමත් කිරීමටත් හැකියාව උදා වේ. රත්නපුර නගරය සහ අවට ප්‍රදේශ සතුව මැණික් ඉල්ලම් පිහිටා තිබීමත්, කැණීම් සංස්කෘතිය හා මැණික් වෙළඳ ජාලයට අනුගත වූ මිනිසුන් වාසය කිරීමත් හේතුවෙන් මැණික් නගර සංකල්පය රත්නපුර නගරයට ප්‍රායෝගික වන අතර මෙම අනන්‍යතාව සහ ශක්‍යතාව උපයෝගී කරගනිමින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කරගැනීමට ඇති හැකියාව ද රත්නපුර නගරය සතු වනු ඇත.

"හරිත වර්ණය" මගින් රත්නපුර නාගරික පරිසරයේ පවතින විවිධත්වය සහ සුන්දරත්වය වෙත අවධානය යොමු කර ඇත. ඒ අනුව, වනාන්තර හා ගංගාවන්ට අමතරව විවිධ භාවිතාවන්ට යොදා ගන්නා ක්‍රීඩාංගණ ආදී හරිත මිශ්‍ර අවකාශයන් ද වැව්, පොකුණු ආදී නිල් පැහැති අවකාශයන් ද 'පරිසරය' නමැති කාණ්ඩයටම අයත් ලෙස රත්නපුර නගර සැලැස්මේ දී හඳුනාගෙන ඇති අතර එම පාරිසරික වත්කම ආරක්ෂා කරගැනීම සහ වැඩිදියුණු කිරීම තුළින් මිනිසුන් වෙත සොඳුරු නගරයක් අනගතයේ දී හිමිවනු ඇත.

රත්නපුර නගරයේ භෞතික පරිසරය සංවර්ධනය කිරීම මගින්, මැණික් මත පදනම් වූ ශක්තිමත් ආර්ථික පදනමක් ගොඩනැගීමට අවශ්‍ය පහසුකම් සැපයීමටත් සංස්කෘතිය, උරුමයන් සහ සොබාදහම මත පදනම් වූ සංචාරක ව්‍යාපාරයක් ගොඩනැගීමට අවශ්‍ය පහසුකම් සැපයීමටත් අවකාශය උදා වේ. ඒ අනුව මෙම අංශයන් ද්විත්වය සංකලනය කර නිර්මාණශීලි ආර්ථිකයක් ගොඩනැගීම රත්නපුර නගර සංවර්ධන සැලැස්මේ දැක්මෙන් අපේක්ෂිත ය. එමගින්, වසර 2030 වන විට සබරගමුව පළාත සතුව පවතින අභිමානය රත්නපුර නගරය විසින් ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පිළිබිඹු කරනු ඇත.

## 4.3 අරමුණු

**අරමුණ 01**

රත්නපුර නගරය ශ්‍රී ලංකාවේ මැණික් වෙළඳ කටයුතු සමබන්ධ ජාතික මධ්‍යස්ථානය බවට පත් කිරීම.

**අරමුණ 02**

රත්නපුර නගරය ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු සඳහා ආකර්ශනීය ස්ථානයක් බවට පත්කිරීම

**අරමුණ 03**

රත්නපුර නගරය නේවාසිකයන් සඳහා ජීවත් වීමට සුදුසු පරිසරයක් බවට පත් කිරීම

## 4.4 අභිමතාර්ථ

අරමුණ 01

රත්නපුර නගරය ශ්‍රී ලංකාවේ මැණික් වෙළඳ කටයුතු සමබන්ධ ජාතික මධ්‍යස්ථානය බවට පත් කිරීම.

අභිමතාර්ථ

1. මැණික් ආශ්‍රිත කටයුතු වලින් වර්ෂ 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට 7% ක දායකත්වයක් ලබා දීම.
2. මැණික් ආශ්‍රිත කටයුතු සඳහා පහසුකම් ලබාදීමෙන් වර්ෂ 2030 වනවිට ආකර්ෂණීය වීදි සහිත පරිසරයක් නගරය තුළ ඇතිකිරීම.

අරමුණ 02

රත්නපුර නගරය ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු සඳහා ආකර්ශනීය ස්ථානයක් බවට පත්කිරීම

අභිමතාර්ථ

1. වර්ෂ 2030 වනවිට රත්නපුර නගර සීමාව සතු හරිත ප්‍රදේශය 40% දක්වා වැඩි කිරීම.
2. වර්ෂ 2030 වනවිට රත්නපුර නගරයේ සංස්කෘතික හා ඓතිහාසික ස්ථානවල පුරාවිද්‍යාත්මක වටිනාකම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ එම වටිනාකම ආර්ථිකමය වටිනාකම් බවට පත් කිරීම.
3. වර්ෂ 2030 වනවිට රත්නපුර නගරය කේන්ද්‍ර කරගත් මැණික් හා සම්බන්ධ වූ පාරිසරික සංචාරක ව්‍යාපාරයට වාර්ෂිකව සංචාරකයන් 100,000 ක් ආකර්ෂණය කරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

**04 පරිච්ඡේදය**
**සංවර්ධන සැලසුම් රාමුව**

අභිමතාර්ථ

**අරමුණ** 03

**අභිමතාර්ථ**

**රත්නපුර නගරය නේවාසිකයන් සඳහා ජීවත් වීමට සුදුසු පරිසරයක් බවට පත් කිරීම**

1. වර්ෂ 2030 වනවිට මැණික් ආශ්‍රිත ආර්ථික අවස්ථාවන් රත්නපුර නාගරික ජනතාවට ලබාදීම මගින් සජීවී නගර අවකාශයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
2. වර්ෂ 2030 වනවිට නීල හරිත ජාලයක් නිර්මාණය කිරීම තුළින් ආපදා තත්ත්වයනට ගැලපෙන නගරයක් බිහිකිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

# පරිච්ඡේදය 05



# ශදුඅත විශ්ලේෂණය හා දත්ත විශ්ලේෂණයේ සාරාංශය

## 05 පරිච්ඡේදය ශදුඅත විශ්ලේෂණය හා දත්ත විශ්ලේෂණයේ සාරාංශය

උපාය මාර්ගික ශදුඅත (SWOT) විශ්ලේෂණය යනු දැක්ම පදනම් කරගත් මූලික ඇගයුමකි. එහිදී දැක්ම වෙත ළඟාවීමට රත්නපුර නගරය සතුව අභ්‍යන්තරව සහ බාහිරව පවත්නා අවස්ථා සහ තර්ජන පිළිබඳව සළකා බලා ඇත. මෙම පරිච්ඡේදයෙන් රත්නපුර නගරය හරිත වර්ණ මැණික් පුරවරයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඇති ශක්‍යතා, දුබලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය කර තිබේ.

අරමුණ 01

### අරමුණ 01

**පළවන අරමුණ: රත්නපුර නගරය ශ්‍රී ලංකාවේ මැණික් වෙළඳ කටයුතු සම්බන්ධ ජාතික මධ්‍යස්ථානය බවට පත් කිරීම**

**ශක්‍යතා**

- ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පැවැත්ම : මැණික් කර්මාන්තය අපනයන ආර්ථිකයේ 5 වන ස්ථානය හිමිකර ගැනීම සහ 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 3% ක් මැණික් කර්මාන්තය තුළින් හිමිවීම.
- පිහිටීම : යෝග්‍ය වූ භූගෝලීය පිහිටීම
- සංස්කෘතිය : දැනටමත් ස්ථාපිත වී ඇති මැණික් වෙළඳාම් ආශ්‍රිත සංස්කෘතිය සහ වෙළඳ ජාලය
- පුහුණු ශ්‍රම බලකාය : සැළකිය යුතු ප්‍රමාණයක් මැණික් පතල් ක්ෂේත්‍රයට හා වෙළඳාමට සම්බන්ධ වී සිටීම
- සන්නාමයක් ලෙස හඳුනාගැනීම: මැණික් වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් රත්නපුර නගරය සතුවන අන්තර් ජාතික අනන්‍යතාවය සහ ගුණාත්මක මැණික් සඳහා වන ජාත්‍යන්තර පිළිගැනීම
- ප්‍රවේශකත්වය : කොළඹ (වාණිජ අගනුවර) සිට කි.මී. 100 ක් දුරින් මාර්ග ජාලයේ ප්‍රධාන සංධිස්ථානයක පිහිටා තිබීම

**දුබලතා**

- මැණික් කර්මාන්තයට අදාළ පහසුකම් ප්‍රමාණවත් නොවීම

**අවස්ථා**

- යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය

**තර්ජන**

- ගංවතුර
- මැණික් වෙළඳාම හරහා අනෙකුත් නගර හා රටවල් වෙත දේශීය මුදල් කාන්දු වීම

***වගු අංක 5.1 :** පළමු අරමුණ සඳහා වූ ශදුඅත විශ්ලේෂණය*
***මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව - 2018*

### 1. *මැණික් කර්මාන්තය අපනයන ආර්ථිකයේ 5 වන ස්ථානය හිමිකර ගැනීම සහ 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 3% ක් මැණික් කර්මාන්තය තුළින් හිමිවීම.*

පූර්ව යටත්විජිත යුගයේ සිටම මැණික් කර්මාන්තයට රත්නපුර ආර්ථිකය තුළ විශාල ස්ථානයක් හිමිව ඇත. 2017 වසර වනවිට ද ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකයේ 5 වන ස්ථානය හිමිකරගෙන පැවති මෙම මැණික් කර්මාන්තය මහ බැංකු වාර්තා සංඛ්‍යාලේඛන වලට අනුව ජාතික ආර්ථිකය සඳහා 3% ක දායකත්වයක් ලබා දී ඇත. (රූපසටහන 3.3)

### 2. *යෝග්‍ය වූ භූගෝලීය පිහිටීම*

නිරිතදිග කඳු බෑවුම් සහ මධ්‍යම කඳුකර ප්‍රදේශ අතර කළු ගං මිටියාවත තුළ රත්නපුර නගරය පිහිටා ඇති අතර මෙම කලාපයෙහි සුවිශේෂී පිහිටීම හා දේශගුණික තත්ත්වය හේතුවෙන් මැණික් නිධි ස්ථානගත වී ඇත. එමෙන්ම සැලසුම් ප්‍රදේශයයේ 90% ක පමණ භූමි ප්‍රමාණයක මැණික් පවතින බව අධ්‍යයනයන්ගෙන් හෙළි වී ඇත. (මූලාශ්‍රය: මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය) (ඇමුණුම 13 බලන්න)




*රූප සටහන් අංක 5.1 : ශ්‍රී ලංකාවේ මැණික් නිධිවල පිහිටීම*
***මූලාශ්‍රය :** ප්‍රාදේශීය අධ්‍යයනය (2006/10 කණ්ඩායම) - නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලයය*

### 3. දැනටමත් ස්ථාපිත වී ඇති මැණික් වෙළඳාම ආශ්‍රිත සංස්කෘතිය සහ වෙළඳ ජාලය.

මැණික් කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාවලිය සළකා බැලීමේදී ඈත අතීතයේ සිටම රත්නපුර නගරය කේන්ද්‍ර කරගනිමින් මැණික් සංස්කෘතිය ස්ථාපිත වී ඇත. ඒ අනුව විශේෂිත වෙළඳ වීදි සහ වෙළඳ අවකාශයන් ද ඒ හා සම්බන්ධ වූ විශේෂිත දෛනික කාලසටහන් ද මිනිසුන් විසින් සංවිධානය කරගෙන ඇත. පහත දැක්වෙන රූප සටහන මගින් එම වෙළඳ රටාව සහ ජාලය හඳුනා ගත හැකි වේ. එබැවින්, නව වෙළඳ රටාවක් රත්නපුර නගරයේ වෙළෙඳුන්ට හඳුන්වා දීමට අවශ්‍ය නොවීම වාසිදායකය.







***රූප සටහන් අංක 5.2 :*** *මැණික් කර්මාන්තයට අදාළ ක්‍රියාවලිය සහ ජාලය*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18 කණ්ඩායම) - වාස්තු විද්‍යා පාසල, කොළඹ*

### 4. ශ්‍රම බලකායෙන් සැළකිය යුතු ප්‍රමාණයක් මැණික් පතල් ක්ෂේත්‍රයට හා මැණික් වෙළඳාමට සම්බන්ධ වී සිටීම

මැණික් කර්මාන්තය හා සබැඳි පතල් කර්මාන්තය සහ වෙළඳ කටයුතු යන ද්විත්වයම උදෙසා රත්නපුර නගරය ප්‍රසිද්ධය. අධ්‍යයනයන්ට අනුව වර්තමානයේදී පතල් කර්මාන්තය හා සෘජුව සම්බන්ධ ජනගහනය සමස්ත ජනගහනයෙන් 1/3 ක් (ආසන්න වශයෙන් 30%) වන අතර මැණික් වෙළෙඳ කර්මාන්තයේ නිරතව සිටින ජනගහනය මුළු ජනගහනයෙන් 1/4 ක් (25%) පමණ වේ. (රූප සටහන 3.3) මීට අමතරව මෙම කර්මාන්තය සමග වක්‍රව සම්බන්ධ ජනගහනය ඉහත සඳහන් ප්‍රමාණයට වඩා ඉහළ අගයක් ගනී.

### 5. මැණික් වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් රත්නපුර නගරය සතුවන අන්තර්ජාතික අනන්‍යතාවය සහ ගුණාත්මක මැණික් සඳහා වන ජාත්‍යන්තර පිළිගැනීම

ලොව හමු වූ විශාලතම නිල් මැණික් අතරින් ත්‍රිත්වයක් ම හමු වී ඇත්තේ රත්නපුර ප්‍රදේශයෙනි. බ්‍රිතාන්‍යයේ කිරීටයේ සවිකර තිබුණු “ආසියාවේ නිල් සීනුව” නමින් විරුදාවලිය ලත් මැණිකත් නිවේයෝර්ක්හි ස්වභාවික ඉතිහාස කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කරනු ලබන මැණිකත් ඒ අතර වේ. එමෙන්ම, සොලමන් රජතුමා සෙරන්ඩිබ් (ශ්‍රී ලංකාවේ පැරණි නම) හි සංචාරයෙන් අනතුරුව ශීබා රැජින වෙත රැගෙන ගිය විශාල රතු මැණික හමු වූ ප්‍රදේශයත් සින්බෑඩ් ගේ චාරිකාවේදී සඳහන්ව ඇති ප්‍රදේශයත් රත්නපුරය බවට විශ්වාස කෙරේ. (මූලාශ්‍රය: සබරගමුව වංශ කතාව) ඒ අනුව ඉතිහාසය පුරාවටම මැණික් සමබන්ධ භූමිය ලෙස ශ්‍රී ලංකාවේ රත්නපුර ප්‍රදේශය අන්තර්ජාතිකව හඳුනාගෙන ඇත.

**මැණික් බලපත්‍ර නිකුත් කිරීම - රත්නපුර**

69 % පතල්

27 % වෙළඳ කටයුතු

27 % මැණික් කැපීම්

**රූප සටහන් අංක 5.3 :** මැණික් බලපත්‍ර නිකුත් කිරීම
**මූලාශ්‍රය :** මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

**ශ්‍රී ලංකාවේ මැණික් අපනයනයේ ප්‍රතිශතය**

69 % රත්නපුර

25 % වෙනත් ප්‍රදේශ

**රූප සටහන් අංක 5.4 :** මැණික් අපනයනය
**මූලාශ්‍රය :** මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

### 6. කොළඹ (වාණිජ අගනුවර) සිට කි.මී. 100 ක් දුරින් මාර්ග ජාලයේ ප්‍රධාන සංධිස්ථානයක පිහිටා තිබීම

ව්‍යාපාර සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ ප්‍රවේශ වීමේ පහසුවයි. රත්නපුර නගරය පිහිටා තිබෙන්නේ ශ්‍රී ලංකාවේ දකුණු දිග ප්‍රදේශයේ පවතින මහාමාර්ග ජාලය තුළ ප්‍රධාන මංසන්ධිස්ථානයක වන අතර එහි සිට කොළඹ වාණිජ අගනගරයට A 004 මාර්ගය හරහා ඇති දුර ප්‍රමාණය කිලෝමීටර් 101 කි. මෙම දුර ප්‍රමාණය පැය 3 කින් ළඟාවිය හැකි කාලසීමාවකි. මීට අමතරව රත්නපුර නගරයට දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගැලනිගම අන්තර් හුවමාරුව හරහා පානදුර මාර්ගය භාවිත කිරීමෙන් ද පැමිණිය හැකි අතර එම මාර්ගයෙහි දුර කි.මී. 97 කි.

# දුබලතා | අරමුණ 01

## 1. *මැණික් කර්මාන්තයට අදාළ පහසුකම් ප්‍රමාණවත් නොවීම*

- අමතර ප්‍රවාහන ක්‍රම (දුම්රිය,ගුවන්, ජල) නොමැතිවීම
- මැණික් පිළිබඳ අධ්‍යයන සහ පර්යේෂණ සඳහා වැඩිදුර අවස්ථා නොමැතිවීම.
- විශාල පරිමාණයේ රජයේ මැණික් කෞතුකාගාරයක් නොමැති වීම.
- විවිධාංගීකරණය වූ, වටිනාකම් එකතු කරන මැණික් ආශ්‍රිත ආර්ථිකයක් නොමැති වීම
- මැණික් ආශ්‍රිත ආර්ථිකයට පහසුකම් සැලසීම සඳහා වූ ආකර්ශනීය වීදි දර්ශන නොමැතිවීම

රත්නපුර නගරය සඳහා පිවිසිය හැකි වන්නේ මහා මාර්ගය හරහා පමණක් වන අතර කොළඹට පැමිණීමට පැය 3ක කාලයක් ගතවේ. එම කාලය අවම කරගැනීම වෙනුවෙන් සහ විකල්ප ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය මාර්ගයක්, අධිවේගී මාර්ගයක් හෝ ගුවන් තොටුපොළක් යොදා ගැනීමට රත්නපුර නගරය ආශ්‍රිතව පවතින භූගෝලීය පිහිටීම හේතුවෙන් නොහැකිවීම ව්‍යාපාර හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමේ දී පවතින විශේෂ දුර්වලතාවයකි.

පුහුණු ශ්‍රම බලකායක් දැනට මැණික් කැණීමේ හා වෙළඳාමේ නියුතුව සිටින අතර එම වෙළෙඳුන්ගෙන් බහුතරයක් දැනුම ලබාගෙන ඇත්තේ පරම්පරාවෙනි. එබැවින් පාරම්පරික උරුමයකින් තොරව මැණික් කර්මාන්තයට පිවිසීමට කැමති හා හැකියාව ඇති පිටත සිට පැමිණෙන ජනයාට මෙම කර්මාන්තයට පිවිසීමට නිසි ක්‍රමයක් නොමැත. එසේම, මැණික් කර්මාන්තය පිළිබඳව ඉගෙනීමට හා පර්යේෂණ සඳහා උනන්දුවක් දක්වන අය සඳහා විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා අධ්‍යාපන අවස්ථාවක් ලබා ගැනීමට මාර්ගයක් ද නොමැත.

මැණික් ව්‍යාපාරය ආශ්‍රිතව ආර්ථික විවිධාංගීකරණයක් නොමැති වීම සහ වෙන්දේසි පහසුකම් සහිත රජය අනුමත මැණික් කෞතුකාගාර නොමැතිවීම වර්තමාන මැණික් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයේ අහිතකර තත්ත්වයක් නිර්මාණයට හේතු වී තිබේ. එමෙන්ම, රත්නපුර නගරයේ මැණික් වෙළඳාම තුළ වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් මැණික් සඳහා අගයන් එකතු කිරීම සිදු නොකරන හෙයින් වර්තමානයේ එය නගරයෙන් පිටතට විශාල මුදල් කාන්දුවක් ඇති කර තිබේ. (වැඩිදුර තොරතුරු රූප සටහන 3.4)

මෙම ජාලය තුළ පළමු ගැණුම්කරුවාට වඩා දෙවන තෙවන ගැණුම්කරුවන්ට ලැබෙන වටිනාකම ක්‍රමයෙන් වැඩි වේ. එහෙයින්, දේශීය වෙළෙන්දන්ට මැණික් ගලකින් ලැබිය යුතු උපරිම වටිනාකම නොලැබේ. එසේම, රත්නපුර නගරයේ මැණික් කර්මාන්තය විවිධාංගීකරණය වී නොමැති අතර අගය එකතු කළ මැණික් ආශ්‍රිත ආර්ථිකය ද මෙතෙක් උපරිම ප්‍රයෝජනයට ගෙන නොමැත.

වර්තමානයේ මැණික් කර්මාන්තයේ අනන්‍යතාව පිළිඹිබු කරන ආකාරයේ ආකර්ෂණීය වීදි දර්ශනයක් රත්නපුර නගරයේ නොමැති නමුත් ආගන්තුකයන්ගෙන් සැමවිටම මෙම වීදි සියල්ලම පිරී පවතී. නමුත් මැණික් පුරවරයේ අනන්‍යතාව නගරයේ වීදි දෙස බලනවිට නැති වී යන අතර නගරය තුළ දක්නට ඇත්තේ ව්‍යාකූලත්වය හා තදබදය පමණි.

## **අවස්ථා** | අරමුණ 01

### 1. *යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය*

යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය කහතුඩුව අන්තර් හුවමාරුව සිට පැල්මඩුල්ල දක්වා කිලෝ මීටර් 73.9 ක් වන අතර එමගින් මාර්ග සම්බන්ධතාව වර්ධනය වීමෙන් මනා ප්‍රවේශකත්වයක් නගරයට ඇති වනු ඇත. නව අධිවේගී මාර්ගය හේතුවෙන් කොළඹ සහ රත්නපුර අතර කාලය විනාඩි 45 ක් දක්වා අඩුකරනු ඇතැයි අපේක්ෂා කරන අතර ව්‍යාපාරික ප්‍රජාව උදෙසා එය වැදගත් වනු ඇත.

## **තර්ජන** | අරමුණ 01

### 1. ගංවතුර

රත්නපුර නගරයට, දැඩි අවදානම් සහිත ගංවතුර, මැදි අවදානම් සහිත ගංවතුර සහ සුළු අවදානම් සහිත ගංවතුර වශයෙන් තුන් ආකාරයකින් ගංවතුර තර්ජන ඇතිවේ. වර්ෂාපතන රටාව නිසා මැයි – ජූනි හා ඔක්තෝබර් මාසවල වාර්ෂික ගංවතුරක් ඇති වීමට ඉඩ ඇත. (වැඩි විස්තර සඳහා 3 වන පරිච්චේදය බලන්න) මෙම ගංවතුර ව්‍යසනයෙන් දින 2 ත් 5 ත් අතර කාලයක් නගරය අවට 80% ක් පමණ භූමිභාගය ජලයෙන් යට වීමෙන් පීඩාවට පත් වේ. මෙම කාලය තුල නගරයට ඇති සම්බන්ධතාව, ප්‍රවේශකත්වය, භෞතික යටිතල පහසුකම් ව්‍යුහය සහ නගර අලංකාරය සඳහා හානි සිදුවේ. ඒ සමගම දේශීය මට්ටමේ ආයතන වලට පිරිසිදු කිරීම් සහ සැපයුම් දාමයන් නැවත යථාතත්වයට පත්කිරීමට අමතර ශ්‍රමයක් සහ වියදමක් දැරීමට සිදුවේ. ඊට අමතරව, වසර 10 කට වරක් පමණ ඇතිවන විශාල ගංවතුර හේතුවෙන් ජාතික ආපදා තත්ත්වයක් රත්නපුර නගරය මූලික කරගනිමින් ප්‍රකාශයට පත් කිරීමට සිදුවන බැවින් ජාතික වශයෙන් පුළුල් අවධානයක් නගරය විසින් දිනාගෙන තිබේ.




***රූප සටහන් අංක 5.5 .*** *රත්නපුර සහ අවට කලාපය තුළ ගංවතුර බලපාන ප්‍රදේශ*
***මූලාශ්‍රය :*** *ප්‍රාදේශීය අධ්‍යයනය (2006/10 කණ්ඩායම) - නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලයය*

### 2. *මැණික් වෙළඳාම හරහා අනෙකුත් නගර හා රටවල් වෙත දේශීය මුදල් කාන්දු වීම*

මැණික් වෙළඳාම තුළ නිරත වෙළඳුන්ගෙන් 25% ක් පමණ රත්නපුර නගරය පදනම් කරගත් අය වන අතර අනෙකුත් ගැණුම්කරුවන් වන බේරුවල වැනි ප්‍රදේශයන්ගෙන් පැමිණෙන වෙළෙඳුන් විසින් රත්නපුර නගරය සතුව පැවති වෙළඳ ඒකාධිකරය වර්තමානය වනවිට තමන් සතු කරගනිමින් පවතී. එමෙන්ම, තායිලන්තය වැනි ජාත්‍යන්තර වෙළඳ පොළවලින් ද රත්නපුර මැණික් වෙළඳපොළට තර්ජන එල්ල වෙමින් පැවතීම වර්තමානයේ දී දැකිය හැකි වේ.




***රූප සටහන් අංක 5.6 :*** *මැණික් වෙළඳාම*
***මූලාශ්‍රය :*** *ප්‍රාදේශීය අධ්‍යයනය (2006/10 කණ්ඩායම) - නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය*

## Goal 02

**රත්නපුර නගරය සංචාරකයින් සඳහා ශ්‍රී ලංකාවේ ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කිරීම**

**ශක්‍යතා**

- මැණික් නගරය ලෙස ජාතික සහ ජාත්‍යන්තරව ඇති ප්‍රසිද්ධිය
- සබරගමුව මහා සමන් දේවාලය
- ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථාන (ස්ථාන 20 කට නොඅඩු ප්‍රමාණයක්) පිහිටා තිබීම
- ඉහළ ජෛව විවිධත්වය
- කළු ගඟ සහ අභ්‍යන්තර ජලවහන රටාව
- ප්‍රධාන ගමනාගමන සම්බන්ධතා

**දුබලතා**

- මැණික් කර්මාන්තය සහ සංචාරක කර්මාන්තය අතර ශක්තිමත් සම්බන්ධතාවක් නොමැතිවීම
- සංචරණයට විශේෂිත වූ ස්ථාන සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම
- වන ආවරණය ක්‍රමිකව අවම වීම
- නාගරික තාපය ඉහළ අගයක පැවතීම
- තිරස් පතල් හේතුවෙන් සැලසුම් ප්‍රදේශයේ විශාල පරිමාණ සංවර්ධන කටයුතු සඳහා පවත්නා ඉඩම් අස්ථායී වීම

**අවස්ථා**

- ප්‍රධාන සංචාරක කලාප හතරකට මධ්‍යගතව පිහිටා තිබීම
- යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය

**තර්ජන**

- ගංවතුර

***වගු අංක 5.2 :*** *දෙවන අරමුණ සඳහා වූ ශඳුඅත විශ්ලේෂණය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව*

## ශක්‍යතා | අරමුණ 02

### 1. *මැණික් නගරය වශයෙන් ජාතික සහ ජාත්‍යන්තරව ඇති ප්‍රසිද්ධිය*

ඈත අතීතයේ සිටම රත්නපුර නගරය "මැණික් නගරය" වශයෙන් ලොව පුරා මිනිසුන් අතර අනන්‍යතාවයක් ඇතිකරගෙන සිටි බවත් රත්නපුර නගරයේ මැණික්වල ගුණාත්මකභාවය පිළිබඳ ජාත්‍යන්තර තලයේ ප්‍රසිද්ධියක් ලබා සිටි බවටත් ප්ලිනි, හියුන්සන් සහ ඉබන් බතූතා වැනි දේශ ගවේෂකයන් ලියූ ඓතිහාසික වාර්තාවලින් පැහැදිලි වේ. අතීතයේ සිටම මෙම ප්‍රදේශයේ මැණික් බහුලව පැවතීම හේතුවෙන් 'රුවන් පුරය' ලෙස හැඳින්වී ඇති අතර අද වන විට 'රත්නපුර' යනුවෙන් හැඳින්වේ. (මූලාශ්‍රය: සබරගමු වංශ කතාව)

### 2. *සබරගමුව මහා සමන් දේවාලය*

සුමන සමන් දෙවියන් සමග බැඳුන රත්නපුරයට ආවේණික වූ සංස්කෘතියක් රත්නපුර නගරයට ඇත. ශ්‍රී පාදය සහ සුමන සමන් දෙවියන් ජනතාව බැති සිතින් ස්මරණය කරන ප්‍රධාන සිද්ධස්ථාන ද්විත්වයකි. කෙසේ නමුත්, ශ්‍රී පාදයට සිව් දෙසින් පිහිටා ඇති සමන් දේඅවල හතර අතුරින් මහා සමන් දේවාලය ලෙස සැලකෙනු ලබන සබරගමුව මහ සමන් දේවාලයට වසර සිය ගණනක ඉතිහාසයක් හිමිව ඇත. 2018 වසර දත්තයන්ට අනුව එක් දිනකදී 5000 කට අධික පුද්ගලයින් ප්‍රමාණයක් පැමිණෙන වැදගත් ස්ථානයක් වන මෙම සමන් දේවාලය විශේෂිත කාලවලදී ඉහත අගයට වඩා වැඩි බැතිමතුන් සංඛ්‍යාවක් ආකර්ෂනය කරගනී. එසේම වාර්ෂික ඇසල පෙරහැර කාලවලදී මෙම ස්ථානයට පැමිණෙන සංචාරකයින් ගණන දිනකට 150,000ක් පමණ වේ.

### 3. *ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථාන*

රත්නපුර නගරය යනු රාජධානි යුගයේ සිටම ශ්‍රී පාදය සහ සුමන සමන් දෙවියන් සම්බන්ධව සංස්කෘතික අනන්‍යතාවයක් තිබුණු නගරයකි. ඊට අමතරව, යටත්විජිත සමයේ හා ඇහැලේපොල යුගයේ ඉදි කරන ලද ස්ථාන රාශියක් ම ඇති අතර එවැනි ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථාන 20 කට වැඩි ප්‍රමාණයක් සැලසුම් ප්‍රදේශයේ ස්ථානගතව පවතී.

### 4. *ඉහළ ජෛව විවිධත්වය*

රත්නපුර නගරය තෙත් කලාපය තුළ පිහිටීම නිසා, මෙම ප්‍රදේශයටම අවේණික සහ ඒකදේශීය ජීවින් වර්ග රැසක් දැකිය හැක. මෙම නගරයේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27.1° C වන අතර වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3760 ක් වේ. එසේම රත්නපුර ප්‍රදේශයේ ස්වභාවික වනාන්තර ආවරණය ආරක්ෂා කිරීම සඳහා ප්‍රයෝජනවත් වන විවිධ පස් වර්ග ඇති අතර ඒවා ස්වභාවික වන ආවරණය ආරක්ෂා කර ගැනීමට උපකාරී වේ.

බොහෝ රටවල ශ්‍රී ලංකාවේ මෙන් ස්වභාවික නාගරික වනාන්තර නොමැති අතර ශ්‍රී ලංකාවේ ද මහනුවර, කෑගල්ල සහ ගාල්ල යන නගරවල පවත්නා නාගරික වනාන්තර හැරුණුවිට නගරය අසලින්ම වනාන්තරයක් ඇත්තේ රත්නපුර නගරයේ පමණි. ඒ අනුව, මෙම සියළුම සාධක රත්නපුර නගරය සතු ජෛව විවිධත්වයට ඉහළ නැංවීමට හේතු වේ.

05 පරිච්ඡේදය
ශදුඅත
විශ්ලේෂණය හා
දත්ත විශ්ලේෂණයේ
සාරාංශය

අරමුණ 02

## 5. කළු ගඟ සහ අභ්‍යන්තර ජලවහන රටාව

ඓතිහාසික වාර්ථාවන්ට අනුව පුරාණ කාලයේ දී බස්නාහිර සිට සබරගමුව (කළුතර – රත්නපුර) දක්වා කළු ගඟ හරහා නාවික වෙළඳ මාර්ගයක් තිබී ඇත. කළු ගඟ රත්නපුර නගරයට සමීපව පිහිටා ඇති අතර නගර සීමාව තුළ සෙමින් ගලා යයි. මෙම කළු ගඟට අමතරව, වේ ගඟත් තවත් ඇළ මාර්ග සහ දිය ඇලි කිහිපයකුත් සැලසුම් ප්‍රදේශය තුල දක්නට ලැබේ. එමෙන්ම සැලසුම් ප්‍රදේශයෙන් 80%ක්ම අභ්‍යන්තර ජල මූලාශ්‍රවලින් සමන්විත වේ.

## 6. ප්‍රධාන ගමනාගමන සම්බන්ධතා

රත්නපුර නගරය ප්‍රධාන ගමනාගමන සන්ධිස්ථානයක් තුළ පිහිටා ඇති අතර එය ශ්‍රී ලංකාවේ නැගෙනහිර, බටහිර සහ දකුණු ප්‍රදේශ වලට සම්බන්ධ වේ. එබැවින්, සංචාරක ආකර්ෂණ නගරයක් ලෙස එයට ප්‍රවේශවීමට පහසු වන අතර පැය 3 ක් ඇතුළත කොළඹ සිට රත්නපුර නගරයට (කි.මී. 101) ළඟා විය හැකිය.

## දුබලතා | අරමුණ 02

### 1. *මැණික් කර්මාන්තය සහ සංචාරක කර්මාන්තය අතර ශක්තිමත් සම්බන්ධතාවක් නොමැතිවීම.*

ප්‍රධාන සංචාරක කලාප හතරක් මධ්‍යයේ රත්නපුර නගරය පිහිටා ඇති නමුත් රත්නපුර නගරයට වෙත පවත්නා විදෙස් සංචාරක ආකර්ෂණය ඉතාම පහළ මට්ටමක පවතී. එසේම මෙම නගරයේ මැණික් කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය සමඟ බැඳී නොමැති හෙයින් දේශීය ආර්ථිකයට විදේශ විනිමය ළඟා කර ගත හැකි පහසු මාර්ග බොහෝමයක් ඇහිරී ඇත.

**දේශීය සහ විදේශීය සංචාරකයන් - සබරගමුව කළාපය**




***රූප සටහන් අංක5.7 :*** *සබරගමුව පළාතට පැමිණි දේශීය සහ විදේශීය සංචාරකයන් (2014 - 2015)*
***මූලාශ්‍රය :*** *සබරගමු පළාත් සංචාරක අමාත්‍යාංශය*

## 2. සංචරණයට විශේෂිත වූ ස්ථාන සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම

දේශීය හා විදේශීය සංචාරකයින් රැසක් ආකර්ෂණය කර ගත හැකි ස්ථාන රැසක් රත්නපුර නගරයේ ඇත. නමුත්, ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැති වීම හා නගරයට පැමිණෙන සංචාරකයින්ගේ අවශ්‍යතා සපුරා දීමට හා නිසි පරිදි කළමනාකරණය කිරීමට නොහැකි වීම නිසාම මෙම ස්ථාන පිළිබඳව සංචාරකයින් එතරම් දැනුවත් නොමැති අතර මේ හේතුවෙන් නගරයට විදේශ විනිමය ඇදී ආ යුතු මාර්ග රැසක් වැසී ඇත. එසේම, පහසුවෙන් සංචාරකයන් ආකර්ෂණය කර ගත හැකි ස්ථාන සඳහා නිසි සංචාරක මාර්ගෝපදේශ හා සංචාරක පුවරු රත්නපුර නගරයේ දැකිය නොහැක. (උදා: ඓතිහාසික වටිනාකම් ඇති වෙහෙර විහාර)

## 3. වන ආවරණය ක්‍රමිකව අවම වීම

ජාතික භෞතික සැලැස්මට අනුව, රත්නපුර නගරය පාරිසරික අධිසංවේදී කලාපයට අයත් ලෙස හඳුනාගෙන ඇති අතර, පාරිසරික තිරාසාරභාවය රැක ගැනීමට නම්, මෙම නගරයේ වන ආවරණය ආරක්ෂා කර ගත යුතු වේ. නමුත් වනාන්තර හෙළිකිරීම් හේතුවෙන් 2007 සිට 2017 වනවිට සැලසුම් ප්‍රදේශයේ වන ආවරණය 10% කින් පමණ අඩුවී ඇත. එසේම, ශ්‍රී ලංකාවේ මහනුවර, කෑගල්ල සහ ගාල්ල හැරුණු විට ස්වභාවිකව වර්ධනය වූ නාගරික වනාන්තරයක් ඇත්තේ රත්නපුර නගරයේ පමණි. වර්තමානයේ දී එම පොම්පකැලේ නාගරික වනාන්තරය (අරුණෝද උද්‍යානය) අනවසර අල්ලාගැනීම් හේතුවෙන් 30% කින් පමණ අඩුවී ඇත. (රූප සටහන් 5.8 හා 5.9) මෙම වන ආවරණය අඩුවීමේ ප්‍රතිශතය මේ අයුරින් පැවතියහොත් 2030 වනවිට රත්නපුර නගරය ආකර්ෂණීය සංචාරක මධ්‍යස්ථානයක් බවට පත්කිරීමට සැලසුම් කිරීමේ දී ඍණාත්මක බලපෑම් ඇති කරනු ඇත.



***රූප සටහන් අංක 5.8 :*** *2007 වසර වනවිට වන ආවරණය*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*






***රූප සටහන් අංක 5.9 :*** *2017 වසර වනවිට වන ආවරණය අඩු වීම*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

## 4. *නාගරික තාපය ඉහළ අගයක පැවතීම*

වියළි කාලයේදී (දෙසැම්බර්– මාර්තු) රත්නපුර නගරයේ දිවා කාලයේ උෂ්ණත්වය 31 ˚C ක් පමණ වේ. කෙසේ නමුත්, මනා සුළං ප්‍රවාහයක් නොමැති ද්‍රෝණියක පිහිටා ඇති නිසා ද, වෙනත් ප්‍රාදේශීය වශයෙන් බලපාන කාළගුණික හා භූගෝලීය තත්වයන් නිසා ද, වියළි දිනවල දිවා කාලයේ උෂ්ණත්වය මිනිසුන්ට දැනෙනුයේ 35 ˚C ක් පමණ තරමටය. මෙම තාප තත්වය දිගටම පැවතියහොත් දිවා කාලයේ දී සංචාරකයන්ට නගරය තුළ ඇවිදීමට හා විවේකීව කාලය ගත කිරීමට අපහසු වනු ඇත. (සිතියම 5.1 බලන්න)

## 5. *තිරස් පතල් (දෝනා) හේතුවෙන් සැලසුම් ප්‍රදේශයේ විශාල පරිමාණ සංවර්ධන කටයුතු සඳහා පවත්නා ඉඩම් අස්ථායී වීම.*

සැලසුම් ප්‍රදේශය පුරාම මැණික් නිධි පිහිටා ඇති හෙයින් බොහෝ තැන්වල මැණික් කැණීම සඳහා තිරස් කැණීම් (දෝනා) සිදුකර ඇත. වාර්ෂිකව මැණික් කැණීම් සඳහා 6000 කට අධික බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරනු ලැබුණද, සමහර ප්‍රදේශවල අනවසර මැණික් කැණීම් බහුල වේ. කැණීම් කටයුතු නිම කිරීමෙන් පසු පතල් නිසි පරිදි වැසී තැබිය යුතු වුව ද, නිසි අයුරින් නොවැසූ පතල් බොහොමයක් වර්තමානයේ දක්නට ලැබේ. එමෙන්ම පතල් වසා දැමුවද තිරස් අතට ගමන් කරන ලද දෝනා වසා දැමීමක් සිදු නොවන බැවින් භූමිය අස්ථාවර වන අතර රත්නපුර නගරයේ සංචාරකයන් ඉලක්ක කරගනිමින් මහා පරිමාණ ඉදිකිරීම් සිදු කිරීමට, භූමියේ පවත්නා මෙම අස්ථාවර බව බාධාවක් වනු ඇත.




**සිතියම් අංක 5.1 :** නාගරික තාපය

1. *රත්නපුර නගරය පාරිසරික අධිසංවේදී කලාපයට අයත් වන අතර ප්‍රධාන සංචාරක කලාප හතරකට මධ්‍යගතව පිහිටා තිබීම.*

මිණිපුර සංචාරක කලාපයට කුරුවිට සහ රත්නපුර අයත් වන අතර එය සීතාවක, සමනල, සිංහරාජ සහ උඩවලව යන ප්‍රධාන සංචාරක කලාප හතරට මධ්‍යගතව පිහිටා ඇත. එය ජාතික භෞතික සැලැස්මට අනුව, පාරිසරික අධි සංවේදී කලාපයට අයත් වන අතර එයට අනුකූලව දැනට පවත්නා මෙම ස්වභාවික පරිසරය රැක ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කර ඇත. එසේම, මේ හරහා සැලසුම් ප්‍රදේශයේ, පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීමට හැකි වනු ඇත.




***රූප සටහන් අංක 5.10 :*** *සබරගමුව පළාත් සංචාරක සිතියම - 2017*
***මූලාශ්‍රය :*** *සබරගමු පළාත් සංචාරක දෙපාර්තමේන්තුව*

### 2. *යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සහ විකල්ප මාර්ගය*

කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට පැල්මඩුල්ල දක්වා යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය කිලෝ මීටර් 73.9 ක් වන අතර එමගින් කොළඹ සිට රත්නපුර අතර ගමන් කාලය විනාඩි 45 ක් දක්වා අඩු වනු ඇත. මෙමඟින්, මෙම නගර දෙක අතර මනා සම්බන්ධතාවක් ඇති කරනු ඇති අතර, රත්නපුර නගරයට ප්‍රවේශ වීමේ හැකියාව වැඩිකර, ගමන් කාලය අඩු කරනු ඇත. එබැවින් මෙම යෝජිත රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හා විකල්ප මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හරහා දේශීය හා විදේශීය සංචාරකයින්ට ගමනාගමන පහසුකම් රැසක් අත්වනු ඇත. (වැඩි විස්තර සඳහා ඇමුණුම 14 බලන්න)

## **තර්ජන** | අරමුණ 02

### 1. *ගංවතුර*

රත්නපුර නගරයට, අවදානම් සහිත ගංවතුර, ප්‍රධාන ගංවතුර සහ සුළු ගංවතුර වශයෙන් තුන් ආකාරයකින් ගංවතුර තර්ජන ඇතිවේ. එසේම, වර්ෂාපතන රටාව නිසා මැයි – ජූනි හා ඔක්තෝබර් මාසවල වාර්ෂික ගංවතුර ඇති වීමට ඉඩ ඇත. (වැඩි විස්තර සඳහා ඇමුණුම් 5 බලන්න). මෙම ගංවතුර ව්‍යසනයෙන් දින 2 ත් 5 ත් අතර කාලයක් නගරය 80% ක් පමණ ජලයෙන් යටවීමේ අවදානම පවතින අතර බොහෝ සංචාරක නිකේතන පාරිසරික සංවේදී කලාප ආශ්‍රිතව ගොඩනගනු ලැබීම හේතුවෙන් ගංවතුර තත්ත්වය සෘජුවම සංචාරක කර්මාන්තය වෙත බලපානු ඇත.

**අරමුණ** 03

රත්නපුර නගරය නේවාසිකයන් සඳහා ජීවත් වීමට සුදුසු නගරයක් බවට පත් කිරීම.



**ශක්‍යතා**

- සුදුසු ජනවිකාශන තත්වය
- සමාජ යටිතල පහසුකම් පිළිගත හැකි තත්ත්වයක පැවතීම
- නගරය ද්විත්ව නගර සංකල්පය මත විකාශය වීම සහ පොකුරු වශයෙන් සේවාවන් සැපයීම

**දුර්වලතා**

- ශක්තිමත් ආර්ථික පදනමක් පවත්නා නමුත් එය නගරයේ හෝ එහි ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා මෙතෙක් භාවිත කර නොමැති වීම
- මාර්ග තදබදය
- හරිත ස්වභාවය ක්‍රමිකව අහිමිවීම සහ ඇවිදීම වෙහෙසකර වීම
- විකල්ප ප්‍රවාහන ක්‍රම නොමැති වීම
- ආපනශාලා සහ අවන්හල් අවම වීම
- රත්නපුර නගරයේ සංස්කෘතික හා ඓතිහාසික උරුමයන් ප්‍රවර්ධනය අවම වීම
- ක්‍රියාශීලී හා උදාසීන විනෝදාස්වාද පහසුකම් නොමැති වීම

**අවස්ථා**

- යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සහ විකල්ප මාර්ගය

**තර්ජන**

- ගංවතුර

*වගු අංක 5.3 : තෙවන අරමුණ සඳහා වූ ශදුඅත විශ්ලේශණය*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව*

05 පරිච්ඡේදය
ශක්‍යතා
විශ්ලේෂණය හා
දත්ත විශ්ලේෂණයේ
සාරාංශය

අරමුණ 03

## ශක්‍යතා | අරමුණ 03

### 1. සුදුසු ජනවිකාශ තත්වය

රත්නපුර නගරයේ ජනවාර්ගික විවිධත්වය සැලකිල්ලට ගත්විට ජනගහනයෙන් බහුතරය සිංහල-බෞද්ධ කාණ්ඩයට අයත් වන නමුත් අනිකුත් ජන වර්ගයන්ද එහි ජීවත් වේ. රත්නපුර නගරයේ ශ්‍රම බලකායෙන් 70% ක් 18 – 60 වයස් කාණ්ඩයේ වේ. ජනගහන විශ්ලේෂණයට අනුව ස්වභාවික වර්ධන වේගය 1.0 ක් වන අතර 2030 දී අපේක්ෂිත ජනගහනය 64,340 ක් වේ. 2030 දී රත්නපුර නගරය ජීවත් වීමට සුදුසු නගරයක් බවට පත් කිරීම සඳහා මෙම ජනවිකාශීය තත්ත්වය වැදගත් වේ.

### 2. සමාජ යටිතල පහසුකම් පිළිගත හැකි තත්ත්වයක පැවතීම

රත්නපුර නගරය සබරගමු පළාතේ ප්‍රධාන සෞඛ්‍ය, අධ්‍යාපන හා අධිකරණ සේවා සැපයුම් මධ්‍යස්ථානය වේ. ඒ අනුව ප්‍රධාන පාසල් 5ක් (එක් ප්‍රධාන පිරිමි පාසලක්ද, ප්‍රධාන කාන්තා පාසල් 3ක්ද එක් ප්‍රධාන මිශ්‍ර පාසලක් ද), ශික්ෂණ රෝහලක්, පෞද්ගලික රෝහල් තුනක් සහ සියළු පහසුකම් සහිත අධිකරණ සංකීර්ණයකින්ද සමන්විත වේ. එපමණක් නොව රත්නපුර නගරයේ පවත්නා නිවාසවලින් 90% ක්ම ස්ථිර නිවාස වේ.

### 3. නගරය ද්විත්ව නගර සංකල්පය මත විකාශය වීම සහ මංසන්ධි කේන්ද්‍ර කරගනිමින් පොකුරු වශයෙන් සේවාවන් සැපයීම

රත්නපුර නගරය පරිපාලන කටයුතු සහ වාණිජ ක්‍රියාකාරකම් වශයෙන් කොටස් දෙකකින් පිහිටුවා ඇත. නව නගරය සබරගමුව පළාතේ පරිපාලන අගනුවර ලෙස සලකන අතර එම ප්‍රදේශයෙන් 90% ක්ම ඉඩම් රජයේ ආයතන වලට අයත් වේ. පැරණි නගරය වාණිජ අග නගරය ලෙස කටයුතු කරන අතර එහි කටයුතු වලින් 90% ක් පමණ වාණිජ කටයුතු වේ. සේවා සැපයීම මත මෙම කොටස් දෙක වෙන්වන අතර නව නගරය පරිපාලන කටයුතු සඳහා ද, රෝහල හා ඉංදිය සෞඛ්‍යය කටයුතු සඳහා ද, පැරණි නගරය වාණිජ සහ අධ්‍යාපන කටයුතු සඳහා ද වෙන්වී තිබෙනු දැකිය හැක. මේ හේතුවෙන් සේවා සැපයීමේදී අදාල සේවාවන්ට අවශ්‍ය සේවා පහසුවෙන් සැපයිය හැකි අතර මිනිසුන්ට ද තම අවශ්‍යතා ඉටු කර ගැනීමේදී ව්‍යාකූල වීමේ ඉඩකඩ අවමය.

## දුබලතා | අරමුණ 03



### 1. ශක්තිමත් ආර්ථික පදනමක් පවත්නා නමුත් එය නගරයේ හෝ එහි ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා මෙතෙක් භාවිත කර නොමැත.

රත්නපුර නගරයේ ආර්ථික කටයුතු භූගෝලීය ලක්‍ෂණ සහ පිහිටීම මත පදනම් වේ. නගරයේ බොහෝ ආර්ථික කටයුතු පදනම් වන්නේ මැණික් කර්මාන්තය මතය. එබැවින්, මැණික් කර්මාන්තයට පහසුකම් සැපයීම සඳහා බොහෝ අනුපූරක ආර්ථික ක්‍රියාකාරකම් නගරය තුළ කේන්ද්‍රගත වී ඇති නමුත් එම කර්මාන්තයෙන් ලැබෙන මුදල් හරහා සමස්ථ ආර්ථිකයට සැලකියුතු දායකත්වයක් නොලැබේ.

### 2. මාර්ග තදබදය

රත්නපුර නගරයේ අවකාශීය විවිධත්වය සැලකිල්ලට ගත්විට ප්‍රධාන පාසැල් පහක් නගරය තුළ පිහිටා ඇත. ඒ අනුව, පාසැල් ළමුන් 12,000 ක් පමණ සහ පෞද්ගලික උපකාරක පංති කටයුතු සඳහා තවත් සිසුන් 10,000 ක් පමණ නගරයට පැමිණීම හේතුවෙන් A 004 මාර්ගය නිරන්තරයෙන් අවහිර වේ. එමෙන්ම වාණිජ, අධ්‍යාපන හා ඇතැම් පරිපාලන සේවා නගරය කේන්ද්‍ර කරගනිමින් පැවතීම හේතුවෙන් එකම වේලාවක දී නගරය තුළ මිනිසුන් හා වාහන වැඩි වශයෙන් සංසරණය වේ. (ඇමුණුම් 6-12 දක්වා බලන්න)

එසේම, විකල්ප මාර්ග නොමැතිවීම හේතුවෙන් නගරයට ඇතුල් වීමට අනවශ්‍ය වාහන නගරය හරහා ගමන් කරයි. මෙම තත්ත්වය A-004 මාර්ගයේ විශාල වාහන තදබදයක් නිර්මාණය කරන අතර මෙම ගමනාගමන තදබදය මහජන කටයුතුවලට බාධා ඇති කරයි. රත්නපුර නගරය දිස්ත්‍රික් සේවා සැපයුම් මධ්‍යස්ථානයක් වීම හේතුවෙන් මෙමඟින් නාගරික ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයන් අපහසුතාවන්ට පත්වේ.

### 3. හරිත ස්වභාවය ක්‍රමිකව අහිමිවීම සහ ඇවිදීම වෙහෙසකර වීම

වසර 2007 ට සාපේක්ෂව වසර 2017 දී රත්නපුර නගරය ආශ්‍රිතව වන ආවරණය 10% කින් පමණ අඩුවී ඇත. ශ්‍රී ලංකාවේ පවත්නා ස්වභාවික නාගරික වනාන්තර හතර අතුරින් එකක් වන පොම්පකැලේ නාගරික වනාන්තරයේ ද අනවසර අල්ලා ගැනීම හේතුවෙන් වනාන්තර ප්‍රදේශයෙන් 30%ක් පමණ අහිමි වී තිබේ. මෙම වන ආවරණය අඩුවීම, නගරය තුල උණුසුම ඉහළ යාමට ද හේතුවක් වී ඇත. රත්නපුර නගරය මනා සුළං ප්‍රවාහයක් නොමැති ද්‍රෝනියක පිහිටා ඇති හෙයින් වියලි දිනවල දිවා කාලයේ උෂ්ණත්වය ඉහල යාම හේතුවෙන් දිවා කාලයේදී වැඩකිරීම සහ ඇවිදීම වෙහෙසකර වේ.

### 4. විකල්ප ප්‍රවාහන ක්‍රම නොමැතිවීම

රත්නපුර නගරයට පිවිසිය හැකි එකම මාර්ගය ඒ 004 මාර්ගය වන අතර මෙම ප්‍රදේශයේ විශේෂිත වූ පිහිටීම හේතුවෙන් දුම්රිය මාර්ග, අධිවේගී මාර්ග, ගුවන්තොටුපොළ යනාදිය දැනට නොමැත.

### 5. ආපනශාලා සහ අවන්හල් අවම වීම

සාමාන්‍ය නගරයක් වාසයට සුදුසු බව හඳුනා ගැනීමේදී විවේකීව කාලය ගත කිරීමට පවත්නා ආපනශාලා සහ අවන්හල් සංඛ්‍යාව හොඳ නිර්ණායකයකි. බොහෝ ප්‍රධාන නගරවල සංචාරකයන් සහ ජනතාව අතර විවිධ ආකාරයෙන් ප්‍රසිද්ධියට පත් වූ අවන්හල් ඇති නමුත් රත්නපුර නගරයේ ඇත්තේ එවැනි අවන්හල් 5කට ආසන්න ප්‍රමාණයක් පමණක් වන අතර ඒවා තුළද මෙම ලක්ෂණය තවදුරටත් ප්‍රවර්ධනය විය යුතු මට්ටමේ පවතී. (පීසා හට්, KFC, කැලේ කඩේ, P & S, රත්නාලෝක).

### 6. *රත්නපුර නගරයේ සංස්කෘතික හා ඓතිහාසික උරුමයන් ප්‍රවර්ධනය අඩු වීම*

රත්නපුර නගරයට සමන් දෙවියන් හා සබැඳුණ ශක්තිමත් සංස්කෘතික පදනමක් ඇත. අගෝස්තු මාසයේ සමන් දේවාලයේ පෙරහැර ඇරඹීම සමග නගරය ජනාකීර්ණ වේ. මේ හැර නගරය ස්වකීය සංස්කෘතික හා ඓතිහාසික උරුමයන් කිසිවක් වර්තමානයේදී ප්‍රවර්ධනය කර නැත. එසේම මෙම නගරයට ජාතික කෞතුකාගාරයක් සහ පුස්තකාල 02 ක් පැවතිය ද එම ස්ථානවල ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහ සෞන්දර්යාත්මක සුන්දරත්වයක් නොමැත.

### 7. *ක්‍රියාශීලි සහ අනෙකුත් විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා ප්‍රදේශ අඩුවීම*

රත්නපුර නගරය තුළ වර්ග කිලෝ මිටර් 0.066 ක භූමි භාගයක් විනෝද කටයුතු සඳහා වෙන්කර තිබුණද මේ වන විට එය සම්පුර්ණයෙන් ම භාවිත කොට නොමැත. එසේම අනවසර පදිංචිකරුවන් විසින් කලු ගං ඉවුරේ ඇති ළමා උද්‍යානය අත්පත් කරගෙන ඇති අතර ඇහැලේපොළ කෞතුකාගාර භූමියේ ඇති අලංකාරවත් බවටද ගංවතුර හේතුවෙන් වාර්ෂිකව හානි සිදුවීම රත්නපුර නගරයට අවාසිදායක තත්ත්වයකි.

## **අවස්ථා** | අරමුණ 03

### 1. *යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සහ විකල්ප මාර්ගය*

යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට පැල්මඩුල්ල දක්වා කිලෝ මීටර් 73.9 ක් වන අතර එමගින් කොළඹ නගරය හා රත්නපුර නගරය අතර ගමන් කාලය විනාඩි 45 ක් දක්වා අඩුවේ. මෙමඟින්, මෙම නගර දෙක අතර මනා සම්බන්ධතාවක් ඇති කරනු ඇති අතර, රත්නපුර නගරයට ප්‍රවේශ වීමේ හැකියාව වැඩිකර, ගමන් කාලය අඩු කරනු ඇත. එබැවින් මෙම යෝජිත රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හා විකල්ප මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හරහා දේශීය හා විදේශීය සංචාරකයින්ට පහසුකම් රැසක් අත්වනු ඇත. යෝජිත විකල්ප මාර්ගය උසාවි හන්දියේ සිට වරකාතොට පාලම දක්වා කිලෝමීටර් 3.5 ක් වූ මංතීරු 4 කින් සමන්විත මාර්ගයකි. මෙම විකල්ප මාර්ගය, නගරය මගහරිමින් දිවෙන ආකාරයට කණු මත ඉදිකිරීමට බලාපොරොත්තු වන බැවින් එය ගංවතුර හානිය මගහැරීමට හේතුවේ. එසේම මෙම මාර්ගය ගංවතුර සමයේදී රත්නපුර නගරයට ඇති ප්‍රධාන සම්බන්ධිත මාර්ගය ලෙස භාවිත කල හැක.

## **තර්ජන** | අරමුණ 03



### 1. *ගංවතුර*

රත්නපුර නගරය වාර්ෂිකව ගංවතුර ආපදාවට ලක්වන අතර මෙම තත්ත්වය හේතුවෙන් දිගු කාලීනව රජයේ සහනාධාර මත යැපෙන ප්‍රජාවක් ඇති කරයි. (වැඩි විස්තර සඳහා නෙවන පරිච්ඡේදය බලන්න) රත්නපුර නගරය යනු සබරගමු පළාතේ සැපයුම් දාමයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයයි. එසේම රත්නපුර නගරයේ වාණිජ කටයුතු පිළිබඳ සැලකීමේදී සිල්ලර සහ තොග වෙලඳ කටයුතු ප්‍රධාන ස්ථානයක් ගනී. කඩ සාප්පු 700 ක් පමණ නගර සභාව තුළ ලියාපදිංචි වී ඇති අතර වාර්ෂිකව ගංවතුරින් මෙම වෙළඳසැල්වලින් 80% කට පමණ බලපෑම් ඇති කරයි. සැලසුම් ප්‍රදේශයේ සිටින ජනගහනයෙන් 70,000 ක් පමණ මෙම ප්‍රධාන සැපයුම් මධ්‍යස්ථානය මත යැපෙයි. ගංවතුරෙන් ප්‍රදේශයේ ජල සැපයුමට වාර්ෂිකව හානි සිදුවෙන අතර පළාත් පාලන ආයතන සහ ප්‍රදේශීය මට්ටමේ ආයතන වලට සැපයුම් ක්‍රියාදාමය නැවත විධිමත් කිරීමට සහ පරිසරය පිරිසිදු කිරීමට අමතර මුදලක් වය කිරීමට සිදුවේ. වාසයට සුදුසු තිරසර නගරයක් බිහිකිරීමෙහිලා මෙම තත්ත්වය ඉතාම අවාසිදායක වේ.

පරිච්ඡේදය 06



# සැලැස්ම

# 6.1. සංකල්පිත සැලැස්ම

2030 වසරේ දී රත්නපුර නගරය හරිත වර්ණ මැණික් පුරවරයක් බවට පත් කිරීමේ දැක්ම පෙරදැරි කරගත් රත්නපුර සංවර්ධන සැලැස්මේ සංකල්පය නිල් ආරනුල් මැණිකයි. රත්නපුරය මැණික් සඳහා ප්‍රසිද්ධ ජලයෙන් වටවුන නගරයක් වන අතර මාර්ග හයකින් රත්නපුරයට ප්‍රවේශ විය හැක. මේ අනුව මාර්ග ජාලය සම්මිශ්‍රනය වූ රත්නපුර නගරයේ භෞතික පිහිටීම, ගුවනින් දකින විට නුල් හයකින් දිස්වන ආරනුලට සමාන කල හැකිය. මෙම පසුබිමට අදාළව රත්නපුර නගරයේ ජල අනන්‍යතාවය නිල් පැහැයෙනුත් භෞතික පිහිටීමේ අනන්‍යතාවය ආරනුල් මැණිකක් වශයෙන් පදනම් කරගනිමින් සැලසුම් සංකල්පය ලෙස නිල් ආරනුල ඉස්මතු කරගෙන ඇත.



***රූප සටහන් අංක 6.1 :*** *නිල් ආරනූල සංකල්පය*

නිල් ආරනුලට විශේෂිතවූ මූලික ලක්ෂණ තුනක් තිබේ. පළමුවැන්න එය හඳුනාගත හැකි වන්නේ ඒ සඳහා යෝග්‍ය පරිසරය සැකසුනු අවස්ථාවේදී ය. දෙවැන්න නම් පුහුණුව ලත් හා පළපුරුදු බව මත මැණික් ගල නිසි පරිදි කැපු විට පමණක් මැණිකේ නියම වටිනාකම ලබාගත හැක. එසේම මෙම මැණික වර්ණ ස්ථර සහ රේඛා ස්ථරය ලෙස ස්ථර දෙකකින් සමන්විත වන අතර ස්ථර දෙකම තියුණු හා ඝන වන විට මැණිකේ වටිනාකම වැඩි වේ.

ඉහත සාධක තුන සැලකිල්ලට ගනිමින්, අනාගතයේදී රත්නපුර නගරයේ මැණික් අනන්‍යතාවය ඉස්මතු වන සේ ඒ සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීමත්, විවිධ තාක්ෂණික උපක්‍රම උපයෝගී කොටගත් කළාපිකරණ සැලැස්මක් මගින් අනාගත සංවර්ධනය නිසි ලෙස දිශානුගත කිරීමත්, ස්ථර දෙකක් මත සැලසුම් කර ඇති සංවර්ධන සැලැස්මක් මගින් රත්නපුර නගර සංවර්ධනය කිරීම උදෙසා මූලික ස්ථර ද්විත්වයක් හඳුනාගැනීම හා එය සවිමත් කිරීම තුළින් නාගරික වටිනාකම වැඩි දියුණු කිරීමත් මෙම සැලසුම් සංකල්පය පසුබිමේ ඇත. ඒ අනුව ගුණාංග හයකින් සමන්විත අභ්‍යන්තර ස්ථරයත් සහ නීල හරිත වර්ණයෙන් සමන්විත වූ බාහිර ස්ථරයත් ක්‍රමිකව නිර්මාණය කිරීම දිගුකාලීන අරමුණයි.




***රූප සටහන් අංක6.2 :*** *සංවර්ධන සැලැස්මේ සංකල්පය*

නාගරික සැලැස්මට අනුව කලාපීකරණ රෙගුලාසි සහ උපාය මාර්ගික ඉඩම් පරිහරණ සැලසුම් මගින් 2030 වසර වන විට රත්නපුර නගරයේ සංවර්ධන දිශානතිය ප්‍රධාන  කලාප හයක් වෙත යොමු කෙරෙනු ඇත. ඒ සඳහා උපායමාර්ගික ව්‍යාපෘති ද සැලසුම මගින් හඳුනාගෙන  ඇත. වසර 2030 වනවිට නිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමේ අරමුණ ඇතිව පරිපාලන, වාණිජ, නේවාසික, සෞඛ්‍ය, විනෝදාත්මක සහ වාණිජ කටයුතු ව්‍යාප්තියේ  ප්‍රවණතාවය නගර මධ්‍යයේ සිට වඩාත් සුදුසු ප්‍රදේශ වෙත යොමු කරනු ලැබේ.

ඒ අනුව, වන ආවරණය සහ ගංගා ඇළ දොළ උපයෝගී කරගනිමින් නගරයෙන් පිටත හරිත හා නීල වර්ණය සවිමත් කිරීමත් නගර අභ්‍යන්තරය ගුණාංග හයක් යටතේ අනාගතයේදී අනෙකුත් නගර අතර කැපී පෙනෙන  මැණික් පුරවරයක් ලෙස ශක්තිමත් කිරීමත් අපේක්ෂා කෙරෙන අතර එම ගුණාංග පහත පරිදි වේ.

1. සුවපහසු ගමනාගමනය හරහා ස්ථානීය සම්බන්ධතා වැඩි කිරීම.
2. මැණික් කර්මාන්තය ප්‍රවර්ධනය තුලින් අනන්‍යතාවය වැඩිදියුණු කිරීම.
3. ස්වාභාවික උපද්‍රව සඳහා ඔරොත්තු දීම තුලින් පරිසරයට  අනුගතවීම වැඩිදියුණු කිරීම.
4. විවිධාංගිකරණය වූ  ආර්ථික කටයුතු හරහා  ඉපයීම් අවස්ථාවන් වැඩිදියුණු කිරීම.
5. පොදු ස්ථාන ඇතිකිරීම තුලින් නාගරිකයන්ගේ  ජීවන තත්වය ඉහළ නැංවීම.
6. නීල හරිත ජාලයක් නිර්මාණය කිරීම තුලින් නාගරික අලංකාරය වැඩිදියුණු කිරීම.

එහෙයින් නිල් ආරනුල සංකල්පය මත පදනම් වෙමින් විවිධ උපායමාර්ගයන් තුළින් රත්නපුර නගරය අනාගතයේදී ශ්‍රී ලංකාවේ ප්‍රධානතම මැණික් නගරය ලෙස දිදුලවීමට මෙම සංවර්ධන සැලැස්මේදී අවධානය යොමු කර ඇත.

06 පරිච්ඡේදය
සැලැස්ම

යෝජිත ඉඩම්
පරිහරණ සැලසුම

# 6.2. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණයට අනුව රත්නපුර නගරයේ සංවර්ධනය කුරුවිට සහ පැල්මඩුල්ල ඔස්සේ තවදුරටත් ව්‍යාප්ත වන බව පැහැදිලිවන අතර නවතම ප්‍රවණතාවය වන්නේ වෙරලුප සහ බටුගෙදර මංසන්ධි දෙක කුඩා නගර වශයෙන් වර්ධනය වීමයි. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සහ විකල්ප මාර්ගය හේතුවෙන් අනාගතයේදී මෙම කුඩා මංසන්ධි වේගවත් සංවර්ධනයක් කරා යොමු වනු ඇත. එසේම භූමි පරිහරණ සැලැස්ම සකස් කිරීමේදී මෙම නිම්නයේ පවතින ස්වභාවික උපද්‍රව වලට ගොදුරුවීමට ඇති හැකියාව, සංවර්ධනය කළහැකි ඉඩම් හිඟ බව, ඉහල සංසරණ ජනගහනය, සහ බලපෑ හැකි අනෙකුත් සාධක සැලකිල්ලට ගන්නා ලදී.

- *උපක්‍රම 6.2.1*
  *පවත්නා භාවිතයන් සහ ප්‍රවර්ධනය කරනු ලබන භාවිතයන්ට පහසු වීමට හා ඒ සඳහා පහසුකම් සැලසීමේ පහසුව උදෙසා එම ක්‍රියාකාරකම් එක් එක් කලාපයට වෙන් වෙන්ව කේන්ද්‍රගත කිරීම*

- *උපක්‍රම 6.2.2.*
  *සංවර්ධන ප්‍රවණතා පදනම් කරගනිමින් නගරයේ වාණිජ කටයුතු වල පීඩනය කුරුවිට හා පැල්මඩුල්ල දිසාවන්ට යොමු කිරීම*

- *උපක්‍රම 6.2.3.*
  *සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සහ නාගරික ප්‍රජාවගේ යහපැවැත්ම උදෙසා ජල සංරක්ෂණ ප්‍රදේශ (ජලය රඳවා තබා ගත යුතු ප්‍රදේශ) විවේක හා විනෝද කටයුතු උදෙසා පරිවර්තනය කිරීම*

- *උපක්‍රම 6.2.4.*
  *නගර මධ්‍යය පරිසරය මැණික් වෙළඳාම ආශ්‍රිත කටයුතු සඳහා පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කිරීම*

ඒ අනුව රත්නපුර වෙළඳ නගරය, ප්‍රසන්න සුවදායී පරිසරයකින් සමන්විත නවාතැන් පහසුකම්, අවන්හල් පහසුකම් සහ සුමට ප්‍රවාහන ජාලයකින් යුත් නගරයක් බවට පරිවර්තනය වන අතර සංචාරක කර්මාන්තය හා සබැඳිව පාරම්පරික මැණික් වෙළඳපොළට ලබාදෙන නව අවස්ථා මගින් ජාතික මැණික් මධ්‍යස්ථානය බවට පත්කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, රත්නපුර නව නගරය පළාත් පරිපාලන අග නගරය ලෙස තවදුරටත් දියුණු කෙරෙන අතර එම සේවා ලබාගන්නා ප්‍රජාව මෙන්ම එම සේවා ලබාදෙන වෘත්තිකයන්ගේ පහසුව උදෙසා ද අවශ්‍ය පහසුකම් ලබා දෙනු ඇත.

මෙම නගර ද්විත්වය අතර මේ වනවිට පැහැදිලි සබඳතාවක් නොපෙනෙන බැවින් ඒ අතර කොටස විවේක හා විනෝද කටයුතු සඳහා පරිවර්තනය කරමින් ඒ තුළින් නගර ද්විත්වය අතර ඇසට පෙනෙන සබඳතාවක් ගොඩනැගීම මෙහි එක් අරමුණක් වන අතර රත්නපුරය, අධ්‍යාපන, සෞඛ්‍ය, අධිකරණ ආදී ලෙස විවිධ සේවා සඳහා සබරගමුව පළාතටම අදාළව ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරන බැවින් එම සේවාවන් එක් එක් කලාපයට කේන්ද්‍රගත කර පහසුකම් සැපයීම මෙම ඉඩම් පරිහරණ සැලැස්මේ තවත් අරමුණකි.

රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමෙන් අනතුරුව රත්නපුරයේ සිට ලංකාවේ ප්‍රධාන වෙළඳ නගරයට (කොළඹ) ඉතාමත් කෙටි කාලයකදී ළඟා වීමට හැකි වන අතර එම කාලය A 004 මාර්ගයේ ගමන් ගැනීමට සිදුවන කාලයට වඩා තෙගුණයකින් අවම වේ. එසේම කළු ගඟ ප්‍රවාහන මාධ්‍යයක් වශයෙන් සංචාරක ව්‍යාපාරය සඳහා භාවිත කිරීමට සැලසුම් කිරීමත් රත්නපුර වෙළඳ නගරය හා නව නගරය අතර යෝජිත වෙරළුප වැව මතට (මුහුදු) ගුවන් යානා ගොඩබැස්සවීමට සැලසුම් කර තිබීමත් හේතුවෙන් අනාගත රත්නපුර නගරය තවදුරටත් හුදකලා නගරයක් නොවනු ඇත.




***සිතියම් අංක 6.2.1 :*** *භූමි පරිහරණ සිතියම (2017)*




**සිතියම් අංක 6.2.2 :** *යෝජිත භූමි පරිහරණ සිතියම (2030)*




***රූප සටහන් අංක 6.2.1 :*** *දැනට පවතින අහස් රේඛාව - 2018*




***රූප සටහන් අංක 6.2.2 :*** *යෝජිත අහස් රේඛාව - 2030*

# 6.3. භෞතික හා සමාජයීය අපරව්‍යූහ පහසුකම් සංවර්ධන උපායමාර්ග

## 6.3.1. සේවා සැලැස්ම

### 6.3.1.1. නේවාසික පහසුකම්

රත්නපුර නගර සැලැස්මට අයත් ඉතාමත් වැදගත් අංගයක් වන්නේ නාගරිකයන්ගේ නිවාස ඉදිකිරීම උදෙසා වාසයට සුදුසු පරිසරයන් හඳුනාගැනීම සහ සුදුසු පරිදි නිවාස ව්‍යාපෘති යෝජනා කිරීමයි. රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල දත්තයන් පදනම් කරගෙන නාගරික සංවර්ධන අධිකාරිය ගණනය කළ දත්තයන්ට අනුව මහා නගර සභා ප්‍රදේශයේ 2017 වසරේ දී මුළු නිවාස සංඛ්‍යාව 10603 කි. ඒවායින් 79.4% ක් ස්ථිර නිවාස වන අතර 19.5% ක් අර්ධ ස්ථිර නිවාස ද, 1.4% ක් තාවකාලික නිවාස ද වේ.

තාවකාලික නිවාස වලින් 50% ක් පිහිටා ඇත්තේ කොස්පැලවින්න , සහ මුද්දුව ප්‍රදේශවල ඇති දුම්රිය මාර්ග රක්ෂිත සහ ගංගා රක්ෂිතවලය. 50% ක් අර්ධ ස්ථිර නිවාස සමන් පෙදෙස, නව නගරය, සහ සමගිපුර ප්‍රදේශයේ ඇති රජය සතු ඉඩම් වලය. මේවයේ ඉඩම් හිමිකමක් නැති අඩු අදායම් ලාභීන් ජීවත් වේ. (මූලාශ්‍රය: සම්පත් පැතිකඩ – රත්නපුර 2017)

අපරව්‍යූහ පහසුකම් සඳහා ඇති පහසු ප්‍රවේශකත්වය හේතුවෙන් නගර මධ්‍යයට ආසන්නයේ ඉහළ ජන ඝණත්වයක් දැකිය හැකි වන අතර එහිදී නාගරිකයන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව වන්නේ මෙම ප්‍රදේශය නිරතුරුවම ස්වභාවික උවදුරු වලට ලක්වීම යි. එහෙයින් අධික වැසි කාලයේදී මෙම ප්‍රදේශය නිරතුරුවම ගංවතුර සහ නායයෑම් වලට මුහුණ දෙන හෙයින් ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා වැඩි නවාතැන් ප්‍රමාණයක් අවශ්‍ය වේ.

| වර්ෂය | ජනගහනය | නිවාස සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | නිවාස හිඟය |
|---|---|---|---|---|
| 2011 | 49085 | 9864 | 10908 | 14298 |
| 2016 | 52520 | 10603 | 11671 | 1068 |
| 2021 | 56197 | 11398 | 12488 | 1089 |
| 2026 | 59131 | 12253 | 13362 | 1109 |
| 2030 | 62604 | 13171 | 14298 | 1127 |

***වගු අංක 6.3.1.1 :*** *නිවාස පිළිබඳ තත්වය*
***මූලාශ්‍රය :*** *ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012 දත්ත පදනම් කරගෙන නාගරික සංවර්ධන අධිකාරිය විසින් කරන ලද ප්‍රක්ෂේපණය*




**සිතියම් අංක 6.3.1.1.1 :** *නිවාස ඝණත්වය*

ඉහතින් දැක්වෙන නිවාස හිඟය ගණනය කිරීමේදී පහත දැක්වෙන උපකල්පනයන් කරන ලදී.

- ජනගහන වර්ධන අනුපාතය 1.5
- පවුලක ජීවත්වන සාමාජිකයන් සංඛ්‍යාව 4
- වාර්ෂික නිවාස වර්ධන අනුපාතය 4.5
- වාර්ෂික නිවාස ක්ෂය වීම 1%

වර්තමාන නිවාස සංඛ්‍යාවෙන් 1944 ක් අර්ධ ස්ථිර නිවාස වන අතර ඒවායෙන් 986 ක් එම ස්ථානවලම සංවර්ධනය කල හැක. තාවකාලික නිවාස වලින් 249 ක් පිහිට ඇත්තේ ගංවතුරට යටවන ප්‍රදේශ වල වන අතර මෙම ප්‍රමාණය සෑම වසරකම නැවත ප්‍රතිසංස්කරණය යුතු ප්‍රමාණය වශයෙන් නිවාස හිඟයට එකතුවේ. විශ්ලේෂණයන්ට අනුව 2030 වසර වනවිට අපේක්ෂිත නිවාස හිඟය 1127 ක් වේ.

- *උපක්‍රම 1.1*
  *මහා නගර සභා සීමාව තුල නව නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘති*

  1. ගල්කඩුවත්ත – මධ්‍යම පාංතික ආදායම් නිවාස ව්‍යාපෘතිය (එකක 400)
  2. මුවගමුව (කොලින් ක්‍රෙසන්ට්) – මධ්‍යම පාංතික ආදායම් නිවාස ව්‍යාපෘතිය (එකක 200)
  3. නව නගරය – රාජ්‍යය නිලධාරීන් සඳහා කුලී පදනම මත ඉදිකරන ස්ටුඩියෝ මාදිලියේ මහල් නිවාස සංකීර්ණය (එකක 200)
  4. හිදැල්ලන – අක්කර 33 ක්වූ නිවාස ව්‍යාපෘතිය (එකක 250)

- *උපක්‍රම 1.2*
  *මහනගර සීමාවෙන් බාහිර නව නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති*

  1. මහවල – ඉහල ආදායම් නිවාස ව්‍යාපෘතිය (ඒකක 200)
  2. කහංගම – අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (ඒකක 200)



*සිතියම් අංක 6.3.1.1.2 : වාසය කිරීමට වඩා සුදුසු ප්‍රදේශ*




***සිතියම් අංක 6.3.1.1.3 : යෝජිත නිවාස ව්‍යාපෘති***

## 6.3.1.2. අධ්‍යාපන පහසුකම්



අධ්‍යාපන පහසුකම් සැලකීමේදී 2017 වසරේ දී රත්නපුර මහා නගර සභා ප්‍රදේශයේ පාසල්වල මුළු සිසුන් සංඛ්‍යාව 24,705 ක් වූ අතර ගුරුවරුන් සංඛ්‍යාව 1074 කි. මෙම සිසුන්ගෙන් 17258 ක් (40%) නගර මධ්‍යයේ ඇති පාසල්වල අධ්‍යාපනය ලැබූ අතර දිනකට සිසුන් 8000 ක් පමණ අමතර පන්ති සඳහා නගරයට පැමිණ ඇත. මෙහි විශේෂත්වය වන්නේ මෙම පාසැල් සහ අමතර පන්ති තුළින් අධ්‍යාපනය ලබා ගැනීමට පැමිණෙන පිරිස සමස්ථ රත්නපුර දිස්ත්‍රික්කයම නියෝජනය කරමින් පැමිණීමයි.




*රූප සටහන් අංක 6.3.1.2.1 : ශිෂ්‍ය ව්‍යාප්තිය*
*මූලාශ්‍රය : අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දත්ත පදනම් කොටගෙන නාගරික සංවර්ධන අධිකාරිය කරන ලද විශ්ලේෂණය*

කි.මී එකක වපසරියක් තුළ ප්‍රාථමික අධ්‍යාපනය ලබාගැනීමට පාසැල් නොමැති නම් හා කි.මී. තුනක වපසරිය තුළ ද්විතීයික අධ්‍යාපනය ලබා ගැනීමට පාසැල් නොමැති නම් එම ප්‍රදේශ සඳහා නව පාසැල් ගොඩනැගිය යුතු වන අතර ප්‍රමාණවත් පහසුකම් නොමැති පාසල් පරිශ්‍රයන් වෙනත් ස්ථාන වල ස්ථාපිත කිරීම උදෙසා සුදුසු ස්ථාන හඳුනාගත යුතුය. ඒ අනුව නගර මධ්‍යය තුළ පිහිටා ඇති පාසැල් බහුතරයක නිදහස් සුවපහසු අධ්‍යාපනයක් හිමිකර ගැනීමට අවකාශ නොමැති බව හඳුනා ගන්නා ලදි.

ඉහත සාධක පදනම් කරගෙන පාසල් වල අනාගත වැඩිදියුණු කිරීම් හා ළමුන්ගේ සුවපහසුව උදෙසා සිසුන් 6633 ක් අධ්‍යාපනය ලබන පාසල් හතරක් අනාගතයේදී සම්පූර්ණව හෝ අර්ධ වශයෙන් වෙනත් ප්‍රදේශයන් වල ස්ථාපිත කලයුතු බව හඳුනාගෙන ඇත. එම පාසැල් පහත පරිදි වේ.

- ශාන්ත ඇලෝසියස් පිරිමි පාසැල
- ශාන්ත ලූකස් පාසැල
- ධර්මපාල විද්‍යාලය
- මිහිඳු විද්‍යාලය




***රූප සටහන් අංක 6.3.1.2.2 :*** *නගර මධ්‍යයේ ශිෂ්‍ය ජනගහනයේ ව්‍යාප්තිය*
***මූලාශ්‍රය :*** *අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දත්ත පදනම් කොටගෙන නාගරික සංවර්ධන අධිකාරිය කරන ලද විශ්ලේෂණය*

## තෘතීයික අධ්‍යාපනය

මැණික් පුරවරය පිළිබඳ දැක්ම ලඟා කරගැනීමේදී තෘතියික අධ්‍යාපන පහසුකම් දියුණුකිරීම අත්‍යවශ්‍ය වේ. ආර්ථික තරඟයට මුහුණ දීමේදී අධ්‍යාපනය මත පදනම්වූ ආර්ථිකයක් ඇතිකළ යුතු වන අතර මෙහි මූලික සාධකය වන්නේ තෘතීයික අධ්‍යාපනය දියුණු කිරීමයි. නව නගරය මුල් කරගෙන පාසල් හැරගිය සිසුනට තෘතීයික අධ්‍යාපන ලබාදීමට කාර්මික විද්‍යාලය, හෝටල් පාසල, ජාතික ආධුනිකත්ව සහ කාර්මික සංවර්ධන අධිකාරිය, විවෘත විශ්ව විද්‍යාලය සහ තෘතියික අධ්‍යාපනය ලබාදෙන අනෙකුත් ආයතන මේ වනවිටත් ස්ථාපනය කර ඇති අතර එම ආයතන මගින් සබරගමුව පළාතටම පහසුකම් සපයනු ලබයි. මීට අමතරව සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය රත්නපුර මූලික රෝහල් පරිශ්‍රයට ආසන්නව ස්ථානගත වේ.

මැණික් පිළිබඳව අධ්‍යයනය කිරීමට අවශ්‍ය පිරිසට හා එම කර්මාන්තයට විධිමත් අධ්‍යාපනයක් සහිතව පිවිසීමට කැමති ආධුනිකයින්ට ඒ සඳහා විධිමත් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාවයක් ඇති අතර හිදැල්ලන පිහිටා ඇති වර්තමාන මැණික් පුහුණු මධ්‍යස්ථානය මේ සඳහා යොදා ගත හැකි වේ. මීට අමතරව ජාත්‍යන්තර තලයේ මැණික් අධ්‍යයන විශ්ව විද්‍යාලයක් පිහිටු වීමට මෙන්ම වැඩිදුර අධ්‍යයන කටයුතු සඳහා අධ්‍යාපන ආයතන ගොඩනැගීමට සුදුසු පරිසරයන් මහවලවත්ත ආශ්‍රිතව මෙම සැලසුමෙන් හඳුනා ගෙන ඇත. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථානය වෙරළුප ස්ථානගත වන බැවින් හා යෝජිත විකල්ප මාර්ගය එයට සම්බන්ධ වන බැවින් මෙම යෝජිත ස්ථාන සඳහා ප්‍රවේශ වීම පහසු වේ.

- *උපක්‍රම 2.1*
  *පාසල් සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම*

    1. යෝජිත තිරිවානකැටිය පාසැල – සිසුන් 4000
    2. යෝජිත නව නගරයේ පාසැල – සිසුන් 4000
    3. යෝජිත මහවලවත්ත පාසැල – සිසුන් 2000




***සිතියම් අංක 6.3.1.2.1 :*** *පවත්නා අධ්‍යාපන පහසුකම්*



***සිතියම් අංක 6.3.1.2.2 : යෝජිත අධ්‍යාපන පහසුකම්***

- *උපක්‍රම 2.2*
  *මැණික් අධ්‍යාපන ආයතනය සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම*

  1. මහවලවත්ත ප්‍රදේශය

## 6.3.1.3. සෞඛ්‍ය පහසුකම්

රත්නපුර පළාත් මහා රෝහල පදනම් කරගෙන සෞඛ්‍යය පහසුකම් සංවර්ධනය වී ඇත. වර්ෂ 2003 ට සාපේක්ෂව රෝගීන්ගේ සංඛ්‍යාව 100,000 වඩා වැඩිවී ඇති අතර රත්නපුර පළාත් මූලික රෝහල ට අදාළව පවත්නා පහසුකම් පහත පරිදි වේ.

| වර්ෂය | ඇඳන් සංඛ්‍යාව | රෝගීන් සංඛ්‍යාව | රෝගීන් ඇඳන් අනුපාතය (දෛනික) | බාහිර රෝගීන් (දෛනික) | වෛද්‍ය වරු | වෛද්‍ය වරු රෝගී අනුපාතය | විශේෂඥ වෛද්‍ය වරු | හෙද / හෙදියන් | අනෙක් සේවකයන් | දිනකට සායනයන්ට එන රෝගීන් | රෝගී ඇඳන් අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| *2016* | *1057* | *116749* | *1.2:1* | *924* | *207* | *1:1.3* | *32* | *674* | *945* | *1112* | *82%* |
| *2006* | *964* | *1600* | *1:7* | *2100* | *142* | *11:3* | *20* | *366* | *575* | - | - |

***වගු අංක 6.3.1.3 :*** *රත්නපුර පළාත් මූලික රෝහල - පහසුකම් සහ සේවක සංයුතිය 2017*
***මූලාශ්‍රය :*** *රත්නපුර මහා රෝහල*

මීට අමතරව සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය රත්නපුර මූලික රෝහලට අනුබද්ධව පිහිටුවා ඇති බැවින් 2019 වසරේ ජනවාරි මස පටන් රත්නපුර මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් වී ඇත. නගර වැසියන්ට සේවය සැලසීමට පෞද්ගලික රෝහල් හතරක්, ආයුර්වේද රෝහලක් සහ අක්ෂි රෝහලක් ද රත්නපුරයේ පිහිටා ඇත. මෙම රෝහල් අතුරින් රත්නපුර මහ රෝහල සහ පෞද්ගලික රෝහල් තුනක් රෝහල මංසන්ධිය කේන්ද්‍ර කොටගෙන පිහිටා ඇති අතර රසායනාගාර සේවා ඇතුළු විවිධ අත්‍යාවශ්‍ය සෞඛ්‍ය පහසුකම් රැසක් එම ප්‍රදේශය ආශ්‍රිතව ලබා ගත හැකි වේ.

- *උපක්‍රම 3.1*
  *සෞඛ්‍යය සේවාවන් එක් ස්ථානයකට කේන්ද්‍රගත කිරීම*

රෝහල් මංසන්ධියට ආසන්නව සෞඛ්‍ය කටයුතු බොහොමයක් ස්ථානගතව පවතින බැවින් ඊට අදාළ පහසුකම් තවදුරටත් එම ප්‍රදේශය මූලික කරගනිමින් ඒකරාශී වීමට නගර සැලසුම තුළින් පහසුකම් සපයා ඇත. එම සංවර්ධන ප්‍රවණතා ප්‍රවර්ධනයට හා නියාමනයට ද රෙගුලාසි මගින් කටයුතු යොදා ඇත. එමෙන්ම මෙම ප්‍රදේශය ආශ්‍රිතව ගොඩනැගීමට යෝජිත වෙරළුප වැව හේතුවෙන් සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට පැමිණෙන පිරිසට සහ එම පිරිස හේතුවෙන් මෙම ප්‍රදේශයට පැමිණෙන හිතවතුන්ට අවශ්‍ය මානසික සුවය ලැබෙනු ඇතැයි ද අපේක්ෂා කෙරෙයි.




**සිතියම් අංක 6.3.1.3.1 :** *සෞඛ්‍ය පහසුකම්*

## 6.3.1.4. පරිපාලන සේවා පහසුකම්

රත්නපුර නගරයේ සංසරණ ජනගහනය, නේවාසික ජනගහනයට සාපේක්ෂව අධික වේ. ඒ සඳහා එක් ප්‍රධානතම හේතුවක් වන්නේ එය සබරගමුව පළාතේ පරිපාලන අග නගරය වීමයි. එම කටයුතු නව නගරය වෙත කේන්ද්‍ර වී පැවතියද වෙළඳ නගරය තුළද ඇතැම් පරිපාලන කටයුතු තවමත් සිදු වෙමින් පවතී. එහෙයින් සියලු පරිපාලන කටයුතු නව නගරය තුළම ස්ථාපනය කිරීමටත් ඒවාට අදාළ පහසුකම් ඒ වෙනට තවදුරටත් ලබාදීමටත් අදාළ කටයුතු මෙම නාගරික සැලසුමෙන් සිදු වේ.

- *උපක්‍රම 4.1*
  *නව පරිපාලන සංකීර්ණයක් ස්ථාපිත කිරීම*

    - නව නගරය – උසාවිය මංසන්ධිය අසළ



***සිතියම් අංක 6.3.1.4.1 :*** *පරිපාලන සේවාවන්*

## 6.3.2. ප්‍රවාහන සේවා සැලැස්ම

රත්නපුරය දිස්ත්‍රික්ක නමයකින් වටවී තිබීම එක් සුවිශේෂී කරුණකි. එබැවින් බස්නාහිර පළාත (කොළඹ–පානදුර ප්‍රදේශ) හා ඌව පළාතත් (බදුල්ල ප්‍රදේශය) නැගෙනහිර පළාතත් (මඩකලපුව ප්‍රදේශය) රට අභ්‍යන්තරයෙන් දකුණු පළාතත් (හම්බන්තොට ප්‍රදේශය) සම්බන්ධ වන අභ්‍යන්තර මාර්ග පද්ධතියේ කේන්ද්‍රස්ථානයක රත්නපුර නගරය පිහිටා ඇති බැවින් නගරය හරහා දිවෙන ප්‍රවාහන ජාලය පහසුවෙන් ගමන් කළහැකි සුමට ප්‍රවාහයක් විය යුතුය. නමුත් නගරයේ භූගෝලීය පිහිටීමත් සේවා නිසි පරිදි ස්ථානගත වී නොතිබීමත් හේතුවෙන් මෙම අපේක්ෂිත සුමට බව නගරයට හිමි වී නොමැත.

**රථවාහන තදබදය සඳහා හේතු**

| | |
|---|---|
| A 004 මාර්ගය අවහිරවීම | • A 004 මාර්ගය නගරයට පිවිසීමේදී සහ පිටවීමේදී පාලම් දෙකක් තුළින් එය සිදුවීම (වරකාතොට පාලම සහ කටුගස් ඇළ පාලම - මොරගහ යට ආසන්නයේ)<br>• නගරයට පිවිසුමේදී සහ නගරයෙන් පිටවීමේදී එයට ආසන්නයෙන් ප්‍රධාන මාර්ගයට තවත් ප්‍රධාන මාර්ග සම්බන්ධ වීම (පානදුර පාර සහ මල්වල පාර) |
| අසංවිධිත සේවා සැකැස්ම | • නගර මධ්‍යයේ පිහිටි ප්‍රධාන පාසල් පහක් A 004 මාර්ගයට මුහුණලා පිහිටා තිබීම<br>• නගරය තුළ පවත්නා වාණිජ කටයුතු වල ව්‍යාප්තිය අසංවිධිත වීම |
| පවත්නා ප්‍රධාන බස් නැවතුම්පොළෙහි ධාරිතාවය ප්‍රමාණවත් නොවීම | • පැරණි දුම්රිය ස්ථානය ප්‍රධාන බස් නැවතුම්පොළ බවට පරිවර්තනය කිරීම<br>• බස් නැවතුම්පොළ පුළුල් කිරීම සඳහා සංවර්ධනය කළ හැකි අවකාශය අවම වීම<br>• බස්රථ බස් නැවතුම්පොළට ඇතුළුවීමේදී සහ පිටවීමේදී පදිකයන්ට අනතුරුදායී ලෙස එය සිදුවීම |
| විකල්ප මාර්ග ගැටළු | • නගරය මගහැර යාමට වෙනත් විකල්ප මාර්ග නොමැතිවීම.<br>• දැනට පවත්නා විකල්ප මාර්ග සංවර්ධනය වී නොමැතිවීම සහ අවම ධාරිතාවයකින් යුක්තවීම (වෙරළුප ගොඩවෙල මාර්ගයෙන් පිටරවුම් පාරට පිවිස මල්වල හංදියට යාමේ හැකියාව ඇත එහෙත් එහි ධාරිතාවය ප්‍රමාණවත් නොවේ) |
| රථ වාහන ගමනාගමන ගැටළු (Circulation Issues) | • මාර්ග පද්ධතියේ එක් දිශාවකට පමණක් ගමන් කළයුතු රථවාහන සැකැස්ම (One way System) හේතුවෙන් නගරය තුළ රථවාහන ගමන්වාර ප්‍රමාණය ඉහළ යාම<br>• ඔත්තේ - ඉරට්ටේ රථ වාහන නැවැත්වීම් ක්‍රම නිසිපරිදි සිදු නොවීම නිසා ප්‍රවාහන දුෂ්කරතා මතුවීම |
| රථ ගාල් පහසුකම් ප්‍රමාණවත් නොවීම | • පවත්නා ගොඩනැගිලිවල රථගාල් සඳහා ප්‍රමාණවත් අවකාශ නොමැතිවීම<br>• නගර මධ්‍යය තුළ සංවර්ධනය කළ හැකි අවකාශය අවම වීම |

***රූප සටහන් අංක 6.3.2.1 :*** *මාර්ග තදබදයට හේතු*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*




***රූප සටහන් අංක 6.3.2.2 :*** *වර්තමාන බස් නැවතුම්පොළ*
***ඡායාරූපකරණය :*** *හසිනි ආටිගල, මාර්තු - 2018*

ඉහත ගැටලු විසඳීම හා මගහැරීම අරමුණු කරගනිමින් ප්‍රවාහන උපායමාර්ගය සැලසුම් කර ඇත.




*රූප සටහන් අංක : 6.3.2.3 : ප්‍රවාහන උපායමාර්ගය*

- ***උපක්‍රම 01***
  ***සම්බන්ධතාව වැඩි දියුණු කිරීම***

මෙම අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා රත්නපුර නගර සංවර්ධන සැලැස්මෙන් කලාපීකරණ රෙගුලාසි සහ විශේෂ ව්‍යාපෘති හඳුන්වාදී ඇත.

- *උපක්‍රම 1.1*
  *නව මාර්ග ඉදි කිරීම*

1. රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම
2. උසාවි මංසන්ධියේ සිට වරකාතොට පාලම දක්වා දිවෙන නව විකල්ප මාර්ගයක් ඉදිකිරීම
3. පට්ටිඹිවිට ප්‍රදේශය හරහා ගුඩ් ෂෙඩ් මාර්ගයේ සිට පල්ලිය පාර දක්වා වූ නව මාර්ගයක් ඉදි කිරීම.

- *උපක්‍රම 1.2*
  *මාර්ග සංවර්ධනය සහ ප්‍රතිසංස්කරණය කිරීම*

1. බටුගෙදර මංසන්ධියේ සිට කරපිංච මාර්ගය විකල්ප මාර්ගයක් වශයෙන් ප්‍රතිසංවර්ධනය කිරීම.

    - පලවන අදියර – බටුගෙදර මංසන්ධියේ සිට මුද්දුව මංසන්ධිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම.
    - දෙවන අදියර – බලිබත්ගොඩ පාලම හරහා මුද්දුව මංසන්ධියේ සිට පානදුර මාර්ගය දක්වා වූ මාර්ගය සංවර්ධනය කිරීම.
    - තුන්වන අදියර – පානදුර මාර්ගයේ සිට කොටම්බෙගාව හරහා  සමන් දේවාලය දක්වා වූ මාර්ගය වැඩිදියුණු කිරීම.
    - හතරවන අදියර – පානදුර මාර්ගයේ (සමන් දේවාලය අසල) සිට කරපිංච මංසන්ධිය දක්වා වූ මාර්ගය සංවර්ධනය කිරීම.

2. විකල්ප මාර්ගයක් වශයෙන් පැරණි දුම්රිය මාර්ගය ෆාම් ගාඩ්න් සිට පිටත වට රවුම් මාර්ගය දක්වා ප්‍රතිසංවර්ධනය කිරීම.
3. ප්‍රධාන මාවත පට්ටිම්විට ප්‍රදේශයේ සිට ප්‍රතිසංවර්ධනය කිරීම.
4. සේනානායක මාවතේ සිට කුඩුගල්වත්ත නොටුපොල දක්වා වූ මාර්ගය ප්‍රතිසංවර්ධනය කිරීම
5. ගොඩවෙල මාර්ගය ප්‍රතිසංවර්ධනය කිරීම.
6. රෝහලේ සිට සමන් පෙදෙස හරහා නව නගරය හරහා දිවෙන මාර්ගය විකල්ප මාර්ගයක් වශයෙන් සංවර්ධනය කිරීම.
7. දුම්රිය මාර්ගයේ සිට ගොඩවෙල මාර්ගය දක්වා වූ මාර්ගය වැඩිදියුණු කිරීම.
8. ගඟබඩ මාර්ගය වැඩිදියුණු කිරීම
9. පිටත වට රවුම් මාර්ගය විකල්ප මාර්ගයක් වශයෙන් වැඩිදියුණු කිරීම.
10. ඇතුලත වටරවුම් මාර්ගය විකල්ප මාර්ගයක් වශයෙන් වැඩිදියුණු කිරීම.
11. බේමානන්ද මාවතේ සිට ගිනිහිරිය දක්වා වූ මාර්ගය වැඩිදියුණු කිරීම

- *උපක්‍රම 1.3*
  *නව පාලම් ඉදිකිරීම සහ පවතින පාලම ප්‍රතිසංස්කරණය කිරීම*

1. බලිබත්ගොඩ මාර්ගය සහ පානදුර මාර්ගය සම්බන්ධ කරමින් බලිබත්ගොඩ පාලම ඉදිකිරීම
2. කුඩුගල්වත්ත පාලම ඉදිකිරීම.
3. සීවලී ක්‍රීඩාංගනය අසල පාලම ප්‍රතිසංස්කරණය කිරීම
4. නගරයට පිවිසෙන මාර්ග අසල තිබෙන පාලම් ප්‍රතිසංස්කරණය කිරීම

- *උපක්‍රම 1.4*
  *පයින් ගමන් කල හැකි මාර්ග වැඩි දියුණු කිරීම*

  - ඉන්දික හෝටලය අසල ඇති තදබදය මගහැරීමට පල්ලිය පාරේ සිට ප්‍රධාන බස්නැවතුම්පොල දක්වා උමං මාර්ගයක් ඉදිකිරීම.
  - පුළුගුපිටිය මංසන්ධියේ සිට ශාන්ත ලූකාස් මංසන්ධිය දක්වා මගී ගුවන් පාලමක් ඉදිකිරීම.
  - නගරය තුළ පවත්නා පටු මංමාවත් පදිකයන්ට හිතකර ලෙස සංවර්ධනය කිරීම සහ පරිසර හිතකාමී ක්‍රම ඒ සඳහා භාවිත කිරීම.




**සිතියම් අංක 6.3.2.1 :** *යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සහ විකල්ප මාර්ගය*

## 06 පරිච්ඡේදය
## සැලැස්ම

භෞතික හා සමාජයීය
අපරව්‍යූහ පහසුකම්
සංවර්ධන උපායමාර්ග

ප්‍රවාහන සේවා සැලැස්ම

- *උපක්‍රම 1.5*
  *ගඟ ආශ්‍රිත ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීම*

හඳුනාගත් ප්‍රදේශවල තොටුපොළවල් ඉදිකිරීම

*a. පළමන අදියර*

I. ප්‍රධාන තොටුපොල – සීවලී ක්‍රීඩාංගනය පිටුපස ළමා උද්‍යානය තොටුපොළකට යොදාගැනීම
II. සමන් දේවාලය අසල පාලම අසලින් නව තොටුපොළක් ඉදි කිරීම

*b. දෙවන අදියර*

I. වරකාතොට  පාලම අසල නව තොටුපොළක් ඉදිකිරීම

*c. තුන්වන අදියර*

I. කුඩුගල්වත්ත නව තොටුපොළක් ඉදිකිරීම
II. ආයුර්වේද කාර්යාලය අසළ නව තොටුපොළක් ඉදිකිරීම
III. කොටම්බෙගාව නව තොටුපොළක් ඉදිකිරීම




*රූප සටහන් අංක 6.3.2.4 : යෝජිත ගංගා තොටුපළවල්*

- *උපක්‍රම 2*
  *අවකාශ සංයුතිය නැවත සකස් කිරීම*

- *උපක්‍රම 2.1*
  *බස්නැවතුම්පොල සංවර්ධනය කිරීම*

    1. පැරණි නගරයේ ප්‍රධාන බස්නැවතුම්පොල සංවර්ධනය කිරීම
    2. පැරණි නගරයේ ප්‍රධාන බස් නැවතුම්පොලට අනුබද්ධ වාහන ගාල්කිරීමේ ස්ථානය සංවර්ධනය කිරීම
    3. නව නගරයේ නව බස් නැවතුම් පොලක් ඉදිකිරීම. (පැල්මඩුල්ල පෙදෙසට යන දුර ගමන් බස් රථ සඳහා)

- *උපක්‍රම 2.2*
  *රථ ගාල් කිරීමේ ස්ථාන සංවර්ධනය කිරීම*

    1. නගරයේ හඳුනාගත් ස්ථානවල වාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධනය කිරීම

        I. පොල්හුනුව පරිශ්‍රය – ගුඩ් ෂෙඩ් මාවත
        II. මහ නගර සභා රථගාල් පරිශ්‍රය, සීවලී ක්‍රීඩා පිටිය අසළ
        III. ආයුර්වේද කාර්යාල පරිශ්‍රය අසළ
        IV. නාගහමුත්තෙට්ටුව පරිශ්‍රය
        V. ලක්ශ්මි සිනමා ශාලා පරිශ්‍රයට යෝජිත වෙළඳ සංකීර්ණය තුළ
        VI. නගර මධ්‍යයට යෝජිත වෙළඳ සංකීර්ණය තුළ
        VII. තැපැල් කාර්යාල පරිශ්‍රය තුළ

- *උපක්‍රම 2.3*
  *කලාපීකරණ සැලැස්ම භරභා මධ්‍යම වාණිජ ප්‍රදේශයේ ඇති නොගැලපෙන භූමි භාවිතයන් වෙනත් සුදුසු ස්ථානවල ස්ථානගත කිරීම*

    1. කලාපිකරණ රෙගුලාසි අනුව කාර්යයන් ඒකරාශී කිරීම.




***රූප සටහන් අංක 6.3.2.5 :*** *යෝජිත රථගාල් ස්ථාන*




***සිතියම් අංක 6.3.2.2 :*** *යෝජිත ප්‍රවාහන සැලසුම*




**සිතියම් අංක 6.3.2.3 :** *යෝජිත සැලසුම් ප්‍රදේශයේ මාර්ග සම්බන්ධතාවයේ වර්තමාන තත්වය (2018)*




**සිතියම් අංක 6.3.2.4 :** *යෝජිත සැලසුම් ප්‍රදේශයේ මාර්ග සම්බන්ධතාවයේ අපේක්ෂිත තත්වය (2030)*

## 6.3.3. ජල සැපයුම් සැලැස්ම

නගරය තුල නල ජලය සපයනුයේ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගිනි. නගරයේ ජල සැපයුම් ජාලයේ දුර ප්‍රමාණය කිලෝ මීටර් 75 ක වේ. නගරයේ දිනපතා ජල සැපයුම ලීටර් 130 ක වන නමුත් එය නාගරික පරිභෝජනය සඳහා ප්‍රමාණවත් නොවේ. නගරයේ ජල ටැංකි 5ක් ඇති අතර එහි මුළු පරිමාව ඝණ මීටර් 4500 කි. පහත වගුවෙන් ජල පරිභෝජනය අනුව ජල සැපයුම් සම්බන්ධතා ප්‍රමාණය දැක්වයි.

| භාවිතය | සම්බන්ධතා ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| නේවාසික | 6447 | 80.89 |
| වාණිජ | 1233 | 15.47 |
| කර්මාන්ත | 44 | 0.55 |
| පාසල් ඇතුළු රජයේ ආයතන | 196 | 2.46 |
| ආගමික | 42 | 0.53 |
| හෝටල් | 08 | 0.10 |
| එකතුව | 7970 | 100.0 |

**වගු අංක 6.3.1.1 :** *ජල පරිභෝජනය - 2017*
**මූලාශ්‍රය :** *ජාතික ජලසම්පාදන සහ ජලප්‍රවාහන මණ්ඩලය 2017*

ජල සැපයුම ප්‍රධාන වශයෙන් යොමුකර ඇත්තේ නේවාසික භාවිතයන් සඳහා වන අතර මුළු නිවාස ප්‍රමාණයෙන් 79.5% කට ජල සම්බන්ධතා ලැබී තිබීම ප්‍රශස්තය. නමුත් ඇතැම් ප්‍රදේශ සඳහා ජල සැපයුම නොමැති අතර ළිං මගින් සහ ගංගා ඇළ දොළ වලින්ද ජලය භාවිතයට ගන්නා අතර එය සුදුසු ක්‍රමයක් ලෙස සැළකිය නොහැකි වේ.

මහා නගර සභාව ඉදිකළ පොදු ජලනල 150 ක් නගරය තුල ස්ථාපිත කර ඇති අතර ඒවා අඩු අදායම් ලාභීන් සහ නගරයට පැමිණෙන්නන් භාවිත කරයි. රත්නපුර නගරයේ අනාගත ජල ඉල්ලුමට බලපා ඇත්තේ නිවාස ඉල්ලුම, වාණිජ ඉල්ලුම සහ දෛනිකව සේවා අවශ්‍යතාවන් සඳහා මෙන්ම සංචාරක කටයුතු සඳහා ද නගරයට පැමිණෙන්නන් ඇතුළු මගී ජනගහනයෙන් ඇති ඉල්ලුම වේ. මීට අමතරව සමන් දේවාල පෙරහැර සමයේ (අගෝස්තු– සැප්තැම්බර් මස) අමතර ජල අවශ්‍යයක් පවතී. තවද, නගර සීමාව තුළ ඇතිවිය හැකි ගිනි ගැනීමකදී ජලය ලබාගැනීමට ප්‍රමාණවත් ලෙස ජල උද්ගාමක කරාම (Fire hydrants) නගරය තුළ රඳවා තබා ගැනීමට නගර සැලැස්ම මගින් නිර්දේශ කරනු ලැබේ.

| | | දිනකට ලීටර් 120 ක් ලෙස | 2018 වසරේදී අවශ්‍යතාවය ($m^3$) | 2030 වසරේදී අවශ්‍යතාවය ($m^3$) |
|---|---|---|---|---|
| වර්තමාන නේවාසික ජනගහනය | 49,083 | 49083*120 | 5889.96 | |
| වර්තමාන සංසරණ ජනගහනය | 100,000 | 20 percent (24 L) | 2400 | |
| අපේක්ෂිත නේවාසික ජනගහනය | 62,340 | 62340*120 | | 7480.8 |
| අපේක්ෂිත සංසරණ ජනගහනය | 150,000 | 20 percent (24 L) | | 3600 |
| විශේෂ කාලවල දිනක අවශ්‍යතාවය | 100,000 | 20 percent (24 L) | 2400 | 2400 |
| මුළු එකතුව | | | 10,689.96 | 13,480.8 |

**වගු අංක 6.3.3.2 :** *ජල පරිභෝජන අවශ්‍යතාවය - 2030*

දැනට නගරයේ පවතින ඉල්ලුමට ජල සැපයුම ප්‍රමාණවත් නොවන අතර "විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය" සහ "ප්‍රජා ජල ව්‍යාපෘතිය" මගින් වසර 2030 වනවිට අපේක්ෂිත ජල සැපයුම් ඉලක්කය සපුරා ගැනීමට නියමිත ය. ඉහළ යන ජල පරිභෝජනය සඳහා පහත දැක්වෙන නිර්දේශයන් ලබාදී ඇත.

- වර්තමාන ජල සැපයුම වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රමය
- අනාරක්ෂිත ළිං ආරක්ෂිතව පාවිච්චි කිරීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පොම්පකැළේ ජල ටැංකියේ පරිමාව කියුබික් මීටර් (m3) 13000 දක්වා වැඩි කිරීම
- නව නගරයේ කියුබික් මීටර් (m3) 10,000 ක්වූ ජල ටැංකියක් ඉදි කිරීම
- ගඟ අද්දර මාවතේ නව ළිඳක් ඉදි කිරීම
- කුඩා පරිමාණ ජල ව්‍යාපෘති මගින් ජල සැපයුම් ලබාදීම

## විසල් රත්නපුර ජල සැපයුම් ව්‍යාපෘතියේ තොරතුරු

මෙම ව්‍යාපෘතිය මගින් රත්නපුර, පැල්මඩුල්ල සහ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන අතර එමගින් පහසුකම් සැලසීමට අපේක්ෂිත ජනගහනය 160,000 ක් වේ. මෙහි ඉදිකිරීම් කටයුතු වල පළමු අදියර 2013 වසරේ සිට 2015 වසර දක්වා සිදු වූ අතර දෙවන අදියර 2020 වසරේ සිට 2023 වසර දක්වා සිදු කිරීමට නියමිත වේ.




**සිතියම් අංක 6.3.3.1 :** *වසර 2030 වනවිට ජල සැපයුම් ව්‍යාප්තිය*

## 6.3.4. විදුලි හා දත්ත රැහැන් පිළිබඳ සැලැස්ම

නාගරික කටයුතු පහසුවෙන් කරගෙන යාම උදෙසා අඛණ්ඩ විදුලි සැපයුමක් තිබීම අත්‍යාවශ්‍ය කාරණාවක් වන අතර ස්ථාවර විදුලි සැපයුමක් උදෙසා ශක්තිමත් සුහුරු සම්ප්‍රේෂණයක් සහ බෙදා හැරීමක් අවශ්‍යය වේ. නගරයේ විදුලිය සැපයුම සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| අංශය | සම්බන්ධතා | ප්‍රතිශතය % |
|---|---|---|
| නේවාසික | 9864 | 74.0 |
| වාණිජ | 3213 | 24.0 |
| රාජ්‍ය සහ රාජ්‍යය නොවන ආයතන | 198 | 1.5 |
| කර්මාන්ත | 89 | 0.4 |
| ආගමික | 48 | 0.1 |
| එකතුව | 13412 | 100.0 |

*වගු අංක 6.3.1.1 : විදුලි සැපයුම - 2018*
*මූලාශ්‍රය : විදුලිබල මණ්ඩලය*

විදුලිබල මණ්ඩල තොරතුරු වලට අනුව සාමාන්‍යය භාවිතය සඳහා විදුලි ඒකක 90–120 (KW) සංඛ්‍යාවක් අවශ්‍යය වේ. අපේක්ෂිත සාමාන්‍යය විදුලි ඒකක 105 (KW) වන අතර ඉහත ඒකක ප්‍රමාණය සාමාන්‍යය තත්වයකි. වර්තමාන අවශ්‍යතාවය විදුලි ඒකක 1,408,360 (KW) වන අතර ලංකා විදුලිබල මණ්ඩලය දක්වන පරිදි රත්නපුර සැලසුම් ප්‍රදේශයට 100% විදුලි බල සැපයුම ලබාදී ඇත.

සෑම වසරකම ගංවතුර සහ දරුණු කාලගුණය හේතුවෙන් භූමිය මතුපිට පිහිටා ඇති සේවා ආධාරකයන් හානි වන බැවින් රත්නපුර සංවර්ධන සැලැස්මෙන් විදුලි බල මණ්ඩලයේ පර්යේෂණයන්ගේ නිර්දේශය සහිතව සංවර්ධන ප්‍රදේශය තුල භූමි අභ්‍යන්තරයෙන් විදුලි රැහැන් යෙදීම නිර්දේශකර ඇත. රට අමතරව ජල නල, විදුලි රැහැන් සහ දුරකථන සේවා එකට සම්බන්ධව හා සමාන්තරව භූමි අභ්‍යන්තරයෙන් සවිකිරීම නිදේශ කර ඇත. විවිධ උපයෝගිතා සේවා එකිනෙක සම්බන්ධව ස්ථානගත කිරීමෙන් නව ක්‍රමානුකූල අපරවයුහ පහසුකම් ජාලයක් සකස් කිරීම අපේක්ෂිත ය. තවද, ගොඩනැගිලි සැලසුම් අනුමත කරන විට සහ හා ව්‍යාපෘති සිදු කිරීමේදී අධිබලැති විදුලි රැහැන් පවත්නා ස්ථාන පිළිබඳව සැළකිළිමත් වීමට නගර සැලැස්ම මගින් නිර්දේශ කරනු ලැබේ.




**සිතියම් අංක 6.3.4.1 :** වසර 2018 වනවිට විදුලි සැපයුම

## වීදි ආලෝකකරණය

යෝජිත වීදි ආලෝකකරණය සැලසුම්කර ඇත්තේ 'බුද්ධිමත් චලන සංවේදක වීදි ආලෝකකරණ පාලන පද්ධතිය' (Smart/ Intelligent Street Lighting) සංකල්පය පදනම් කරගෙනය. ඒ අනුව වීදි වල මෝටර් රථ සහ පදිකයන් ගමන් කිරීමේදී ස්වයංක්‍රීයව වීදි ආලෝකකරණය ක්‍රියාත්මක වන අයුරින් සැලසුම් කර ඇත. වෙළඳ නගරයේ සහ නව නගරයේ පදික වේදිකා, රේඛීය උද්‍යාන, වැව රවුම සහ ගඟ ඉවුරේ වීදි ආලෝකකරණය ඉහත දක්වනලද තාක්ෂණය අනුව සකස් කල යුතුය. ප්‍රශස්ථ අවම ආලෝක මට්ටමකින් යුතු ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන වීදි ආලෝකකරණයක් යොදා ගැනීමෙන් නගරයේ බලශක්තිය නිරසාර අයුරින් යොදාගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂිත ය.




*රූප සටහන් අංක 6.3.4.1 : යෝජිත සුහුරු වීදි ආලෝකකරණ පද්ධතිය*

## 6.3.5. අපජලය හා මළාපවාහන සැලැස්ම

### ජලාපවාහන සහ මළාපවාහන මාර්ග

මේ වනවිට නගරය තුළ ඇති කාණු පද්ධතියේ සම්පූර්ණ දිග කිලෝ මීටර් 31 ක් වන අතර ඉන් කොටසක් නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය යටතේ ආසියානු බැංකු මූල්‍ය ආධාර ලබා වැඩි දියුණු කරන ලද වැසිදිය බැස යන කාණු වේ. මේවා කොන්ක්‍රීට් වලින් ඉදිකර ඇති අතර අනෙක් කොටස ඉදි කර නැති කාණු වේ. එමෙන්ම, රත්නපුර නගරය තුළ මධ්‍යම මළාපවාහන පද්ධතියක් ද නොමැත.

මෙම ප්‍රදේශයේ ජලාපවහනය සංවර්ධනය කර ඇත්තේ  සෘජුකෝණාස්රාකාර හැඩයටය. එසේ වුවද මෙම ජලාපවහන ජාලයට අදාළ ගලා යාමේ දිශාව සහ රටාව මැණික් කැනීම් හේතුවෙන් නිරතුරුව වෙනස් වේ. මධ්‍යගතවූ මලපවාහන පද්ධතියක් නිර්මාණය කිරීම සහ මහජනයාට ජලමුද්‍රිත වැසිකිළි භාවිතය සඳහා උපදෙස් ලබාදීම සංවර්ධන සැලැස්ම මගින් 2030 වනවිට අපේක්ෂා කෙරේ.




***සිතියම් අංක 6.3.5.1 :*** *රත්නපුර ජලාපවහන සැලැස්මට අදාළ ගලා යාමේ දිශාවන්*




**සිතියම් අංක 6.3.5.2 :** *රත්නපුර ජලාපවහන සැලැස්ම*

## 6.3.6. ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ සැලැස්ම



නාගරික ඝණ අපද්‍රව්‍යය ලෙස හඳුන්වනු ලබන්නේ නාගරික ප්‍රදේශය තුල නිපදවන විවිධ අපද්‍රව්‍යයන්ගේ එකතුවක් වන අතර එය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. (මූලාශ්‍රය: එකසත් ජාතීන්ගේ සංවිධානය, 2005). නාගරික ඝණ අපද්‍රව්‍යය කළමනාකරණය යනු නාගරික ප්‍රදේශවල ඝණ අපද්‍රව්‍යය එක්රැස් කිරීම, රැගෙන යාම, පිරියම් කිරීම, ප්‍රතිචක්‍රීයකරණය, සම්පත් ප්‍රතිසාධනය, බැහැර කිරීම වේ. නාගරික අපද්‍රව්‍යය 'සාමාන්‍ය අපද්‍රව්‍යය' සහ 'ප්‍රතිචක්‍රීයකරණය කළහැකි අපද්‍රව්‍යය' වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වර්ගකල හැක.

නේවාසික, වාණිජ, කර්මාන්ත, ආයතනික ඉදිකිරීම්, කඩා ඉවත්කිරීම් ක්‍රියාවලීන් හේතුවෙන් සහ නාගරික සේවාවන් හේතුවෙන් උත්පාදනය වන අපද්‍රව්‍යය, නාගරික අපද්‍රව්‍යය යනුවෙන් හැඳින්වේ. ජනගහනයේ ව්‍යාප්තිය සහ ආර්ථික සංවර්ධනය හේතුවෙන් අපද්‍රව්‍යය උත්පාදනය වන අතර නිසි අපද්‍රව්‍යය කළමනාකරණයක් නොමැතිවීම මානව සෞඛ්‍යයට සහ පරිසරයට තර්ජනයක් වේ.

### ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් රත්නපුර මහා නගර සභාවේ වර්තමාන තත්වය

රත්නපුර මහා නගර සභාව දිනකට ඝණ අපද්‍රව්‍යය අසන්න වශයෙන් ටොන් 30ක් පමණ එක්රැස් කරයි. ඝණ අපද්‍රව්‍යය උත්පාදනයේ සංයුතිය පහත අංක 01 දරන වගුවෙන් දැක්වේ.

| අපද්‍රව්‍යය වර්ගය | ටොන් ගණන |
|---|---|
| දිරන (කෙටිකාලින) | 17.1 |
| කඩදාසි | 1.8 |
| දැව | 1.8 |
| ලී කුඩු/ වී කුඩු | 1.8 |
| නොදිරන (කෙටි කාලින) | 1.8 |
| පොලිතින් සහ ප්ලාස්ටික් | 1.8 |
| අනුභේදිත අපද්‍රව්‍යය (Demolition Waste) | 1.2 |
| ලෝහ | 0.9 |
| ඝාතකාගාර අපද්‍රව්‍යය | 0.6 |
| වීදුරු සහ අනෙක් | 1.2 |

***වගු අංක 6.3.1.1 :*** *ඝණ අපද්‍රව්‍ය උත්පාදනයේ සංයුතිය*
***මූලාශ්‍රය :*** *රත්නපුර මහා නගර සභාව*

දෛනිකව රැස් කරන කසල සංයුතිය (ටොන්)




*රූප සටහන් අංක 6.3.6.1 : දෛනිකව රැස් කරන කසල සංයුතිය - 2017*
*මූලාශ්‍රය : රත්නපුර මහා නගර සභාව*

ප්‍රජාවගේ ආර්ථික හා සමාජයීය රටාව හැඩගැසී ඇති අකාරයට අනුකූලව නාගරික අපද්‍රව්‍යය සංයුතිය වෙනස් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ අනෙක් පළාත් මෙන්ම රත්නපුර මහා නගර සභා සීමාවේ ද අපද්‍රව්‍යයවල කාබනික සංයුතිය ඉහලය (63%).




*රූප සටහන් අංක 6.3.6.2 : නාගරික අපද්‍රව්‍යය රැස්කිරීම - 2017*
*මූලාශ්‍රය : රත්නපුර මහා නගර සභාව*




**රූප සටහන් අංක 6.3.6.3 :** *අපද්‍රව්‍යය උත්පාදනය කිරීමේ මූලාශ්‍ර අනුව නාගරික අපද්‍රව්‍යය රැස්කිරීම - 2017* | **මූලාශ්‍රය :** *රත්නපුර මහා නගර සභාව*

මෙම ඝණ අපද්‍රව්‍ය එකතුවෙන් 50% ක පමණ ප්‍රමාණයක් කාබනික සහ කාබනික නොවන වශයෙන් එම අපද්‍රව්‍ය උත්පාදනය වන ස්ථානයේදී ම වෙන්කිරීම සිදු වේ.




**රූප සටහන් අංක 6.3.6.4 :** *වර්ග අනුව නාගරික අපද්‍රව්‍යය එක්රැස් කිරීම - 2017*
**මූලාශ්‍රය :** *රත්නපුර මහා නගර සභාව*

වර්තමානයේදී මහා නගර සභාව කසල බැහැර කරනු ලබන්නේ මහා නගර ප්‍රදේශය තුල පිහිටි අක්කර 8 ක් පමණවූ කණාදොළ ප්‍රදේශයට වේ. ටොන් 25කට අසන්න ප්‍රමාණයක් අපද්‍රව්‍ය මෙම බැහැරලන ප්‍රදේශයට ගෙනෙන අතර එයින් 12% ක් (ටොන් තුනක්) පමණ කොම්පෝස්ට් පොහොර නිපදවීමට යොදාගනී. එසේම 1% ක් අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීයකරණයට භාජනය කරන අතර ඉතිරි 84% (ටොන් 21) කිසිම ප්‍රතිකර්මයකින් තොරව කසල අංගනයට මුදා හරී.

නගර මධ්‍යයේ, පොදු ප්‍රදේශවල, සහ ප්‍රධාන මාර්ගය අසල ප්‍රදේශවල දෛනිකව දොරින් දොරට ගොස් කසල එක්රැස් කිරීම කරනු ලැබේ. එසේම අතුරු මාර්ගවල අපද්‍රව්‍යය සතියට දින තුනක් රැස්කිරීම කරනු ලැබේ. එයට අමතරව නගර සීමාව තුල ඇති 'දේවාලේගාව' ග්‍රාම නිලධාරී වසමේ සෑම නිවසකටම කොම්පෝස්ට් බඳුන් ලබාදී කසළ එක් රැස් කිරීමේ වෙනස් ආදර්ශකයක් අත්හදා බලමින් පවතී.

මහජන සෞඛ්‍යය පරීක්ෂක වරයෙක්, සෞඛ්‍යය අධීක්ෂක වරුන් 4 දෙනෙක්, වැඩ අධීක්ෂක වරුන් 12 දෙනෙක්, රියදුරන් 50 දෙනෙක් සහ කම්කරුවන් 50 දෙනෙක් අපද්‍රව්‍යය එක්රැස් කිරීමේ සහ ප්‍රවාහනය කිරීමේ ක්‍රියාවලිය සඳහා යොදවා තිබේ. අපද්‍රව්‍යය එක්රැස් කිරීම සහ ප්‍රවාහනය සඳහා ට්‍රැක්ටර් 12, ට්‍රේලර් 13, කසල තද කිරීමේ යන්ත්‍ර 2ක් සහ අත්කරත්ත 2 ක් යොදවා තිබේ (මූලාශ්‍රය: රත්නපුර මහා නගර සභාව)

ප්‍රතිචක්‍රීයකරණය කළහැකි ප්ලාස්ටික්, පොලිතින්, ටින්, යකඩ කාඩ්බෝඩ් සහ කඩදාසි ගැනුම්කරුවන් හට අලෙවි කිරීමෙන් මහා නගර සභාව මසකට රුපියල් 300,000 ක් පමණ උපාය ගනී. එසේම කසල ප්‍රතිචක්‍රීයකරණය කිරීමෙන් මාසිකව කොම්පොස්ට් පොහොර කිලෝග්‍රෑම් 40,000ක් පමණ නිෂ්පාදනය කරයි.

2018 වසරේ දී ජනගහනය 49,083 ක් වන අතර එය ආසන්නව කුටුම්භ ඒකක 20732 ක් වේ. මහා නගර සීමාව තුල සාමාන්‍යය දිනක ඒක පුද්ගල කසල උත්පාදනය කිලෝග්‍රෑම් 1ක් (ටොන් 0.00110231) පමණ වේ. වර්ෂ 2030 වනවිට පුරෝකථනය කල ජනගහනය 64,340 ක් වන අතර ඒ අනුව අපේක්ෂිත ඒක පුද්ගල කසල උත්පාදනය ටොන් 70ක් පමණ වේ.

## හඳුනාගත් ගැටළු

1. අපද්‍රව්‍යය එක්රැස් කිරීමේ සහ කසල අංගනය වෙත ප්‍රවාහනය කිරීමේ ක්‍රියාවලිය සඳහා යොදවා තිබෙන වාහන සහ උපකරණවල හිඟකම.
2. කසල ප්‍රතිචක්‍රීයකරණය කර කොම්පෝස්ට් සෑදීම සඳහා වර්තමාන කොම්පෝස්ට් අංගනයේ ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවීම.
3. ප්‍රතිචක්‍රීයකරණය කළහැකි කසල ගබඩා කිරීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම.

වර්තමානයේ දී දිනපතා අපද්‍රව්‍යය එක්රැස් කිරීමේ ප්‍රමාණවත් පහසුකම් මහා නගර සභාවට නොමැත. අසන්න වශයෙන් ටොන් 23 ක්වූ ඝණ අපද්‍රව්‍යය කණාදොළ කසල අංගනයට බැහැර කරයි. කණාදොළ ප්‍රදේශය නගරයට කිලෝමීටර් 3ක් පමණ ඈතින් පිහිටා ඇති අතර පරිසර හිතකාමී අයුරින් අපද්‍රව්‍යය රැගෙන ඒම සිදු නොවේ. එසේම වෙන් නොකරන ලද කසල බැහැර කිරීමෙන් ද බොහෝ සෞඛ්‍ය ගැටළු මතුව් තිබේ.

## අපද්‍රව්‍යය උත්පාදන ප්‍රක්ෂේපනය

රත්නපුර මහා නගර සභාව තුල කසල උත්පාදනය අනාගතයේදී පදනම් වන්නේ නිවාස ඉල්ලුම, වාණිජ ඉල්ලුම, සහ සංචාරක සහ විනෝද කටයුතු ඇතුළුව එදිනෙදා නගරයට පැමිණෙන ජනතාවගේ ඇති ඉල්ලුම මතය. ඊට අමතරව සමන් දේවාල පෙරහැර කාලය වන අගෝස්තු/ සැප්තැම්බර් මාසවලදී අමතර අපද්‍රව්‍යය උත්පාදනයක් දක්නට ලැබේ.

| | | දිනකට ඒක පුද්ගල කසළ ජනනය (ටොන්) | දෛනිකව සමස්ත පුද්ගල කසළ ජනනය (ටොන්) | දෛනිකව සමස්ත පුද්ගල කසළ ජනනය (ටොන්) |
|---|---|---|---|---|
| වර්තමාන ජනගහනය | 49,083 | 0.00110231 | 54.10468173 | 54.10468173 |
| සංසරණ ජනගහනය | 100,000 | 0.000220462 | 22.0462 | 22.0462 |
| අපේක්ෂිත ජනගහනය | 64,340 | 0.00110231 | 70.9226254 | 70.9226254 |
| අපේක්ෂිත සංසරණ ජනගහනය | 150,000 | 0.000220462 | 33.0693 | 33.0693 |
| පෙරහැර කාලසීමාවේදී පැමිණෙන දෛනික බැතිමතුන් සංඛ්‍යාව | 100,000 | 0.000220462 | | 22.0462 |

***වගු අංක 6.3.6.2 :*** *වසර 2030 සඳහා ප්‍රක්ෂේපිත ඝණ අපද්‍රව්‍ය උත්පාදනය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

- උපකල්පනය කරන ලද දිනපතා ඒක පුද්ගල කසල උත්පාදනය කිලෝග්‍රෑම් 1කි.
- මගී අපද්‍රව්‍යය උත්පාදනය පදනම් වී ඇත්තේ දිනපතා ඒක පුද්ගල කසල උත්පාදනය දිනපතා පරිභෝජනයෙන් ප්‍රමාණයෙන් 20% යන උපකල්පනය මතය.
- පෙරහැර කාලසීමාවේදී පැමිණෙන දෛනික බැතිමතුන්ගේ අපද්‍රව්‍යය උත්පාදනය පදනම් වී ඇත්තේ ඒක පුද්ගල කසල උත්පාදනය දිනපතා පරිභෝජනයෙන් ප්‍රමාණයෙන් 20% යන උපකල්පනය මතය.

## අපද්‍රව්‍යය කළමනාකරණය

- ***උපක්‍රම 01 - අපද්‍රව්‍යය උත්පාදනය අවම කිරීම***

ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත අංශවල අපද්‍රව්‍යය උත්පාදනය අඩුකිරීමේ ක්‍රමවේදයන් හඳුන්වාදීම.

(අ) 10R මූලධර්ම අදාල කරගැනීම, දැනුවත්කිරීමේ වැඩසටහන් හඳුන්වාදීම සහ අධ්‍යාපන වැඩසටහන් පොදු ස්ථාන සහ පාසල්වල සංවිධානය කිරීම සහ ප්‍රචලිත කිරීම, පොලිතින් සහ ප්ලාස්ටික් නිෂ්පාදන අතිරික්ත භාවිතය අධෛර්යමත් කිරීම.

(ආ) පොලිතින් සහ කඩදාසි නැවත භාවිතය සඳහා දිරිමත් කිරීම, ප්ලාස්ටික් සහ කඩදාසි නැටි, කෝප්ප සහ අත් පිස්නා වැනි නිෂ්පාදනය භාවිතා කිරීමට මහජනය දැනුවත් කිරීම මගින් අධෛර්යමත් කර පාරම්පරික ස්ථිර ද්‍රව්‍යය එනම් මැටි බඳුන් රෙදි අත්පිසනා ප්‍රවර්ධනය කිරීම. එසේම හෝටල් ගිමන් හල් සහ ආයතන නැවත නැවත භාවිත කළහැකි ද්‍රව්‍යය භාවිතයට පෙළඹවීම.

- *උපක්‍රම 02 - සම්පත් ප්‍රතිසාධනය උපරිම කිරීම*

(අ) මූලාරම්භක ස්ථානයේ එනම්, නිවස, කාර්යාල, පාසල හෝ ආයතන ආදියෙහි අපද්‍රව්‍යය වෙන් කිරීම. එසේම ප්‍රතිචක්‍රිය කල නොහැකි අපද්‍රව්‍යය මිශ්‍ර නොකර බැහැර කිරීමට පළාත් පාලන ආයතන යොමු කිරීම. මීට අමතරව අවිධිමත් කසල එකතු කරන්නන් සහ පළාත් පාලන ආයතන කසල එකතු කිරීම පහසුවනු වස් ජාතික වර්ණ කේතය අනුව වෙනම ලේබල් අලවා සකස් කර ඇති බඳුන තබා ගැනීමට දිරිගැන්වීම.

- *ආහාර – කොළ*
- *කඩදාසි – නිල්*
- *ප්ලාස්ටික් – තැඹිලි*
- *යකඩ – දුඹුරු*
- *විදුරු – රතු*

(ආ) ප්‍රජා සංවිධාන සහ අනෙකුත් රාජ්‍යය නොවන සංවිධානවල සහාය ඇතිව සෑම ප්‍රදේශයකම අඛණ්ඩ අධ්‍යාපනය සහ මහජන දැනුවත් කිරීම් සැසි සංවිධානය කළ යුතුය. එවැනි සැසිවලදී, 'වෙන්කිරීම් නොකලොත් එකතු කරන්නේ නැත" යන ප්‍රතිපත්තිය සහභාගීත්ව ශිල්පක්‍රම භාවිතයෙන් සන්නිවේදනය කළ යුතුය.

- *උපක්‍රම 03 - සියලුම කෙටි කාලීනව දිරාපත් වන අපද්‍රව්‍යය කොම්පෝස්ට් බවට පරිවර්තනය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර කොම්පෝස්ට් සහතික කිරීම සඳහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.*

(අ) දිරාපත් වන අපද්‍රව්‍යය කොම්පොස්ට් බවට පත්කිරීම ප්‍රවර්ධනය කිරීම. නිවෙස්වල කොම්පොස්ට් බඳුන් ආධාරයෙන් ඒ අසල කුඩා විදුලි ජනන යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට බලශක්තිය නිපදවීම සහ බලශක්තිය නිපදවිය හැකි වෙනත් සුදුසු සහ අඩු වියදම් සහිත තාක්ෂණයන් මේ සඳහා හඳුන්වාදීම. නිවෙස්වල කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සඳහා කොම්පෝස්ට් බඳුන් මිලට ගැනීමට ජනතාව දිරිමත් කිරීම.

(ආ) මහා පරිමාණ විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට (සමහර හෝටල්, ආපනශාලා, රෝහල්, වෙලඳපොල ආදියෙන්) ගෘහස්ථ අපද්‍රව්‍යය භාවිතය ප්‍රයෝගික නොවන අතර ඒ සඳහා විමධ්‍යගත කරන ලද සරල තාක්ෂණයෙන් යුත් කොම්පොස්ට් බලාගාර පිහිටුවීම. (windrowing, static files)

- *උපක්‍රම 04 - දිරාපත් නොවන අපද්‍රව්‍යය සඳහා පරිසර හිතකාමී, ආර්ථික මගයෙන් යෝග්‍ය විය හැකි අපද්‍රව්‍යය ප්‍රතිකාරක තාක්ෂණය යොදාගැනීමේ පහසුකම් සැලසීම*

(අ) නැවත භාවිතා කිරීමේ පුරුදු ප්‍රචලිත කිරීම සඳහා සෑම මට්ටෙමන්ම දැනුවත් කිරීමේ වැඩසටහන් හඳුන්වා දීම

(ආ) ප්‍රතිචක්‍රීකරණය කළහැකි ද්‍රව්‍ය නැවත වෙළඳ පොළ වෙත ලබාදීම.

(ඇ) අපද්‍රව්‍ය එක්රැස් කිරීමට පුද්ගලික අවිධිමත් අංශය විසින් සපයනු ලබන සේවාවන් පහසු කිරීම සඳහා මහනගර සභාව විසින් පහසුකම් සැපයීම.

නාගරික අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීකරණය කරන ප්‍රධාන අංශය මෙම අවිධිමත් අංශය හෙයින් එය ඝණ අපද්‍රව්‍යය කළමනාකරණ උපායමාර්ගයේ අත්‍යවශ්‍යය අංශයක් ලෙස, මෙම සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම, නිරතුරුව විධිමත් උපදෙස් ලබාදීම, එම කසල රැස්කරන රාජ්‍ය නොවන

සංවිධානයන් හඳුනාගෙන එම සංවිධානයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, එම සංවිධාන හඳුනාගැනීමන සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම මගින් ඔවුනට නෛතික ආරක්ෂාව සැපයීම.

(ඈ) නගර සභාව මගින් අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීයකරණය කිරීම් සඳහා ප්‍රජාව දිරි ගැන්වීම.

ප්‍රාදේශීය වශයෙන් අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපාරවලට පහසුකම් සැලසීම සහ විවිධ ප්‍රතිචක්‍රීයකරුවන් සම්බන්ධීකරණය කිරීම හා ඔවුන්ගේ ධාරිතාව වැඩිදියුණු කිරීමට උපකාරී කිරීම සහ රාජ්‍යය නොවන සංවිධාන, අනෙකුත් නේවාසික මට්ටම් ප්‍රතිචක්‍රියකරුවන් සහ මිලදී ගැනීමේ නියෝජිතයන් ජාලයක් වශයෙන් හඳුනාගැනීම සහ ප්‍රජා මුල සංවිධාන වශයෙන් මෙම කාර්යයේ නිරත වීමට දිරිමත් කිරීම.

- *උපක්‍රම 05 - අන්තරාකාර ජීව අපද්‍රව්‍ය සහ සෞඛ්‍ය සත්කාර අපද්‍රව්‍යය නාගරික අපද්‍රව්‍යය වලට එකතු වීම වැළැක්වීම සඳහා ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම*

(අ) සෞඛ්‍ය අපද්‍රව්‍ය අනිවාර්යය මූලාශ්‍රයක් වශයෙන් හඳුනා ගැනීම.

(ආ) සෞඛ්‍යය අපද්‍රව්‍ය, අපද්‍රව්‍යය වශයෙන් ඉවත් කිරීමට පෙර ඒ සඳහා සෞඛ්‍යය ආරක්ෂිත පිලියම්කර බැහැර කිරීම හෝ පිටකිරීම අනිවාර්යය කිරීම.

(ඇ) සෞඛය අපද්‍රව්‍ය අවසාන වශයෙන් බැහැර කිරීම සෞඛය ආරක්ෂිතවා කලයුතුබව ස්ථාපිත කිරීම.

(ඈ) ආයතනික යාන්ත්‍රණය ස්ථාපිත කිරීම.

සියලුම සෞඛය ආයතන වල අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීයකරණය කර බැහැරකිරීම අධීක්ෂණය කර තහවුරු කිරීම සඳහා නිසි පහසුකම් සහිතව ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

- *උපක්‍රම 06 - ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යය කළමනාකරණය*

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යය හානිකර වන අතර එසේ වන්නේ සමහර ඉලෙක්ට්‍රොනික භාණ්ඩවල නිෂ්පාදිත ද්‍රව්‍යය වල තත්වය සහ සනත්වය මතය. මේවායේ හානිකර කොටස් සෞඛ්‍යයට සහ පරිසරයට හානිදායක තර්ජනයක් වේ. ඉවතලන පරිඝණක, රූපවාහිනී යන්ත්‍ර, VCD, ස්ටීරියෝ, ෆොටෝකොපි යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර , විදුලි ලාම්පු, ජංගම දුරකථන, ශ්‍රව්‍ය උපකරණ සහ විවිධ බැටරි වර්ග නිසි ලෙස බැහැර නොකලොත් ඒවා පස සහ භූගත ජලය සමග එකතු වේ. මෙම භාණ්ඩ බොහොමයක් නැවත භාවිතයට ගැනීම, අලුත්වැඩියා කිරීම, සහ පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමෙන් පරිසර පද්ධතියට වියහැකි හානිය අවම කල හැක. මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යය සඳහා සුදුසු කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කල යුතුය.

(අ) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යය සුදුසුකම් ලත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යය බැහැර කරන ආයතන වෙත යොමු කිරීම.

- *උපක්‍රම 07 - කසළ එක්රැස් කිරීම සහ ප්‍රවාහනය ශක්තිමත් කිරීම*

(අ) දොරෙන් දොරට ගොස් කසල එක්රැස් කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම.

(ආ) පොදු ජනතාව කසල එක්රැස් කිරීමේ කාලසටහන් පිලිබඳ දැනුවත් කිරීම.

(ඇ) නලා නාද කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම– කසල රැස් කිරීමට එක්රැස් කිරීමේ වාහන පැමිණි බවට මහජනයාට නලා නාද කිරීමෙන් දැනුවත් කිරීම මගින් නියමිත පරිදි මහජනයාට කසල රථයට භාරදිය හැකිවීම.

(ඈ) කොම්පොස්ට් ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු උපකරණ /යන්ත්‍ර සැපයීමට පළාත්පාලන ආයතන වෙත සැපයීම.

(උ) ඒකක වලට වෙන් කරන ලද වාහන භාවිත කිරීම.

(ඌ) විශාල වාහන ගමන්කළ නොහැකි ප්‍රදේශ සඳහා අත් කරත්ත භාවිත කිරීම.

- *උපක්‍රම 08 – සෞඛ්‍යය ආරක්ෂිත කසළ බැහැර කිරීමේ අංගනයක් ස්ථාපිත කිරීම*

අපද්‍රව්‍යය පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය හරහා ප්‍රතිචක්‍රීයකරණය කල නොහැකි, කොම්පෝස්ට් වලට පරිවර්තනය කල නොහැකි කසල හේතුවෙන් ඉඩම් ගොඩ කිරීම සීමාසහිත වේ. එහෙයින් අවශේෂ ඉවත් කිරීමේදී වන සෞඛ්‍යය හා පරිසරය කෙරෙහි බලපෑම් අවම කිරීම සඳහා සුදුසු තාක්ෂණය යොදා සකස් කරන ලද සනීපාරක්ෂක කසළ රඳවන යොදාගත යුතුය. මේ සඳහා රඹුක්කන්ද ප්‍රදේශයේ සහ කණාදොළ ප්‍රදේශයේම වෙනත් ස්ථානයක් හඳුනාගෙන ඇති අතර පරිසර නිර්දේශයන්ට අනුකූලව වඩා සුදුසු ස්ථානය යොදාගැනීමට අපේක්ෂිතය. (සිතියම් අංක 6.3.6.1) එම ස්ථාන ද්වින්වයම අක්කර පහක පමණ වපසරියකින් යුක්ත වේ.

- *උපක්‍රම 09 - දැනුවත් කිරීමේ වැඩසටහන්*

ප්‍රජා සහයෝගය සහ මහජන සහභාගීත්වය කසළ බැහැර කිරීමේදී අවශ්‍යය වන අනෙක් වැදගත් කරුණු වේ. 10R සංකල්පයට අනුව සකස් කළ කුටුම්භ මට්ටමේ සුදුසු ඝණ අපද්‍රව්‍යය කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් හා සෞඛ්‍යය සම්බන්ධ වැඩමුළු තුළින් අපද්‍රව්‍යය අවම කිරීම, ද්‍රව්‍යයන් නැවත නැවත භාවිතයට ගැනීමේ පුරුදු මහජනයා තුල ඇතිකිරීම මේ තුළින් අපේක්ෂිත ය.

- *උපක්‍රම 10 - පද්ධති වැඩි දියුණු කිරීම සහතික කිරීම සඳහා නිතිපතා අධීක්ෂණය හා ඇගයීම් පද්ධති ස්ථාපනය කළ යුතුය*

## ඝණ අපද්‍රව්‍යය කළමනාකරණ උපාය මාර්ග

- *උපක්‍රම 01*
  *කසල රැස් කිරීම විධිමත් කිරීම*

**a. *කසල රැස් කිරීමේ 'බෙල් ක්‍රමය'***

සතිය තුල තෝරාගත් දිනවලදී ගෙයින් ගෙට ගොස් කසල රැස් කිරීම මෙම වර්ගයට අයත්වේ. නිවෙස් මට්ටමේ කසල අඩුකිරීම සහ නැවත භාවිතය සම්බන්ධව ප්‍රජා මූලික දැනුවත් කිරීමේ වැඩසටහන්, ගෘහස්ථ මට්ටමින් කොම්පෝස්ට් දියුණු කිරීම සඳහා ප්‍රජා මූලික වැඩ සටහන් සහ අපද්‍රව්‍ය වෙන් කිරීම සඳහා ප්‍රජා දායකත්වය වැඩිදියුණු කිරීම ද සමගාමීව සිදුවිය යුතුය.

**b. *GPS තක්ෂණය යොදාගැනීම***

වාහන ක්‍රියාකාරකම් ආරක්ෂිතව පාලනය කිරීම, ඉන්ධන පරිභෝජනය අවම කිරීම සහ නඩත්තු වියදම් අඩු කිරීම, GPS තාක්ෂණය උපයෝගී කර ගැනීමේ වාසි වේ.

**c. *ජංගම යෙදුම් (Mobile Application) හඳුන්වා දීම***

සාමාන්‍ය ජනතාව සහ රියදුරන් (අපද්‍රව්‍යය එකතු කරන්නන්) අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීම, සහ මාර්ග කාලයන් අඩු කිරීම සඳහා මෙවැනි ආකාරයේ යෙදුම් භාවිත කල හැක. එය තවදුරටත් මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා එම යෙදුම හා තවත් යෙදුම් එකිනෙකට සම්බන්ධ කිරීමේ හැකියාවක් ද පවතී. උදාහරණයක් ලෙස කසල කළමණාකරණයට සමගාමීව නව රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු, ත්‍රීරෝද රථ හෝ ටැක්සි සේවා කඩිනමින් ලබාගැනීමට හා විශේෂ ප්‍රවෘත්ති ලබාගැනීමට මෙම යෙදුම භාවිත කළහැකි වීමෙන් මහජනතාවට එය දෛනිකව අවශ්‍ය වන යෙදුමක් බවට පත් වේ. මේ සඳහා වන පිරිවැය විවිධ වෙළඳ දැන්වීම් ප්‍රචාරණ මධ්‍යයක් ලෙස එම යෙදවුම යොදාගැනීමෙන් පූර්ණය කර ගත හැකි වේ.

- *උපක්‍රම 02*
  *අපද්‍රව්‍යය වෙන් කිරීම අනිවාර්ය කිරීම*

**a. *දිරාපත්වන අපද්‍රව්‍යය***

දිරාපත්වන අපද්‍රව්‍යය සඳහා කොම්පෝස්ට් සෑදීමේ ක්‍රමය හඳුන්වාදීමට අපේක්ෂිත ය. මේ සඳහා නිවාස සහ පාසල් ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කල හැකි වේ. එසේම කණාදොළ පිහිටි වර්තමාන කොම්පොස්ට් අංගනය අමතර ටොන් 10 දිරාපත්වන අපද්‍රව්‍යය බැහැර කිරීමට හැකි වන අයුරින් විශාල කිරීම කල හැකිය.

**b. *අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීයකරණය***

වෙන්කළ අපද්‍රව්‍යය නැවත වෙන්කිරීම සඳහා මධ්‍යස්ථාන ඇතිකිරීම. ඉන්පසු ප්‍රතිචක්‍රියකරණය කල අපද්‍රව්‍යය ආදායම් ලැබියහැකි සම්පත් බවට පරිවර්තනය කිරීම කල හැක. මෙහිදී ඊට සමානව වෙන් කරන ස්ථාන ඉදිකිරීම සහ ප්‍රතිචක්‍රියකරණය කල ද්‍රව්‍යය ගබඩා කිරීමේ පහසුකම් සැපයීම කල යුතුය.

**c. *අපද්‍රව්‍යය ඉඩම් ගොඩකිරීම සඳහා යොදා ගැනීම***

සුදුසු පරිදි සැකසීමෙන් අනතුරුව පාරවල් සෑදීමේදී සහ වෙනත් කටයුතු සඳහා මෙම අපද්‍රව්‍යය සඳහා භාවිත කල හැක.

| අයිතම | දර්ශකය | 2017 තත්වය | 2022 ඉලක්කය |
|---|---|---|---|
| 1. අපද්‍රව්‍යය අවම කිරීම (බැහැර කිරීම් ප්‍රමාණය) | නිවසේදී කොම්පෝස්ට් සාදාගන්න නිවෙස් ගණන | 6% (2014) | 10% |
| 2. කොම්පෝස්ට් නිෂ්පාදනය | අංගනයෙන් බැහැරව නිපදවූ කොම්පෝස්ට් ප්‍රමාණය (දිනකට ටොන් ) | දිනකට ටොන් 2.3 | දිනකට ටොන් 15 ton/day |
| | කණාදොළ කොම්පෝස්ට් නිෂ්පාදනය (මාසිකව ටොන්) | මාසිකව ටොන් 2.3 | මාසිකව ටොන් 15 |
| 3. ප්‍රතිචක්‍රීයකරණය | කණාදොළ ප්‍රතිචක්‍රියකරන ලද අපද්‍රව්‍යය (දිනකට ටොන්) | දිනකට ටොන් 0.14 | දිනකට ටොන් 10.5 |
| 4. දැනුවත් කිරීම් | උත්පාදන මට්ටම අනුව වර්ග 5කට වෙන්කරන ලද ප්‍රතිශතය | 0 % | 80 % |
| | ග්‍රාම නිලධාරී කොට්ඨාශ 15 තුල පවත්වන ලද ඝණ අපද්‍රව්‍යය කළමනාකරණය සම්බන්ධ වාර්ෂික දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය | 3 | 15 |
| 5. පුහුණුව සහ අධ්‍යාපනය | රත්නපුර මහා නගර සභාවේ පුහුණු වූ නිලධාරීන් සංඛ්‍යාව | නිතිපතා නැත | ද්විවාර්ෂිකව |
| 6. අපද්‍රව්‍ය බැහැර කිරීම | අවසානයේ බැහැර කරන ලද ප්‍රමාණය (දිනකට ටොන් ) | දිනකට ටොන් 47.3 | දිනකට ටොන් 27.2 |
| | රඹුක්කන්ද ඉඩම අත්පත් කරගෙන සෞඛ්‍යාරක්ෂක අයුරින් කසල ගොඩ කිරීම | යෝජිත | සපුරා ගත යුතුය |

**වගු අංක 6.3.6.3 :** *ඝණ අපද්‍රව්‍යය කළමනාකරණ සැලැස්ම (2030) - රත්නපුර මහා නගර සභාව*




***සිතියම් අංක 6.3.6.1 :*** *යෝජිත කසළ කළමණාකරන සැලැස්මට අදාළ කසළ බැහැර කිරීමේ ස්ථාන*

# 6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ග

රත්නපුර නගරයේ ආර්ථික ව්‍යුහය නගර දෙකක් මත, එනම් වෙළඳ නගරය හෙවත් පැරණි නගරය සහ නව නගරය මත පදනම් වී ඇති අතර පැරණි නගරය හා නව නගරය මත පදනම් වන ආර්ථිකය එකිනෙක වෙනස් හා අනන්‍ය වීම මෙහි විශේෂත්වයකි. එමෙන්ම එම නගර තුළින් සේවා ලබාදෙන වපසරිය ද එකිනෙකට වෙනස් වේ. වෙළඳ නගරයයේ ආර්ථික කටයුතු මහ නගර සභා සීමාව තුල වාසය කරන ප්‍රජාව සහ ඉන් පිටත ග්‍රාමීය ප්‍රදේශ වල වාසය කරන ප්‍රජාව ඉලක්කගත කරමින් සිදුවන අතර නව නගරයේ ආර්ථික කටයුතු මූලිකවම පරිපාලන සේවා ලබාගැනීම උදෙසා සබරගමුව පළාතේ නන් දෙසින් පැමිණෙන ප්‍රජාව ඉලක්ක කරගෙන සිදු වේ.

ශ්‍රී ලංකාවේ අනෙකුත් නගර වල මෙන්ම රත්නපුරයේදී ද මංසන්ධි සහ වීදි පදනම් කරගනිමින් ආර්ථික කටයුතු සිදුවීම දැකගත හැකිය. නමුත් මෙහිදී පවතින විශේෂත්වය වන්නේ නගරයේ පවතින ප්‍රධානතම ආර්ථික මූලය වන මැණික් වෙළඳ කටයුතු ද ඉහත ආකෘතියටම හැඩගැසී පැවතීමයි. ඒ අනුව වෙනත් කර්මාන්ත, කඩ කාමර පදනම් කරගනිමින් සිදු වුවත් මැණික් ආශ්‍රිත කටයුතු සාම්ප්‍රදායානුකූලවම ආවරණ සහිත ස්ථාන වලින් බැහැරව සිදු වේ. මැණික් වෙළඳාමට අමතරව තොග බඩු කර්මාන්තය සහ නිමි ඇඳුම් වෙළඳාම ද රත්නපුර නගරය පදනම් කරගනිමින් පවතින අතර ඉහත කර්මාන්ත හේතුවෙන් බැංකු හා මූල්‍ය කටයුතු ද මෙම වෙළඳ නගරය කේන්ද්‍ර කරගනිමින් බිහිව ඇති ආකාරය දැකිය හැකි වේ.




*රූප සටහන් අංක 6.4.1 : රත්නපුර නගරයේ ආර්ථික ව්‍යුහය - 2017*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය*



***සිතියම් අංක 6.4.1 :*** *වසර වනවිට වාණිජ භාවිත ව්‍යාප්තිය*

## 06 පරිච්ඡේදය සැලැස්ම

### ආර්ථික සංවර්ධන උපායමාර්ග

පූර්ව යටත්විජිත යුගයේ සිට මැණික් කර්මාන්තයට රත්නපුර ආර්ථිකය තුළ සැලකිය යුතු ස්ථානයක් හිමි විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 වාර්තාවේ සංඛ්‍යාලේඛන වලට අනුව මැණික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකයේ 5 වන ස්ථානයේ රැඳී තිබෙන අතර එයින් ජාතික ආර්ථිකයට වන දායකත්වය 3% ක් වේ. (වැඩි විස්තර සඳහා පරිච්ඡේද 3 සහ 5 ට යොමු වන්න) මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සංඛ්‍යාලේඛන වලට අනුව වර්තමානයේදී මැණික් වෙළඳාමට සෘජුව සම්බන්ධ වී සිටින්නන්ගෙන් 25% ක් සහ කැනීම් කටයුතුවල සිටින්නන්ගෙන් 30% ක් රත්නපුරය නියෝජනය කරන අතර වක්‍රව සම්බන්ධිත පිරිස මෙම ප්‍රතිශතයට වඩා ඉහළ අගයක් ගනී.

මේ අනුව, රත්නපුර නගරයට ආවේණික ප්‍රධානතම ආර්ථික පදනම වන මැණික් කර්මාන්තය ශක්තිමත් කර එය අනෙකුත් මූල්‍ය උත්පාදන මාර්ග හා සම්බන්ධ කිරීමත් එමගින් නව ආර්ථික අවස්ථා නාගරිකයන්ට හිමිකර දීමත් රත්නපුර සංවර්ධන සැලැස්මෙහි ආර්ථික සංවර්ධන උපාය මාර්ගය වන අතර නගරය තුළ හා අවට වාසය කරන මිනිසුන් සතු පාරිසරික, සංස්කෘතික සහ සමාජයීය අනන්‍යතාවය ආර්ථිකමය ශක්‍යතාවක් බවට පරිවර්තනය කිරීම මෙහිදී අපේක්ෂිත ය.

නගරයෙන් ආර්ථිකමය ප්‍රතිලාභ ලබන මිනිසුන් කොට්ඨාශ හතරකි. එනම්, නාගරිකයන්, වෙළෙඳුන්, සංසරණය වන ජනගහනය හා සංචාරකයන් ලෙසිනි. 2030 වසර ඉලක්ක කරගත් මෙම සැලැස්මට අනුව ඉහත සඳහන් සිව් පාර්ශවීයයන්ට පහසුකම් සැලසෙන ආර්ථිකමය පරිසරයක් නිර්මාණය කෙරෙනු ඇති අතර ආර්ථික සංවර්ධන උපාය මාර්ගය යටතේ රත්නපුරයේ ආර්ථිකය ප්‍රධාන අංශ තුනක් යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂිත වේ.




*රූප සටහන් අංක : 6.4.2 : ආර්ථික සංවර්ධන උපායමාර්ගය*

- *උපක්‍රම 01*
  *මැණික් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම*

සංවර්ධන සැලැස්මේ දැක්ම වන "හරිත වර්ණ මැණික් පුරවරය" ලඟා කරගැනීම උදෙසා ආර්ථික සංවර්ධන උපක්‍රමවල ප්‍රමුඛස්ථානය මැණික් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට ලබාදී ඇත. රත්නපුර නගරයේ අනන්‍යතාව සහ ආර්ථිකය රැඳී තිබෙන ප්‍රධානතම මූලය මැණික් කර්මාන්තය වීම මීට හේතුවයි. එබැවින් සංවර්ධන සැලැස්මේ පළමු අරමුණ වන 'රත්නපුරය ශ්‍රී ලංකාවේ මැණික් ආශ්‍රිත වෙළඳාම සම්බන්ධ ජාතික මධ්‍යස්ථානය බවට පත් කිරීම' පිණිස මැණික් කර්මාන්තය 2030 වසර වන විට දළ දේශීය නිෂ්පාදිතයට 7% ක දායකත්වයක් සැපයීම අවශ්‍ය වේ. මේ සඳහා මැණික් ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ආකර්ෂණීය පරිසරයක්, වීදි හා මංසන්ධි ආශිතව ලබාදීමටත් එයට සමගාමීව වෙනත් භෞතික පහසුකම් ලබාදීමටත් සැලසුම් කර ඇත.




***රූප සටහන් අංක 6.4.3 :*** *වර්තමාන මැණික් කේන්ද්‍රස්ථාන සහ වීදි - 2017*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*

- *උපක්‍රම 1.1*
  *මැණික් සංස්කෘතිය ආශ්‍රිත අදායම් උත්පාදන මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම*

මැණික් සංස්කෘතියට අදාළ වෙළෙඳාම් ස්ථාන, කාල සීමාවන් සහ වෙළෙඳ ජාල මේ වනවිටත් රත්නපුර නගරය කේන්ද්‍ර කරගනිමින් ස්ථාපිත වී ඇත. එබැවින් ඉහළ අදායමක් ලබාගැනීම සඳහා මෙම ජාලයන් ශක්තිමත් කිරීමට පහසුකම් සැලසීමත් රත්නපුරය නගරයට පමණක් ආවේණික මෙම සංස්කෘතිය, සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ කිරීම තුළින් ආදායම් උත්පාදන මාර්ග වැඩි දියුණු කිරීමත් කාලීන අවශ්‍යතාවයකි. මේ වනවිට රත්නපුර මැණික් වෙළඳාම, බේරුවල වැනි ප්‍රදේශවලට ව්‍යාප්තව පවතින නමුත් සාම්ප්‍රදායික කැණීම් සහ විශේෂිත කාල පරාසවල  පවතින ප්‍රධාන මිලදී ගැනීම් ස්ථාන වැනි දෑ මත පදනම්ව පවතින මැණික් සංස්කෘතිය නවමත් රත්නපුර නගරය සතු ව ඇත. එහෙයින්, මැණික් වෙළඳාම සඳහා අවශ්‍යය භෞතික යටිතල පහසුකම් සැපයීම මගින් රත්නපුර නගරය, ශ්‍රී ලංකාවේ මැණික් වෙළෙඳ කේන්ද්‍රය බවට පත් කිරීම මෙම සැලැස්මේ අරමුණකි. නගරය තුළින් ගිලිහී යමින් පවතින මැණික් වෙළඳාම නැවත වරක් නගරයට සංකේන්ද්‍රණය කරගැනීම ද දිගු කාලීනව අපේක්ෂිත ය.

මැණික් කර්මාන්තයේ දියුණුවට අවශ්‍ය භෞතික කරුණු

- *අගනුවර (වෙළඳ) සිට නගරයට කෙටි කාලයකදී පහසුවෙන් ළඟාවිය හැකි වීම*
- *ජාත්‍යන්තර වෙළඳ ප්‍රජාව සඳහා වෙළඳ අවකාශයක් තිබීම*
- *ව්‍යාපාරිකයන් සඳහා සුදුසු ආහාරපාන ලබා ගැනීමේ ස්ථාන තිබීම*
- *දේශීය සහ ජාත්‍යන්තර ව්‍යාපාරිකයන් සඳහා නැවතීම් පහසුකම් තිබීම*
- *හමුවීමට සහ ඒකරාශී වීමට පහසු ස්ථාන තිබීම*

මැණික් කර්මාන්තයේ දියුණුවට අවශ්‍ය වෙළඳපොල කරුණු

- *සුඛෝපභෝගී වෙළඳ ස්ථාන සහ ප්‍රදර්ශන ස්ථාන*
- *ඉහළ තලයේ දේශීය මැණික් වෙළඳසැල්*
- *මැණික් වෙන්දේසි ස්ථාන සහ කර්මාන්තයට අදාළ මෙවලම් සාප්පු*
- *විස්තිරණය වූ වෙළඳපොල ඉඩකඩ*
- *මැණික් ආශ්‍රිත ස්වර්ණාභරණ භාණ්ඩ සහ අත්කම් සහිත කුඩා කඩ සාප්පු*
- *දේශීය ව්‍යාපාරිකයන්ගේ භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම සඳහා අවකාශ*
- *DIY * මැණික් කැපීම ආශ්‍රිතව සිදු කරන නව නිර්මාණ සහ සාම්ප්‍රදායික සහ ජාත්‍යන්තර තලයේ ප්‍රදර්ශනය කිරීමේ ස්ථාන*

*නිවෙස් ආශ්‍රිත නව නිර්මාණ කිරීම සහ අලුත්වැඩියා කිරීම වැනි අලංකරණ කටයුතු වෘත්තියමය ශිල්පියෙක් නොමැතිව තමන් විසින්ම කරගැනීම DIY (Do It Yourself) ලෙස හැඳින්වේ.*

මෙම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විශේෂ ව්‍යාපෘති සහ කලාපිය සැලසුම් රෙගුලාසි සකස් කර තිබේ.

1. රුවන්පුර අධිවේගී මාර්ගය ඉදි කිරීම.
2. ප්‍රධාන වීදිය, ශාවියා මාවත සහ දෙමුවාවත වීදිය මැණික් වීදි වශයෙන් ප්‍රති සංවර්ධනය කිරීම සහ මැණික් අනන්‍යතාවය රැකෙන අයුරින් වීදි පෙනුම වෙනස් කිරීම.
3. ඉහළ තත්වයේ දේශීය මැණික් සාප්පු සඳහා 'ප්‍රධාන විදිය' යොදා  ගැනීම.
4. කුඩා ප්‍රමාණයේ මැණික් සාප්පු සඳහා 'ශාවියා මාවත' යොදා ගැනීම.
5. දෙමුවාවත ප්‍රදේශය DIY* මැණික් කැපීම සහ මැණික් ප්‍රදර්ශන ප්‍රදේශයක් වශයෙන් භාවිතා කිරීම. (සාම්ප්‍රදායික / ජාත්‍යන්තර)
6. ලක්ෂ්මි සිනමා සංකීර්ණය (අනහැර දමා ඇති) වෙන්දේසි ස්ථාන සහ මෙවලම් සාප්පු සහිත මැණික් ආශ්‍රිත  වාණිජ ව්‍යාපෘතියකට  පරිවර්තනය කිරීම.

7. මැණික් වෙළඳාම ව්‍යාප්ත කිරීම සඳහා බද්ධ සිටි පරිශ්‍රය මැණික් චතුරස්‍රයක් (විවෘත අවකාශයක්) වශයෙන් සංවර්ධනය කිරීම.
8. මැණික් ආශ්‍රිත ස්වර්ණාභරණ වෙළඳාම සඳහා සුදුසු විදි රටාවක් අනුව ෆ්‍රෑන්ක් හෙට්ටිආරච්චි මාවත සංවර්ධනය කිරීම.
9. අනන්‍යතාව පිළිබිඹු කිරීමට මෙන්ම වාණිජ කටයුතු සහ සන්නිවේදන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා තැපැල් කාර්යාල පරිශ්‍රයේ මැණික් කුළුණක් ඉදි කිරීම.
10. කලාපීකරණ රෙගුලාසි හරහා විශේෂ මාර්ගෝපදේශ හඳුන්වාදීම තුලින් මැණික් ආශ්‍රිත කටයුතු සඳහා වැඩි ඉඩකඩ ප්‍රමාණයක් නගර සීමාව තුළ වෙන්කරවා ගැනීම.

- *උපක්‍රම 1.2*
  *මැණික් සංස්කෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඓතිහාසික ගොඩනැගිලි යොදාගැනීම*

මැණික් කර්මාන්තය සඳහා කෞතුකාගාර, වෙන්දේසි අවකාශ, අවන්හල් හා නවාතැන් පහසුකම් යනාදී අනුග්‍රාහක සාධක අවශ්‍යය වන නමුත් වර්තමානයේදී එම ස්ථාන වල හිඟයක් දැකිය හැකි වේ. නමුත් මේ සඳහා භාවිත කළ හැකි වසර සියයකට වඩා පැරණි ඓතිහාසික ගොඩනැගිලි 15ක් පමණ නගරය පුරා විසිරී පවතී. මෙම ගොඩනැගිලි මැණික් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වන ලෙස පරිවර්තනය කිරීම මගින් පැරණි ගොඩනැගිලි නිසි පරිදි නවීකරණයත්, සංරක්ෂණයත්, ඒවායේ සැඟවුණු ආර්ථික ප්‍රතිලාභය නගරයට හිමිකර ගැනීමත් යන අරමුණු ත්‍රිත්වයම ඉටු වේ. එමෙන්ම, රත්නපුරය යනු මැණික් ආශ්‍රිත නගරයක් සහ ව්‍යාපාරිකයනට හිතකර ස්ථානයක් යන හැඟීම නවදුරටත් ඇති වේ.

1. ඕලන්ද කොටුව ප්‍රතිසංස්කරණය කොට එහි භාවිතය සම්මන්ත්‍රණ ශාලා සහ මැණික් වෙන්දේසි පහසුකම් සහිත ජාතික මැණික් කෞතුකාගාරය බවට පත් කිරීම
2. පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට එහි භාවිතය අවන්හලක් ලෙස වෙනස් කිරීම.
3. පොලිස් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කොට එහි භාවිතය අවන්හලක් ලෙස වෙනස් කිරීම

- *උපක්‍රම 1.3*
  *සංචාරක කටයුතු මැණික් සංස්කෘතිය සමග සම්බන්ධ කිරීම*

මැණික් ආශ්‍රිත සංස්කෘතිය, සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කිරීම මගින් මෙම කර්මාන්ත ද්විත්වයටම වාසි සහගත අවස්ථාවන් උදා වේ. එකිනෙකට අනන්‍ය සම්පත් භාවිතයට ගැනීම සහ එම සම්පත් එකිනෙකට සම්බන්ධ කරගැනීම තුළින් මැණික් කර්මාන්තයට ජාතික හා ජාත්‍යන්තර තලයේ සංචාරක ආකර්ෂණයක් හිමිකර ගැනීමට හැකි වන අතර පහත සඳහන් අවස්ථා සංචාරකයන්ට ද ලබා ගත හැකි වේ.

- සම්ප්‍රදායික මැණික් කැනීම් ගවේෂණයට අවස්ථාව ලබාදීම.
- මැණික් වර්ග ගවේෂණය කර අත්දැකීම් ලබාගැනීමට අවස්ථාව ලබාදීම
- මැණික් ආශ්‍රිත ස්වර්ණාභරණ නිෂ්පාදනය සම්බන්ධව ඉගෙනීමට අවස්ථාව ලබාදීම
- මැණික් ආශ්‍රිත ස්වර්ණාභරණ නිෂ්පාදන මිලදී ගැනීමට අවස්ථාව ලබාදීම




***රූප සටහන් අංක 6.4.4 :*** *ෆ්‍රෑන්ක් හෙට්ටිආරච්චි මාවත ස්වර්ණාභරණ මාවතක් ලෙස සංවර්ධනය කිරීම*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

- ***උපක්‍රම 1.4***
  ***මැණික් ආශ්‍රිත අධ්‍යාපන අවස්ථා සහ පුහුණුවීම් කටයුතු සලසාදීම***

නව නගරය ආසන්නයේ හිදැල්ලන පිහිටා ඇති ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථානයට අමතරව ආධුනිකයන් සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව මැණික් පිලිබඳ ඉගෙනීමට ස්ථානයක් නොමැති බැවින් රත්නපුර නගර සංවර්ධන සැලැස්ම මගින් මේ සඳහා ස්ථානයක් සපයා දීමට අපේක්ෂා කෙරේ.

- ඕලන්ද කොටුව තුල ජාතික මැණික් කෞතුකාගාරය ස්ථාපනය කිරීම
- හිදැල්ලන මැණික් පුහුණු මධ්‍යස්ථානය දියුණු කිරීම
- මැණික් සම්බන්ධ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අධ්‍යාපන ආයතනයක් මහවලවත්ත ප්‍රදේශයේ මූලික කොටගෙන පිහිටුවීම. (වැඩිදුර තොරතුරු සඳහා අධ්‍යාපන පරිච්ඡේදය කියවන්න)




***රූප සටහන් අංක 6.4.5 :*** *යෝජිත පහසුකම් සහිත මැණික් කේන්ද්‍රස්ථාන, විදි සහ චතුරශ්‍ර*

- *උපක්‍රම 02*
  *සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම*

රත්නපුර නගර සංවර්ධන සැලැස්මේ දෙවන අරමුණ වන්නේ රත්නපුර නගරය, සංචාරකයන් හට ආකර්ශනීය ස්ථානයක් බවට පත් කිරීමයි. වර්තමානයේදී පවතින ප්‍රවණතාවයක් වන සති අන්ත නිවාඩු ගත කිරීමේදී පවුලේ සියලුම සාමාජිකයන් හට ආකර්ෂණීය වන පහසු, සුවදායී විකල්පයක් ලෙස රත්නපුර නගරය හඳුන්වා දීම මෙහි එක් අරමුණකි. මීට අමතරව ජලය සහ වනාන්තර ආශ්‍රිත, පරිසර හිතකාමී නැවුම් අත්දැකීම් රැසක් ලබාගත හැකි ප්‍රදේශයක් ලෙසත් මැණික් සංස්කෘතිය හා බැඳුණු අත්දැකීම් ලබාගත හැකි ස්ථානයක් ලෙසත් රත්නපුර නගරය සංචාරකයන් අතර ප්‍රකට වීම නගර සැලසුමෙන් අපේක්ෂිත ය. 2030 වසර වන විට රත්නපුරය නගරය මැණික් ආශ්‍රිත පරිසරික සංචාරක කලාපයක් ලෙස ඉහළ නැංවීම සඳහා වසරකට සංචාරකයන් 100,000 ක් පමණ පිරිසක් අපේක්ෂා කරන අතර මේ ආශ්‍රිතව බිහි වේ යැයි අපේක්ෂිත සෘජු හා වක්‍ර රැකියා හේතුවෙන් නාගරිකයන්ට ආර්ථික ප්‍රතිලාභ හිමිකර දීම ද සැලැස්මේ වක්‍ර අරමුණකි. මීට අමතරව, සංචාරක කටයුතු උදෙසා සිදු කරනු ලබන ඉදිකිරීම් සහ පරිවර්තනය කිරීම් හේතුවෙන් නගර වැසියන්ට අලංකාරවත් නගරයක් හිමිකර දීමත් සංචාරකයන් ඉලක්ක කරගනිමින් සිදුවන දිවා රාත්‍රී ක්‍රියාකාරකම් හේතුවෙන් සුවපහසු, ආරක්ෂිත, සජීවී නගරයක අත්දැකීම රත්නපුර නාගරිකයන්ට විඳගැනීමට සැලැස්වීමත් තවත් අරමුණකි.

- *උපක්‍රම 2.1*
  *රත්නපුරය නගරයට ප්‍රවේශ වීම සඳහා විකල්ප ප්‍රවේශයක් හඳුන්වාදීම*

රත්නපුර නගරයට ප්‍රවිෂ්ට වියහැකි එකම ප්‍රවාහන ක්‍රමය වන්නේ මහා මාර්ගයයි (A 004 මාර්ගය) එබැවින්, සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා විකල්ප ප්‍රවාහන මාධ්‍යයක් අවශ්‍යය වේ. රත්නපුර නගරය නිම්නයක පිහිටා ඇති අතර විශාල කඳුකරයකින් ද වටවී ඇති බැවින් බොහොමයක් විකල්ප සාර්ථක නොවූවත් මුහුදු ගුවන්යානා පර්යන්තයක් රත්නපුරය පදනම් කරගනිමින් හඳුන්වාදීම තුළින් දිගුකාලීනව නගරයට හිතකර බලපෑමක් ඇති වනු ඇත.

1. වෙරලුප වැව පදනම් කරගෙන මුහුදු ගුවන්යානා පර්යන්තයක් හඳුන්වාදීම




***රූප සටහන් අංක 6.4.6 :*** *යෝජිත වෙරලුප වැව*

**06 පරිච්ඡේදය**
**සැලැස්ම**

ආර්ථික සංවර්ධන
උපායමාර්ග

- ***උපක්‍රම 2.2***
  ***ඓතිහාසික ගොඩනැගිලි, නවාතැන් සහ ආහාරපාන සපයන ස්ථාන ලෙස පරිවර්තනය කිරීම***

සංචාරක කර්මාන්තය ස්ථාපිත වීම සඳහා උපකාරී වන ප්‍රධාන සාධකය වනුයේ ආහාර සහ නවාතැන් පහසුකම්ය. නමුත් මේ වනවිට නගරය කේන්ද්‍ර කරගනිමින් බිහිව ඇති එවන් ස්ථාන වල හිඟයක් දැකිය හැකි වේ. කෙසේ නමුත්, මේ සඳහා පරිවර්තනය කළ හැකි ඇහැළේපොළ සහ බ්‍රිතාන්‍ය යුගයට අයත් ඓතිහාසික ගොඩනැගිලි 15ක් පමණ රත්නපුර නගර මධ්‍යයේ සහ අවට ඇත. ඒවා යොදාගෙන අවන්හල් සහ නවාතැන් නිසිපරිදි ස්ථාපිත කිරීම මගින් සංචාරක කර්මාන්තයට අවශ්‍ය පහසුකම් සැපයෙනු ඇත. එමෙන්ම, විවේක කටයුතු සඳහා රත්නපුර නගරයට පැමිණීමට  සංචාරකයින් තුළ ද කැමැත්තක් වර්ධනය වනු ඇත.

1. වෙළඳ නගර මධ්‍යයේ පිහිටි ආයුර්වේද කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ අවන්හලක් ලෙස භාවිතා කිරීම
2. වෙළඳ නගර මධ්‍යයේ පිහිටි ඇහැළේපොල මහාධිකාරම් ගේ අන්තඃපුර මාළිගා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ අවන්හලක් ලෙස භාවිතා කිරීම
3. වෙළඳ නගර මධ්‍යයේ පිහිටි සෞඛ්‍ය අධ්‍යක්ෂක නිළ නිවස අලුත්වැඩියා කිරීම සහ නවාතැන් පහසුකම් උදෙසා භාවිතා කිරීම
4. මුවගම පිහිටි නියෝජ්‍ය පොලිස්පති කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම හා නවාතැන් පහසුකම් උදෙසා භාවිතා කිරීම
5. මුවගම පිහිටි දිස්ත්‍රික් විනිසුරුගේ නිළ නිවස (අතපත්තු වලව්ව) අලුත්වැඩියා කිරීම හා නවාතැන් පහසුකම් උදෙසා භාවිතා කිරීම
6. මුවගම පිහිටි හිටපු ප්‍රධාන ඇමතිගේ නිළ නිවස අලුත්වැඩියා කිරීම හා නවාතැන් පහසුකම් උදෙසා භාවිතා කිරීම
7. මුවගම පිහිටි දිස්ත්‍රික් ඉංජිනේරු නිළ නිවස අලුත්වැඩියා කිරීම හා නවාතැන් පහසුකම් උදෙසා භාවිතා කිරීම




***රූප සටහන් අංක 6.4.7 :*** *භාවිතය වෙනස්කලයුතු ඓතිහාසික ගොඩනැගිලි*

- *උපක්‍රම 2.3*
  *සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා නීල හරිත පාරිසරික ජාලයක් නිර්මාණය කිරීම*

ගංවතුර හා අනාගත දේශගුණික විපර්යාස තර්ජන සඳහා පිළිතුරු දෙමින් වැඩි ආර්ථික අවස්ථාවන් සහිත ආකර්ෂණීය හා පරිසර හිතකාමී නාගරික පරිසරයක් නිර්මාණය කිරීම නීල හරිත පාරිසරික ජාලයක් නිර්මාණය කිරීමෙන් අරමුණු වේ. එය පදනම් වන්නේ ජල මාර්ග (නිල්) සහ වනාන්තර, උද්‍යාන (කොළ/ හරිත) මතය. මේ සඳහා ස්වභාවික පරිසර පද්ධතිය යළි ගොඩනැංවීමත්, මිනිසා සහ පරිසරය සම්බන්ධ වන නගර අලංකරණ සැලැස්මක් ලබාදීමත්, එයට අනුරූපී වන පරිදි අපරව්‍යුහ පහසුකම් ලබාදීමත් අපේක්ෂිත ය.

මෙම උපාය මාර්ගය ප්‍රධාන තේමාවන් හතරක් මත අවධානය යොමු කරයි. එනම්;

*තේමාව 1 – පරිසර පද්ධති සහ පාරිසරික සම්බන්ධතා වැඩිදියුණු කිරීම*
*තේමාව 2 – ආර්ථික සංවර්ධනය සඳහා අවස්ථා ලබා දීම*
*තේමාව 3 – ප්‍රජාව සමග සම්බන්ධ කිරීම*
*තේමාව 4 – ස්වභාවික උවදුරෙන් ප්‍රජාව ආරක්ෂා කිරීම*

රත්නපුර නගරය පසු කරමින් ගලා යන කළුගඟ විවේක හා විනෝද කටයුතු ලබාදීමට යොදාගැනීම තුළින් නාගරික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයනු ඇතැයි මෙම සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂිත ය. එබැවින්, කළු ගඟ මූලික කොටගෙන එයට සම්බන්ධ වන අනෙකුත් ගංගා සහ ඇළ මාර්ග උපයෝගී කරගනිමින් ජල මූලික ජාලයක් ගොඩනැගීමත් ඒ අවට පවතින වනාන්තර, ලඳු කැලෑ හා උද්‍යාන එකිනෙක සම්බන්ධ කිරීම මගින් හරිත ජාලයක් ගොඩනැගීමත් සැලසුම් කර ඇත. මේ යටතේ පරිසර පද්ධති සහ පාරිසරික සම්බන්ධතා වැඩිදියුණු කිරීම මගින් ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීම සිදු වේ. ඉහත සඳහන් ආකාරයට ගොඩනැගෙන පාරිසරික ජාලය, ආර්ථික අවස්ථා උත්පාදනය කිරීම පිණිස යොදා ගත හැකි අතර මෙතෙක් කාලයක් දෛනික කටයුතු සඳහා පරිසරය හා ගැටුණු ප්‍රජාව අනාගතයේදී පරිසරය සමග සම්බන්ධ වී පරිසරය රැක ගැනීම තුළින් තමන්ගේ ආර්ථික අවස්ථා සුරක්ෂිත කරගැනීම මෙහිදී අපේක්ෂිත ය. මෙම ජාලය ශක්තිමත්ව ගොඩනැගීම තුළින් ගංවතුර, නායයාම් වැනි ස්වභාවික ව්‍යසනයන්ගෙන් ප්‍රජාව ආරක්ෂා කර ගැනීම දිගුකාලීන අරමුණක් වේ. එමෙන්ම, මෙම නීල හරිත ජාලය හරහා නගරය තුළ පිහිටි ස්ථාන අතර අන්තර් සම්බන්ධයක් ගොඩනැගීමත්, දුරින් පිහිටි උප නගර අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීමත් අනාගතයේදී අපේක්ෂා කරන අතර අපරව්‍යුහ පහසුකම් නිසි පරිදි සැපයීම මගින් ප්‍රජාවට පහසුකම් සැපයීම ද වක්‍ර අරමුණකි.

මෙම උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම තුලින් ගංවතුර පිළිබඳ ගැටළුව අවම කිරීමත්, නගරය සතුව තිබූ පාරිසරික වටිනාකම නැවත වරක් ප්‍රතිස්ථාපනය කිරීමත්, ජල මූලයන්හි ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමත්, "රත්නපුර නගරය සතුවන පාරිසරික අනන්‍යතාවය පිළිබඳ හැඟීම" වැඩිදියුණු කිරීමත් සහ මිනිසුන් හා ස්ථාන ඒකාබද්ධ කිරීමත් සිදුවනු ඇත. එමගින් රත්නපුරය නගරයට අනන්‍ය පාරිසරික වටිනාකම හා පිළිගැනීම ලබා ගැනීමට හැකි වනු ඇති අතර එය නගරයේ ආර්ථික සංවර්ධනය සහ සංචාරක අවස්ථා වැඩි කිරීමට යොදා ගත හැකි වේ.

1. වෙරළුප ජල රඳවා ගැනීමේ වැව ඉදිකිරීම
2. වෙරළුප ක්‍රීඩාංගනය ඉදිකිරීම
3. වෙරළුප පිට්ටනිය අසල පිහිටි 'ජලය තේමාව කරගත්' උද්‍යානය ඉදිකිරීම
4. ලේන්නැඩිය පරිශ්‍රයේ තෙත් බිම් උද්‍යානය ඉදිකිරීම
5. පාසැල් ළමුන් සහ පර්යේෂකයින්හට ජෛව විවිධත්වය පිලිබඳ පර්යේෂණ කිරීම සඳහා පොම්පකැළේ නාගරික වනෝද්‍යානය සහ අංගම්මන වන රක්ෂිතය වෙත පහසුකම් සපයා දීම (පරිසර පද්ධතියට හානි නොවෙන සේ)

6. පොම්පකැළේ ස්වභාවික පිහිනුම් තටාකය නැවත ප්‍රතිසංවර්ධනය කිරීම
7. කුළුබඩු උද්‍යානයක් වෙරළිප ආශ්‍රිතව නිර්මාණය කිරීම.
8. කළු ගඟේ හඳුනාගත් ස්ථානවල තොටුපොළවල් ඉදිකිරීම

*a. පළමන අදියර*

I. ප්‍රධාන තොටුපොළ – සීවලී පිට්ටනය පිටුපස පවත්නා අනහැර දැමූ ළමා උද්‍යානය ප්‍රධාන තොටුපොළ බවට පත් කිරීම
II. සමන් දේවාලය අසල එල්ලෙන පාලම අසල නව තොටුපොළක් ඉදිකිරීම

*b. දෙවන අදියර*

I. වරකාතොට පාලම අසල නව තොටුපොළක් ඉදිකිරීම

*c. තෙවන අදියර*

I. කුඩුගල්වත්ත නව තොටුපොළක් ඉදිකිරීම
II. ආයුර්වේද මංසන්ධියේ නව තොටුපොළක් ඉදිකිරීම
III. කොටම්බෙගාව නව තොටුපොළක් ඉදිකිරීම

මෙම තොටුපොළවල් පදනම් කරගනිමින් සංචාරකයින් ඉලක්ක කරගත් පියැසි සහිත බෝට්ටු සේවාවක් (Water Taxi Service) ආරම්භ කිරීම අපේක්ෂිත වේ. දිගුකාලීන අරමුණක් ලෙස එමගින් නාගරිකයන්ගේ ප්‍රවාහන අවශ්‍යතාවක් සපිරෙනු ඇතැයි ද අපේක්ෂිත ය.




**සිතියම් අංක 6.4.2 :** *සංචාරක ප්‍රවර්ධනය උදෙසා නීල හරිත ජාලයක් නිර්මාණය*

- *උපක්‍රම 2.4*
  *සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා දර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීම*

සංචාරක කර්මාන්තයේ පැවැත්ම උදෙසා දර්ශනීය ස්ථානයන්හි පවතින දර්ශනීය බව ආරක්ෂා කරගත යුතු ය. මේ සඳහා සැලසුම් ප්‍රදේශය තුළ ඇති හඳුනාගත් දර්ශනීය ස්ථාන ඒවායේ අනන්‍යතාවයට හානි නොකරමින් සංවර්ධනය කළ යුතු වේ. එපමණක් නොව, එම ස්ථාන වලට ප්‍රවේශ වීමේ පහසුකම් ද එම ස්ථාන පදනම් කරගනිමින් අපරව්‍යූහ පහසුකම් ද සුදුසු පරිදි ලබා දිය යුතු වේ. එමෙන්ම, මෙම දර්ශනීය ස්ථාන සඳහා පහසුකම් සැලසීමේදී රත්නපුර නගර අනන්‍යතාව ආරක්ෂා කරගැනීමත්, සංචාරක ඉලක්ක ඉටු කරගැනීමත්, ජාතික හා ජාත්‍යන්තර සම්මතයන් මත පිහිටා කටයුතු කිරීමත් අවශ්‍ය වේ.

ලෝක සංචාරක සංවිධානයේ (WTO) මතය අනුව සංචාරකයන්ගේ දැනට පවත්නා ඉල්ලීම් සපුරාලීම පමණක් නොව අනාගත අපේක්ෂාවන් ද සපුරාලිය හැකි පරිදි සංචාරක ව්‍යාපාරය කටයුතු කළයුතු වේ. එබැවින්, දර්ශනීය වටිනාකම් සහිත ස්ථානයන් ආරක්ෂා කරගැනීමත් වැඩිදියුණු කිරීමත් එම ස්ථාන භාවිත කල හැකි පිරිසගේ ධාරිතාවය වැඩි කිරීමත් ඒ තුළින් රත්නපුර නගරය සතු සංචාරක තරඟකාරී බව ඉහළ දැමීමත් මෙම උපායමාර්ගයෙන් අපේක්ෂිත ය.

| *දර්ශනීය ස්ථානයේ නම* | *ප්‍රධාන ආකර්ෂණ හෝ ක්‍රියාකාරකම* | *ප්‍රවර්ධනය කිරීම* |
|---|---|---|
| *ආනන්ද මෛත්‍රී විහාර පරිශ්‍රය* | *කඳු මුදුන* | *දර්ශනීය පෙදෙස් සංරක්ෂණය කිරීම සහ නගරය නැරඹීමට පහසුකම් සැලසීම* |
| *කජුගස්වත්ත විහාර පරිශ්‍රය* | *යෝධ බුදු පිළිමය, කඳු මුදුන* | *දර්ශනීය පෙදෙස් සංරක්ෂණය කිරීම සහ නගරය නැරඹීමට පහසුකම් සැලසීම* |
| *වීරගොඩ විහාර පරිශ්‍රය* | *යෝධ බුදු පිළිමය* | *දර්ශනීය පෙදෙස් සංරක්ෂණය කිරීම* |
| *නාලන්ද එල්ලාවල නාගරික උද්‍යාන පරිශ්‍රය* | *නාගරික දර්ශනය* | *අතිරේක කලාත්මක නිර්මාණ සහ භූ දර්ශන අලංකරණය මගින් මෙම ස්ථානයේ දර්ශනීය බව ඉහළ නැංවිය හැකිය.* |
| *ඇහැලේපොල අන්තඃපුර මාළිගා පරිශ්‍රය* | *නාගරික දර්ශනය* | *අතිරේක කලාත්මක නිර්මාණ සහ භූ දර්ශන අලංකරණය මගින් මෙම ස්ථානයේ දර්ශනීය බව ඉහළ නැංවිය හැකිය.* |
| *ආයුර්වේද කාර්යාල පරිශ්‍රය (මොරගහයට පාලම අසල)* | *ගංගා දර්ශනය* | *අතිරේක කලාත්මක නිර්මාණ සහ භූ දර්ශන අලංකරණය මගින් මෙම ස්ථානයේ දර්ශනීය බව ඉහළ නැංවිය හැකිය.* |
| *හිටපු මහ ඇමති බංගලා පරිශ්‍රය (මුවගම පිහිටි රජයේ නිල නිවාස)* | *කඳු මුදුන* | *අතිරේක කලාත්මක නිර්මාණ සහ භූ දර්ශන අලංකරණය මගින් මෙම ස්ථානයේ දර්ශනීය බව ඉහළ නැංවිය හැකිය.* |
| *මහවලවත්ත ඉහළ කොට්ඨාශ (Upper Division) පරිශ්‍රය* | *කඳු මුදුන* | *අතිරේක කලාත්මක නිර්මාණ සහ භූ දර්ශන අලංකරණය මගින් මෙම ස්ථානයේ දර්ශනීය බව ඉහළ නැංවිය හැකිය.* |

***වගු අංක 6.4.1 :*** *හඳුනාගත් දර්ශනීය ස්ථාන*




**සිතියම් අංක 6.4.3 :** *රත්නපුර නගරයේ දර්ශනීය ස්ථාන*

**06 පරිච්ඡේදය සැලැස්ම**

ආර්ථික සංවර්ධන උපායමාර්ග

- *උපක්‍රම 03*
  *ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීම*

රත්නපුර නගරයේ ආර්ථිකය නාගරික සීමාවට අයත් ප්‍රජාව මෙන්ම නගරය අවට ප්‍රදේශ වල ප්‍රජාව මත ද පදනම් වී ඇත. එයට හේතුව වන්නේ රත්නපුර නගරය අවට පිහිටි ගම් සහ උප නගර ප්‍රදේශවල ආර්ථිකය මෙම ප්‍රධාන වෙළඳ නගරය මත පදනම්ව තිබීමයි. එහෙයින්, එම ප්‍රාදේශීය ආර්ථිකයට පහසුකම් සැපයෙන අයුරින් නාගරික සැලසුම නිර්මාණය කිරීම අත්‍යාවශ්‍ය කටයුත්තකි. මෙම උපායමාර්ගය යටතේ ප්‍රාදේශීය ආර්ථික කටයුතු සඳහා වැඩි අවකාශයක් වෙන් කිරීමත්, පවතින අවකාශයන් තවදුරටත් පුළුල් කිරීමත්, එයට සමගාමීව අපරව්‍යුහ පහසුකම් ලබා දීමත්, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සඳහා අවකාශ පුළුල් කිරීමත්, ව්‍යාපාරික කටයුතු සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක බවින් යුතු අවකාශ සැපයීමත් අපේක්ෂිත ය.

- *උපක්‍රම 3.1*
  *රත්නපුර නගරය  වෙළඳ වීදි සංස්කෘතියට අනුගත කිරීම*

පදිකයන් ඉලක්ක කරගත් වෙළඳ විදි සංස්කෘතිය මිනිසුන්ට වඩාත් පහසුවෙන් භාණ්ඩ හා සේවා ලබාගැනීමට අවකාශය ලබා දෙන අතරම නගරයට වඩාත් සජීවී බවක් ලබාදෙයි. එබැවින්, මෙම වෙළඳ වීදි සංස්කෘතිය නිසි සැලසුමක් සහ කළමණාකරණයක් සහිතව හඳුනාගත් වීදි මත ප්‍රවර්ධනය කිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ රැසක් නගරයට අත්කර ගත හැකි වේ.

1. රථවාහන වලින් තොර වෙළඳ විදියක් වශයෙන් පල්ලිය පාර සංවර්ධනය කිරීම.









***රූප සටහන් අංක 6.4.8 :*** *පල්ලිය පාර සංවර්ධනය*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

- *උපක්‍රම 3.2*
  *නගරයේ පවතින වාණිජ ව්‍යුහයට පහසුකම් සැලසීම*

රත්නපුර නගරය, තොග සහ සිල්ලර වෙළඳාම මත පදනම් වී ඇති අතර නගරය අවට ප්‍රදේශයේ ජීවත් වන්නේ ග්‍රාමීය ජනගහනයකි (80% ක් පමණ). මහජන පොළ දිනපතාම පවතින අතර නිම් ඇඳුම්, බැංකුකරණ කටයුතු සහ අනෙකුත් මූල්‍යය කටයුතු ද රත්නපුර නගරය මත පදනම් වී ඇත. එහෙයින්, අවට ප්‍රදේශය පෝෂණය කර පවත්වාගෙන යාම සඳහා පවත්නා වාණිජ ව්‍යුහය වෙත පහසුකම් සැපයිය යුතුය.

1. සීවලී ක්‍රීඩාංගනය යාබදව බහු කාර්ය වාණිජ ගොඩනැගිල්ලක් ඉදි කිරීම
2. පොදු පොළ සංකීර්ණය නෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සහ ඒ සඳහා සනීපාරක්ෂක පහසුකම් සහ අනෙකුත් අවශ්‍යය පහසුකම් සැපයීම
3. ගුඩ් ෂෙඩ් මාර්ගයේ ඇති පොල්හුනුව පරිශ්‍රයේ වාණිජ සංකීර්ණයක් ඉදි කිරීම
4. නාගහමුත්තෙට්ටුව පරිශ්‍රයේ හෙළ බොජුන්හලක් සහිතව (දේශීය ආහාර සඳහා) ආපනශාලාවක් ඉදිකිරීම
5. නගර මධ්‍යයේ එක් එක් කලාපයේ වැඩි ප්‍රමාණයක් පවතින ආර්ථික කටයුතු නවදුරටත් එම කලාපයටම ඒකරාශී වන ලෙස පහසුකම් සැපයීමෙන් හා නියාමනයක් සිදු කිරීම මගින් ආර්ථික කාර්යක්ෂමතාව ලබා ගැනීම
6. කලාපීය රෙගුලාසි වලට අනුකූල භාවිතයන් සඳහා යොමුවීම.




***රූප සටහන් අංක 6.4.9 :*** *දේශීය ආර්ථිකය ප්‍රශස්ථකරණ ව්‍යාපෘති*

- *උපක්‍රම 3.3*
  *කලාපීකරණ රෙගුලාසි*

කලාපීකරණ ක්‍රියාවලිය තුළ රත්නපුර නගර සභා ප්‍රදේශය කලාප 10 කට බෙදා ඇත. මෙහිදී ඇතැම් වෙළඳ කටයුතු සඳහා ඇතැම් කලාපවල අවකාශය ලබා දී ඇති අතර ඇතැම් ඒවා සඳහා අවකාශ ලබා දී නොමැත. එක් එක් කලාපයේ පවත්නා භාවිතය සහ ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිත භාවිතය මත පදනම් වෙමින් මෙම නීරණයන්ට එළඹ ඇත. මෙම ක්‍රියාවලිය ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන සිදු කර ඇති අතර වැඩිදුර තොරතුරු 'රත්නපුර නගර සංවර්ධන සැලැස්ම – වෙළුම 02 හි සඳහන් වේ.



**සිතියම් අංක 6.4.4 :** *යෝජිත ආර්ථික සංවර්ධන සැලැස්ම*

# 6.5. තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග

කළු ගඟ ආශ්‍රිතව බිහි වී ඇති රත්නපුර නගරය, කඳුවැටි අතර පිහිටා ඇති වනාන්තර වලින් වට වුණු නගරයක් වන අතර මධ්‍යම කඳුකරයට පිවිසීමේ දොරටුවක් ලෙස ද ක්‍රියා කරයි. පාරිසරික සංවේදී බවින් යුත් නගරයක් ලෙස ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් හඳුනාගැනීමත්, ජාතික භෞතික සැලැස්මට අනුව මෙම ප්‍රදේශය අධිසංවේදී මධ්‍යම පරිසර කලාපයට අයත් සීමාව තුළ පැවතීමත් හේතුවෙන් සමස්ථ ශ්‍රී ලංකාවේ පාරිසරික සමතුලිත බව පවත්වා ගැනීම උදෙසා රත්නපුර නගරය තම අනන්‍ය පාරිසරික තත්ත්වයන් ඉදිරියටත් ආරක්ෂා කරගත යුතු වේ.

| ස්වභාවික පරිසරය | | |
|---|---|---|
| වන ආවරණය | ජලවහන රටාව | භූ විෂමතාවය |
| ස්වභාවික වනාන්තර | ගංගා | කඳුකරය සහ පැතලි භූමිය |
| ඉහළ ජෛව විවිධත්වය | පෝෂක ප්‍රදේශ | මැණික් සහ වෙනත් ඛනිජ |
| අනවසරයෙන් අල්ලා ගැනීම් | පරිසර දූෂණය | නීති විරෝධී පතල් කටයුතු |
| වන විනාශය | | අනවසර ඉදිකිරීම් |
| මානව ජනාවාස | | |

*වගු අංක 6.5.1 : රත්නපුර නගරයේ පාරිසරික ව්‍යුහය*

කළු ගඟ ඇතුළු විවිධ ජල මූලයන් ද අංගම්මන රක්ෂිතය ඇතුළු විවිධ වනාන්තර ප්‍රදේශයන් ද පොම්ප කැලේ වැනි නාගරික වනෝද්‍යානයන් ද රත්නපුරයට ආවේණික සහ අවේණික නොවන ශාක හා සත්ත්වයින් ඇතුළත් ජෛව විවිධත්වයෙන් ද සමන්විත මෙම සැලසුම් ප්‍රදේශය පාරිසරික වශයෙන් ඉතා සංවේදී භූමියක් වුවත් යම් යම් හේතූන් මත පෙර පැවති පරිසර පද්ධතීන් පසුකාලීනව අවදානමට ලක් වී ඇත. (වැඩිදුර තොරතුරු සඳහා තෙවන සහ පස් වන පරිච්ඡේද වෙත යොමුවන්න) එබැවින්, එම පද්ධති යළිත් ප්‍රතිස්ථාපනය කිරීමටත් ප්‍රදේශයට ආවේණික පරිසර පද්ධතීන් තවදුරටත් ශක්තිමත් කිරීමටත් රත්නපුර නගර සැලැස්ම තුළින් අපේක්ෂිත ය.

06 පරිච්ඡේදය
සැලැස්ම

තිරසාර පරිසර
සංවර්ධන උපායමාර්ග

සංරක්ෂණ සැලැස්ම

# පරිසර කළමනාකරණ උපාය මාර්ග

රත්නපුර නගරයේ පාරිසරික ව්‍යුහය පදනම් වන්නේ වන ආවරණය, ජලවහන රටාව, භූගෝලීය පිහිටීම සහ භූ විෂමතාව මතය. නමුත් සංවර්ධනය කළ හැකි අවකාශයන්හි පවතින හිඟ බව හේතුවෙන් වර්තමානයේ දී ස්වභාවික පරිසරය සහ මානව ජනාවාස අතර නිරන්තර අරගලයක් දැකිය හැකි වේ. එබැවින්, මෙම කොට්ඨාශ ද්විත්වය අතර ඒකාබද්ධතාවයක් ඇති කිරීමත් එම පාරිසරික සුරක්ෂිත බව තුළින් හිමිවන ආර්ථික සහ සමාජයීය ප්‍රතිලාභය ප්‍රජාවට හිමිකර දීමත් සංවර්ධන සැලැස්මේ පරිසර කළමනාකරණ උපාය මාර්ගය යි.




***රූප සටහන් අංක 6.5.1 :*** *තිරසාර පාරිසරික උපායමාර්ග*

මෙම සැලැස්මට අනුව රත්නපුර ප්‍රජාවගේ වාසයට සුදුසු නගරයක් බිහිකිරීම යන අවසන් අරමුණ ළඟා කරගැනීම උදෙසා පරිසර කළමණාකරණ උපායමාර්ගය සෘජුවම සම්බන්ධ වන අතර හරිත ආවරණය 40% දක්වා වර්ධනය කිරීමටත් නීල හරිත ජාලයක් ගොඩනැගීම තුළින් ආපදා සඳහා ප්‍රත්‍ය නගරයක් බවට රත්නපුර නගරය පරිවර්තනය කිරීමත් මෙමගින් අපේක්ෂිත ය.

## 6.5.1. සංරක්ෂණ සැලැස්ම

- ***උපක්‍රම 1.1***
  ***තෙත්බිම් සංරක්ෂණය, ජලය රඳවා ගැනීම සහ රැඳවුම් ප්‍රදේශ සංරක්ෂණය කිරීම.***

රත්නපුර නගර සභා සීමාව තුළ පවත්නා ජල රැඳවුම් ප්‍රදේශ ලෙස වගා කරනු ලබන කුඹුරු, අතහැර දමන ලද කුඹුරු, සහ වගුරුබිම් ආදිය හඳුනාගෙන ඇත. නගරය වාර්ෂිකව ගංවතුර උවදුරට මුහුණ දෙනු ලබන හෙයින් ජලගැලීම් වලින් සිදුවන හානිය අවම කිරීම සඳහා ජල රැඳවුම් ප්‍රදේශ සංරක්ෂණය කර තැබීමට සැලසුමෙන් යෝජනා කර ඇත. ඒ අනුව, කුඹුරු හා අත්හරින ලද කුඹුරු ඉඩම් "පාරිසරික සංවේදී කලාපය" යටතට ගැනෙන අතර කලාපීකරණ සැලසුමට අදාළ අනුමත භාවිතයන් පමණක් මෙම ස්ථාන වල සිදු කළ හැකි වේ. මෙහිදී ගොවිජන සේවා පනත පිළිබඳව ද සැළකිළිමත් විය යුතුය. එමෙන්ම, යාබද ප්‍රදේශවල සංවර්ධන කටයුතු අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව, අදාළ ආයතනවල නිර්දේශ අනුව සිදු කළ යුතුය.

- *උපක්‍රම 1.2*
  *වනාන්තර ආරක්ෂා කිරීම*

පවත්නා වන වගාවන් සහ වන රක්ෂිතයන් ද (උදා: අංගම්මන රක්ෂිතය) නාගරික වනෝද්‍යාන ද (උදා : පොම්ප කැළේ) නවදුරටත් සංරක්ෂණය කළ යුතුය. මෙම ස්ථාන "සංරක්ෂිත කලාපය" යටතට ගැනෙන අතර කලාපීකරණ සැලසුමට අදාළ අනුමත භාවිතයන් පමණක් මෙම ස්ථාන වල සිදු කළ හැකි වේ.




***රූප සටහන් අංක 6.5.2 :*** *පොම්ප කැළේ හරිත තීරය*

- *උපක්‍රම 1.3*
  *දර්ශනීය ස්ථාන සංරක්ෂණය කිරීම*

රත්නපුර නාගරික පෙදෙසෙහි පාරවල් බොහොමයක් දර්ශනීය ස්ථාන හරහා ගමන් කරයි. මේ අතර ලෝක උරුමයක් වන ශ්‍රී පාදය ද නැරඹිය හැකි වේ. ඊට අමතරව, නගර සභා සීමාව තුළ දර්ශනීය කුඩා කඳු මුදුන් දක්නට ලැබෙන අතර මේ පිළිබඳව තොරතුරු සවිස්තරාත්මකව ආර්ථික සංවර්ධන උපාය මාර්ගයේදී පැහැදිලි කර ඇත. ඒ අනුව නගරයේ හඳුනාගත් දර්ශනීය ස්ථාන සංරක්ෂණය කල යුතුය. මෙම ස්ථානවල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමේදී ප්‍රදේශයෙහි දර්ශනීය සුන්දරත්වයට අවහිර නොවන පරිදි එය සිදු කළ යුතු අතර මෙම ස්ථානීය වටිනාකම් වලට බාධා වන පරිදි සිදු කෙරෙන සංවර්ධන ක්‍රියාකාරකම් ද පාලනයකට යටත් වනු ඇත.

| *දර්ශනීය ස්ථානයේ නම* | *ප්‍රධාන ආකර්ෂණ* |
|---|---|
| *ආනන්ද මෛත්‍රී විහාර පරිශ්‍රය* | *කඳු මුදුන* |
| *කජුගස්වත්ත විහාර පරිශ්‍රය* | *යෝධ බුදු පිළිම, කඳු මුදුන* |
| *වීරගොඩ විහාර පරිශ්‍රය* | *යෝධ බුදු පිළිමය* |
| *නාලන්ද එල්ලාවල නාගරික උද්‍යාන පරිශ්‍රය* | *නාගරික දර්ශනය* |
| *ඇහැලේපොල අන්තඃපුර මාළිගා පරිශ්‍රය* | *නාගරික දර්ශනය* |
| *ආයුර්වේද කාර්යාල පරිශ්‍රය (මොරගහයට පාලම අසල)* | *ගංගා දර්ශනය* |
| *හිටපු මහ ඇමති බංගලා පරිශ්‍රය (මුවගම පිහිටි රජයේ නිල නිවාස)* | *කඳු මුදුන* |
| *මහවලවත්ත ඉහළ කොට්ඨාශ (Upper Division) පරිශ්‍රය* | *කඳු මුදුන* |

***වගු අංක 6.5.2 :*** *දර්ශනීය ස්ථානයන්හි පවත්නා ආකර්ෂණීය අංග*




**සිතියම් අංක 6.5.1 :** *රත්නපුර නගරයේ සංරක්ෂිත සැලැස්ම*

## 6.5.2. භූ දර්ශන කළමනාකරණ සැලැස්ම

නගරයක පවතින සෞන්දර්යාත්මක බව වැඩිදියුණු කිරීම නගර අලංකරණයෙන් සිදු කෙරේ. මෙම ක්‍රියාවලිය නගරය තුළ පැළ රෝපණය, වර්ණවත් දැන්වීම් පුවරු භාවිතය වැනි සරල දෘශ්‍ය අංගයන්ගෙන් මෙන්ම වීදි ආලෝකකරණය, වීදි ආශ්‍රිත ආසන සැලසුම්කරණය වැනි ක්‍රියාකාරී අංගයන්ගෙන් ද මාර්ග සහ පදික මංතීරු අලංකරණය වැනි යටිතල පහසුකම් ව්‍යාපෘතීන් තුළින් ද සිදු කළ හැකි වේ.

රත්නපුර නගරය පිළිබඳව ප්‍රජාව තුළ සෞන්දර්යාත්මක හැඟීමක් ඇති කිරීම භූ දර්ශන කළමනාකරණ සැලැස්ම තුළින් අපේක්ෂිත ය. මෙහිදී දිගුකාලීන වශයෙන්, භූමි අලංකරණය සහ පවත්වාගෙන යාම පිළිබඳ දැනුවත් කිරීමත් නිසි සම්බන්ධීකරණයක් තුළින් එය සිදු කිරීමත් සැලැස්මේ අරමුණකි. රත්නපුර නගරය, එකිනෙකට වෙනස් මෙන්ම විවිධ වූ භූ දර්ශන සහිතව නිර්මිත නගරයක් හෙයින් මෙම ස්වභාවික සම්පත් ප්‍රශස්තකරණය කිරීම සඳහා විශේෂඥ දැනුමක් සහ නිසි කළමනාකරණයක් යොදාගැනීම අවශ්‍යය වේ. මේ අනුව, රත්නපුර සංවර්ධන සැලැස්ම තුළ ස්වාභාවික භූ දර්ශන (ගස්/ වනාන්තර/ ගංගා/ කඳු), කෘත්‍රිම භූ දර්ශන (නිවාස/ මාර්ග/ උද්‍යාන) සහ නාගරික භූ දර්ශන (නාගරික උද්‍යාන/ උද්‍යාන/ කුඩා පොදු උද්‍යාන/ ප්‍රජාව ඒකරාශී වන පරිසර) පිළිබඳව සැළකිළිමත් වී ඇත.

සැලැස්මෙන් අපේක්ෂිත ප්‍රතිඵල

- අ. *රත්නපුර නගරයේ භූ දර්ශනයේ ස්වභාවය සහ විවිධත්වය සංරක්ෂණය කිරීම හා වැඩිදියුණු කිරීම.*
- ආ. *උද්‍යාන සංරක්ෂණය, නැවත ස්ථාපිත කිරීම, උද්‍යාන නිර්මාණය සහ විනෝදාත්මක කටයුතු සඳහා ස්ථාන ඇතිකිරීම.*
- ඇ. *මිනිස්, ශාක සහ සත්ත්ව යන අංශයන්හි මතු පරපුර සඳහා යෝග්‍ය සෞඛ්‍ය සම්පන්න පරිසරයක් හිමිකර දීම*

ශ්‍රී ලංකාව තුළ පවත්නා අනෙකුත් නගර හා සසඳන විට රත්නපුර නගරයට අනන්‍ය ප්‍රෞඪත්වය සුරක්ෂිත කරගැනීමට මෙන්ම සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම උදෙසා ද නගරයේ සෞන්දර්යාත්මක බව වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍යය වේ. එමෙන්ම, සංවර්ධන සැලැස්මෙහි දෙවන අරමුණට අනුව අනාගත රත්නපුර නගරය සංචාරක මධ්‍යස්ථානයක් බවට පත්කිරීමට අවශ්‍ය පරිසරය සැකසිය යුතු වන අතර මෙහි වාසය කරන ප්‍රජාවට තම නගරයේ සතුටින් ජීවත් වීමටත්, රැකියාවන් කිරීමටත්, නගරයෙන් බැහැරව ගිය පසු එය සෙනෙහසින් සිහි කිරීමටත් හැකි ස්ථානයක් බවට පත් විය යුතු ය.

මෙම උපායමාර්ගය තුළින් ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කර ඇති අතර රත්නපුර නගරය සතු මැණික් සංස්කෘතිය හා ජලජ සම්පත් පිළිබඳ විශේෂ අවධානය යොමු කර ඇත. පරිසර හිතකාමී මෙන්ම සියලු සමාජ ස්ථරයන් නියෝජනය කරන මිනිසුන්ට ද හිතකාමී වූ නීල හරිත වර්ණ ඉස්මතු වූ ආකර්ෂණීය, පිරිසිදු හා තිරසාර බවින් යුත් වීදි දර්ශන සහිත නගරයක් බවට රත්නපුර නගරය පත් කිරීම මෙහි අවසාන අරමුණයි.




***රූප සටහන් අංක 6.5.3 :*** *නාගරික හරිත ස්ථාන*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

- *උපක්‍රම 2.1*
  *පැරණි නගරයට අදාළව භූ දර්ශන සැලැස්ම*

- *උපක්‍රම 2.1.1*
  *ගං ඉවුරු වල භූ දර්ශනය*

කලු ගඟ ඉවුර රත්නපුර නගරයේ වැදගත් කොටසක් වන අතර මෙම නිශ්චිත තීරය කළුගඟ රක්ෂිතයට අයත් වේ. මෙම තීරය රේඛීය උද්‍යානයක් බවට පරිවර්තනය කිරීමත් ඒ ආශ්‍රිතව පවත්නා පාලම් හා දර්ශනීය ස්ථාන සඳහා ප්‍රමුඛතාව දෙමින් දියදිසි සංවර්ධනයක් (Waterfront Development) කිරීමත් ඒ මගින් ඉහළ සෞන්දර්යාත්මක අගයක් නගරයට හිමිකර ගැනීමත් නාගරික සැලසුමෙන් අපේක්ෂිත ය. එසේම, මෙම අලංකරණ කටයුතු කිරීමේදී ගං ඉවුරු වල සිටුවීමට තෝරා ගනු ලබන ශාක වර්ග රත්නපුර ප්‍රදේශයට අවේණික ශාක වීමත් ගංවතුර තත්ත්වයනට යෝග්‍ය වීමත් අත්‍යාවශ්‍ය වේ.




***රූප සටහන් අංක 6.5.4 :*** *ගං ඉවුර සංවර්ධනය හා භූ දර්ශන අලංකරණය*

- *උපක්‍රම 2.1.2*
  *දර්ශනීය ස්ථානවල භූ දර්ශනය*

රත්නපුර නගරය තුළ පවත්නා දර්ශනීය ස්ථාන පෙන්නුම් කරන්නේ මෙම නාගරික ප්‍රදේශයට අනන්‍ය වූ භූ දර්ශනයයි. එය රත්නපුර නගරයේ ප්‍රතිරූපය ගොඩනැංවීමටත් වෙනත් නගර වලින් රත්නපුර නගරය වෙන් කර හඳුනා ගැනීමටත් ඉවහල් වේ. එය මෙහි වසන ප්‍රජාවගේ ක්‍රියාකාරී ජීවිතය සමග සෘජුවම සම්බන්ධ වන බැවින් යෝග්‍ය පරිදි යොදාගන්නා භූමි අලංකරණ කටයුතු තුළින් දර්ශනීය ස්ථානයන්හි වටිනාකම ඉහළ නැංවීම අවශ්‍ය වේ.

- *උපක්‍රම 2.1.3*
  *මාර්ගවල භූ දර්ශනය*

රත්නපුර නගරය ඈත අතීතයේ සිටම මැණික් වෙළඳාම පිණිස වෙන්වූ විදි සඳහා ප්‍රසිද්ධය. එසේම සමහර විදි, ජනාකීර්ණ වෙළඳ විදි ලෙස ද කටයුතු කරයි. මේ අනුව, රත්නපුර නගර සංවර්ධනයේ දී විදි අලංකරණය කිරීම අත්‍යාවශ්‍ය වේ.

- විදි මාදිලි 1 – ප්‍රධාන විදිය, මැණික් වෙළඳාම ආශ්‍රිත වාණිජ කටයුතු සඳහා වූ රේඛිය අවකාශ සහිත මාර්ගයක් ලෙස භූමි අලංකරණ සහ වීථි අලංකරණ සහිතව පහසුකම් සැපයීමට යෝජිත ය. දෙපස වීථි පුළුල් කර හඳුනාගත් ස්ථානයන්හි දී අසුන් ගැනීමේ පහසුකම් ලබාදීම මෙහිදී අපේක්ෂිත ය.

- විදි මාදිලි 2 – ශාවියා මාවත, මැණික් වෙළඳාම ආශ්‍රිත වාණිජ කටයුතු සඳහා වූ රේඛිය අවකාශ සහිත මාර්ගයක් ලෙස භූමි අලංකරණ සහ වීථි අලංකරණ සහිතව පහසුකම් සැපයීමට යෝජිත ය. දෙපස වීථි පුළුල් කර හඳුනාගත් ස්ථානයන්හි දී අසුන් ගැනීමේ පහසුකම් ලබාදීම මෙහිදී ද අපේක්ෂිත ය.

- විදි මාදිලි 3 – දෙමුවාවත විදිය, මැණික් වෙළඳාම ආශ්‍රිත වාණිජ කටයුතු සඳහා වූ රේඛිය අවකාශ සහිත මාර්ගයක් ලෙස භූමි අලංකරණ සහ වීථි අලංකරණ සහිතව පහසුකම් සැපයීමට යෝජිත ය. දෙපස වීථි පුළුල් කර හඳුනාගත් ස්ථානයන්හි දී අසුන් ගැනීමේ පහසුකම් ලබාදීම මෙහිදී ද අපේක්ෂිත ය.

- විදි මාදිලි 4 – පල්ලිය පාර, වෙළඳ වීථියක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂිත බැවින් පදිකයින් ඉලක්ක කරගත් වෙළඳ කටයුතු පහසුවෙන් කරගැනීම උදෙසා අවශ්‍ය පහසුකම් සැපයීම යෝජිත ය. ඒ සඳහා ගැළපෙන භූමි අලංකරණ සහ වීථි අලංකරණ සහිතව මෙම වීථිය සැකසීම මගින් එහි අනන්‍යතාව සුරක්ෂිත කිරීම මෙහිදී අපේක්ෂිත ය.

- විදි මාදිලි 5 – සේනානායක මාවත, බණ්ඩාරනායක මාවත, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත (කොළඹ – මඩකලපුව A 004 මාර්ගය) සහ ගුඩ් ෂෙඩ් මාර්ගය පදික හිතකාමී මාර්ගයන් බවට පත් කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම යෝජිත ය. ඒ සඳහා අවශ්‍ය පදික මංතීරු, ආරක්ෂිත වැටවල් සහ අවශ්‍ය ස්ථාන්යන්හිදී ගැළපෙන භූමි අලංකරණ සහ වීථි අලංකරණ සහිතව මෙම මාර්ග සැකසීම මගින් ඒවායේ අනන්‍යතාව සුරක්ෂිත කිරීම මෙහිදී අපේක්ෂිතය.




***රූප සටහන් අංක 6.5.5 :*** *රත්නපුර නගර මධ්‍යයේ ඇති මාර්ග සහ මංසන්ධි*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

- *උපක්‍රම 2.1.4*
  *නගර අලංකරණ ප්‍රවේශය (Urban Design Approach)*

වර්තමානයේදී, රත්නපුර නගරය එහි වාසය කරන ප්‍රජාවට හා නගරයට පැමිණෙන ආගන්තුකයන්ට ප්‍රසන්න දර්ශණයක් නොපෙන්වන අතර සුවපහසු බවක් හා සෞන්දර්යාත්මක බවක් ලබා නොදෙයි. මිණිපුර අනන්‍යතාව තවදුරටත් මෙම නගරයෙන් පිළිබිඹු නොවන අතර නගරය තුළට පිවිසීමෙන් අනතුරුව ව්‍යාකූලත්වයට හා තදබදයට හසුවීමට පමණක් මිනිසුන්ට සිදු වේ. එබැවින්, මෙම තත්ත්වය මගහරවා ප්‍රජා හිතකාමී, සුරැකි, සුසැදි, සොඳුරු නගරයක් නිර්මාණය කිරීම උදෙසා ඉහත සියලු ගැටළු සහ අනන්‍යතා පිළිබඳ සැළකිළිමත් වූ නගර අලංකරණ ප්‍රවේශයක අවශ්‍යතාව රත්නපුර නගරයට ඇත.

- මැණික් ව්‍යාපාරිකයින්ට එක් රැස් වීමට සහ තමන්ගේ ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට නගර මධ්‍යය තුළ චතුරශ්‍ර මාදිලියේ විවෘත අවකාශ නිර්මාණය කිරීම
- නගරයට ඇතුළු වන ස්ථානයන් සහ කේන්ද්‍රීය ස්ථානයන්හි මැණික් ආශ්‍රිත මූර්ති නිර්මාණය කිරීම

- *උපක්‍රම 2.1.5*
  *පටු මංමාවත් වල භූ දර්ශනය*

රත්නපුර නගර මධ්‍යය තුළ පටු මංමාවත් රැසක් දැකිය හැකි අතර පදිකයින්ගේ පහසුව උදෙසා නිර්මාණය කරගත් මෙම කුඩා අතුරු මාර්ග හේතුවෙන් ආර්ථික හා සාමාජයීය අවශ්‍යතා පහසුවෙන් සහ ඉක්මණින් කරගැනීමට ප්‍රජාවට අවකාශ සැලසී ඇත. මෙම මාර්ගයන් තුළ ආලෝකකරණය, අලංකරණය සහ සුවපහසු බවත් ආරක්ෂාවත් තහවුරු කළ හැකි අනන්‍යතාවයට හානි නොවෙන සංවර්ධන ක්‍රියාවලියක් මගින් අනාගත නාගරික ජනතාවගේ ඇවිදීමේ අවකාශය ඉහළ නැංවෙනු ඇත.




***රූප සටහන් අංක 6.5.6 :*** *හඳුනාගත් පටු මාර්ග මාදිලි*
***මූලාශ්‍රය :*** *ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*




**සිතියම් අංක 6.5.2 :** සංවර්ධනය කිරීම පිණිස හඳුනාගත් පටු මංමාවත්

හඳුනාගත් පටු මාර්ග

- මොරගහයට ලී මඩුව අසළින් ඇතුලු වී "කැලේ කඩේ" අවන්හල අසළින් පිටවීම
- ලෝක වෙළඳපොල අසළින් ඇතුලු වී "නවාතැන" අවන්හල අසළින් පිටවීම
- ධර්මපාල විදුහල අසළින් ඇතුලු වී IOC එක (බණ්ඩාරනායක මාවත) අසළින් පිටවීම.
- ගුඩ් ෂෙඩ් මාර්ගයෙ පාලිත ස්ටෝර්ස් අසළින් ඇතුලු වී ආලෝක රෝහල ඉදිරිපිටින් සහ පල්ලිය පාරෙන් පිටවීම
- ඉන්දික හෝටලය අසළින් ඇතුළුවී පල්ලිය පාරෙන් පිටවීම
- මහජන පොළ අසළින් ඇතුලු වී DFCC බැංකුව එක අසළින් පිටවීම
- ශාන් වෙලඳසල (බණ්ඩාරනායක මාවත) අසළින් ඇතුලු වී මහජන පොළ ඉදිරිපසින් පිටවීම

- *උපක්‍රම 2.2*
  *නව නගරයට අදාළව භූ දර්ශන සැලැස්ම*

- *උපක්‍රම 2.2.1*
  *මංසන්ධීන්හි භූ දර්ශනය*

රත්නපුර නගරයේ අනන්‍යතාවය මැණික් සහ ජලය වන අතර නගරයට පිවිසෙන මිනිසුන්ට එය දැනවීම මෙහි අරමුණයි. නගර අලංකරණ ප්‍රවේශයේදී වෙළඳ නගරය පිළිබඳව සැලකිළිමත් වූ හෙයින් නව නගරයේ මංසන්ධි අලංකරණයේදී ජලය මූලික කරගැනීම අපේක්ෂිත වේ. මේ අනුව, පරිපාලන නගරයට ඇතුළු වන පිරිසගේ මානසික සුවය වර්ධනය කිරීමට සහ නගර අලංකරණය පිණිස වතුරමල් ආදිය යොදාගැනීම යෝජිත ය.

- හිදැල්ලන හන්දියට වතුර මලක් ඉදි කිරීම
- උසාවිය හන්දියට වතුර මලක් ඉදි කිරීම

- *උපක්‍රම 2.3*
  *පොදු විවෘත ප්‍රදේශවල භූ දර්ශනය*

නාගරික උද්‍යාන පිහිටුවීම හා නඩත්තු කිරීම මගින් ප්‍රතිලාභ රාශියක් ළඟාකරගත හැක. නාගරිකයන් දිනපතා ශාරීරික ක්‍රියාකාරකම්වල නිරතවීම වැඩි වීම, සොබාදහම සමග දරුවන්ගේ ඇති බැඳීම වර්ධනය වීම, මිනිසුන් නිරතුරුව ඒ ආශ්‍රිතව රැඳී සිටීම මගින් එකිනෙකා කෙරෙහි සුරක්ෂිත බව ඇතිවීම හේතුවෙන් අපරාධ අවම වීම, මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීම මෙන්ම ආර්ථික සංවර්ධන අවස්ථා වැඩි වීම ආදී ප්‍රතිලාභ ප්‍රජාවට හිමිකර දීම උදෙසා නාගරික උද්‍යාන වැදගත් කාර්යභාරයක් ඉටු කරන බැවින්, හඳුනාගත් පොදු විවෘත ප්‍රදේශ වල ප්‍රමාණවත් සෙවන සහ යෝග්‍ය වූ භූමි අලංකරණයක් සහිතව මෙම පොදු අවකාශ නිර්මාණය කිරීමට නිර්දේශ කරනු ලැබේ.

1. නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය සංවර්ධනය කිරීම
2. නානමලදොල රක්ෂිතය කුඩා නාගරික උද්‍යානයක් බවට පරිවර්තනය කිරීම
3. තරුණ බෞද්ධ සංගම් පරිශ්‍රය (YMBA) හරිත පොදු අවකාශයක් බවට පරිවර්තනය කිරීම
4. නාගහමුන්නෙට්ටුව පරිශ්‍රය කුඩා පොකුණක් සහ හෙල බොජුන් හලක් ඇතුළුව සංවර්ධනය කිරීම. (ඇහැලේපොළ කෞතුකාගාර පරිශ්‍රය ද ඒ ආසන්නයේම පවතින හෙයින් සංවර්ධන කටයුතු අවසන් වීමෙන් පසු මෙම පරිශ්‍රයන් ඒකාබද්ධව දිස්වන අතර රත්නපුර නගර මධ්‍යයේ පවතින සුවිසල් උද්‍යාන කලාපයක් බවට එය පත් වනු ඇත)
5. ලේන්නැඩිය පරිශ්‍රයයේ තෙත්බිම් උද්යානයක් නිර්මාණය කිරීම




***රූප සටහන් අංක 6.5.7 :*** *නව නගරයේ භූමි අලංකරණය සඳහා තෝරාගත් අවකාශයන්*




***රූප සටහන් අංක 6.5.8 :*** *වෙළඳ නගරයේ භූමි අලංකරණය සඳහා තෝරාගත් අවකාශයන්*

- *උපක්‍රම 2.4*
  *පියසි මතුපිට භූ දර්ශනය*

හරිත පියසි වැසි ජලයෙහි දූෂක අවශෝෂණය කරන අතර වැසි ජලය පිටාර ගැලීම අඩු කිරීමෙන් සහ ප්‍රමාද කිරීමෙන් ජල කළමනාකරණයට සහාය වේ. එමෙන්ම එය වායුගෝලීය උෂ්ණත්වය අඩු කිරීමෙන් නාගරික තාප බලපෑම අඩු කිරීමට උපකාරී වේ. නගරයේ එක් පියැස්සක් වුව හරිත පියසි බවට පරිවර්තනය කිරීමෙන් විශාල වෙනසක් දැකිය හැකි වේ. එනිසා නගරයේ සෑම පියස්සක්ම හරිත පියසි බවට පරිවර්තනය කිරීම නිර්දේශ කරනු ලැබේ.

- *උපක්‍රම 2.5*
  *ගල් ඇතිරීමේ භූ දර්ශනය*

ශාඛා මනාව වර්ධනය වියහැකි අයුරින් ගස් සිටුවීමට ප්‍රමාණවත් ඉඩකඩක් වෙන් කර ගල් ඇතිරීම් සිදු කිරීමට යෝජිතය. අනාගතයේදී ගස් වියන් බිහිවීම මගින් වායු දූෂණයෙන් අවම වූ පරිසරයක් ලබා ගැනීමටත් ගල් ඇතිරීම් රටා සහ සෙවණ වූ පදික මංතීරු හේතුවෙන් නගරය තුල ඇවිදින්නන්ව තවදුරටත් දිරිමත් කිරීමත් අපේක්ෂිත ය.

- *උපක්‍රම 2.6*
  *භූ දර්ශනය ආලෝකකරණය*

යෝජිත ආලෝකකරණයේ ප්‍රධාන ලක්ෂණය විය යුත්තේ වීථි සහ අත්‍යාවශ්‍ය ස්ථාන ආලෝකමත් කරමින් ආලෝකය විහිදීමයි. මේ සඳහා විවිධ ක්‍රම, එනම් ගස් ආලෝකකරණය, ගොඩනැගිලි පියසි මතින් මඟී සහ වාහන සඳහා ආලෝකකරණය සැපයීම ආදිය යොදාගත හැකිය. මෙහි ඉලක්කය වන්නේ ප්‍රධාන නගරයේ ආරක්ෂිතව ගමන් කිරීමයි. ඒ සඳහා 'සුහුරු ආලෝකකරණ ක්‍රමය" යෝජනා කර තිබේ. (වැඩි විස්තර සඳහා විදුලි හා දත්ත පරිච්ඡේදය බලන්න)

## 6.5.3. ආපදා අවදානම කළමණාකරණය කිරීමේ සැලැස්ම

රත්නපුර නාගරික ප්‍රදේශය නිරන්තර ගංවතුරට භාජනය වන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති අතර නායයෑම්, සුළි කුණාටු සහ අකුණු තත්ත්වයන් ද දැකිය හැකි වේ. මේ සඳහා බලපා ඇති හේතූන් පිළිබඳ විමසා බලන විට ඇතැම් ඒවා ස්වභාවික වන අතර ඇතැම් හේතු සාධක මනුෂ්‍යය ක්‍රියාකාරකම් සමග සම්බන්ධ වී ඇත. (වැඩි විස්තර සඳහා 3 හා 5 වන පරිච්ඡේදය බලන්න)

රත්නපුර නගරය, ආපදා සහිත පරිසරයක් වුවද නගරය සතුව මෙම ආපදා තත්ත්වයනට මුහුණ දීමට පවතින විභවතාවයන් ද රාශියකි. මේ යටතේ ප්‍රජාව සතුව පවතින ආපදා පිළිබඳ පාරම්පරික දැනුම මෙන්ම ආපදා කළමණාකරණ කුසලතා සහ පුහුණු නිපුණතාවන් ද රජය සහ රාජ්‍යය නොවන සංවිධාන විසින් ආපදා කළමනාකරණය සඳහා කෙරෙන ඍජු මැදිහත් වීම ද ඒකාබද්ධ සංවර්ධන කටයුතු සඳහා සිදු කෙරෙන ආයතනික මැදිහත් වීම් ද ප්‍රජා මූලික නායකත්වයන් ද වඩා සුරක්ෂිත ස්ථානයක පර්පාලන නගරය ස්ථාපිත කිරීම වැනි සැලසුම්කරණ ප්‍රවේශයන් ද හඳුනා ගත හැකිය.

*ආපදා කළමනාකරණ උපක්‍රම*




***රූප සටහන් අංක 6.5.9 :*** *ආපදා කළමනාකරණ උපායමාර්ග*

- ***උපක්‍රම 3.1***
  ***ආපදා ස්වභාවයේ තීව්‍රතාවය අඩු කිරීම***

- ***උපක්‍රම 3.1.1***
  *රෙගුලාසි*

- ***උපාය මාර්ග 1.1 : ආපදා ප්‍රදේශ සඳහා රෙගුලාසි හඳුන්වා දීම***

රත්නපුර නාගරික ප්‍රදේශයට ගලන ගංවතුර එහි ස්වභාවය අනුව සුළු ගංවතුර, ප්‍රධාන ගංවතුර, සහ අවදානම් සහිත ගංවතුර ලෙස හඳුනාගත හැකි අතර මෙම ස්වභාවයන්ට අනුකූලව එයට හසුවන භූමිය ද ඉදිකිරීම් තහනම් කලාප, සීමිත කලාප සහ අවදානම් කලාප ලෙස වර්ග කළ හැකි වේ. මේ අනුව, ගංවතුර සහ නායයාම් කලාප සඳහා සිතියම් සකසා ඇති අතර එම උපද්‍රවයන්ගේ ස්වභාවයන්ට අනුකූල ව රෙගුලාසි ද සකස් කර ඇත.

අන්තරායකර නායයෑම් සම්බන්ධයෙන් හඳුනාගත් නිර්ණායක වන්නේ බෑවුම් පරාසය සහ කාණ්ඩයන්, භූමියේ පවතින මව් පාෂාණයේ ස්වභාවය, භූමිය සැකසී ඇති ආකාරය, වර්තමාන ඉඩම් පරිහරණ රටාව, එම භූමියට අදාළව පවත්නා නාය යෑම් ඉතිහාසය, ජලවහන රටාව සහ කාණු පද්ධතිය යි. ඒ අනුව ඉදිකිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන සීමා කිරීම් ජනතාවට ලබා දෙනු ඇත.

තහනම් (දැඩි අවදානම් සහිත) ප්‍රදේශ

- කිසිදු ඉදිකිරීම් කටයුත්තකට අවසර නොමැත.
- පවත්නා ජනාවාස වෙනත් සුදුසු තැනක ස්ථානගත කළ යුතු ය.
- රුක් රෝපණ කටයුතු නැවත සිදු කිරීමේ වැඩසටහන් සිදු කළ යුතු ය.

සීමාසහිත (මැදි අවදානම් සහිත) ප්‍රදේශ

- දැනට පවතින ජනාවාස වැඩිදියුණු කිරීමේදී ඉදිකිරීම් සම්බන්ධ රෙගුලාසි දැඩිව අනුගමනය කළ යුතු ය.
- මෙම කලාපයට අදාළ ගොඩනැගිලි රෙගුලාසි අනුගමනය කරන්නේ නම් පමණක් නව ඉදි කිරීම් අනුමත කළ යුතු ය.
- කැණීම් කටයුතු තහනම් වේ.

අනතුරු ඇඟවීම් සහිත (අඩු අවදානම්) ප්‍රදේශ

- ගොඩනැගිලි රෙගුලාසි අනුගමනය කිරීමට පදිංචිකරුවන් දිරිගැන්වේ.

- *උපාය මාර්ග 1.2 : නායයෑම් හා ගංවතුරට අනුගත වීමට රෙගුලාසි හඳුන්වා දීම*

    - ගංවතුර උවදුරට ලක් වන දැඩි අවදානම් සහ මැදි අවදානම් සහිත ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මාර්ගෝපදේශ හඳුන්වා දීම
    - ගංවතුර උවදුරට ලක් වන ප්‍රදේශවල බිම් මහලේ වාහන නැවැත්වීම සඳහා රෙගුලාසි සම්පාදනය කිරීම
    - ගංවතුර ආපදා අවස්ථාවලදී සුමටව ගං වතුර ගැලීම සඳහා ඉඩ සැලසීමට, නිවාස වෙන් කිරීම සඳහා සිමෙන්ති තාප්ප නිර්මාණය කිරීම සීමා කිරීමට රෙගුලාසි හඳුන්වා දීම
    - මැදි අවදානමක් සහිත නාය යැමේ ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම

- *උපාය මාර්ග 02 : භූමි පරිහරණය සීමා කිරීම*

කලාපීකරණ රෙගුලාසි හරහා මාර්ගෝපදේශ හඳුන්වාදීම

- *උපාය මාර්ග 03 : තෝරාගත් ප්‍රදේශ වල පතල් කැනීම් කටයුතු සඳහා සීමාවන් පැනවීම*

නායයාම් සඳහා දැඩි අවදානම් සහ මැදි අවදානම් සහිත ප්‍රදේශවල පතල් කටයුතු සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම

- *උපාය මාර්ග 04 : ගංගා සහ ඇළ මාර්ග රක්ෂිත ආරක්ෂා කිරීම*

රක්ෂිත කලාපයන්හි ඉදිකිරීම් නොකිරීමට සහ හඳුනාගත් විශේෂ ස්ථානයන්හි, අනුමත ඉදිකිරීම් පමණක් සිදු කිරීමට මාර්ගෝපදේශ හඳුන්වාදීම

- *උපාය මාර්ග 05 : මතුපිට සහ භූගත ජලය නගර ජලාපවහන මාර්ගයට එකතුවීම අවම කිරීම*

    - ගෘහ අපජලය සඳහා ජල පෙරහන පද්ධති හඳුන්වාදීම
    - හරිත පියසි පද්ධති හඳුන්වාදීම

ඉහත කරුණු හා සම්බන්ධ රෙගුලාසි රත්නපුර නගර සැලසුම – වෙළුම 02 හි සඳහන් ව ඇත.

## 06 පරිච්ඡේදය
## සැලැස්ම

නිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග

ආපදා අවදානම කළමණාකරණය කිරීමේ සැලැස්ම

- *උපක්‍රම 3.1.2*
  *විශේෂ ව්‍යාපෘති*

- *උපාය මාර්ගය 01 :*
  *කළු ගඟ හැරවීම*

විකල්ප 01 : කළු ගඟ උඩවලව ජලාශයට හැරවීම




***රූප සටහන් අංක 6.5.10 :*** *කළු ගඟ හැරවීම*

විකල්ප 02 : ගංවතුර කාලයේදී වෙරළුපේ වැව ආසන්නයෙන් කළු ගඟ හැරවීම (අතිරික්ත ජල ප්‍රවාහය)

- *උපාය මාර්ගය 02:*
  *ජල රැඳවුම් ප්‍රදේශ විනෝදජනක අවකාශයන් සඳහා පරිවර්තනය කිරීම*

  - ව්‍යාපෘතිය 01: වෙරළුප ජල රැඳවුම් වැව ඉදිකිරීමේ ව්‍යාපෘතිය
  - ව්‍යාපෘතිය 02: වෙරළුප ක්‍රීඩාංගනය ඉදිකිරීම
  - ව්‍යාපෘතිය 03: ලේන්නැඩිය වගුරු භූමිය තෙත්බිම් උද්‍යානයක් ලෙස පරිවර්තනය කිරීම
  - ව්‍යාපෘතිය 04: කලු ගඟ රක්ෂිත ප්‍රදේශය ආශ්‍රිතව තෝරාගත් ප්‍රදේශ වල ගං ඉවුරු සංවර්ධනය කිරීම
  - ව්‍යාපෘතිය 05: කළු ගඟ ඉවුර හරහා ජල පාලක පැනි බැම්මක් ගොඩනැගීම සහ දියදිසි සංවර්ධනයක් (Waterfront Development) සිදු කිරීම




***සිතියම් අංක 6.5.3 :*** *ගංවතුර උවදුර බලපාන ප්‍රදේශ*



**සිතියම් අංක 6.5.4 :** පාරිසරික සංවේදී ප්‍රදේශ




**සිතියම් අංක 6.5.5 :** විවේක හා විනෝද කටයුතු සඳහා යෝජිත වෙරළපෙ කලාපය




**සිතියම් අංක 6.5.6 :** .විවේක හා විනෝද කටයුතු සඳහා යෝජිත නගර මධ්‍යය කලාපය

- *උපාය මාර්ගය 02 :*
  *ජල පාලක පැති බැම්මක් ඉදිකිරීම*

ජල පාලක පැති බැම්ම යනු ගංවතුර වළක්වා ගැනීම හෝ එහි තීව්‍රතාවය අවම කරගැනීම සඳහා ගොඩනගන බාධකයකි. මෙය ජලජ ඉංජිනේරු විද්‍යාවේ ප්‍රධාන තාක්ෂණික අංග අතරින් එකක් වන අතර ජලය ඉවත් කර භූමිය ප්‍රයෝජනවත් ලෙස යොදාගැනීමට එය උපකාරී වේ. එබැවින්, වරකාතොට පාලම ප්‍රදේශයේ සිට ආයුර්වේද කාර්යාල ප්‍රදේශයය දක්වා ජල පාලක පැති බැම්මක් ඉදි කිරීම වාර්ෂික ගංවතුර උවදුරෙන් නගරය ආරක්ෂා කිරීම සඳහා ප්‍රයෝජනවත් වේ.




***රූප සටහන් අංක 6.5.11 :*** *ජල පාලක පැති බැම්ම*

- *උපාය මාර්ගය 03 :*
  *බෑවුම් ස්ථානයන්හි ස්ථායිතාවය වැඩි දියුණු කිරීම*

  - රත්නපුර – කොළඹ මාර්ගයේ ජාතික කෞතුකාගාරය ඉදිරිපිට බෑවුම සඳහා ජෛව තාක්ෂණික ස්ථායීකරණ හා පාංශු ජීව විද්‍යාත්මක ස්ථායීකරණ (මෘදු – ඉංජිනේරු විසඳුම්) යෙදීම.
  - වටරවුම් මාර්ගය ආරම්භක ස්ථානය ආසන්නයේ ඉහළ භූමි ප්‍රදේශයේ බෑවුම නාය යාම වැලැක්වීම සඳහා දැල් යොදා ගැනීමේ තාක්ෂණය (Mesh Net Technology) භාවිතා කිරීම. (බෑවුම් ස්ථානයන්හි ස්ථායිතාවය ඇති කිරීම සඳහා)

- *උපාය මාර්ගය 04 :*
  *ආපදා කාල සීමාව තුළ ගමනා ගමන ජාලය පහසු කිරීම*

  - යෝජිත විකල්ප මාර්ගය – වෙරළුප හන්දිය සිට වරකාතොට පාලම දක්වා
  - මාර්ග සංවර්ධනය කිරීම – රත්නපුර මූලික රෝහලේ සිට නව නගරය වෙත (සමන් පෙදෙස ප්‍රදේශය)
  - A 004 මාර්ගයේ රෝහල සහ නව නගරය අතර දූරියන්ගස්දෙක මංසධිය ප්‍රදේශයේ මාර්ගය ප්‍රතිසංවර්ධනය කිරීම

- *උපාය මාර්ග 05 :*
  *හදිසි සේවා සඳහා සැහැල්ලු ගුවන් යානා ගොඩබැස්වීමේ ස්ථාන ඉදිකිරීම්*

  - ගොඩබැස්වීමේ ස්ථාන 01 – නිවපු දිස්ත්‍රික් විනිසුරු බංගලාව
  - ගොඩබැස්වීමේ ස්ථාන 02 – පැරණි සමාජ ශාලා (Upper Club) පරිශ්‍රය
  - ගොඩබැස්වීමේ ස්ථාන 03 – සීවලී විදුහල් ක්‍රීඩාංගනය
  - ගොඩබැස්වීමේ ස්ථාන 04 – දිස්ත්‍රික් විනිසුරු බංගලාව (අනපන්තු වලව්ව ) පරිශ්‍රය
  - ගොඩබැස්වීමේ ස්ථාන 05 – යෝජිත තිරිවානකැටිය පාසල් පරිශ්‍රය




***රූප සටහන් අංක 6.5.12 :** යෝජිත ගුවන්යානා ගොඩබැස්වීමේ ස්ථාන*

- *උපාය මාර්ගය 06 :*
  *ආපදා සහන සැපයිය හැකි මධ්‍යස්ථාන වෙත ආපදාවන්ට පූර්වයෙන් පහසුකම් සැලසීම*

  - බටුගෙදර – ශෛලනලාරාම පන්සල පරිශ්‍රය
  - තිරිවානකැටිය පන්සල (කෝවිල අසල) පරිශ්‍රය
  - කොස්පැලවින්න පාසැල් පරිශ්‍රය
  - මුවගම්කන්ද පන්සල් පරිශ්‍රය
  - රත්නපුර කන්‍යාරාම පාසැල් පරිශ්‍රය
  - ලන්දේසි කොටුව පරිශ්‍රය
  - ශාන්ත ඇලෝසියස් පල්ලිය පරිශ්‍රය
  - රත්නපුර සුමනා බාලිකාව ඉදිරිපිට පිහිටා ඇති රජයේ නිල නිවාස
  - කහන්ගම පාසැල් පරිශ්‍රය
  - ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාල පරිශ්‍රය

- *උපාය මාර්ගය 07 :*
  *ගුවන් මගී පාලම් ඉදිකිරීම*

    - ධර්මපාල විදුහලේ සිට බස් පර්යන්තය දක්වා
    - තරුණ බෞද්ධ සංගම් පරිශ්‍රයේ සිට මහජන සති පොළ දක්වා




***රූප සටහන් අංක 6.5.13 :*** *යෝජිත ගුවන් මගී පාලම්*

- *උපාය මාර්ග 08 :*
  *පානදුර මාර්ගයේ ඇල්ලගාව ප්‍රදේශයේ පත්තිනි දේවාලය අසළදී කළු ගඟේ ස්වභාවික, සුමට බැස්මට අවහිර වන සේ පිහිටා ඇති කළු ගල කඩා ඉවත් කිරීම*

- *උපාය මාර්ග 09 :*
  *කාණු පද්ධති සැලැස්ම*

රත්නපුර මහ නගර සභා සීමාව තුළ පවතින කාණු පද්ධතිය පිළිබඳව නැවත වරක් සමීක්ෂණයක් සිදු කර මේ වන විට අවහිර වී ඇති ස්ථානයන්හි බාධා ඉවත් කර අවශ්‍ය ස්ථානයන්හි පිළිසකර කිරීම් සිදු කර සුමට ජල බැස්මක් රත්නපුර නගර සීමාව තුළ ඇති කිරීම.




**සිතියම් අංක 6.5.7 :** *අභ්‍යන්තර ජලවහන රටාව*




සිතියම් අංක 6.5.8 : ආපදා කළමනාකරණ සැලැස්ම

- *උපක්‍රම 3.2*
  *ජනතාවගේ අවදානම අවම කිරීම*

ආපදා කළමනාකරණය සඳහා වූ ප්‍රයත්නයක, පළමු පියවර වන්නේ උපද්‍රව සිතියම් උපයෝගී කොටගෙන අවදානම් මට්ටම සහ අවදානම් සාධක පිළිබඳ විස්තර (සමාජ, ආර්ථික, භෞතික හා පාරිසරික වත්කම්) විශ්ලේෂණය කිරීමයි. ඉන් අනතුරුව මෙම විශ්ලේෂණයන් පදනම් කරගනිමින් සකස් කරනු ලබන උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් තුළින් ආපදා තත්ත්වයන්ගේ අවදානම අවම කරගැනීමට හැකියාව ලැබේ.




***රූප සටහන් අංක 6.5.14 :*** *පාරිසරික අවදානම*
***මූලාශ්‍රය :*** *එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන විසින් 2013 වසරේදී සිදුකරන ලද ආපදා ප්‍රත්‍ය නගර සංවර්ධන උපායමාර්ග සකස් කිරීමේ අධ්‍යයනය*

- *උපක්‍රම 3.2.1*
  *පූර්ව ආපදා අවස්ථාව*

- *උපාය මාර්ග 01 :*
  *ජංගම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය හඳුන්වාදීම*

පූර්ව ආපදා අවස්ථාවේදී ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය විසින් ආපදා තත්ත්වය පුරෝකථනය කිරීමක් සිදු කෙරෙනු ලබන අතර එම තොරතුරු ප්‍රජාව වෙත සන්නිවේදනය කිරීම සඳහා කැළි කසළ වෙනුවෙන් නිපදවන සන්නිවේදන මෘදුකාංගයම භාවිතයට ගැනීම වඩා කාර්යක්ෂම වේ. මෙහිදී ජනතාව දැනුවත් කිරීම උදෙසා පහත පරිදි තොරතුරු ලබාදීම සුදුසු වේ.

- සතියකට පෙර
- දින 2 ට පෙර
- ආපදා අතරතුර
- ආපදාවෙන් පසු (මාස 01 දක්වා)

- *උපාය මාර්ග 02 :*
  *පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය හඳුන්වාදීම*

ආපදා කළමණාකරණ කාර්යාලය, ආපදා තත්ත්වයන්ට පූර්වයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සමග සම්බන්ධ වී ආපදා තත්ත්වයන් පුරෝකථනය කර දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ජනතාව දැනුවත් කිරීම සුදුසු වේ.

- පියවර I – ප්‍රතිචාර දැක්වීමට සූදානම් වීම
- පියවර II – නිරීක්ෂණය සහ අධීක්ෂණය
- පියවර III – සන්නිවේදනය සහ බෙදා හැරීම
- පියවර IV – සමාලෝචනය කිරීම සහ එම ක්‍රියාවලීන් ඉදිරියට පවත්වාගෙන යාම (ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමග)

- *උපාය මාර්ගය 03 :*
  *පූර්ව ආපදා සමාලෝචන රැස්වීම*

මෙම රැස්වීමේ පරමාර්ථය වන්නේ ආපදා කළමණාකරණය සඳහා වැඩි වගකීම ඇති පාර්ශ්වයන් රැස්කර එළඹෙන කාලය තුල සිදුවිය හැකි ආපදා සඳහා, 'පවතින ආපදා කළමණාකරණ ක්‍රමවේදයන්' සුපරීක්ෂාකාරී ලෙස ක්‍රියාත්මක වනවා ද යන්න සලකා බැලීමයි. මෙම කාර්යය මේ වනවිට ද දිස්ත්‍රික්කයට අදාළව දිස්ත්‍රික් ලේකම්ගේ මූලිකත්වයෙන් සිදු වේ.

සමාලෝචන රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡා කළ යුතුය :

- ආපදා සැලැස්ම යලි සළකා බැලීම
- ආපදා කළමනාකරණය සඳහා සම්බන්ධ පාර්ශවයන්ගේ භූමිකාවන් හා වගකීම් පිළිබඳව එකඟතාව
- කාන්තාවන්, ගර්භණී මව්වරුන්, කිරි දෙන මව්වරුන්, වැඩිහිටියන්, ළමයින් හා ආබාධ සහිත පුද්ගලයන් වැනි වඩාත් අවදානමට ලක් වූ කණ්ඩායම්වලට අදාළ වැදගත් තොරතුරු යාවත්කාලීන කිරීම
- සන්නිවේදනය සහ බෙදා හැරීමේ පද්ධති පැහැදිලි කිරීම
- උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කටයුතු පිරික්සීම
- අවදානමට ලක්වන පිරිස සඳහා පිහිටුවන කඳවුරු ස්ථාන, උවදුරු සහිත ස්ථානයන්ගෙන් ආරක්ෂිතව ඉවත් විය හැකි මාර්ග, අනතුරු හැඟවීම් සංඥා සහ ස්ථාන වල ආරක්ෂාව තහවුරු කිරීම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම

- *උපක්‍රම 3.2.2*
  *ආපදා අවස්ථාව*

- *උපාය මාර්ග 01 :*
  *ආපදා කාලසීමා තුළ නගර මධ්‍යයේ ආපදා ආධාර ජාලයක් පිහිටුවීම*

ආපදා සැලැස්මට අදාළව ගුවන්යානා ගොඩබැස්වීමේ ස්ථාන ද්විත්වයක් සහ ආපදා සහන මධ්‍යස්ථානයක් නගර මධ්‍යයට යෝජිත වේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූලිකත්වයෙන් පොලිස් ස්ථානයේද සහාය සහිතව ඉහත සඳහන් සහන සැපයීමේ ජාලය සක්‍රීය කිරීමෙන් කාර්යක්ෂමව ප්‍රජාවට උපකාරී කිරීමට හැකියාව උදා වේ.

- *උපාය මාර්ග 02 :*
  *ආපදා අවස්ථාවලදී නගර මධ්‍යයෙන් පිටත ආපදා ආධාර ජාලයක් පිහිටුවීම*

ආපදා සැලසුමට අදාළව ගුවන්යානා ගොඩබැස්වීමේ ස්ථාන ත්‍රිත්වයක් නගරයෙන් පිටත ස්ථානයන්ට යෝජිත වේ. ශ්‍රී ලංකා නාවුක හමුදාව සහ කුරුවිට යුද හමුදා කඳවුරේ සහාය සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉහත සඳහන් සහන සැපයීමේ ජාලය සක්‍රීය කිරීමෙන් කාර්යක්ෂමව ප්‍රජාවට උපකාරී කිරීමට හැකියාව උදා වේ.

මෙම කරුණු වලට අමතරව සංචාරක සැලැස්මෙන් යෝජිත බෝට්ටු සේවා හේතුවෙන් නගරය තුළ බෝට්ටු යම් ප්‍රමාණයක් ස්ථානගතව ඇති බැවින් එම බෝට්ටු මෙවන් ආපදා අවස්ථාවක දී ආපදා සහන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගැනීමේ හැකියාවක් ද පවතී.

- *උපක්‍රම 3.2.3*
  *පශ්චාත් ආපදා අවස්ථාව*

- *උපාය මාර්ග 01 :*
  *කෙටි කාලීන ප්‍රතිසංස්කරණ කටයුතු*

ආපදා සහන සේවා කණ්ඩායම් යොදවාගෙන පිරිසිදු කිරීමත් තාවකාලික නිවාස සහ සැපයුම් දාමය (ආහාර හා ජලය වෙන පිවිසීම) නැවත ආරම්භ කිරීමත් මේ යටතේ සිදු වේ.

- *උපායමාර්ගය 02 :*
  *දිගුකාලීන ප්‍රතිසංස්කරණ කටයුතු*

ආපදා සහන ලබාදී නැවත පදිංචි කිරීමත් පුනරුත්ථාපන ණය සහ නෛතික සහාය හරහා විපතට පත් ජනතාවට සහාය වීමත් මේ යටතේ සිදු වේ.

- *උපාය මාර්ග 03 :*
  *පශ්චාත් ආපදා සමාලෝචන රැස්වීම*

මෙම රැස්වීමේ මූලික අරමුණ වන්නේ ගංවතුර අවස්ථාවේදී පැවති පද්ධතිවල කාර්යක්ෂමතාව සහ පාර්ශවකරුවන්ගේ කාර්ය සාධනය ඇගයීමයි.

සමාලෝචන රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡා කළ යුතුය :

- ධනාත්මක අත්දැකීම් සමාලෝචනය
- ලේඛන අධ්‍යයනය
- විවිධ පාර්ශවකරුවන්ගේ කාර්යභාරයන් හා වගකීම් අධීක්ෂණය කිරීම.
- වැදගත් දත්ත යාවත්කාලීන කිරීම
- පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියේ වැඩි දියුණු කලයුතු ස්ථාන විශ්ලේෂණය කිරීම
- සහ ගංවතුර බලපෑ ප්‍රදේශ වෙත ගොස් උපකරණවල තත්වය පරීක්ෂා කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය යාවත්කාලීන කිරීම එය සහ ප්‍රජාව සහ පාර්ශවකරුවන් සමඟ හුවමාරු කර ගැනීම

## 6.5.4. පොදු අවකාශ සැලැස්ම

විවෘත අවකාශයන් තනි තනි පුද්ගලයන්ට මෙන්ම සමස්ථයක් ලෙස ලෙස සමාජයට ද සමාජයීය, සෞඛ්‍ය, ආර්ථික සහ පාරිසරික ප්‍රතිලාභ රාශියක් සපයයි. සෑම විවෘත අවකාශයක්ම නගරයකට වටිනාකමක් එක් කරන අතර නාගරිකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ගුණාත්මක බවින් ඉහළ විවෘත අවකාශ ලබාදීම නාගරික සැලැස්මෙන් අපේක්ෂිත ය. කෙසේ නමුත්, පහසු ප්‍රවේශකත්වයක් සහිතව මනාව සැලසුම් කරන ලද විවිධාකාර වූ විවෘත අවකාශ නිර්මාණය කිරීම සහ කළමනාකරණය කිරීම වර්තමානයේදී අභියෝගයක් බවට පත් ව ඇත. එහෙත් එමගින් නගරයට සහ නාගරිකයන්ට අත්වන ප්‍රතිලාභ පිළිබඳව සළකා බලා යෝග්‍ය පරිදි විවෘත අවකාශයන් ලබාදීමට සැලැස්මෙන් කටයුතු කර ඇත.

## රත්නපුර නගර සභා බල ප්‍රදේශයේ ක්‍රියාකාරී විනෝදාස්වාද ස්ථාන

| අංකය | උද්‍යාන සහ ක්‍රීඩාංගන වර්ගය | භූමි ප්‍රමාණය (හෙක්.) | වර්තමාන භාවිතය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|
| | වර්තමාන පොකට් උද්‍යාන (EPP) | | | |
| 1 | $EPP_1$ | 0.1 | ක්‍රීඩාංගනය | බටුගෙදර |
| 2 | $EPP_2$ | 0.1 | ක්‍රීඩාංගනය | මිහිදුගම |
| 3 | $EPP_3$ | 0.1 | ක්‍රීඩාංගනය | නවනගරය |
| 4 | $EPP_4$ | 0.1 | ක්‍රීඩාංගනය | මුවගම |
| | උප එකතුව | 0.4 | | |
| | වර්තමාන කුඩා උද්‍යාන (EMP) | | | |
| 5 | $EPP_1$ | 0.3 | ප්‍රති සංවර්ධිත | රත්නපුර නගරය බටහිර |
| 6 | $EPP_2$ | 0.4 | ප්‍රති සංවර්ධිත | රත්නපුර නගරය උතුර |
| 7 | $EPP_3$ | 0.6 | බටුගෙදර ක්‍රීඩාංගනය | බටුගෙදර |
| 8 | $EPP_4$ | 0.3 | මිහිදුගම ක්‍රීඩාංගනය | මිහිදුගම ,ගොඩිගමුව |
| 9 | $EPP_5$ | 0.3 | මහවල ක්‍රීඩාංගනය | මිහිදුගම |
| 10 | $EPP_6$ | 0.3 | ගොඩිගමුව ක්‍රීඩාංගනය | මිහිදුගම |
| 11 | $EPP_7$ | 0.2 | සූරියන් ක්‍රීඩාංගනය | මිහිටිය |
| 12 | $EPP_8$ | 0.7 | | මිහිටිය |
| 13 | $EPP_9$ | 0.3 | | වෙරළුප කොස්පලවින්න |
| 14 | $EPP_{10}$ | 0.2 | හිදැල්ලන කන්ද ක්‍රීඩාංගනය | නව නගරය |
| 15 | $EPP_{11}$ | 0.5 | කුඩුගල්වත්ත ක්‍රීඩාංගනය | රත්නපුර නගරය උතුර, රත්නපුර නගරය , ගොඩිගමුව |
| | උප එකතුව | 3.6 | | |
| | වර්තමාන ප්‍රාදේශීය උද්‍යාන (ELP) | | | |
| 16 | $EPP_1$ | 1.8 | සීවලී ක්‍රීඩාංගනය | රත්නපුර නගරය උතුර |
| 17 | $EPP_2$ | 2.9 | මුද්දුව ක්‍රීඩාංගනය | මුද්දුව නැගෙනහිර |
| | එකතුව | 4.7 | | |

**වගු අංක 6.5.3 :** *පවතින උද්‍යාන සහ ක්‍රීඩාංගණ – 2018*

නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව, සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී 1000 ක ජනගහනයකට හෙක්ටයාර් 1.4 ක අවම වශයෙන් පොදු විවෘත ප්‍රදේශයක් සඳහා වෙන් කළ යුතුය. ජන හා සංඛ්‍යාලේඛන වාර්තා අනුව රත්නපුර මහ නගර සභා සීමාව තුළ ජනගහනය 49,083 කි. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයට අනුව වසර 2030 වන විට ජනගහනය 64,340 ක් බව පුරෝකථනය කර ඇත. ඒ අනුව හෙක්ටයාර 85.6 ක අවම ඉඩමක් 2030 වන විට පොදු එළිමහන් ස්ථාන ලෙස වෙන් කිරීමට නියමිතය. (වැඩිදුර තොරතුරු සඳහා ඇමුණුම 15 බලන්න)

- *උපක්‍රම 4.1*
  *වැව් සහ පොකුණු*

    1. වෙරළුප ජල රැඳවුම් ප්‍රදේශයෙහි ජල රැඳවුම් වැව ඉදිකිරීම
    2. නාගහමුන්නෙට්ටුව පරිශ්‍රයේ පොකුණක් ඉදිකිරීම

- *උපක්‍රම 4.2*
  *ක්‍රීඩාංගණ සහ ළමා උද්‍යාන සංවර්ධනය කිරීම*

    1. මොණරවිල ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීම
    2. මුද්දුව ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීම
    3. සීවලී ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීම
    4. වෙරළුප ක්‍රීඩාංගණය ඉදිකිරීම
    5. නව නගරයේ ස්ථාපිත ළමා උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීම
    6. වෙරළුප ක්‍රීඩාංගණය අසල ළමා උද්‍යානය ඉදිකිරීම

- *උපක්‍රම 4.3*
  *තේමා උද්‍යාන (Theme Park)*

    1. වෙරළුප ක්‍රීඩාංගණය අසල ජලය තේමා කරගත් උද්‍යානයක් නිර්මාණය කිරීම

- *උපක්‍රම 4.4*
  *තෙත්බිම් උද්‍යාන*

    1. ලේන්නැඩිය පරිශ්‍රයේ තෙත්බිම් උද්‍යානයක් ඉදිකිරීම

- *උපක්‍රම 4.5*
  *නාගරික කුඩා උද්‍යාන (Pocket Parks)*

    1. YMBA පරිශ්‍රය අලංකාර පොදු අවකාශයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සහ නැවත සංවර්ධනය කිරීම
    2. නානමළදොළ රක්ෂිතය නාගරික කුඩා උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම
    3. නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය සංවර්ධනය

- *උපක්‍රම 4.6*
  *වනාන්තර හා නාගරික වනාන්තර*

    1. පාසැල් ළමුන් හා පරේය්ෂකයින් සඳහා ජෛව විවිධත්වය විමර්ශනය කිරීමට පොම්ප කැළේ නාගරික වනෝද්‍යාන සහ අංගම්න වන රක්ෂිත පරිශ්‍රයන්හි පහසුකම් සැපයීම
    2. පොම්ප කැළේ නාගරික වනෝද්‍යානය තුළ පවතින ස්වාභාවික පිහිනුම් තටාකය ප්‍රතිනිර්මාණය කිරීම

- *උපක්‍රම 4.7*
  *Linear Parks*

    1. ලංකාවේ ප්‍රධාන ගංගා හතරෙන් එකක් වන "කළු ගඟ" ගලා බසින්නේ රත්නපුර මහ නගර සභා සීමාව හරහා වන අතර කළු ගඟ රක්ෂිතයට අඩි 66 ක සීමාවක් අයත් වේ. මෙම සැලසුමට අනුව නගරාසන්නයෙන් ගලන ගඟ සීමාවේ රක්ෂිතයන් රේඛීය උද්‍යාන වශයෙන් සංවර්ධනය කිරීමට යෝජිතය.

2. කළු ගඟේ එක් අතු ගංගාවක් වන "වේ ගඟ" මෙම නාගරික සීමාවන් තුලින් ගලා එන අතර දෙපසින් අඩි 15 ක් රක්ෂිත ප්‍රදේශයක් ඒ සඳහා වෙන් වී ඇත. එම සීමාව ද රේඛීය උද්යාන සංකල්පය යටතේ සංවර්ධනය කිරීමට කිරීමට යෝජිතය.
3. කටුගස් ඇළ දෙපස ඇල රක්ෂිතය ගමන්කළහැකි මාර්ගයක් වශයෙන් සංවර්ධනය කිරීමට යෝජිතය.
4. යෝජිත වෙරළුප වැව සහ නාගහමුත්තෙට්ටුව පොකුණ වටා ඇවිදින මංතීරු ඉදිකිරීමට යෝජිතය.

## යෝජිත පොදු එළිමහන් විනෝදාත්මක ප්‍රදේශ සැලසුම - 2030 (රත්නපුර මහා නගර සභා ප්‍රදේශය)

| අංක | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|
| 1 | පොකට් උද්‍යාන (PPP) | 0.2 |
| 2 | කුඩා උද්‍යාන (PMP) | 1.4 |
| 3 | රේඛීය උද්‍යාන (PLi.P) | 76.4 |
| 4 | වනාන්තර උද්‍යාන (PFP) | 20.9 |
| | උප එකතුව | 98.9 |
| 5 | වර්තමාන PORS | 8.7 |
| | මුළු එකතුව | 107.6 |

*වගු අංක 6.5.3 :*
*යෝජිත පොදු එළිමහන් විනෝදාත්මක ප්‍රදේශ සැලැස්ම*

| අංක | උද්‍යාන වර්ගය | ප්‍රමාණය | ඉඩදිය හැකි භාවිතයන් |
|---|---|---|---|
| 1 | පොකට් උද්‍යාන | හෙක්ටයාර්. 0.2 අඩු (අක්.0.5) | • විසිරුන ක්‍රීඩා ස්ථාන<br>• විවේක ස්ථාන<br>• බිම් කොටස් |
| 2 | කුඩා උද්‍යාන | හෙක්.0.2 – 1.0 (0.5- 2.5 අක්) | • දරුවන්ගේ ක්‍රීඩා ප්‍රදේශ<br>• කුඩා තණබිම් ක්‍රීඩාංගන<br>• රේඛීය වන උද්‍යාන<br>• විවේක ස්ථාන |
| 3 | රේඛීය උද්‍යාන | වර්තමාන ගඟ/ඔය/ඇළ/ මාර්ග/ දුම්රිය මාර්ග සඳහා වෙන්කළ ප්‍රදේශ මත පදනම් වේ | • ඇවිදීම<br>• ව්‍යායාම කිරීම<br>• සයිකල් පැදීම<br>• ස්වභාවික මාර්ග |
| 4 | වන උද්‍යාන | වනාන්තර වර්ගය මත පදනම් වෙ | • විමසීම් මධ්‍යස්ථාන<br>• ස්වභාවික මාර්ග<br>• සෙවණ සහිත ඇවිදීමේ මාවත්<br>• ඇවිදින මංතීරු<br>• කඳවුරු බැඳීම (සීමිත කාර්යයන් සඳහා )<br>• පර්යේෂණ |

***වගු අංක 6.5.4 :*** *පොදු එළිමහන් විනෝදාත්මක අවකාශ සැලැස්ම - අවසර ලත් ක්‍රියාකාරකම්*




**සිතියම් අංක 6.5.9 :** *ක්‍රියාකාරී විනෝදාස්වාද ස්ථාන*

## *රත්නපුර මහා නගර සභාවේ ක්‍රියාකාරී නොවන විනෝදාස්වාද මධ්‍යස්ථාන*



- *උපක්‍රම 4.8*
  *මහජන පුස්තකාල*

වර්තමානයේ වෙළඳ නගර මධ්‍යයේ සහ නව නගරයේ පුස්තකාල පිහිටා ඇත. එසේ වුවද වෙළඳ නගරයේ පවතින පුස්තකාල ගොඩනැගිල්ල ඒ සඳහා ප්‍රමාණවත් නොවන අතර එම ස්ථානයද කලබලකාරී පරිසරයකින් යුක්ත වේ. මෙම ගොඩනැගිල්ල පෞරාණික වටිනාකමකින් යුක්ත වන බැවින් නව ඉදිකිරීම් සහිතව පුස්තකාලය සංවර්ධනය කිරීමද පුරාවිද්‍යා රෙගුලාසි අනුව දුෂ්කර වේ. එබැවින්, ප්‍රධාන පුස්තකාලය එම ස්ථානයෙන් ඉවත් කර සන්සුන් හා නිදහස් වටපිටාවක් තුළ වැඩි අවකාශ සහිතව නව පුස්තකාලයක් ඉදි කිරීමට සුදුසු වේ.

a. රත්නපුර කෞතුකාගාර පරිශ්‍රය තුළ යෝජිත නව පුස්තකාලය ඉදිකිරීම.
b. නව නගරයේ පිහිටා ඇති පුස්තකාල පරිශ්‍රයට අවශ්‍ය පහසුකම් ලබා දීම සහ භූමි අලංකරණ කටයුතු සිදුකිරීම.

- *උපක්‍රම 4.9*
  *සිනමා ශාලා*

a. ජෝති – බණ්ඩාරනායක මාවත (ආසන ධාරිතාව – 200–250)
b. ලක්ෂ්මී – කුඩුගල්වත්ත – (ආසන ධාරිතාව – 200–250)
c. ඉම්පීරියල් – ටෙලිකොම් ආයතනය අසළ – (ආසන ධාරිතාව – 200–250)

- *උපක්‍රම 4.10*
  *නාට්‍යය ශාලා සහ කලාගාර*

මහා නගර සභා ගොඩනැගිල්ලේ පවතින නගර ශාලාව නාට්‍යය ප්‍රදර්ශනය සඳහා යොදා ගන්නා නමුත් නගරය තුළ පාසැල් ළමුන් 12000 කට ආසන්න සංඛ්‍යාවක් සිටින බැවින් ඒ සඳහා මෙම අවකාශය කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. එබැවින්, ආසන පහසුකම් 750 – 1000 සහිත නව රංග ශාලාවක් සහ කලාගාරයක් කෞතුකාගාර පරිශ්‍රය ආසන්නයේ ඉදිකිරීමට යෝජිතය.




***සිතියම් අංක 6.5.10 :*** *ක්‍රියාකාරී නොවන විනෝදාස්වාද ස්ථාන*

# 6.6. සංස්කෘතික සහ උරුමයන් පිළිබඳ උපායමාර්ග

## 6.6.1. උරුමයන්ට අයත් වන ස්ථාන

*පුරාවිද්‍යා ස්ථාන, සංස්කෘතික ස්ථාන සහ ආගමික ස්ථාන*

### I. ඓතිහාසික මහ සමන් දේවාලය

සමන් දෙවියන් හා බැඳුණු ඉතිහාසයක් පවතින සමන් දේවාලය ශ්‍රී පාදස්ථානයේ සිට සතර දිසාවට පිහිට වූ දේවාල සතරින් එකක් වන අතර ප්‍රධානතම දේවාලය වීම හේතුවෙන් සබරගමුව මහ සමන් දේවාලය ලෙස ප්‍රසිද්ධියට පත් ව ඇත. වාර්ෂික ඇසළ පෙරහැරත්, උඳුවප් පොහොය (දෙසැම්බර් මස) සිට වෙසක් පොහොය (මැයි මස) තෙක් පවත්නා ශ්‍රී පාද වන්දනා සමයත් හේතුවෙන් එම කාලයන් තිදී මෙහි පැමිණෙන බැතිමතුන් සංඛ්‍යාව ඉහළ අගයක් ගන්නා අතර දෛනිකව පැමිණෙන පිරිස ද හේතුවෙන් රත්නපුර නගරයට සමන් දේවාලය ඓතිහාසිකමය ලෙසත්, සංස්කෘතිමය ලෙසත් එක සේ වටිනාකමකින් යුත් ස්ථානයකි.

### II. ඇහැලේපොළ වලව්ව

ඇහැලේපොළ අදිකාරම් වාසය කළ ස්ථානය ඇහැලේපොළ වලව්ව ලෙස හැඳින්වෙන අතර වර්තමානයේ දී එම ස්ථානය කෞතුකාගාරයක් ලෙස සංවර්ධනය කර ඇත. සබරගමු පළාතේ ප්‍රාග් ඉතිහාසය, පුරාණ සත්ව සංහතිය, ඉතිහාසය, සංස්කෘතිය සහ ස්වාභාවික උරුමය යන විෂය ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන කෞතුක භාණ්ඩ සහ ආදර්ශක එකතුන් 3500 ක් පමණ මෙහි ප්‍රදර්ශනය කෙරේ. කෞතුකාගාරය මෙම ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කොට මහජනයා සඳහා විවෘත කරන ලද්දේ 1988 මැයි මස 13 වැනි දිනයි.

### III. ලන්දේසි බලකොටුව

පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන යුගයන් තුනටම අයත් යැයි සැළකෙන වර්තමානයේදී 'ලන්දේසි බලකොටුව' නමින් හැඳින්වෙන පරිශ්‍රය ඓතිහාසික වටිනාකමින් යුතු වන අතර මෙම බලකොටුවේ සැකැස්ම කළුතර බලකොටුවට සමාන යැයි පැවසේ. ආරක්ෂිත ස්ථානයක් ලෙස ද පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස ද හඳුනාගත හැකි මෙම ස්ථානය අනාගතය ට ද ආරක්ෂා කරගත යුතු වටිනා සම්පතකි.

## 6.6.2. සංස්කෘතික උත්සව (සමන් දේවාල පෙරහැර)

වාර්ෂිකව සැප්තැම්බර් මාසයේදී පැවැත්වෙන මහ සමන් දේවාල පෙරහැර රත්නපුර නගරයට අයත් එක් සුවිශේෂී අංගයක් වේ. සබරගමු සංස්කෘතියට අයත් නර්තනාංග ඇතුළු විවිධ චාරිත්‍ර වාරිත්‍ර නැරඹීමට දෙස් විදෙස් සංචාරකයන්ට මෙහිදී අවස්ථාව උදා වන අතර දේවාල පරිශ්‍රය තුළ පමණක් වීථි සංචාරය කිරීම මෙම පෙරහැරට ආවේණික ලක්ෂණයකි.





***රූප සටහන් අංක 6.5.1 :*** *සමන් දේවාලයේ පෙරහැර*
***ඡායාරූපකරණය :*** *ෆෞසාන් ෆවුස්, 2016*

## 6.6.3 පුරාවිද්‍යා සංරක්ෂණ ප්‍රදේශ

| ස්ථානය | ග්‍රාම නිළධාරී කොට්ඨාශය |
|---|---|
| මහා සමන් දේවාලය | දේවාලේගාව |
| ඇහැලේපොල වලව්ව | රත්නපුර නගරය |
| ඇහැළේපොළ අන්තඃපුර ගොඩනැගිල්ල | රත්නපුර නගරය |
| ලන්දේසි බලකොටුව | රත්නපුර නගරය |
| පොලිස් ගොඩනැගිල්ල | රත්නපුර නගරය |
| වේස් අනුස්මරණ ශාලාව (පුස්තකාලය) | රත්නපුර නගරය |
| ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය | රත්නපුර නගරය |
| ශාන්ත ඇලෝසියස් දේවස්ථානය | රත්නපුර නගරය |
| ගණේගොඩ විහාරය | තිරිවානකැටිය |
| ජයසුමනාරාම මහා විහාරය | තිරිවානකැටිය |
| ගල්ලෙන් විහාරය | වෙරළුප |

**වගු අංක 6.5.1 :**
*පුරාවිද්‍යා සංරක්ෂණ ස්ථාන*

## *සංස්කෘතික සහ උරුමයන් කළමණාකරණ උපායමාර්ගය*

සංචාරක කර්මාන්තය සංවර්ධනය කරමින් ආදායම උත්පාදනයට සමගාමීව අදාළ ස්ථාන්යන්හි ඓතිහාසික, සංස්කෘතික සහ අධ්‍යාපනික වටිනාකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සැමරීම සංස්කෘතික උරුම කළමනාකරණය මගින් සිදු වේ. යුනෙස්කෝවට අනුව, සංස්කෘතික අනන්‍යතාව ශ්‍රී ලාංකිකයින්ගේ උරුමය වන අතර අනාගත පරපුර වෙත එය දායාද කිරීම වර්තමාන පරපුරට අයත් යුතුකමකි. එමෙන්ම, ස්පර්ශ කළහැකි ස්මාරක බාණ්ඩයට අයත් වන ඓතිහාසික හා ස්වාභාවික වටිනාකම්වලින් යුත් ස්ථාන මෙන්ම ගොඩනැගිලි සංකීර්ණ ද යුනෙස්කෝ විසින් උරුමයන් යටතට හඳුනාගනු ලබයි. කෙසේ වෙතත් ඉහත අංගයන්ට අමතරව මුඛ සම්ප්‍රදායයන් වන ජන සංගීතය හා නැටුම් වැනි සුවිශේෂී ලක්ෂණ ද මෙහි දී අදාළ වේ.

රත්නපුර සංස්කෘතිය සුමන සමන් දෙවියන්, සමන් දේවාලය සහ මැණික් කර්මාන්තය මත පදනම්ව ඇති අතර එහි ඇති ඓතිහාසික උරුමය ඇහැලේපොල යුගය මෙන්ම  යටත්විජිත යුගය මත ද පදනම් වී ඇත. සබරගමු නර්තන සම්ප්‍රදාය වැනි ආවේණික ලක්ෂණයන්ද මෙහිදී දැකිය හැකි වීම අමතර විශේෂත්වයක් වේ. සංවර්ධන කටයුතු වලදී මෙම සංස්කෘතීන් සහ උරුමයන් නිසි ඇගයීමකට පාත්‍ර නොවූව ද වර්තමානය දක්වාම සුරක්ෂිත වී ඇති ප්‍රබල සංස්කෘතියක් හා උරුමයක් රත්නපුර නගරය සතුව පවතින බව හඳුනාගත හැකිය. මේ අනුව, පවත්නා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමත්, නාගරික ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම උදෙසා මෙම ඓතිහාසික හා සංස්කෘතික පසුබිම උපකාරී කරගැනීමත් රත්නපුර නගර සංවර්ධන සැලැස්මෙහි සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ උපාය මාර්ගය වේ.




***රූප සටහන් අංක 6.6.2 :** සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ උපාය මාර්ගය*

මෙම සැලැස්මෙහි ප්‍රධාන අරමුණු වන "රත්නපුර නගරය, වාසය කිරීමට ප්‍රිය උපදවන නගරයක් ලෙස නිර්මාණය කිරීම" සහ "සංචාරකයන් හට ආකර්ශණීය ප්‍රදේශයක් බවට රත්නපුරය පත් කිරීම" යන්න මත පදනම් වෙමින් සංස්කෘතිය හා උරුම කළමනාකරණ උපාය මාර්ගය සැලසුම් කර ඇත.

**06 පරිච්ඡේදය**
**සැලැස්ම**

සංස්කෘතික සහ උරුමයන් පිළිබඳ උපායමාර්ග

පුරාවිද්‍යා සංරක්ෂණ ප්‍රදේශ

- ***උපක්‍රම 01***
  *ස්වරූපය ආරක්ෂා කිරීම*

සමන් දේවාලය ප්‍රදේශය ආශ්‍රිතව පවතින දේවාල සංස්කෘතිය සහ මැණික් විදි ආශ්‍රිතව පවතින මැණික් සංස්කෘතිය එකිනෙකට අනන්‍ය වන අතර ලංකාවේ වෙනත් ප්‍රදේශයක දී එය දැකිය නොහැකි වේ. එබැවින් එම වටිනාකම් හඳුනාගැනීමත් එම ස්වරූපය තවදුරටත් ආරක්ෂා කර ගැනීමත් සැලැස්මෙන් අපේක්ෂිත ය. මෙහිදී, අදාළ සංවර්ධන කටයුතු මෙම ස්වරූපයන්ගේ වටිනාකමට හානි නොවන ආකාරයට හා එහි වටිනාකම ඉස්මතු වන ආකාරයට සිදු කිරීම යෝජිත වේ.

- ***උපක්‍රම 1.1 :***
  *මැණික් විදි වල ආවේණික ස්වරූපය ආරක්ෂා කිරීම*

1. ප්‍රධාන වීදිය, ශාවියා මාවත සහ දෙමුවාවත යන විදි ප්‍රතිසංස්කරණය කොට මැණික් අනන්‍යතාවට අදාල වීදි දර්ශන සකස්කර පහසුකම් ලබාදීම.

- ***උපක්‍රම 1.2 :***
  *සමන් දේවාලය අවට ප්‍රදේශයෙහි ස්වරූපය ආරක්ෂා කිරීම*

1. එක් පසෙකින් මීටර් 500 බැගින් වන සේ සමන් දේවාලය දෙපස පානදුර මාර්ගයේ කි. මී 1 ක දුර ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීම. එහිදී කලාපීකරණ සැලසුමට අදාළ රෙගුලාසීන්ට අනුගත විය යුතු වේ. සමන් දේවාලය සතු ආගමික සහ සංස්කෘතික ලක්ෂණ වලට අනුකූල වන සේ මෙම ප්‍රදේශයට අදාළ වෙනත් විශේෂ රෙගුලාසි සකසා ඇති විට ඒවාට යටත්ව නව ගොඩනැගිලි ඉදිකිරීමත් පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීමත් සිදු කළ යුතු ය.

2. සමන් දේවාලයේ සිට කොටම්බෙගාව දක්වා පෙරහැර වීදිය ප්‍රතිසංස්කරණය කිරීම. එහිදී දේවාලයේ අනන්‍යතාවය ආරක්ෂා වනලෙස වීදි දර්ශනය සමග සකස් කල යුතු අතර දිය කැපීමේ පෙරහැරට මාර්ගය භාවිත කිරීමට සහ ඒ හේතුවෙන් රථවාහන ගමනාගමනයට බාධා නොවන අයුරින් පානදුර මාර්ගයේ අදාල කොටස පුළුල් කිරීමකට සහ පහසුකම් සැපයීමට යෝජිත වේ.

3. සමන් දේවාලයට පැමිණෙන බැතිමතුන්ට පහසුකම් සැපයෙන පරිදි ප්‍රමාණවත් රථගාල් පහසුකම් සහිතව ආහාර පාන ලබාගැනීම උදෙසා හෙළබොජුන්හලක් ඉදි කිරීම කළයුතු වේ. මෙහිදී සමන් දේවාලයේ බාහිර පෙනුමට සහ අනන්‍යතාවයට අනුකූල වන ලෙස එහි ඉදි කිරීම් සිදු කළ යුතුය.




**සිතියම් අංක 6.6.1 :** *ස්වරූප සංරක්ෂණය*

- *උපක්‍රම 02*
  *සංරක්ෂණය*

සංරක්ෂණයට අදාළ ස්ථානයන්හි කිසිදු වෙනස්කමක් සිදු කිරීමට නොහැකි අතර මේ යටතට ගැනෙන සමන් දේවාලය ආදී ස්ථානයන්හි සිදු කරන වෙනස්කම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණයට යටත්ව සිදු විය යුතු ය. කෙසේ වෙතත්, මෙම ආගමික, සංස්කෘතික සහ පුරාවිද්‍යාත්මක උරුමයන් යෝග්‍ය පරිදි සංරක්ෂණය කිරීම මගින් නාගරිකයන්ගේ ආර්ථිකයට ප්‍රතිලාභ හිමිවන අතර ඔවුන්ගේ අනන්‍යතාව හා අභිමානය ආරක්ෂා කරගැනීමට එය උපකාරී වනු ඇත.

- *උපක්‍රම 2.1 :*

සංස්කෘතික, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක ස්ථාන පුරාවිද්‍යාත්මක ප්‍රතිපත්ති හා රෙගුලාසි අනුව සංරක්ෂණය කළ යුතු වේ.

- *උපක්‍රම 03*
  *අනුවර්තී නැවත භාවිතය*

රත්නපුරය සතු ඓතිහාසික ගොඩනැගිලි ගණන ආසන්න වශයෙන් 15 ක් පමණ වේ. එම ගොඩනැගිලි වර්තමානයේදී රජයේ කාර්යාල සහ නිළ නිවාස සඳහා භාවිත කෙරෙන අතර කිසිදු අමතර ආර්ථික ප්‍රතිලාභයක් නගරයට උපයා නොදෙයි. එහෙත්, මෙම ගොඩනැගිලි එම ඉදිකිරීම් කටයුතු වලට කිසිදු වෙනසක් සිදු නොකර සංචාරක සහ වෙළඳ කටයුතු උදෙසා භාවිත කිරීමේ ඉහළ ශක්‍යතාවක් පවතී. එතුළින් නගරය තුළ හා ඒ අවට පවතින ඓතිහාසික වටිනාකම රැකගැනීමත් නගරයට ආර්ථික සහ සාමාජයීය අවස්ථා උදා කර දීමත් අපේක්ෂිත වේ.

- *උපාය මාර්ග 3.1 :*
  *හඳුනාගත් ඓතිහාසික ගොඩනැගිලිවල අනුවර්තී නැවත භාවිතය*

1. ලන්දේසි කොටුව ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව ජාතික මැණික් කෞතුකාගාරයක් බවට පත් කිරීම. මේ යටතට රැස්වීම් ශාලා සහ වෙන්දේසි පහසුකම් ද ලබාදීමට යෝජිත ය.

2. පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ අවන්හලක් ලෙස භාවිතා කිරීම. මැණික් ව්‍යාපාරික කටයුතු මේ ආශ්‍රිතව සිදුවන බැවින් එම ක්‍රියාවලින්ට අවශ්‍ය පහසුකම් මේ මගින් සැපයෙනු ඇත.

3. පොලිස් ගොඩනැගිල්ල ඇතුළු පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සහ අවන්හලක් ලෙස භාවිතා කිරීම. මැණික් ව්‍යාපාරික කටයුතු මේ ආශ්‍රිතව සිදුවන බැවින් එම ක්‍රියාවලින්ට අවශ්‍ය භෝජන පහසුකම්, නිදහස් අවකාශ සහ රථවාහන නැවැත්වීමේ පහසුකම් ද මේ පරිශ්‍රය මගින් සැපයෙනු ඇත.

4. ඇහැලේපොල මහාධිකාරම් ගේ අන්තඃපුර මාළිගා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ අවන්හලක් ලෙස භාවිතා කිරීම. මෙම පරිශ්‍රයට ආසන්නයෙන් ආපදා කාලසීමාවේදී ගුවන් යානා ගොඩබස්වන ස්ථානය සැකසීම යෝජිත බැවින් ආපදා නොමැති කාලයන්හිදී එම ස්ථානය විවෘත අවන්හල් භූමියක් ලෙස යොදාගත හැකි වීම අමතර ප්‍රතිලාභයකි.

5. ආයුර්වේද කාර්යාල ගොඩනැගිල්ල ඇතුළු පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සහ අවන්හලක් ලෙස භාවිතා කිරීම. කළු ගඟ මේ ආසන්නයෙන් ගලා යන බැවින් සහ යෝජිත ගංගා තොටුපළක් මේ ආශ්‍රිතව ඉදිවන බැවින් මේ ආශ්‍රිතව සිදු වේ යයි අපේක්ෂිත සංචාරක කටයුතු සඳහා අවශ්‍ය භෝජන පහසුකම්, නිදහස් අවකාශ සහ රථවාහන නැවැත්වීමේ පහසුකම් ද මේ පරිශ්‍රය මගින් සැපයෙනු ඇත.

6. සෞඛ්‍ය අධ්‍යක්ෂක නිළ නිවස ප්‍රතිසංස්කරණය කිරීම සහ ආගන්තුක නිවසක් (Guest House) ලෙස භාවිතා කිරීම. සංචාරක කටයුතු සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් නගර මධ්‍යය තුළ දී ප්‍රමාණවත් පරිදි ලබාදීම මෙහිදී අපේක්ෂිතයි.

7. මුවගම පිහිටා ඇති නියෝජ්‍ය පොලිස්පති කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ ආගන්තුක නිවසක් (Guest House) ලෙස භාවිතා කිරීම. සංචාරක කටයුතු සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් නගරයෙන් පිටත දී ප්‍රමාණවත් පරිදි ලබාදීම මෙහිදී අපේක්ෂිතයි.

8. මුවගම පිහිටා ඇති දිස්ත්‍රික් විනිසුරු නිළ නිවස ප්‍රතිසංස්කරණය කිරීම සහ ආගන්තුක නිවසක් (Guest House) ලෙස භාවිතා කිරීම. සංචාරක කටයුතු සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් නගරයෙන් පිටත දී ප්‍රමාණවත් පරිදි ලබාදීම මෙහිදී අපේක්ෂිත අතර මෙම පරිශ්‍රයට සැහැල්ලු ගුවන් යානා ගොඩබැස්වීමේ අංගනයක් ද යෝජිත බැවින් එම ප්‍රතිලාභය ද ආගන්තුකයන්ට ලැබෙනු ඇත.

9. මුවගම පිහිටා ඇති හිටපු ප්‍රධාන ඇමතිගේ නිළ නිවස ප්‍රතිසංස්කරණය කිරීම සහ ආගන්තුක නිවසක් (Guest House) ලෙස භාවිතා කිරීම. මෙහිදී, සංචාරක කටයුතු සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් නගරයෙන් පිටත දී ප්‍රමාණවත් පරිදි ලබාදීමට අමතරව නගරයෙන් පිටත දර්ශනීය ස්ථානයක පිහිටීම සංචාරක කර්මාන්තයට වාසි සහගත තත්ත්වයක් වනු ඇත.

10. දිස්ත්‍රික් ඉංජිනේරු නිළ නිවස ප්‍රතිසංස්කරණය කිරීම සහ ආගන්තුක නිවසක් (Guest House) ලෙස භාවිතා කිරීම. සංචාරක කටයුතු සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් නගරයෙන් පිටත දී ප්‍රමාණවත් පරිදි ලබාදීම මෙහිදී ද අපේක්ෂිතයි.



**සිතියම් අංක 6.6.2 :** *ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය*

# 6.7. ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

## 6.7.1. උපායමාර්ගික ව්‍යාපෘති

### කෙටිකාලීන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතිය | ස්ථානය | වගකිවයුතු ආයතනය (ක්‍රියාත්මක කිරීම) | වගකිවයුතු ආයතනය (නඩත්තු කිරීම) |
|---|---|---|---|---|
| 1. | ලක්ෂ්මි වාණිජ ව්‍යාපෘතිය | ලක්ෂ්මි සිනමා ශාලා පරිශ්‍රය | රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 2. | පොම්පකැලේ නාගරික වනෝද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 3. | ගංගා තොටුපොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය - අදියර 1 | • සීවලී ක්‍රීඩාංගණය පිටුපස ළමා උද්‍යාන අවකාශය<br>• සමන් දේවාලය ආසන්නයේ වැලි පාලම අසළ විවෘත අවකාශය | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 4. | පල්ලිය පාර සංවර්ධන ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 5. | මහජන පොළ සංවර්ධන ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 6. | පටු මංමාවත් සංවර්ධන ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 7. | නාගහමුත්තෙට්ටුව සංවර්ධන ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 8. | මුද්දුව ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 9. | සීවලී ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 10. | ළමා උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - නව නගරය | නව නගරය | රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 11. | නානමළදොළ කුඩා නාගරික උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නව නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 12. | නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 13. | බටුගෙදර මංසන්ධියේ සිට කරපිංච මාර්ගය දක්වා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |

| | | | | |
|---|---|---|---|---|
| 14. | සේනානායක මාර්ගයේ සිට කුඩුගල්වත්ත යෝජිත හොටුපොළ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 15. | රත්නපුර රෝහලේ සිට නවනගරය දක්වා මාර්ගය (සමන් පෙදෙස හරහා) ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | සමන් පෙදෙස | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 16. | ගඟ අද්දර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 17. | පිටරවුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 18. | ඇතුල් රවුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 19. | සීවලී ක්‍රීඩාංගණය අසළ පාලම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 20. | ඉන්දික හෝටලය අසළ සිට පල්ලිය පාර දක්වා උමං මාර්ගයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 21. | පුළුණුපිටිය මංසංධියේ මගී ගුවන් පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | පුළුණුපිටිය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 22. | පැරණි බස් නැවතුම්පොළ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය |
| 23. | රත්නපුර නගරයේ ප්‍රධාන බස් නැවතුම්පොළට අනුබද්ධ බස් රථ නැවැත්වීමේ ස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය |
| 24. | නව බස් නැවතුම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නව නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය |
| 25. | නගර මධ්‍යයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව |
| 26. | කැටන්දොළ ජල සැපයුම් ව්‍යාපෘතිය | කණාදොළ | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |

## මධ්‍යකාලීන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතිය | ස්ථානය | වගකිවයුතු ආයතනය (ක්‍රියාත්මක කිරීම) | වගකිවයුතු ආයතනය (නඩත්තු කිරීම) |
|---|---|---|---|---|
| 1. | මැණික් වතුරශ්‍රය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය |
| 2. | වෙරළුප ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | වෙරළුප | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 3. | වෙරළුප ක්‍රීඩාංගණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | වෙරළුප | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 4. | හෙන්බිම් උද්‍යාන ව්‍යාපෘතිය | ලේන්හැඩිය | නාගරික සංවර්ධන අධිකාරිය | රත්නපුර මහ නගර සභාව |
| 5. | ගංගා තොටුපොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය - අදියර 2 සහ 3 | වරකාතොට පාලම අසළ, කුඹුගල්වත්ත, ආයුර්වේද හංදිය සහ කොටම්බෙගාව | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 6. | දර්ශණීය ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය සහ නව නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 7. | සැහැල්ලු ගුවන්යානා අංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය - අදියර 1 | • පැරණි දිසා විනිසුරු නිළ නිවාස පරිශ්‍රය<br>• අපර් ක්ලබ් පරිශ්‍රය | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 8. | ආපදා සහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 9. | මොණරවිල ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 10. | තරුණ බෞද්ධ සංගම් පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 11. | ගල්කඩුවත්ත මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘතිය | නව නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 12. | මුවගම මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 13. | නිළධාරීන් උදෙසා කුලී පදනම මත ලබාදෙන ස්ටුඩියෝ නිවාස ව්‍යාපෘතිය | නව නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 14. | කහංගම අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | කහන්ගම | නාගරික සංවර්ධන අධිකාරිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 15. | විකල්ප මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |

| | | | | |
|---|---|---|---|---|
| 16. | ගොඩවෙල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 17. | බලිබත්ගොඩ පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 18. | කුඩුගල්වත්ත පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 19. | නගරයට ඇතුළු වීමට පවතින පාලම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 20. | රථවාහන නැවතුම් පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 21. | හෙළබොජුන්හල ඉදිකිරීමේ ව්‍යාපෘතිය | සමන් දේවාල පරිශ්‍රය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |

## දිගුකාලීන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතිය | ස්ථානය | වගකිවයුතු ආයතනය (ක්‍රියාත්මක කිරීම) | වගකිවයුතු ආයතනය (නඩත්තු කිරීම) |
|---|---|---|---|---|
| 1. | රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | කොළඹ - පැල්මඩුල්ල | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 2. | මැණික් වීදි සංවර්ධන ව්‍යාපෘතිය | ප්‍රධාන වීදිය, ශාවියා මාවත සහ දෙමුවාවත වීදිය | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය |
| 3. | ආභරණ වීදි සංවර්ධන ව්‍යාපෘතිය | ෆ්‍රෑන්ක් හෙට්ටිආරච්චි මාවත | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය |
| 4. | ලන්දේසි කොටුව ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ජාතික මැණික් කෞතුකාගාරය ලෙස - රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 5. | සංචාරක නිවාස ලෙස ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කිරීමේ ව්‍යාපෘතිය | • සෞඛ්‍ය අධ්‍යක්ෂ නිළ නිවස - රත්නපුර නගරය<br>• උප පොලිස් කාර්යාල ගොඩනැගිල්ල - මුවගම<br>• දිසා විනිසුරු නිළ නිවස - මුවගම<br>• පැරණි ප්‍රධාන ලේකම් නිළ නිවස - මුවගම<br>• දිස්ත්‍රික් ඉංජිනේරු නිළ නිවස - මුවගම | නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 6. | අවන්හල් ලෙස ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කිරීමේ ව්‍යාපෘතිය | • පොලිස් ගොඩනැගිල්ල - රත්නපුර නගරය<br>• පුස්තකාල ගොඩනැගිල්ල - රත්නපුර නගරය<br>• ඇහැලේපොළ අන්තඃපුර ගොඩනැගිල්ල - රත්නපුර නගරය<br>• ආයුර්වේද කාර්යාල ගොඩනැගිල්ල - රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 7. | ජලය තේමා කරගත් විවේක හා විනෝද කටයුතු උද්‍යාන ව්‍යාපෘතිය | වෙරළුප | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | රත්නපුර මහ නගර සභාව |
| 8. | මැණික් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය | තැපැල් කාර්යාල පරිශ්‍රය, රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 9. | වාණිජ සංකීර්ණ ව්‍යාපෘතිය - පොල්හුණුව පරිශ්‍රය | රත්නපුර නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |

| අංකය | ව්‍යාපෘතිය | ස්ථානය | වගකිවයුතු ආයතනය (ක්‍රියාත්මක කිරීම) | වගකිවයුතු ආයතනය (නඩත්තු කිරීම) |
|---|---|---|---|---|
| 10. | හෙළබොජුන්හල ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නාගහමුන්නෙට්ටුව පරිශ්‍රය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 11. | ඇහැළේපොළ කෞතුකාගාර පරිශ්‍රය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 12. | කළු ගඟ උඩවලව ජලාශයට හැරවීමේ ව්‍යාපෘතිය | | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 13 | ගංවතුර පාලන පැති බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 14. | සැහැල්ලු ගුවන්යානා අංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය - අදියර 2 | • සීවලී විද්‍යාල ක්‍රීඩාංගණ පරිශ්‍රය<br>• දිසා විනිසුරු නිළ නිවාස පරිශ්‍රය (අතපත්තු වලව්ව)<br>• යෝජිත තිරිවානකැටිය විද්‍යාල පරිශ්‍රය | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව |
| 15. | මගී ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | රත්නපුර නගරය | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 16. | ළමා උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | වෙරළුප | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව |
| 17. | නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නව නගරය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 18. | බහු කාර්යය සේවා ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය | කෞතුකාගාර පරිශ්‍රය | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 19. | මහවලවත්ත ඉහළ ආදායම් නිවාස ව්‍යාපෘතිය | මහවලවත්ත | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 20 | තිරිවානකැටිය යෝජිත පාසැල් ව්‍යාපෘතිය | තිරිවානකැටිය | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 21. | නව නගරයට යෝජිත පාසැල් ව්‍යාපෘතිය | නව නගරය | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 22. | මහවලවත්ත යෝජිත පාසැල් ව්‍යාපෘතිය | මහවලවත්ත | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

## 6.7.2. ප්‍රමුඛ ව්‍යාපෘති

ව්‍යාපෘතීන් වල ස්වභාවය අනුව නිමා කිරීමට ගතවන කාලය සළකා බලා කෙටිකාලීන, මැදිකාලීන සහ දිගුකාලීන ලෙස වර්ග කිරීමක් සිදු කළ ද ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කරන ලද විශ්ලේෂණයකින් අනතුරුව ව්‍යාපෘති ප්‍රමුඛතා ලැයිස්තුවක් හඳුනාගන්නා ලදි. මෙම ව්‍යාපෘතීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමේදී නගර සැලැස්මේ දැක්ම ළඟා කරගැනීම පිණිස වැඩි බර තැබීමක් සිදු කළ අතර මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් නාගරිකයන්ගේ පිළිගැනීම සහ විවිධ පාර්ශවකරුවන් සතුව පවතින ආර්ථික ශක්‍යතාවය සළකා බලන ලදි. අවසාන වශයෙන්, 70 කට ආසන්න ප්‍රමාණයක් අතුරින් ව්‍යාපෘති 27 ක් ප්‍රමුඛතා ලැයිස්තුවට තෝරා ගන්නා ලද අතර එම ව්‍යාපෘති වෙනුවෙන් සංක්ෂිප්ත ව්‍යාපෘති සැලසුම් වාර්තා සකස් කර ඇත.

- ෆ්‍රැන්ක් හෙට්ටිආරච්චි මාවත ආභරණ වීදියක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- ජාතික මැණික් කෞතුකාගාරය ලෙස ලන්දේසි කොටුව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- අවන්හලක් ලෙස පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- සංචාරක නිවාස ලෙස ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමේ කිරීමේ ව්‍යාපෘතිය
- අවන්හලක් ලෙස ආයුර්වේද කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- අවන්හලක් ලෙස ඇහැලේපොළ අන්තඃපුර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය
- වෙරළුප විවේක හා විනෝද කටයුතු පර්ෂදය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- පොම්පකැලේ නාගරික වනෝද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය
- නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- ෆුඩ් සිටි පරිශ්‍රයේ මැණික් චතුරශ්‍රය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- ප්‍රධාන වීදිය, ශාවියා මාවත සහ දෙමුවාවත වීදි මැණික් වීදි ලෙස සංවර්ධන ව්‍යාපෘතිය
- තැපැල් කාර්යාල පරිශ්‍රය තුළ මැණික් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- හරිත අවකාශයක් ලෙස තරුණ බෞද්ධ සංගම් පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- ඇහැලේපොළ කෞතුකාගාර පරිශ්‍රය මධ්‍ය උද්‍යානයක් ලෙස ප්‍ර ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- නාගහමුත්තෙට්ටුව පරිශ්‍රය හෙළබොජුන් හලක් සහ පොකුණක් සහිතව සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය
- දර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- කෞතුකාගාර පරිශ්‍රයේ පුස්තකාලයක් ශ්‍රවණාගාරයක් සහ කලාගාරයක් සහිතව බහු කාර්යය සේවා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- රථවාහන වලින් තොර වෙළඳ වීදියක් ලෙස පල්ලිය පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- රත්නපුර නගරයේ පටු මංමාවත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- අපර් ක්ලබ් පරිශ්‍රයේ සැහැල්ලු ගුවන්යානා අංගනයක් සහිතව ආපදා සහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- පැරණි දිසා විනිසුරු නිළ නිවස පරිශ්‍රයේ සැහැල්ලු ගුවන්යානා අංගනයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- රත්නපුර නගරයේ පැරණි බස් නැවතුම්පොළ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය
- ගොඩවෙල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- රත්නපුර රෝහලේ සිට නවනගරය දක්වා මාර්ගය (සමන් පෙදෙස හරහා) ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- රත්නපුර නගරයේ හඳුනාගත් ස්ථානයන්හි රථවාහන නැවතුම් පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- නගර මධ්‍යයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
- නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ ස්වර්ණාභරණ වීදිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

01

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - ස්වර්ණාභරණ වීදිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | නගර මධ්‍යය |

- ව්‍යාපෘතියේ අදාළත්වය

මැණික් කර්මාන්තය මත රත්නපුර නගරයේ ආර්ථිකය පදනම් වී ඇති අතර යටත්විජිත සමයට පෙර සිටම එය රත්නපුර නගරයේ ආර්ථිකය තුළ ප්‍රධාන ස්ථානයක් ගෙන ඇත. 2016 වසරේ මහ බැංකු වාර්තාවන්ට අනුව මැණික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකය තුළ පස්වන ස්ථානය ගනී. එමෙන්ම, වර්තමානයේ මැණික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ජාතික

**06 පරිච්ඡේදය සැලැස්ම**

ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

ප්‍රමුඛ ව්‍යාපෘති

ආදායමට 3%ක දායකත්වයක් දක්වන අතර රත්නපුර නගරයේ ජනතාවගෙන් 25%ක් පමණ මැණික් කර්මාන්තයේ නිරතව සිටියි. මැණික් වෙළඳාමේදී මැණික් සඳහා අගය එකතු වීම ප්‍රධාන වශයෙන් සිදුවන්නේ ආභරණ සැකසීමේදී වන බැවින් ඒ සඳහා විශේෂිත වූ වීදියක් රත්නපුර නගරයට තිබීම අනාගතයේ දී සංචාරක ආකර්ෂණය ලබාගැනීමට සහ මැණික් කර්මාන්තය දියුණු කිරීමට හේතු වනු ඇත. එමගින් රත්නපුර ප්‍රජාවට වාසි රැසක් හිමිවනු ඇති අතර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳාම තුළින් අපේක්ෂිත සංචාරක කර්මාන්තය හරහා සෘජු හා වක්‍ර ආර්ථික වාසි රැසක් නගරයට හිමිවනු ඇත.

මේ වනවිට රත්නපුර නගරය තුළ මැණික් කර්මාන්තය ස්ථාපිත වී ඇති නමුත් ඒ තුළින් ඉහළ ආදායමක් ඉපයීමට නම් එහි අනන්‍යතාව පිළිබිඹු වන ආකාරයට ආකර්ෂණීය මංමාවත් ඉදිකර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳාම දියුණු කළ යුතු වේ. මේ සඳහා ෆ්‍රැන්ක් හෙට්ටිආරච්චි මාවත ස්වර්ණාභරණ විදියක් බවට සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඉවහල් වනු ඇත.

- මෙම ව්‍යාපෘතිය හරහා පහත සඳහන් වාසි අත්වනු ඇත.
    - ස්වර්ණාභරණ වෙළඳාම සඳහාම විශේෂිත වූ වීදි
    - විශේෂ ගෘහ නිර්මාණ ශිල්පයන්ගෙන් යුත් වීදි
    - වාණිජ ගොඩනැගිලි වල ඉදිරිපස සෙවන කළ පටු ආලින්ද සහිත මාර්ග
    - ස්වර්ණාභරණ වෙළඳාම සඳහාම විශේෂිත වූ සුඛෝපභෝගි කඩ සාප්පු
    - දේශීය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනයට හා විකිණීමට අවකාශ
    - ජාතික හා ජාත්‍යන්තර ව්‍යාපාරිකයින් සඳහා අනන්‍ය වූ සංඥා පුවරු
    - තෝරාගත් ප්‍රදේශ සඳහා සර්ලන වීදි ආලෝකකරණ පද්ධති හා බිම් සැකසීම්
    - ජලාපවාහන පද්ධතිය

- මූල්‍ය සැලැස්ම

| අංගය | රු. (මිලියන) |
|---|---|
| ස්වර්ණාභරණ වීදිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | මිලියන 200 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ෆ්‍රෑන්ක් හෙට්ටිආරච්චි මාවත දෙපස පිහිටි ඉඩම් පුද්ගලික අංශයට අයත් ඒවා වේ. එබැවින්, මේ සඳහා කටයුතු කිරීමට රත්නපුර මහනගර සභාවෙන් හා පුද්ගලික අංශයෙන් සමන්විත කමිටුවක් පත්කරගත යුතුව ඇත. මෙහි ඇති බොහෝ පරිශ්‍රයන් නීතීඥවරුන් විසින් කුලී පදනම මත ලබාගෙන ඇති අතර ව්‍යාපෘතිය ඇරඹීමට පෙර වෙළඳ නගරයේ සිටින මෙම නීතීඥවරුන්ගේ කටයුතු නව නගරයේ ඒ සඳහා වෙන්කර ඇති අවකාශයන් තුළ ස්ථාපනය කළ යුතුය. අනතුරුව, ෆ්‍රෑන්ක් හෙට්ටිආරච්චි මාවත ස්වර්ණාභරණ වීදියක් බවට සංවර්ධනය කිරීම රත්නපුර මහනගර සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් යටතේ සිදු කරනු ඇත. මෙසේ සංවර්ධනය කරනු ලබන ස්වර්ණාභරණ වීදිය නඩත්තු කිරීම පුද්ගලික අංශය යටතේ සිදුවනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ ඕලන්ද කොටුව අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

02

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - ඕලන්ද කොටුව අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 1
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 100

- ව්‍යාපෘතියේ අදාළත්වය

යටත්විජිත සමයේ සිටම මෙම ඕලන්ද කොටුව රත්නපුර නගරයේ විශේෂ ස්ථානයක් ගනී. නගර මධ්‍යයයේ ඇති කුඩා කඳු මුදුනක මෙම බලකොටුව පිහිටා ඇත. අතීතයේදී මෙය පරිපාලන හා ආරක්ෂක කටයුතු සඳහා භාවිත කර ඇති අතර වර්තමානයේදී එය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පිහිටා ඇති ස්ථානය වේ. මෙම ස්ථානය අවට මැණික් හා සම්බන්ධ කටයුතු ස්ථාපනය වී ඇති නිසාත් ස්වභාවික අනතුරුවලින් තොර ආරක්ෂිත ස්ථානයක් නිසාත් මෙය ජාතික මැණික් කෞතුකාගාරය ස්ථාපනය කිරීමට සුදුසුම ස්ථානය වේ. එබැවින්, රත්නපුර නගරයේ ආර්ථික වර්ධනය උදෙසාත් පෞරාණික හා සංස්කෘතික වටිනාකමකින් යුත් මෙම ගොඩනැගිල්ල ආරක්ෂා කර ගැනීම උදෙසාත් මෙම ස්ථානය අලුත්වැඩියා කොට ජාතික මැණික් කෞතුකාරයක් එහි පිහිටුවීම වඩාත් සුදුසු වේ.

යෝජිත මැණික් කෞතුකාගාරය හරහා නරඹන්නන්ට විවිධ මැණික් වර්ග මෙන්ම මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදනයේ පැරණි නිෂ්පාදන ක්‍රම පිළිබඳව ද දැනගැනීමට හැකිවනු ඇත. මෙම ව්‍යාපෘතිය හරහා රත්නපුර නගරයේ සංචාරක කර්මාන්තය දියුනු වනු ඇති අතර 5000කට අධික ජනතාවකට මෙමඟින් වක්‍රාකාරයෙන් වාසි අත්වනු ඇත. එසේම මේ හරහා රත්නපුර නගරයේ ආර්ථික හා සංස්කෘතිකමය වටිනාකම පිලිබිඹු වනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - ප්‍රදර්ශන ශාලා
  - සම්මන්ත්‍රණ ශාලා
  - වෙන්දේසි මධ්‍යස්ථාන
  - කුඩා වෙළඳසැල්
  - දේශීය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනයට හා විකිනීමට අවකාශය
  - රථවාහන නැවැත්වීමේ පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| අංගය | රු. (මිලියන) |
|---|---|
| ඕලන්ද කොටුව අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය | මිලියන 100 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

දැනට පවත්නා පොලිස් දෙපර්තමේන්තුවේ ගොඩනැගිලි මෙම ස්ථානයෙන් ඉවත් කොට නව නගරයේ ඒ සඳහා වෙන්කර ඇති අවකාශයේ ස්ථාපනය කිරීමට යෝජිතය. අනතුරුව අලුත්වැඩියා කරනු ලබන ඕලන්ද බලකොටු පරිශ්‍රය තුළ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ස්ථාපනය කරනු ඇත. ත්‍රෛපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමෙන්තුව හා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. අලුත්වැඩියා කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සිදුකරනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යටතේ සිදුවනු ඇත.

## රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ පුස්තකාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

03

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - පුස්තකාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – පර්චස් 40
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 50

- ව්‍යාපෘතියේ අදාළත්වය

මෙම ගොඩනැගිල්ල යටත්විජිත සමයේදී වේස් අනුස්මරණ ශාලාව ලෙස හඳුන්වා ඇති අතර නගර මධ්‍යයේ පවතින ඕලන්ද කොටුව ආසන්නයේම පිහිටා ඇත. වර්තමානයේදී මෙම ගොඩනැගිල්ල පුස්තකාලය සඳහා භාවිත වේ. මෙම ස්ථානය අවට මැණික් හා සම්බන්ධ කටයුතු ස්ථාපනය වී ඇති නිසාත් ස්වභාවික අනතුරුවලින් තොර ආරක්ෂිත ස්ථානයක් නිසාත් මැණික් ව්‍යාපාරිකයන්ට සහ පැමිණෙන සංචාරකයින්ට සුබෝපභෝගී අත්දැකීම් රැසක් අත්විඳිය හැකි අවන්හලක් ඉදිකිරීමට සුදුසුම ස්ථානය වේ. එබැවින්, රත්නපුර නගරයේ ආර්ථික වර්ධනය උදෙසාත් පෞරාණික හා සංස්කෘතික වටිනාකමකින් යුත් මෙම ගොඩනැගිල්ල ආරක්ෂා කර ගැනීම උදෙසාත් පුස්තකාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කොට සුබෝපභෝගී අවන්හලක් පිහිටුවීම වඩාත් සුදුසු වේ.

මෙම ව්‍යාපෘතිය හරහා රත්නපුර නගරයේ සංචාරක කර්මාන්තය නව දුරටත් දියුණු වනු ඇති අතර ජාතික මැණික් කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන්නන් හට පහසුකම් සැලසෙනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - ආහාර පාන ලබාගැනීමේ පහසුකම්
    - සනීපාරක්ෂක පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| අංගය | රු. (මිලියන) |
|---|---|
| පුස්තකාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය | මිලියන 50 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

දැනට පවතින පුස්තකාලය ඇහැළේපොල කෞතුකාගාර පරිශ්‍රයේ ඉදිකිරීමට යෝජිත බහුකාර්ය ගොඩනැගිල්ල වෙත විතැන් කිරීමට නියමිතය. ද්විපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. අලුත්වැඩියා කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සිදුවනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සිදුවනු ඇත.

## රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ ඓතිහාසික ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

04

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - ඓතිහාසික ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | මුවගම |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 4
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 200

06 පරිච්ඡේදය
සැලැස්ම

ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

ප්‍රමුඛ ව්‍යාපෘති

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන්ට හා ව්‍යාපාරිකයන්ට ප්‍රමාණවත් තරම් නවාතැන් පහසුකම් නගරයේ නොමැත. රත්නපුර නගරය තුළ දැනට පවතින සංචාරක නිකේතනයන්ගෙන් තුනෙන් දෙකකටම ප්‍රමාණවත් තරම් ඉඩ පහසුකම් නොමැති අතර දර්ශනීය ස්ථානවල පිහිටා නොමැත. මෙසේ දර්ශනීය ස්ථානවල පිහිටා ඇති සංචාරක නිකේතනන බොහෝමයක් නගරාසන්නව හෝ නගරය තුළ පිහිටා නොමැත.

කෙසේ නමුත්, රත්නපුර නගරයේ පවතින පෞරාණික ගොඩනැගිලි බොහෝමයක් ඇහැළෙපොළ හෝ යටත් විජිත (බ්‍රිතාන්‍ය) ගෘහ නිර්මාණ ශිල්පයන්ට අනුව ඉදිකර ඇති අතර වර්තමානය වන විට මේවා රජයේ කාර්යාල ලෙස හෝ රාජ්‍ය නිලධාරීන්ගේ නිල නිවාස ලෙස භාවිත වේ. මෙම ඉපැරණි ගොඩනැගිලි සියල්ලම පිහිටා ඇත්තේ දර්ශනීය හා නිස්කලංක වටපිටාවකින් යුතු කුඩා කඳු මුදුන්වලය. එසේම, මෙම ස්ථාන සියල්ලම නගර මධ්‍යයට ඉතාම ආසන්නව පිහිටා ඇති අතර මෙහි සිට මුවගම මාර්ගය හරහා පහසුවෙන් හා ඉක්මනින් නගර මධ්‍යයට ළඟා විය හැක. රත්නපුර නගර සැලැස්මට අනුව යෝජිත අභ්‍යන්තර ගුවන් පථයන්ගෙන් එකක් ද මෙම කලාපය තුළ ඉදිකිරීමට නියමිත අතර මේ හරහා ද නගරයේ සංචාරක ආකර්ෂණය වැඩි වනු ඇත. එබැවින් මෙම පෞරාණික ගොඩනැගිලි අලුත්වැඩියා කර සංචාරක නිකේතන බවට පත්කිරීමෙන් ඒවායේ ඉපැරණි ගෘහ නිර්මාණ ශිල්පයන් ආරක්ෂා වනු ඇති අතර නගරයේ ආර්ථිකය ද දියුණු වනු ඇත. එසේම, මෙම ව්‍යාපෘතිය හරහා නගරයට පැමිණෙන සංචාරකයන්ට හා ව්‍යාපාරිකයන්ට පහසුකම් රැසක් සැලසෙනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - නවාතැන් පහසුකම්
  - ආහාර පාන ලබාගැනීමේ පහසුකම්
  - විනෝදාස්වාද පහසුකම්
  - සනීපාරක්ෂක පහසුකම්
  - වාහන නවතා තැබීමේ පහසුකම්
  - දර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීම

- මූල්‍ය සැලැස්ම

| අංශය | රු. (මිලියන) |
|---|---|
| ඓතිහාසික ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය | මිලියන 200 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම ව්‍යාපෘතියට අනුව උප පොලිස් පරීක්ෂක කාර්යාලය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලබා දී ඇති ස්ථානයට ද අනෙකුත් නිල නිවාස නාගරික සංවර්ධන අධිකාරියට අයත් නව නගරයේ පවතින වෙනත් ඉඩම්වලට විතැන් කරනු ඇත. ද්විපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කිරීමේ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුදැනුම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුවනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ ආයුර්වේද කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

05

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - ආයුර්වේද කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 1
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 50

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින්ට හා ව්‍යාපාරිකයින්ට ප්‍රමාණවත් තරම් ආහාර පාන ලබාගැනීමේ පහසුකම් නගරයේ නොමැත. රත්නපුර නගරය තුළ දැනට ඇති අවන්හල්වලින් තුනෙන් දෙකකටම ප්‍රමාණවත් තරම් ඉඩ පහසුකම් නොමැති අතර දර්ශනීය

ස්ථානවල පිහිටා නොමැත. මෙසේ දර්ශනීය ස්ථානවල පිහිටා ඇති අවන්හල් බොහෝමයක් නගරාසන්නව හෝ නගරය තුළ පිහිටා නොමැත.

මෙම ව්‍යාපෘතිය සඳහා යෝජිත ගොඩනැගිල්ල බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පයන්ට අනුව ඉදිකර ඇති අතර වර්තමානය වන විට ආයුර්වේද කාර්යාලය ලෙස භාවිත වේ. මෙම ගොඩනැගිල්ල දර්ශනීය වටපිටාවකින් යුත් කලු ගං ඉවුරේ පිහිටා ඇති අතර බ්‍රිතාන්‍ය පාලන සමයේ දී අවන්හලක් ලෙස භාවිත වී ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වේ. එසේම මෙම ගොඩනැගිල්ල නගර සීමාවේ පිහිටා ඇති නිසා නගරයේ ඕනෑම තැනක සිට ඉතාම පහසුවෙන් ළඟා විය හැක. රත්නපුර නගර සැලැස්මට අනුව යෝජිත ගංගා තොටුපොළවලින් එකක් මෙම ස්ථානය ආසන්නයේ ඉදිකිරීමට නියමිතව ඇති අතර ඒ තුළින් ද මෙම ස්ථානයට ඇති සංචාරක ආකර්ෂණය වැඩි වනු ඇත. එබැවින් මෙම පෞරාණික ගොඩනැගිල්ල අලුත්වැඩියා කර අවන්හලක් බවට පත්කිරීමෙන් එහි ඉපැරණි ගෘහ නිර්මාණ ශිල්පයන් ආරක්ෂා වනු ඇති අතර නගරයේ ආර්ථිකය ද දියුණු වනු ඇත. එසේම, මෙම ව්‍යාපෘතිය හරහා නගරයට පැමිණෙන සංචාරකයින්ට හා ව්‍යාපාරිකයින්ට පහසුකම් රැසක් සැලසෙනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි
    - නවාතැන් පහසුකම්
    - ආහාර පාන ලබාගැනීමේ පහසුකම්
    - විනෝදාස්වාද පහසුකම්
    - සනීපාරක්ෂක පහසුකම්
    - වාහන නවතා තැබීමේ පහසුකම්
    - දර්ශනීය ස්ථාන සංවර්ධනය

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන)* |
|---|---|
| *ආයුර්වේද කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 50* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

දැනට පවතින ආයුර්වේද කාර්යාලය නව නගරයේ පිහිටුවීමට යෝජිත පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය වෙත විතැන් කරනු ඇත. ද්විපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. අලුත්වැඩියා කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුදැනුම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුවනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුවනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ ඇඹැළේපොළ අන්තඃපුර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

06

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - ඇඹැළේපොළ අන්තඃපුර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගරය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – 80 Perch
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 150

- ව්‍යාපෘතියේ අදාළත්වය

පිහිටීම හා පෙනුම අනුව ඇහැළේපොළ අන්තඃපුර ගොඩනැගිල්ල රත්නපුර නගරයට වටිනා සම්පතකි. මෙම ගොඩනැගිල්ල ඇහැළේපොළ, ලන්දේසි හා බ්‍රිතාන්‍ය යන යුග තුනෙහිම ලක්ෂණ පෙන්නුම් කරයි. මුල් කාලීනව උඩරට ගෘහ නිර්මාණ ශිල්පයන්ට අනුව නිමවා ඇති අතර ඇහැළේපොළ යුගයේ දී අන්තඃපුර ගොඩනැගිල්ල ලෙස මෙම ස්ථානය භාවිත කර ඇති බව පුරාවිද්‍යාත්මක වාර්තාවන්ට අනුව හෙළි වේ. පසු කාලීනව, බ්‍රිතාන්‍ය පාලකයින්ගේ නිල නිවාසයක් ලෙස භාවිත වී ඇති නිසා මෙම ගොඩනැගිල්ලට බ්‍රිතාන්‍ය හා ලන්දේසි ගෘහ නිර්මාණ ලක්ෂණ ද එකතු වී ඇත. එසේම නගර මධ්‍යයයේ ඇති දර්ශනීය වටපිටාවකින් යුත් කුඩා කඳු ගැටයක පිහිටා ඇති මෙම ඇහැළේපොළ ගොඩනැගිල්ල වර්තමානය වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය ලෙස භාවිත වේ.

එමෙන්ම, ස්වභාවික අනතුරුවලින් තොර දර්ශනීය වටපිටාවකින් යුතු ආකර්ෂණීය ස්ථානයක පිහිටා ඇති නිසාත්, සංස්කෘතික හා ඓතිහාසික වටිනාකමකින් යුත් නිසාත්, නගරයට පැමිණෙන දේශීය හා විදේශීය ව්‍යාපාරිකයින්ට පහසුකම් සැලසෙන ආකාරයේ කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ ශාලාවක් පිහිටුවීමට වඩාත් සුදුසුම ස්ථානය මෙය වේ. රත්නපුර නගරය යනු පළාත් අගනගරය වන බැවින් කුඩා කණ්ඩායම් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීමට යෝග්‍ය සම්මන්ත්‍රණ ශාලාවක අවශ්‍යතාව නගරයට තිබේ. එබැවින්, නගරයට ඒකරාශී වෙතැයි අපේක්ෂිත ජනගහනයට අවශ්‍ය පහසුකම් මෙම ව්‍යාපෘතිය හරහා සැලසෙනු ඇත. එසේම, නගරයේ ඉදිකිරීමට යෝජිත අභ්‍යන්තර සැහැල්ලු ගුවන් යානා අංගනයන්ගෙන් එකක් මෙම ස්ථානයට යාබදව ඉදිකිරීමට නියමිත අතර ස්වභාවික අනතුරු නොමැති කාලවලදී එය එළිමහන් අවන්හලක් ලෙස භාවිත කිරීමට හැකි වනු ඇත. ඒ අනුව මෙහි පැමිණෙන්නන්ට සුබෝපභෝගී අත්දැකීම් රැසක් මෙම  ව්‍යාපෘතිය හරහා හිමි වනු ඇත.

මෙම පරිශ්‍රය සඳහා ඇතුළුවීම "මල් රේණු මාවත" ඔස්සේ සිදුවනු ඇති අතර පැරණි කම්කරු දෙපාර්තමේන්තු පරිශ්‍රය වාහන නැවැත්වීම සඳහා භාවිත කිරීමට හැකිවනු ඇත. එසේම මෙම ගොඩනැගිල්ලේ භාවිතය වෙනස් කිරීමේදී එම පරිශ්‍රය වෙත මෙතෙක් පැවති ෆර්ගසන් උසස් විද්‍යාල මාවතේ පිවිසුම වසා දැමෙනු ඇත.

මෙම පෞරාණික ඇහැළේපොළ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර කුඩා සම්මන්ත්‍රණ ශාලාවක් සහිත අවන්හලක් බවට පත්කිරීමෙන් මෙහි ඉපැරණි ගෘහ නිර්මාණ ශිල්පයන් හා සංස්කෘතිකමය හා ඓතිහාසික වටිනාකම ආරක්ෂා වනු ඇති අතර නගරයේ ආර්ථිකය ද දියුණු වනු ඇත. එමෙන්ම, මෙම ව්‍යාපෘතිය හරහා නගරයට පැමිණෙන සංචාරකයින්ට හා ව්‍යාපාරිකයින්ට පහසුකම් රැසක් සැලසෙනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි
  - පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවල කුඩා කණ්ඩායම් රැස් විය හැකි සම්මන්ත්‍රණ ශාලා පහසුකම්
  - සුබෝපභෝගි නවාතැන් පහසුකම්
  - ආහාර පාන ලබාගැනීමේ පහසුකම්
  - සනීපාරක්ෂක පහසුකම්
  - වාහන නවතා තැබීමේ පහසුකම්
  - විනෝදාස්වාද පහසුකම්
  - දර්ශනීය ස්ථාන සංවර්ධනය

- මූල්‍ය සැලැස්ම

| *අංශය* | *රු. (මිලියන)* |
|---|---|
| *ඓතිහාසික ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 150* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම ව්‍යාපෘතියට අනුව දැනට පවතින පුරවිද්‍යා දෙපාර්තමේන්තුව නව නගරයේ ඉදිකිරීමට යෝජිත පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය වෙත විතැන් කරනු ඇත. ද්විපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුවනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ වෙරළුප විවේක හා විනෝද කටයුතු කලාපය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

07

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම -වෙරළුප විවේක හා විනෝද කටයුතු කලාපය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | වෙරළුප |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 10 ක් පමණ
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 1500

- ව්‍යාපෘතියේ අදාළත්වය

අතීතයේ සිටම රත්නපුර යනු ජල සම්පත උදෙසා ප්‍රසිද්ධ නගරයකි. එසේම රත්නපුර නගර සැලැස්මට අදාළ ප්‍රදේශයෙන් 80%ක්ම මිරිදිය ජලයෙන් සමන්විත අතර ඒ අතරින් "කලු" ගඟ, "වේ" ගඟ හා දිය ඇලි ප්‍රධාන වේ. එබැවින්, 2030 වන විට රත්නපුර නගරය ජීවත් වීමට සුදුසු නගරයක් බවට පත් කිරීමේ දී මෙම නගරය මතුපිට හා භූගතව පවත්නා ජල නලය ඒ සඳහා භාවිත කිරීම වැදගත් වේ. ඒ අනුව මෙම ජල සම්පත භාවිතයෙන් රත්නපුර නගරයට දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීමට වෙරළුප ජල රැඳවුම් ප්‍රදේශයේ ජල රැඳවුම් වැවක් හා ජලය තේමා කර ගත් උද්‍යානයක් ඉදිකිරීමට යෝජනා කර ඇත. එසේම මෙම යෝජිත ව්‍යාපෘතිය හරහා රත්නපුර නගරයේ ජල සම්පත නව දුරටත් ආරක්ෂා වනු ඇති අතර මෙමඟින් දියුණු වනු ඇතැයි අපේක්ෂිත සංචාරක කර්මාන්තය තුළින් සෘජු හා වක්‍ර අදායම් මාර්ග රැසක් බිහි වනු ඇත.

එසේම රත්නපුර නගර සීමාව තුළ පිහිටා ඇති පාසැල් වලින් ප්‍රධාන පාසල් 5ක් රත්නපුර නගර මධ්‍යය කේන්ද්‍ර කර ගනිමින් පිහිටා ඇති අතර ඒවායේ ඉගෙනුම ලබන සමස්ත සිසුන් සංඛ්‍යාව 12000කට අධිකය. රත්නපුර නගරයේ පවතින ඉඩම් හිඟය හේතුවෙන් සෑම පාසලකටම වෙන වෙනම ක්‍රීඩාංගණ ලබා දීම අපහසු අතර කුඩා ළමුන් සඳහා විධිමත් ලෙස සැකසූ ළමා උද්‍යානයක් ද නගරය තුළ නොමැත. එබැවින්, යෝජිත වෙරළුප ක්‍රීඩාංගණය හා ළමා උද්‍යානය තුළින් මෙම ගැටළු ද්විත්වයම විසඳෙනු ඇත.

එසේම, නව නගරය පිහිටා ඇත්තේ රත්නපුර ප්‍රධාන නගරයේ සිට කිලෝමීටර 5ක පමණ දුරින් වන අතර අද වන විට මෙම නගර දෙකම හුදෙකලා නගර දෙකක් ලෙස වෙන වෙනම සංවර්ධනය වෙමින් පවතී. මෙම නගර ද්විත්වය අතර පවතින ස්වභාවික බාධාවන් නිසාම, නගර දෙක යා කරමින් දිවෙන A004 මාර්ගයට අමතර ව වෙනත් කිසිඳු පැහැදිලි සම්බන්ධතාවක් දැකිය නොහැකිය. එබැවින්, මෙම ව්‍යාපෘතියේ තවත් අරමුණක් වනුයේ, මෙම යෝජිත ජල රැඳවුම් ප්‍රදේශය මඟින් රත්නපුර නගරය හා නව නගරය අතර පැහැදිලි දෘශ්‍යමය සබඳතාවක් නිර්මාණය කිරීමයි.

- ඉදිකිරීමට යෝජිත අංග

    - ජල රැඳවුම් වැව
    - ජලය තේමා කර ගත් උද්‍යානය
    - ක්‍රීඩාංගණය
    - ළමා උද්‍යානය

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - මුහුදු ගුවන් යානා ගොඩබෑස්වීමේ ස්ථානය
    - ව්‍යායාම මංතීරු
    - ඇවිදීමේ මංතීරු
    - හංස බෝට්ටු
    - පාවෙන අවන්හල්
    - විනෝදාස්වාද ක්‍රියාකාරකම්
    - ජලය පදනම් කරගත් ක්‍රියාකාරකම්
    - ආහාර පාන ලබාගැනීමේ පහසුකම්
    - සනීපාරක්ෂක පහසුකම්
    - වාහන නවතා නැබීමේ පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන)* |
| --- | --- |
| *වෙරළුප විවේක හා විනෝද කටයුතු කලාපය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 1500* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම ව්‍යාපෘතියට තෝරා ගත් ප්‍රදේශයේ පවතින සියලු ඉඩම් පුද්ගලික හිමිකරුවන්ට අයත් කුඹුරු ඉඩම් වන අතර ඒවායේ වී ගොවිතැන් හෝ වෙනත් මහා පරිමාණ වගාවන් මේ වනවිට සිදු නොවේ. එබැවින්, මෙම ඉඩම් අත්පත් කරගැනීමට අදාළ කටයුතු කටයුතු සිදු වනු ඇත. මීට අමතරව, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුදැනුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට නියමිත අතර ඉදිකිරීමේ කටයුතු හා නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් සිදුවනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ පොම්පකැලේ නාගරික වනෝද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය

08

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - පොම්පකැලේ නාගරික වනෝද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- 3.2 ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 15
- 3.3 ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 100

- ව්‍යාපෘතියේ අදාළත්වය

2050 වසර ඉලක්ක කරගත් ජාතික භෞතික සැලැස්මට අනුව රත්නපුර නගරය පාරිසරික අධිසංවේදී කලාපයක් තුළ පිහිටයි. පොම්පකැලේ නාගරික වනාන්තරය යනු රත්නපුර නගරයට සොබාදහමෙන් ලැබුණු වටිනා ත්‍යාගයක් වන අතර අද වන විට මෙවැනි ස්වභාවික නාගරික වනාන්තර, නගර සීමාවක් තුළ දැකිය හැකි වනුයේ ඉතාම කලාතුරකිනි. ලංකාව තුල පිහිටා ඇති නාගරික වනෝද්‍යාන හතරෙන් එකක් වන ජෛව විවිධත්වයෙන් අනූන මෙම වනාන්තරය රත්නපුර නගරයට අලංකාර හරිත වර්ණයක් එක් කරයි. එසේම, මෙම කුඩා වනාන්තර පරිශ්‍රය දේශීය මෙන්ම විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය ලබාගත හැකි ආකාරයේ කුඩා ස්වභාවික පිහිනුම් තටාකයකින් ද සමන්විත වේ. එබැවින් මෙම යෝජිත ව්‍යාපෘතිය හරහා රත්නපුර නගරයේ වන සම්පත තව දුරටත් ආරක්ෂා වනු ඇති අතර මෙමඟින් දියුණු වනු ඇතැයි අපේක්ෂිත සංචාරක කර්මාන්තය තුළින් සෘජු හා වක්‍ර අදායම් මාර්ග රැසක් බිහි වනු ඇත.

මෙම ව්‍යාපෘතිය තුළින් වෙනස් මාදිලියක විනෝදාස්වාදක අවකාශයක් රත්නපුර නගරයට නිර්මාණය වනු ඇති අතර ජෛව විවිධත්වයෙන් අනූන පරිසරයක් ආරක්ෂා වීම මගින් පාරිසරික ගවේෂකයින්ට, පාසල් සිසුන්ට හා පක්ෂීන් ගවේෂකයන්ට මෙන්ම නරඹන්නන්ට ද තම අධ්‍යන කටයුතු කරගැනීමට අවශ්‍ය පහසුකම් හිමි වනු ඇත. මීට අමතරව නාගරිකයන්ගේ භෞතික හා මානසික සෞඛ්‍යය වර්ධනය කරන ආකාරයේ පරිසරයක් නිර්මාණය වීම තුළින් හා ගස් වැල් හා හරිත ශාකවලින් සමන්විත අලංකාර හා ජීවත් වීමට සුදුසු නගරයක් බවට රත්නපුර නගරය පත් වනු ඇත. එසේම ව්‍යාපෘතිය තුළින් රත්නපුර නගරයේ නිවාස හා ඉඩම්වල වටිනාකම ද ශීඝ්‍රයෙන් ඉහළ යනු ඇති අතර ඒ තුළින් ද නගරයේ ආර්ථික මට්ටම ඉහළ යනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - පිහිනුම් තටාකය සංවර්ධනය
  - සතුන් නැරඹීම සඳහා ක්‍රමානුකූලව සැකසූ පරිසර හිතකාමී මංපෙත්
  - වන ආවරණයට ඉහළින් නගරයේ දිසා තුනකට නාභිගත කළ නැරඹුම් මැදිරි
  - භූමියට සහ භූමිය පරිහරණය කරන සතුන්ට හිරිහැර නොවන සේ භූමියට ඉහළින් වන ආවරණය අතරින් සකසනු ලබන මංපෙත්
  - සාකච්ඡා කිරීමට අවකාශ
  - ආසන පහසුකම්
  - ආහාර පාන ලබාගැනීමේ පහසුකම්
  - සනීපාරක්ෂක පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| අංශය | රු. (මිලියන) |
|---|---|
| පොම්පකැලේ නාගරික වනෝද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය | මිලියන 100 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ද්විපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා රත්නපුර මහ නගර සභාව විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. භෞතික පරිසරය සංවර්ධනය කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුවනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් සිදුවනු ඇත.

## රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

09

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම- නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – පර්චස් 80
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරයේ වැසියන්ට හා නගරයට පැමිණෙන සංචාරකයින්ට නිදහසේ කාලය ගත කිරීමට පවත්නා විවෘත අවකාශයන් ඉතාම සීමිත වේ. එම සීමිත අවකාශයන් අතුරින් එකක් වන නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය, මීට දශක කිහිපයකට පෙර ඉදි කර ඇති අතර මේ වන විට එය අත් හැර දමා ඇත. යටත්විජිත සමයේ මෙම ස්ථානය සොල්දාදුවන් විසින් නැරඹුම් ස්ථානයක් (බැලුම්ගල) ලෙස භාවිත කර ඇති බව පුරාවිද්‍යාත්මක සාක්ෂි මඟින් හෙළිදරව් වේ. මෙම නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය නගරය මධ්‍යයේ ඇති කඳු ගැටයක් මුදුනෙහි පිහිටා ඇති අතර එය දර්ශනීය වටපිටාවකින් ද සමන්විතය. මේ අනුව නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය හරහා නගරයට පැමිණෙන සංචාරකයින්ට, ව්‍යාපාරිකයින්ට හා නගර වැසියන්ට නිදහස්, විවෘත අවකාශයක් හිමිවනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - ආසන පහසුකම්
  - ආහාර පාන ලබාගැනීමේ පහසුකම්
  - සනීපාරක්ෂක පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන )* |
|---|---|
| *නාලන්ද එල්ලාවල නාගරික උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 70* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ත්‍රෛපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා රත්නපුර මහ නගර සභාව විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. සංවර්ධන කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුදැනුම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුවනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් සිදුවනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ මැණික් චතුරස්‍රය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

10

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - මැණික් චතුරස්‍රය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය - නගර මධ්‍යය - ෆුඩ් සිටි පරිශ්‍රය, රත්නපුර




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – පර්චස් 40
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

මැණික් කර්මාන්තය, රත්නපුර නගරය තුළ ස්ථාපිත වී ඇති නමුත් මෙමඟින් ඉහළ ආදායමක් ඉපයීමට නම් මැණික් වෙළඳාම සඳහා නගරය තුළ ඇති අවකාශය පුළුල් කළ යුතුය. වර්තමානයේදී මැණික් වෙළඳාම සඳහා රත්නපුර නගරයේ ඇති එකම හා ප්‍රධානම විවෘත අවකාශය වන්නේ අඹගහයට පරිශ්‍රයයි. නමුත් වර්තමානය වන විට මෙම ස්ථානය පමණක් මැණික් වෙළඳාම සඳහා ප්‍රමාණවත් නොවන අතර අමතර ස්ථානයක් ඒ සඳහා වෙන්කිරීමේ අවශ්‍යතාවක් නගරයට පවතී. එමෙන්ම, මෙම වෙළඳ අවකාශය තව දුරටත් පුළුල් කිරීමෙන් නගරයට පැමිණෙන දේශීය හා විදේශීය මැණික් වෙළෙන්දන් හට ඒ සඳහා හිමිවන විවෘත අවකාශයන් ප්‍රමාණය ඉහළ යන අතර ඔවුන්ගේ ආකර්ෂණය තවදුරටත් නගරය වෙත රඳවා ගැනීමට හැකි වනු ඇත. නගර මධ්‍යයේ පිහිටි ෆුඩ් සිටි පරිශ්‍රයේ ඉදි කිරීමට යෝජිත මැණික් චතුරස්‍රය තුළින් මෙම අවශ්‍යතාවය ඉටු කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතිය රත්නපුර නගරය තුළ මැණික් කර්මාන්තය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතීන්ගෙන් ප්‍රමුඛ ව්‍යාපෘතියකි.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - දේශීය මැණික් වෙළඳාම සඳහා අවකාශය
    - ව්‍යාපාරිකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් හා ආහාරපාන ලබා ගැනීමේ පහසුකම්
    - පුළුල් වූ මැණික් වෙළඳ අවකාශය

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන)* |
|---|---|
| *මැණික් චතුරස්‍රය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 70* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම ඉඩම දැනට අයිතිව පවතිනුයේ රත්නපුර මහ නගර සභාවට බැවින් ඉඩම නැවත අත්පත් කර ගැනීමේ අවශ්‍යතාවක් නොමැත. මෙම ව්‍යාපෘතිය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධීක්ෂණය යටතේ සිදුවනු ඇති අතර ඉදිකිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් හා නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව විසින් සිදු කරනු ඇත.

## රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ මැණික් වීදි සංවර්ධන ව්‍යාපෘතිය

11

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - මැණික් වීදි සංවර්ධන ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතියේ අදාළත්වය

2030 වසර ඉලක්ක කරගත් රත්නපුර නගර සංවර්ධන සැලැස්මට අනුව, මැණික් කර්මාන්තය හරහා ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයට 7% ක දායකත්වයක් ලබාදීමට අපේක්ෂිත ය. මෙම අරමුණ කරා ළඟාවීමටත් මැණික් සම්පත තුළින් ප්‍රාදේශීය ආර්ථිකය සමෘද්ධිමත් කිරීමටත් ඒ

සඳහා අවශ්‍ය භෞතික සංවර්ධනයන් සිදුකළ යුතුය. මැණික් කර්මාන්තය මේ වනවිටත් රත්නපුර නගරය තුළ ස්ථාපිත වී ඇති බැවින් ඒ සඳහා වෙන් වූ විශේෂිත වීදි නගරය ආශ්‍රිතව දැකිය හැකි අතර එම කර්මාන්තය තුළින් ඉහළ ආදායමක් ඉපයීම සඳහා දැනට ඒ සඳහා ප්‍රසිද්ධ වීදි, ආකර්ෂණීය හා දැකුම්කලු ආකාරයට සංවර්ධනය කළ යුතුය. මේ අනුව ප්‍රධාන වීදිය, ශාවියා මාවත හා දෙමුවාවත වීදිය මැණික් වීදි ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය තුළින් රත්නපුර නගරයේ මැණික් කර්මාන්තය නව තවත් ප්‍රවර්ධනය වනු ඇති අතර දේශීය හා විදේශීය සංචාරකයින්ගේ හා ව්‍යාපාරිකයින්ගේ ආකර්ෂණය වැඩි වනු ඇතැයි අපේක්ෂිත ය.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - මැණික් කර්මාන්තය සඳහාම විශේෂ වූ වීදි
    - දේශීය හා විදේශීය ව්‍යාපාරිකයින්ට හඳුනාගැනීමට පහසු ආකාරයේ සංඥා පුවරු
    - මැණික් වෙළඳාම සඳහාම වෙන් වූ සුබෝපභෝගී වෙළඳ කුටි
    - සුදුසු ආකාරයේ වීදි ආලෝකකරණ පද්ධති හා පදික වේදිකා
    - වීදි ආසන පහසුකම්
    - ආහාර පාන ලබා ගැනීමේ පහසුකම්
    - සනීපාරක්ෂක පහසුකම්
    - දේශීය ව්‍යවසායකයින්ට තම නිෂ්පාදිතයන් ප්‍රදර්ශනය කිරීමට හා විකිණීමට අවකාශය
    - මැණික් කැපීම හා ඔප දැමීම සඳහා වෙන් වූ ස්ථාන

- මූල්‍ය සැලැස්ම

| *අංශය* | *රු. (මිලියන)* |
|---|---|
| *මැණික් වීදි සංවර්ධන ව්‍යාපෘතිය* | *මිලියන 170* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු නාගරික සංවර්ධන අධිකාරියේ හා ජාතික ස්වර්ණාභරණ අධිකාරියේ අධීක්ෂණය යටතේ සිදුවනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව යටතේ සිදු වනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ මැණික් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

12

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - මැණික් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය - තැපැල් කාර්යාල පරිශ්‍රය - රත්නපුර නගරය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – පර්චස් 80
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 500

- ව්‍යාපෘතියේ අදාළත්වය

සබරගමුව පළාතේ ප්‍රධාන නගරය ලෙස කොළඹ නගරයට කි.මී.100 ක දුරින් ගිණිකොණ දෙසට වන්නට පිහිටා ඇති රත්නපුර නගරයේ ආර්ථිකය මැණික් කර්මාන්තය මත පදනම්ව පවතී. කෙසේ නමුත්, පූර්ව යටත් විජිත යුගයේ සිටම රත්නපුර නගරය තුළ ස්ථාපිතව පවතින මෙම මැණික් කර්මාන්තය තුළින් ඉහළ ආදායමක් ඉපයීමට දේශීය හා විදේශීය ව්‍යාපාරිකයින් අතර රත්නපුර නගරය ජනප්‍රිය වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ප්‍රචලිත කළ යුතු වේ. ඒ සඳහා නගරය තුළ පවතින වාණිජ අවකාශයන් තවදුරටත් පුළුල් කළ යුතු වන අතර මැණික් කර්මාන්තයේ දිගු කාලීන පැවැත්ම සඳහා අවශ්‍ය කරන භෞතික යටිතල පහසුකම් සංවර්ධනය එයට සමගාමීව සිදු කළ යුතු වේ. ඒ සඳහා යෝජිත මැණික් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය මගින් අනාගතයේදී රත්නපුර නගරය මැණික් කර්මාන්තයේ කේන්ද්‍රස්ථානයක් වනු ඇතැයි අපේක්ෂිත ය.

රත්නපුර තැපැල් කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීමට යෝජිත මෙම මැණික් කුළුණ මහල් 15කින් සමන්විත වනු ඇති අතර රත්නපුර නගරයට ආවේණික වූ මැණික් අනන්‍යතාවය පිළිබිඹු වන පරිදි එය ගොඩනැගෙනු ඇත. එමෙන්ම, මෙම යෝජිත කුළුණ නගර මධ්‍යයේ ඉදිකෙරෙනු ඇති බැවින් නගරයේ අනාගත අහස් රේඛාව (Sky Line) මෙම කුළුණෙහි උස මත පදනම් වනු ඇතැයි අපේක්ෂිත ය.

මෙම යෝජිත මැණික් කුළුණෙහි ඉහළ මහල් සුඛෝපභෝගී නිවාස සඳහා ද පහළ මහල් වාණිජ අවකාශයන් සඳහා වෙන් කෙරෙනු ඇති අතර එම අවකාශයන්ට අමතරව සංචාරක තොරතුරු මධ්‍යස්ථානයක් හා සන්නිවේදන මධ්‍යස්ථානයක් මෙම ස්ථානයට යෝජිත ය. එමෙන්ම, නව නගරයට විතැන් කිරීමට නියමිත පොලිස් ස්ථානයේ හා තැපැල් කාර්යාලයේ හදිසි අවශ්‍යතා වෙනුවෙන් ප්‍රමාණවත් අවකාශයක් මෙම කුළුණ තුල වෙන් කෙරෙනු ඇත. මෙම කුළුණෙහි බිම් මහල වාහන නවතා තැබීමේ අංගනයක් ඉදිකිරීමට වෙන් කෙරෙනු ඇති අතර නගර මධ්‍යයට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ද මෙම ව්‍යාපෘතිය හරහා සැපයෙනු ඇත. මෙම මැණික් කුළුණෙහි පියැසි අවකාශය (rooftop) සඳහා අලංකාර අහස් දර්ශනයක් (Sky View) සහිත සුඛෝපභෝගී අවන්හලක් යෝජිත වන අතර රත්නපුර ජනතාවට නැවුම් අත්දැකීමක් ඒ ඔස්සේ විඳගැනීමට හැකියාව ලැබෙනු ඇත.

එබැවින්, මෙම මැණික් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය තුළින් රත්නපුර නගරය සතු අනන්‍යතාවය පිළිබිඹු වනු ඇතැයි ද නගරය සතු ව්‍යාපාරික අවස්ථා පුළුල් වනු ඇතැයි ද නගරයේ ආර්ථිකය ශීඝ්‍රයෙන් වර්ධනය වනු ඇතැයි ද අපේක්ෂිත ය.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි
    - අලංකාර අහස් දර්ශනයක් (Sky View) සහිත සුඛෝපභෝගී අවන්හල්
    - දේශීය හා විදේශීය ව්‍යාපාරිකයින්ට පහසුකම් සැලසෙන ආකාරයේ සුඛෝපභෝගී නවතැන් පහසුකම්
    - සංචාරක තොරතුරු මධ්‍යස්ථානය
    - සුඛෝපභෝගී වෙළඳසැල්
    - මැණික් වෙළඳාම සඳහාම වෙන් වූ වෙළඳ කුටි
    - සන්නිවේදන කටයුතු සඳහා ආධාරක ව්‍යුහයන්
    - දේශීය ව්‍යවසායකයින්ට තම නිෂ්පාදිතයන් ප්‍රදර්ශනය කිරීමට හා විකිණීමට අවකාශය
    - එක් රැස් වීමේ ස්ථානීය අවකාශයන් (Gathering Spaces)
    - වාහන නවතා තැබීමේ පහසුකම්
    - සනීපාරක්ෂක පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන)* |
|---|---|
| *මැණික් කුළුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 500* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ඉඩම් හුවමාරු ක්‍රමය යටතේ මෙම ව්‍යාපෘතිය සිදු කෙරෙනු ඇත. ඒ අනුව, දැනට මෙම පරිශ්‍රයේ ස්ථානගතව පවතින තැපැල් කාර්යාලය නව නගරයේ ඉදිකිරීමට යෝජිත පරිපාලන සංකීර්ණය වෙත විතැන් කෙරෙනු ඇති අතර මැණික් කුළුණ ඉදිකිරීමේ හා නඩත්තු කිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරය විසින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ තරුණ බෞද්ධ සංගම් පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

13

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - තරුණ බෞද්ධ සංගම් පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – පර්චස් 50
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 50

- ව්‍යාපෘතියේ අදාළත්වය

ගොඩනැගිලි හා විවිධ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් රත්නපුර නගරයේ ප්‍රමාණවත් තරම් හරිත අවකාශයන් නොමැත. විශේෂයෙන්ම, රත්නපුර නගර මධ්‍යයේ පවතින බණ්ඩාරනායක මාවත දෙපස කිසිදු හරිත අවකාශයක් දක්නට නොලැබේ. එමෙන්ම, මෙම මාර්ගය කේන්ද්‍ර කරගනිමින් අතිරේක අධ්‍යාපන ආයතන ගොඩනැගී ඇති අතර ඒ ආශ්‍රිතව ගැවසෙන සිසුනට තම අමතර කාලය ආරක්ෂිතව ගත කිරීමට සුදුසු අවකාශයක් ද මෙම මාර්ගය අවට නොමැත. එබැවින්, මෙම ව්‍යාපෘතිය හරහා පාසල් සිසුන්ට මෙන්ම නගරයට පැමිණෙන්නන්ට ද රැඳී සිටිය හැකි හරිත අවකාශයක් නගර මධ්‍යයේ නිර්මාණය වනු ඇත. ඒ අනුව ගස් වැල්වලින් සමන්විත දැකුම්කලු නිදහස් අවකාශයක් නාගරික පරිසරය තුළ නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධානම අරමුණයි.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - නාගරික පරිසරය තුළ අලංකාර හරිත අවකාශය
  - එක් රැස් වී සිටීමට අවකාශය
  - ආසන පහසුකම්
  - සනීපාරක්ෂක පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන)* |
|---|---|
| *තරුණ බෞද්ධ සංගම් පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 50* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ද්විපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. ප්‍රතිසංස්කරණ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුදැනුම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුවනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් සිදුවනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ ඇඹැලේපොළ කෞතුකාගාර පරිශ්‍රය මධ්‍ය උද්‍යානයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

14

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - ඇඹැලේපොළ කෞතුකාගාර පරිශ්‍රය මධ්‍ය උද්‍යානයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 5
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරයේ පවත්නා අවිධිමත් ඉදිකිරීම් හේතුවෙන් වර්තමානයේ දී නාගරික ජනතාවට හා නගරයට පැමිණෙන්නන්ට කාලය ගත කිරීමට ඇති විවෘත අවකාශයන් ඉතාම සීමිතය. නමුත් යෝජිත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය හරහා රත්නපුර නගරය තුළ අලංකාර භූ දර්ශනයකින් හා නිස්කලංක පරිසරයකින් සමන්විත මධ්‍ය උද්‍යානයක් නිර්මාණය වනු ඇත. එසේම, මෙම ව්‍යාපෘතිය තුළින් මෙම නාගරික අවකාශය නොඉඳුල් හරිත අවකාශයක් ලෙස ආරක්ෂා කරගැනීම අපේක්ෂිත ය. මෙම යෝජිත මධ්‍ය උද්‍යානය මඟින් රත්නපුර නගරයේ පවතින නාගරික තදබදය අඩු වනු ඇති අතර ප්‍රදේශවාසීන්ට මෙන්ම සංචාරකයින්ට ද ඒ තුළින් පහසුකම් රැසක් සැලසෙනු ඇත. 2030 වසර ඉලක්ක කරගත් නගර සංවර්ධන සැලැස්මට අනුව රත්නපුර නගරය පවුලේ සැමට එක්ව විනෝද විය හැකි සති අන්ත නවාතැනක් ලෙස දේශීය සංචාරකයින් අතර ප්‍රචලිත වීම අපේක්ෂිත වන බැවින් නගරයේ ජීවත් වන්නන්ට හා නගරයට පැමිණෙන්නන්ට නිදහසේ කාලය ගත කිරීමට අවකාශය මෙම ව්‍යාපෘතිය තුළින් හිමිවනු ඇත.

මෙම පරිශ්‍රයට යාබදව පිහිටා ඇති නාගහමුන්නෙට්ටුව පරිශ්‍රය ද මෙම ව්‍යාපෘතියට සමගාමීව සංවර්ධනය කිරීමට යෝජිතව ඇති අතර අනාගතයේදී මෙම පරිශ්‍රයන් දෙකම ඒකාබද්ධව එක් පරිශ්‍රයක් ලෙස දිස්වනු ඇත. එමෙන්ම, මෙම කෞතුකාගාර පරිශ්‍රයේ ඉදිකිරීමට යෝජිතව ඇති, සම්මන්ත්‍රණ ශාලාවකින්, පුස්තකාලයකින් හා කලාගාරයකින් සමන්විත බහු කාර්ය ගොඩනැගිල්ල මඟින් ද මෙම මධ්‍ය උද්‍යානයට ආර්ථිකමය හා සෞන්දර්යාත්මක වටිනාකමක් එකතු වනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - නාගරික පරිසරය තුළ අලංකාර හරිත අවකාශයක් ලෙස
  - ආසන පහසුකම්
  - විනෝදාත්මක ක්‍රියාකාරකම්
  - සතුන්ගේ අභිජනන කටයුතු සඳහා නාගරික ප්‍රදේශය තුළ වාසස්ථානයක් ලෙස
  - ජල රැඳවුම් ප්‍රදේශය සංරක්ෂණය

- මූල්‍ය සැලැස්ම

| අංගය | රු. (මිලියන) |
|---|---|
| ඇහැලේපොළ කෞතුකාගාර පරිශ්‍රය මධ්‍ය උද්‍යානයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | මිලියන 70 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති ඉඩම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයිති බැවින් ඉඩම් අත්පත් කර ගැනීමක් අවශ්‍ය නොවේ. එසේම, මෙම ව්‍යාපෘතිය පුරාවිද්‍යා දෙපර්තමේන්තුව මඟින් අධීක්ෂණය කරනු ඇති අතර ද්විපාර්ශවික ගිවිසුමකට අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. නඩත්තු කිරීමේ කටයුතු ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ඇත.

## රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ
## නාගහමුත්තෙට්ටුව පරිශ්‍රය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

15

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - නාගහමුත්තෙට්ටුව පරිශ්‍රය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 3
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරය සතුව පවත්නා සංවර්ධනය කල හැකි ඉඩම් සීමිත බැවින් පොදු අවකාශ උදෙසා එම ඉඩම් භාවිත කිරීම අපහසු වේ. එමෙන්ම, රත්නපුර නගරයට වාර්ෂිකව මුහුණ දීමට සිදු වන ගංවතුර ආපදාව හේතුවෙන් නගරය තුළ පවත්නා ජල රැඳවුම් කලාප තවදුරටත් ඒ ආකාරයෙන්ම ආරක්ෂා කර ගත යුතු වේ. නාගහමුන්නෙට්ටුව පරිශ්‍රය ජල රැඳවුම් කලාපයක් වන අතර එය වාණිජ භාවිතයකට පරිවර්තනය කිරීම පරිසර හිතකාමී නොවේ. එබැවින්, එම කලාපය එයට සුදුසු පරිසර හිතකාමී වෙනත් භාවිතයකට පරිවර්තනය කිරීම මෙහිදී අපේක්ෂිත ය. යෝජිත ව්‍යාපෘතියට අනුව මෙම පරිශ්‍රය පොකුණක් සහිත උද්‍යානයක් ලෙස සංවර්ධනය වනු ඇති අතර රත්නපුර නගරයට ආවේණික ආහාර සංස්කෘතිය විදහාපාන හෙළ බොජුන්හළකින් ද සමන්විත වනු ඇත. එමෙන්ම, මෙම පරිශ්‍රය කෞතුකාගාර පරිශ්‍රයට යාබදව පිහිටා ඇති බැවින් ව්‍යාපෘතිය අවසානයේ දී මෙම කලාප ද්විත්වයම එක් කලාපයක් ලෙස දිස්වීම මෙහිදී අපේක්ෂිත අනෙකුත් අරමුණයි. නාගහමුන්නෙට්ටුව පරිශ්‍රය සංවර්ධනය කිරීම තුළින් මෙහි පැමිණෙන ජනතාවට ආහාරපාන ලබා ගැනීමේ පහසුකම්, ව්‍යායාම මංතීරු, ආසන පහසුකම් වැනි පහසුකම් රැසක් සැලසෙනු ඇති අතර නගරයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින් වෙත නිදහස් පරිසර හිතකාමී අවකාශයක් අත්දැකීමට හැකිවනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - ආසන පහසුකම්
    - ආහාර පාන ලබාගැනීමේ පහසුකම් (හෙළ බොජුන්හළ)
    - ව්‍යායාම මංතීරු
    - සනීපාරක්ෂක පහසුකම්
    - විනෝදාත්මක ක්‍රියාකාරකම්

- මූල්‍ය සැලැස්ම

| *අංශය* | *රු. (මිලියන)* |
|---|---|
| *නාගහමුන්නෙට්ටුව පරිශ්‍රය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 70* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

නාගහමුන්නෙට්ටුව පරිශ්‍රයේ ඉඩම් පුද්ගලික හිමිකරුවන් සතු වගා නොකරනු ලබන කුඹුරු ඉඩම් වන අතර එම ඉඩම් පවරා ගැනීම මූලික අදියරේදී සිදු කළ යුතු වේ. අනතුරුව උද්‍යානය ඉදිකිරීම සහ නඩත්තු කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුකෙරෙනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ දර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

16

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - දර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගරය හා නව නගරය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 1
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

2030 වසර ඉලක්ක කරගත් සංවර්ධන සැලැස්මට අනුව රත්නපුර නගරයට දේශීය හා විදේශීය සංචාරකයින් 100,000ක් පමණ පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහිදී, රත්නපුර නගරයේ මෙතෙක් කලක් සැඟව සහ විවෘතව තිබූ දර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීම තුළින් මෙම ඉලක්කයට ළඟා වීමට අපේක්ෂිත ය. මෙලෙස හඳුනාගත් දර්ශනීය ස්ථාන බොහෝමයක් පිහිටා ඇත්තේ නගර මධ්‍යයේ පවතින කුඩා කඳු මුදුන්වල වන අතර එම ස්ථානයන්ට ශ්‍රී පාදය, කළු ගඟ සහ රත්නපුර නගරය සෞන්දර්යාත්මක අයුරින් දිස් වේ. එහෙයින්, මෙම ව්‍යාපෘතිය තුළින් ඉලක්කගත සංචාරකයන් තවදුරටත් නගරය වෙත රඳවා තබා ගැනීමට අවශ්‍ය පසුබිම සැකසෙනු ඇත. එසේම, අදාළ ස්ථානවල පාරිසරික හා ආර්ථිකමය වටිනාකම ද මෙමඟින් ඉහළ යනු ඇති අතර අවට පිහිටි ඉඩම් හා නිවාසවල ද වටිනාකම ද ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි
    - විනෝදාත්මක ක්‍රියාකාරකම්
    - ආගමික කටයුතු
    - ඡායාරූපකරණයට සුදුසු වටපිටාව
    - නාගරික පරිසරය තුළ පිහිටි දැකුම්කලු දර්ශනයන්

- අපේක්ෂිත ස්ථානීය වෙනස්කම්

| දර්ශනීය ස්ථානයේ නම | ප්‍රධාන ආකර්ෂණ හෝ ක්‍රියාකාරකම | ප්‍රවර්ධනය කිරීම | අදාළ ආයතනය |
|---|---|---|---|
| ආනන්ද මෛත්‍රී විහාර පරිශ්‍රය | කඳු මුදුන | දර්ශනීය පෙදෙස් සංරක්ෂණය කිරීම සහ නගරය නැරඹීම | ආනන්ද මෛත්‍රී පන්සල, නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව |
| කළුගස්වත්ත විහාර පරිශ්‍රය | යෝධ බුදු පිළිමය, කඳු මුදුන | දර්ශනීය පෙදෙස් සංරක්ෂණය කිරීම සහ නගරය නැරඹීම | කළුගස්වත්ත පන්සල, නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව |
| වීරගොඩ විහාර පරිශ්‍රය | යෝධ බුදු පිළිමය | දර්ශනීය පෙදෙස් සංරක්ෂණය කිරීම | වීරගොඩ පන්සල, නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව |
| නාලන්ද එල්ලාවල නාගරික උද්‍යාන පරිශ්‍රය | නාගරික දර්ශනය | අතිරේක කලාත්මක නිර්මාණ සහ භූ දර්ශන අලංකරණය මගින් මෙම ස්ථානයේ දර්ශනීය බව ඉහළ නැංවිය හැකිය. | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව |
| මහවලවත්ත ඉහළ කොට්ඨාශ (Upper Division) පරිශ්‍රය | කඳු මුදුන | අතිරේක කලාත්මක නිර්මාණ සහ භූ දර්ශන අලංකරණය මගින් මෙම ස්ථානයේ දර්ශනීය බව ඉහළ නැංවිය හැකිය. | වතු සමාගම, නාගරික සංවර්ධන අධිකාරිය |

- මූල්‍ය සැලැස්ම

| අංශය | රු. (මිලියන) |
|---|---|
| *දර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 70* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ත්‍රෛපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර මහ නගර සභාව හා අදාළ වෙනත් ආයතනයන් විසින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. සංවර්ධන කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය හා රත්නපුර මහ නගර සභාව මඟින් සිදු කරනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් හෝ අදාළ වෙනත් ආයතනයන් මඟින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ බහු කාර්ය සේවා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය

17

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - බහු කාර්ය සේවා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | කෞතුකාගාර පරිශ්‍රය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 1
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 200

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරය සබරගමුව පළාතේ ප්‍රධාන නගරය ලෙස පැවතිය ද ප්‍රමාණවත් ආසන පහසුකම් සහිත ශ්‍රවණාගාරයක් නගරයට නොමැත. එමෙන්ම, රත්නපුර නගර සීමාව තුළ පිහිටි පාසල්වල සිසුන් 12,000කට අධික සංඛ්‍යාවක් ඉගෙනුම ලබන අතර මේ වනවිට රත්නපුර නගර ශාලාව තුළ පවතින ශ්‍රවණාගාරයෙහි විශාල සිසුන් සංඛ්‍යාවකට එක වර අසුන් ගත හැකි පහසුකම් නොමැත. මේ හේතුවෙන් ප්‍රමාණවත් ආසන පහසුකම් සහ නවීන අංගෝපාංග සහිත විශාල පරිමාණයේ ශ්‍රවණාගාරයක අවශ්‍යතාව රත්නපුර නගරයට ඇත. එසේම 2030 සංවර්ධන සැලැස්මට අනුව රත්නපුර නගරය ජීවත් වීමට සුදුසු නගරයක් බවට පත් කිරීමේ දී ප්‍රදර්ශන වැනි දෑ පැවැත්වීම සඳහා කලාගාරයක අවශ්‍යතාව නගරයට පවතී. එමෙන්ම, යෝජිත සංවර්ධන සැලැස්මට අනුව දැනට පවතින පුස්තකාල ගොඩනැගිල්ල අවන්හලක් බවට පත් කිරීමට යෝජිත බැවින් එම පුස්තකාලය වෙනත් සුදුසු ස්ථානයකට විතැන් කළ යුතුය. මෙම අවශ්‍යතා තුන ස්ථාන තුනක ඉදිකිරීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නගරය තුළ නොමැති වීමත් මේ සියල්ලටම අවශ්‍ය වන්නේ නිස්කලංක වටපිටාවන් වීමත් හේතුවෙන් ශ්‍රවණාගාරය, කලාගාරය සහ පුස්තකාලය සඳහා එක් පරිශ්‍රයක් වෙන්කිරීම යෝග්‍ය වන අතර ඒ සඳහා බහු කාර්ය සේවා ගොඩනැගිල්ලක් ඉදි කිරීම මෙහිදී අපේක්ෂිත වේ.

එසේම නගරයට පැමිණෙන්නන්ගේ රථ වාහන නවතා තැබීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් මේ වන විට නගරය තුළ නොමැති අතර මෙම ව්‍යාපෘතිය හරහා වාහන නවතා තැබීමේ පහසුකම් ද ආහාරපාන ලබා ගැනීමේ පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් ද සැලසෙනු ඇත. ඇහැලේපොළ කෞතුකාගාර පරිශ්‍රයේ ඉදි කිරීමට යෝජිත මධ්‍ය උද්‍යානයට හා නාගහමුත්තෙට්ටුව පරිශ්‍රයට ආසන්නව මෙම බහු කාර්ය සේවා ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත බැවින් මෙහි පැමිණෙන නාගරිකයන්ට සහ සංචාරකයන්ට මෙම පරිශ්‍රයන් සියල්ල එක් පරිශ්‍රයක් ලෙස සළකා විනෝද විය හැකි වීම මෙහිදී අපේක්ෂිත අමතර වාසිදායක තත්ත්වයකි.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - පුස්තකාල පහසුකම්
    - සුවපහසු ආසන පහසුකම්
    - විනෝදාස්වාද පහසුකම්
    - සනීපාරක්ෂක පහසුකම්
    - ආහාරපාන ලබා ගැනීමේ පහසුකම්
    - වාහන නවතා තැබීමේ පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| අංශය | රු. (මිලියන) |
|---|---|
| බහු කාර්ය සේවා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය | මිලියන 200 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම ව්‍යාපෘතියට අදාළ භූමිය කෞතුකාගාර පරිශ්‍රයට අයිති බැවින් එය පවරා ගැනීම සිදු කළ යුතුය. එසේම මෙම ව්‍යාපෘතිය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ඇත. මීට යාබදව පවතින මිහිඳු විද්‍යාලය විතැන් කිරීමට අවශ්‍ය වුවහොත්, නිර්වානකැටිය හා මහවලවත්ත ප්‍රදේශවල හඳුනාගත් පාසල් ඉදිකිරීමට යෝග්‍ය වූ යෝජිත භූමියකට විතැන් කළ හැකිය. මෙහි ඉදිකිරීම් හා නඩත්තු කිරීම් කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ඇත.

## රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ
## වෙළඳ වීදිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (පල්ලිය පාර)

18

- අංශය - නාගරික සංවර්ධනය
- ව්‍යාපෘතියේ නම - වෙළඳ වීදිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (පල්ලිය පාර)

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – 500m (මාර්ගයේ දිග)
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 50

- ව්‍යාපෘතියේ අදාළත්වය

බටහිර රටවල දී රථ වාහන ගමන් කිරීම උදෙසා පවතින අවකාශය මාර්ග ලෙසින් හැඳින්වෙන අතර මිනිස් ක්‍රියාකාරකම් ඒ සමග මිශ්‍ර වන ස්ථාන වීදි ලෙස හඳුන්වයි. නමුත් ආසියාතික රටක් වන ශ්‍රී ලංකාවේ පවතින මාර්ගයන් රථ වාහන ගමන් කිරීමට මෙන්ම අනෙකුත් මිනිස් ක්‍රියාකාරකම් උදෙසා ද ඉතිහාසයේ සිටම යොදා ගෙන ඇත. මෙම ක්‍රියාකාරකම් අතුරින් මාර්ග පදනම් කරගත් වෙළඳාම ප්‍රධාන වන අතර එය නගරයට සජීවී බවක් ද ලබාදෙයි. රත්නපුර නගරය තුළ මෙම පසුබිම දැකගත හැකි වන්නේ පල්ලිය පාර පදනම් කරගෙන ය. එමෙන්ම, මාර්ගයක් ලෙස හැඳින්වුවද මෙම අවකාශය පෙන්වනු ලබන්නේ වීදියක ලක්ෂණ වේ. මෙවන් මාර්ගයන් වර්තමානය වනවිට දුලබ වන බැවින් සහ එම ක්‍රියාකාරීත්වය හිතාමතා නගරයක් තුළ නිර්මාණය කළ නොහැකි බැවින් මෙම ක්‍රියාවලිය සිදුවන මාර්ග ආරක්ෂා කරගැනීමත්, එම ක්‍රියාකාරීත්වය නගරයට අගතියක් නොවන පරිදි කළමණාකරණය කර ගැනීමත් එමගින් නගරයේ ආර්ථික සහ සමාජයීය සංස්ථාවට පහසුකම් සැලසීමත් මෙහිදී අපේක්ෂිත ය.

පල්ලිය පාර රත්නපුර නගර මධ්‍යයේ පිහිටා ඇති අතර මේ හරහා ඉතා පහසුවෙන් හා ඉක්මනින් රත්නපුර ප්‍රධාන බස් නැවැතුම්පොළේ සිට නගර මධ්‍යයට ළඟා විය හැකි වේ. මෙම මාර්ගය වීදි වෙළඳාම සඳහා මිනිසුන් අතර ඉතා ජනප්‍රිය අතරම එය නගරයේ වාසය කරන විවිධ ස්ථරයන්ට අයත් බොහෝ මිනිසුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ද උපකාරී වේ. කෙසේ නමුත්, රථවාහන ගමන් කිරීම සහ නවතා තැබීම හේතුවෙන් එම මාර්ගය භාවිත කරන පදිකයන් අපහසුවට පත්වන අතර එහි පවතින වීදි වෙළඳාමට ද එමගින් බාධා සිදු වෙමින් පවතී. ඒ අනුව යෝජිත වෙළඳ වීදි සංවර්ධන ව්‍යාපෘතිය තුළින් රත්නපුර නගරයේ පල්ලිය පාරට ආවේණිකව පැවති පදික හිතකාමී වෙළඳපොළ ආරක්ෂා කරගැනීම අරමුණු කරගෙන ඇත. එසේම, මෙම ව්‍යාපෘතිය තුළින් පල්ලිය පාර රථවාහන වලින් තොර වූ එයටම අනන්‍ය වීදි ලක්ෂණ සහිත වෙළඳ වීදියක් බවට පත් වනු ඇත.

මීට අමතරව, රත්නපුර නගර සැලැස්ම මගින් සංචාරක කටයුතු ප්‍රවර්ධනය කෙරෙන බැවින් මෙම වෙළඳ වීදිය රාත්‍රී කාලයේදී ක්‍රියාකාරී වනු ඇතැයි ද එම කාල සීමාව තුළ දී වීදි ආහාරපාන අලෙවිකරණ අවකාශයක් ලෙස නගරයට නැවුම් අත්දැකීමක් එක් කරනු ඇතැයි ද අපේක්ෂිත ය.

- 5. මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - බාධාකාරී බවින් තොර නිදහස් වෙළඳ වීදි අත්දැකීම
  - ආවේණික වීදි දර්ශනය
  - වීදි ආලෝකකරණ පද්ධතිය
  - සුදුසු බිම් ඇතිරිලි

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *( රු.මිලියන )* |
| --- | --- |
| ***වෙළඳ වීදිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (පල්ලිය පාර)*** | ***මිලියන 50*** |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ප්‍රතිසංස්කරණ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් හා නඩත්තු කිරීම් කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ පටු මංමාවත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

19

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - පටු මංමාවත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




1. මොරගහයට ලී මඩුව අසළින් ඇතුලු වී "කැලේ කඩේ" අවන්හල අසළින් පිටවීම
2. ලෝක වෙළඳපොල අසළින් ඇතුලු වී "නවාතැන" අවන්හල අසළින් පිටවීම
3. ධර්මපාල විදුහල අසළින් ඇතුලු වී IOC එක (බණ්ඩාරනායක මාවත) අසළින් පිටවීම.
4. ගුඩ් ෂෙඩ් මාර්ගයෙ පාලිත ස්ටෝර්ස් අසළින් ඇතුලු වී ආලෝක රෝහල ඉදිරිපිටින් සහ පල්ලිය පාරෙන් පිටවීම
5. ඉන්දික හෝටලය අසළින් ඇතුළුවී පල්ලිය පාරෙන් පිටවීම
6. මහජන පොළ අසළින් ඇතුලු වී DFCC බැංකුව එක අසළින් පිටවීම
7. ශාන් වෙලඳසල (බණ්ඩාරනායක මාවත) අසළින් ඇතුලු වී මහජන පොළ ඉදිරිපසින් පිටවීම

- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අදාළ නොවේ
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 20

- ව්‍යාපෘතියේ අදාළත්වය

ගොඩනැගිලි අතරින් එහා මෙහා ගමන් කිරීමට මිනිසුන් විසින් හඳුනාගත් කුඩා අවකාශයන් පටු මංමාවත් ලෙසින් හැඳින්වේ. මෙම අවකාශයන් ආරක්ෂිතව සහ පදික හිතකාමී ලෙස පැවතීම මගින් නගරය තුළ සැරිසරන මිනිසුන් හට ඇවිදීමට පවතින උනන්දුව ඉහළ යන අතර වක්‍රාකාරයෙන් එමගින් නගරය තුළ ජනනය වන රථවාහන හැසිරවීම් ප්‍රමාණය අවම වේ. රත්නපුර නගරයේ අවකාශීය සැකැස්මට අනුව නගරය පුරා මෙවන් පටු මංමාවත් ගණනාවක් මාර්ග පද්ධතියට සමගාමීව පවතින නමුත් මේ වනවිට එම පටු අවකාශයන්ගෙන් බොහොමයක් අප්‍රකටව සහ අවම භාවිතයකට යටත්ව පවතී. අනාරක්ෂිත බව, අපිරිසිදු බව, ප්‍රමාණවත් අලෝකකරණයක් නොමැති වීම, නෙතට ප්‍රිය නොවීම ආදී කරුණු මේ සඳහා හේතු වී ඇත. එබැවින්, මෙම ව්‍යාපෘතියට අනුව වීදි ආලෝකකරණය හා බිම් ඇතිරිලි ද බිත්ති මත අඳිනු ලබන සිතුවම් ද සහිතව මෙම නාගරික පටු මංමාවත් සංවර්ධනය කිරීමට යෝජිතය. එසේම, මේ හරහා පටු මංමාවත්වල ආරක්ෂාව ද ඉහළ යනු ඇති අතර පදිකයින්ට ඉතා පහසුවෙන් හා ඉක්මනින් නගරය තුළ ගමන්කිරීමට හැකි වීමෙන් ඔවුන්ගේ ආර්ථික හා සමාජ අවශ්‍යතා පහසුවෙන් සපුරා ගැනීමට ද හැකි වනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මගින් හිමිවන වාසි

    - ඉහළ ආරක්ෂාව
    - වීදි ආලෝකකරණය
    - ආකර්ෂණීය වීදි චිත්‍ර
    - සුදුසු බිම් ඇතිරිලි
    - ඇවිදීමේ හැකියාව ඉහළ නැංවීම

- මූල්‍ය සැලැස්ම

| *අංශය* | *රු. (මිලියන )* |
| --- | --- |
| ***පටු මංමාවත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*** | ***මිලියන 20*** |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

හඳුනාගත් පටු මංමාවත් ප්‍රතිසංස්කරණ කිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් හා නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ ආපදා සහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

20

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - ආපදා සහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – පර්චස් 40
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 150

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරය තෙත් කලාපයේ පිහිටා ඇති බැවින් ද කලු ගං මිටියාවතේ පිහිටා ඇති බැවින් ද එය වාර්ෂිකව ජල ගැලීම්වලට ලක් වන නගරයකි. කෙසේ නමුත්, නිරන්තරයෙන් ස්වභාවික ආපදාවලට මුහුණ දෙන නගරයක් වුවද කිසිදු ආපදා සහන මධ්‍යස්ථානයක් රත්නපුර නගරය තුළ පිහිටා නොමැත. එබැවින් යෝජිත ව්‍යාපෘතියට අනුව ජල ගැලීම්වලට ලක් නොවන නගර මධ්‍යයේ පිහිටා ඇති කුඩා කඳු මුදුනක පිහිටි අපර් ක්ලබ් (Upper Club) පරිශ්‍රයේ සැහැල්ලු ගුවන්යානා අංගනයක් සහිතව ආපදා සහන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අපේක්ෂිත ය.

ආපදාවන්ගෙන් වැඩි වශයෙන් බලපෑම්වලට ලක් වනුයේ රත්නපුර නගරය වන අතර පරිපාලන නගරය වන නව නගරය පාදක කරගනිමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. නමුත් ආපදා අවස්ථාවක දී නව නගරය සහ රත්නපුර නගරය අතර මාර්ග සබඳතාව බිඳවැටෙන බැවින් ආපදා සහන යැවීම පහසු නොවේ. එබැවින්, ඉක්මනින් හා පහසුවෙන් ආපදා සහන බෙදාහැරීම උදෙසා රත්නපුර නගරය තුළ ආපදාවට පත් නොවන ස්ථානයක ආපදා සහන මධ්‍යස්ථානයක් පිහිටුවා තිබීම වැදගත් වේ.

එමෙන්ම, ආපදා අවස්ථාවන්හිදී නගරයේ සැපයුම් දාමය ඉක්මනින් බිඳී යන බැවින්, මෙම යෝජිත ආපදා සහන මධ්‍යස්ථානය, මිනිසුන්ට අත්‍යාවශ්‍යය භාණ්ඩ ගබඩා කර තබා ගැනීමේ සහ බෙදා හැරීමේ අවකාශයක් ලෙස භාවිත කළ හැකි වේ. මීට අමතරව, යෝජිත මධ්‍යස්ථානයේ වහලය මතට සැහැල්ලු ගුවන් යානා ගොඩබැස්වීමේ අංගනයක් ඉදිකිරීමට සැලසුම් කර ඇති බැවින් හදිසි අවස්ථාවකදී ඉක්මනින් ප්‍රතිචාර දැක්වීමට ඒ තුළින් හැකිවනු ඇතැයි අපේක්ෂිතය.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - ගබඩා පහසුකම්
    - සැහැල්ලු ගුවන් යානා ගොඩබැස්සවීමේ පහසුකම්
    - ආපදා සහනාධාර ක්‍රියාවලිය වේගවත් කිරීමේ පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන)* |
|---|---|
| *ආපදා සහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 150* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ඉදිකිරීම් කටයුතු ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය හා රත්නපුර මහ නගර සභාව මඟින් සිදු කරනු ඇති අතර නඩත්තු කිරීම් කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ සැහැල්ලු ගුවන් යානා අංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය

21

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - සැහැල්ලු ගුවන් යානා අංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – පර්චස් 20
- 3.3 ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරයේ යෝජිත සංවර්ධන සැලැස්මට අනුව සැහැල්ලු ගුවන් යානා අංගන 5 ක් ඉදිකිරීමට නියමිතය. පැරණි දිසා විනිසුරු නිළ නිවස පරිශ්‍රයේ ඉදිකිරීමට නියමිත අංගනය ඉන් එකක් වන අතර එම පරිශ්‍රය රත්නපුර ෆර්ගසන් උසස් විද්‍යාලයට යාබදව කුඩා කඳු ගැටයක් මුදුනෙහි පිහිටා ඇත. මෙම යෝජිත ගුවන් යානා අංගනය වාර්ෂිකව රත්නපුර නගරයට බලපාන ආපදා අවස්ථාවන්හි දී මිනිසුන්ට සහන සැලසීමට බෙහෙවින් උපකාරී වනු ඇති අතර ඒ තුළින් ආපදා සහනාධාර ලබාදීමේ ක්‍රියාවලිය කඩිනම් කල හැකි වේ. එමෙන්ම, ජලගැලීම් සිදුවන කාලවලදී මෙම පරිශ්‍රයට යාබදව පිහිටි ෆර්ගසන් උසස් විදුහල ආරක්ෂිත ස්ථානයක් ලෙස ක්‍රියා කරන බැවින් ද යෝජිත මගී ගුවන් පාලම් ද්විත්වයක් මෙම කඳු ගැටයේ සිට දෙපසට සැලසුම් කර ඇති බැවින් ද (රත්නපුර ධර්මපාල විද්‍යාලයේ සිට එක් පසෙකින් ප්‍රධාන බස් නැවැතුම්පොළ දක්වාත් අනෙක් පසින් පොදු වෙළඳපොළ දක්වාත්) මෙම යෝජිත ගුවන්යානා අංගනය උපකාරී කරගනිමින් ආපදා කළමනාකරණ කටයුතු සිදු කිරීම අනාගතයේ දී පහසු වනු ඇත.

රත්නපුර නගරය ආපදාවන්ට ලක් වන කාලය වසරකට කිහිප වරක් වන අතර ඉතිරි කාලයේදී මෙම අංගනය එළිමහන් අවන්හලක් (Heli-Lounge) ලෙස භාවිත කිරීමට හැකි වනු ඇත. එමෙන්ම, මෙම පරිශ්‍රය ඇහැලේපොළ අන්තඃපුර ගොඩනැගිලි පරිශ්‍රයට යාබදව පිහිටා ඇති බැවින් එම ස්ථානයට යෝජිත ව්‍යාපෘතියෙහි විස්තාරිත අවකාශයක් (extended space) ලෙස ක්‍රියාත්මක වෙනු ඇතැයි අපේක්ෂිත ය. ඒ අනුව, අනාගතයේ දී මෙම පරිශ්‍රයන් දෙකම එකිනෙකට සම්බන්ධව පෙනෙනු ඇති අතර එම ස්ථානයට පැමිණෙන සංචාරකයන්ට ද සුඛෝපභෝගී අත්දැකීම් රැසක් මෙම ව්‍යාපෘතිය හරහා හිමි වනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - සැහැල්ලු ගුවන් යානා ගොඩබැස්වීමේ පහසුකම්
    - ආපදා සහනාධාර ක්‍රියාවලිය වේගවත් කිරීමේ පහසුකම්
    - සුඛෝපභෝගී එළිමහන් අවන්හල් අත්දැකීම

- මූල්‍ය සැලැස්ම

| අංගය | (රු.මිලියන) |
|---|---|
| සැහැල්ලු ගුවන් යානා අංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය | මිලියන 70 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ද්විපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා රත්නපුර මහ නගර සභාව විසින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මෙහෙයවනු ඇති අතර නඩත්තු කිරීම් කටයුතු රත්නපුර මහ නගර සභාව විසින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ පැරණි බස් නැවැතුම්පොළ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

22

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - පැරණි බස් නැවැතුම්පොළ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 2
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 250

- ව්‍යාපෘතියේ අදාළත්වය

ශ්‍රී ලංකාවේ දකුණු කොටසට අයත් මාර්ග ජාලය තුළ වැදගත් සංධිස්ථානයක රත්නපුර නගරය පිහිටා ඇත. කොළඹ – මඩකලපුව දක්වා දිවෙන A 004 මාර්ගය එම මාර්ග ජාලය තුළ සුවිශේෂී වේ. එමෙන්ම, මෙම දිස්ත්‍රික්කයට මායිම්ව දිස්ත්‍රික්ක 9ක් පිහිටා ඇත. එබැවින්, එම නගර වෙනට රත්නපුර නගරයෙන් ගමන්වාර ඇරඹෙන බස් රථ සහ නගරය පසු කර යන බස් රථ ප්‍රමාණය සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගනී. එමෙන්ම, රත්නපුර නගරය සබරගමුව පළාතේ අග නගරය වන බැවින් ද රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වෙළඳ නගරය වන බැවින් ද මෙම කලාපය තුළ ප්‍රධානතම සේවා සැපයුම් මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියා කරන බැවින් ද දෛනිකව විශාල සංසරණ ජනගහනයක් නගරය වෙනට ආකර්ෂණය කරගනියි.

කෙසේ නමුත්, වර්තමානය වනවිට ද නගරය තුළ ප්‍රධාන බස් නැවැතුම්පොළ ලෙස භාවිත වනුයේ පසුකාලීනව නවීකරණයට ලක් වූ පැරණි දුම්රිය නැවැතුම්පොළයි. මේ හේතුවෙන් දෛනිකව නගරයට පැමිණෙන සංසරණ ජනතාවට සහ රත්නපුර නගර සීමාවේ වාසය කරන ජනතාවට අවශ්‍ය ගමනාගමන පහසුකම් සපුරාලීමට මෙම බස් නැවැතුම්පොළ සතු අවකාශය මෙන්ම පහසුකම් ද කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ.

2030 සංවර්ධන සැලැස්මට අනුව දෛනිකව 150,000 ක පමණ සංසරණ ජනගහනයක් ද වසරකට 100,000ක පමණ සංචාරකයන් ද නගරයට පැමිණෙනැයි අපේක්ෂා කෙරේ. එබැවින්, මෙම අපේක්ෂිත ජනගහනයට පහසුකම් සැපයීමට හැකි පරිදි ප්‍රමාණවත් අවකාශීය පහසුකම්, ආසන පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් ද සහිතව දැනට පවතින බස් නැවැතුම්පොළ පුළුල් හා නවීකරණය කළ යුතු වේ.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - මනා ලෙස කළමනාකරණය කරන ලද පොදු ප්‍රවාහන පහසුකම්
  - සනීපාරක්ෂක පහසුකම්
  - ආසන පහසුකම්
  - ආහාර පාන ලබාගැනීමේ පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| අංගය | රු. (මිලියන) |
| --- | --- |
| පැරණි බස් නැවැතුම්පොළ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය | මිලියන 250 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම ව්‍යාපෘතිය භාණ්ඩාගාර අරමුදල්වලින් ක්‍රියාත්මක වීමට නියමිතය. ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය නාගරික සංවර්ධන අධිකාරිය හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ඇත. ඉඩම් හිමිකාරීත්වය රත්නපුර මහ නගර සභාව යටතේ පවතින බැවින් නඩත්තු කටයුතු එම ආයතනය මඟින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ ගොඩවෙල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

23

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - ගොඩවෙල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගරය |

- 3.2 ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – කි.මී. 4 (මාර්ගයේ දිග)
- 3.3 ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරය යනු රථවාහන තදබදය අධික නගරයකි. මේ සඳහා හේතූන් ගණනාවක් බලපෑව ද මාර්ගයේ ධාරිතාව අවම වීම ද එම හේතූන් අතරින් හඳුනාගත් එක් හේතුවකි. මේ වනවිට මංතීරු ද්විත්වයකින් පමණක් සමන්විත A 004 මාර්ගය ද භූ විද්‍යාත්මක පිහිටීම නිසා පළල් කිරීමේ හැකියාවක් නොපවතින බැවින් නගරයට ප්‍රවේශ විය හැකි විකල්ප මාර්ග සංවර්ධනය කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු වේ. මේ සඳහා හඳුනාගත් එක් ප්‍රධානතම මාර්ගයක් වන්නේ ගොඩවෙල මාර්ගයයි. මෙම මාර්ගය තැනිතලා භූමියක පිහිටා ඇති බැවින් එය නව දුරටත් පුළුල් කළ හැකි අතර වෙරළුප කලාපයට යෝජිත විවේක හා විනෝද කටයුතු පරිශ්‍රයට ප්‍රවේශ මාර්ගය වන්නේ ද මෙම ගොඩවෙල මාර්ගයයි. එමෙන්ම, යෝජිත වෙරළුප වැව හේතුවෙන් මෙම ගොඩවෙල මාර්ගය අනාගතයේ දී ගංවතුර ආපදාවට ලක් නොවනු ඇතැයි අපේක්ෂිත ය.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - පහසුවෙන් හා ඉක්මනින් නගරයට ප්‍රවේශ වීමට ඇති හැකියාව
    - නගර මධ්‍යය සහ නව නගරය අතර ඇතිවන රථවාහන තදබදය අඩු වීම
    - කාලය ඉතිරි වීම
    - යෝජිත වෙරළුප විවේක හා විනෝද කටයුතු පරිශ්‍රයට ප්‍රවේශය

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන)* |
|---|---|
| *ගොඩවෙල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* | *මිලියන 70* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ගොඩවෙල මාර්ගයේ අයිතිය වර්තමානයේ දී රත්නපුර මහ නගර සභාව සතු වේ. මෙය අත්‍යවශ්‍ය විකල්ප මාර්ගයක් බැවින් වැඩිදුර සංවර්ධන කටයුතු උදෙසා ගොඩවෙල මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියට භාර දිය යුතු යැයි මෙහිදී යෝජනා කෙරේ. අනතුරුව, මෙම මාර්ගයේ ඉදිකිරීම කටයුතු හා නඩත්තු කිරීම කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ රත්නපුර රෝහලේ සිට නව නගරය දක්වා විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම

24

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - රත්නපුර රෝහලේ සිට නව නගරය දක්වා වූ විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | සමන් පෙදෙස |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – කි.මී. 3 ක් පමණ (මාර්ගයේ දිග)
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 50

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරය තෙත් කලාපයේ පිහිටා ඇති නිසාත් කලු ගං මිටියාවතේ පිහිටා ඇති නිසාත් එය වාර්ෂිකව ජල ගැලීම්වලට ලක් වන නගරයකි. එයින් වැඩි වශයෙන් බලපෑම්වලට ලක් වනුයේ රත්නපුර නගරයයි. මෙසේ සිදුවන ජලගැලීම් හේතුවෙන් එම කාලවලදී රත්නපුර මූලික රෝහලට ළඟා වීමේ ප්‍රවේශ මාර්ග අවහිර වේ. එහෙයින්, ආපදා අවස්ථාවන්හි දී මූලික රෝහලට ළඟා වීම උදෙසා විකල්ප මාර්ගයක් සංවර්ධනය කර තැබීම වැදගත් වේ. මීට අමතරව, සබරගමුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය රත්නපුර මහ රෝහලට අනුබද්ධව 2019 වසරේ දී පිහිටුවා ඇති අතර මෙම වෛද්‍ය පීඨයේ ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද පරිශ්‍රය රෝහල හා නව නගරය අතර ඉඩමක පිහිටා ඇති බැවින් ඒ සඳහා ප්‍රවේශ මාර්ගයක් සංවර්ධනය කර තැබීම ද අත්‍යාවශ්‍ය වේ.

ඉහත කරුණු ද්විත්වයම සඳහා යොදාගත හැකි විකල්ප මාර්ගයක් ලෙස සමන් පෙදෙස හරහා දිවෙන පටු මාර්ගය හඳුනාගෙන ඇති අතර එම මාර්ගය සංවර්ධනය කිරීම මගින් විශාල පිරිසකට ගමනාගමන පහසුකම් සැලසෙනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - පහසුවෙන් හා ඉක්මනින් රෝහලට ප්‍රවේශ වීමට ඇති හැකියාව
    - ශික්ෂණ රෝහල, වෛද්‍ය පීඨය හා නව නගරය අතර අතර මාර්ග පද්ධතිය සංවර්ධනය වීම

- මූල්‍ය සැලැස්ම

| *අංගය* | *රු. (මිලියන)* |
|---|---|
| *රත්නපුර රෝහලේ සිට නව නගරය දක්වා විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම* | *මිලියන 50* |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු හා නඩත්තු කිරීම් කටයුතු රත්නපුර මහ නගර සභාව මඟින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ රථවාහන නැවතුම් පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

25

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - රථවාහන නැවතුම් පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

1. පොල්හුනුව පරිශ්‍රය, ගුඩ් ශෙඩ් පාර
2. මහ නගර සභා රථගාල, සීවලී ක්‍රීඩාංගණයට යාබද පරිශ්‍රය
3. ආයුර්වේද කාර්යාලයට යාබද පරිශ්‍රය
4. නාගහමුත්තෙට්ටුව පරිශ්‍රය
5. මහජන පොළ පරිශ්‍රය
6. යෝජිත වාණිජ සංකීර්ණ පරිශ්‍රය (නගර මධ්‍යය)
7. තැපැල් කාර්යාල පරිශ්‍රය
8. යෝජිත වාණිජ සංකීර්ණ පරිශ්‍රය (ලක්ෂ්මී සිනමා ශාලාව)

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අදාළ නොවේ
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරය යනු සබරගමුව පළාතේ ප්‍රධාන නගරය වන අතර, 2030 වසර ඉලක්ක කරගත් නගර සංවර්ධන සැලැස්මට අනුව රත්නපුර නගරයට දෛනිකව සංසරණය වෙතැයි අපේක්ෂිත ජනගහනය 150,000කි. නමුත් දැනට පවතින නගර ව්‍යුහයට අනුව එම අපේක්ෂිත සංසරණ ජනගහනයට සාපේක්ෂව රථවාහන නැවතුම් පහසුකම් ප්‍රමාණවත් නොවේ. එමෙන්ම, නගරයේ භූගෝලීය පිහිටීම සහ අවකාශීය සැකැස්ම පිළිබඳව සළකා බලන විට රථවාහන පහසුකම් වෙනුවෙන් විශාල පරිශ්‍රයන් වෙන් කිරීම ද ප්‍රායෝගික නොවේ. එබැවින්, මෙම නගර සංවර්ධන සැලැස්මට අනුව නගර මධ්‍යයෙහි පවත්නා විවිධ කලාප වෙන වෙනම හඳුනාගෙන ඇති අතර එකී කලාපයන්ගේ ක්‍රියාකාරීත්වයට අනුකූලව එම කලාප සඳහා අවශ්‍ය වන රථගාල් අවකාශය එම කලාපය තුළම ලබා දීමට යෝජිත ය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය හරහා නගරයේ සෑම කුඩා කලාපයකටම සනීපාරක්ෂක පහසුකම් සහිතව වෙන වෙනම රථවාහන නැවතුම් පහසුකම් ලබා දෙනු ඇත. මෙම ව්‍යාපෘතිය හරහා නගරයට පැමිණෙන සංචාරකයන්ට, ව්‍යාපාරිකයන්ට සහ නගර වැසියන්ට පහසුකම් රැසක් සැලසෙනු ඇතැයි අපේක්ෂිත ය.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි
    - මනාව කළමනාකරණය වුණු රථවාහන නැවතුම් පහසුකම්
    - සනීපාරක්ෂක පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| අංගය | රු. (මිලියන) |
|---|---|
| රථවාහන නැවතුම් පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | මිලියන 70 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ද්විපාර්ශවික ගිවිසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා රත්නපුර මහ නගර සභාව විසින් මෙම ව්‍යාපෘතිය සිදු කරනු ඇති අතර නඩත්තු කිරීමේ කටයුතු රත්නපුර මහ නගර සභාව විසින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

26

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | රත්නපුර නගරය | රත්නපුර නගර මධ්‍යය |

1. පොල්හුනුව පරිශ්‍රය, ගුඩ් ශෙඩ් පාර
2. මහ නගර සභා රථගාල, සීවලී ක්‍රීඩාංගණයට යාබද පරිශ්‍රය
3. ආයුර්වේද කාර්යාලයට යාබද පරිශ්‍රය
4. නාගහමුත්තෙට්ටුව පරිශ්‍රය
5. මහජන පොළ පරිශ්‍රය
6. ප්‍රධාන බස් නැවතුම්පොළ පරිශ්‍රය
7. තැපැල් කාර්යාල පරිශ්‍රය
8. යෝජිත වාණිජ සංකීර්ණ පරිශ්‍රය (ලක්ෂ්මී සිනමා ශාලාව)

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මූලු ඉඩම් ප්‍රමාණය – අදාළ නොවේ
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 70

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරය යනු සබරගමුව පළාතේ ප්‍රධාන නගරය වන අතර වසර 2030 ඉලක්ක කරගත් සංවර්ධන සැලැස්මට අනුව නගරයට සංසරණය වෙතැයි අපේක්ෂිත ජනගහනය 150,000 කි. නමුත් දැනට පවතින නගර ව්‍යුහයට අනුව එම අපේක්ෂිත සංසරණ ජනගහනයට සාපේක්ෂව පවත්නා සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවේ. එබැවින්, මෙම නගර සංවර්ධන සැලැස්මට අනුව නගර මධ්‍යයෙහි පවත්නා විවිධ කලාප වෙන වෙනම හඳුනාගෙන ඇති අතර එම කලාප සඳහා අවශ්‍ය වන සනීපාරක්ෂක පහසුකම් එම කලාපය තුළම ලබා දීමට යෝජිත ය. රථවාහන නැවැත්වීමේ පහසුකම් ද මෙම පරිශ්‍රයන්හි ලබාදෙන බැවින් එය වඩාත් සුවපහසු සේවාවක් වනු ඇත. මෙම ව්‍යාපෘතිය හරහා නගරයට පැමිණෙන සංචාරකයින්ට, ව්‍යාපාරිකයින්ට හා නගර වැසියන්ට පහසුකම් රැසක් සැලසෙනු ඇතැයි අපේක්ෂිත ය.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

    - සුවපහසු සනීපාරක්ෂක පහසුකම්
    - රථවාහන නැවතුම් පහසුකම්

- මූල්‍ය සැලැස්ම

| අංගය | රු. (මිලියන) |
|---|---|
| සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | මිලියන 70 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

මෙම සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම රත්නපුර මහ නගර සභාව විසින් සිදු කරනු ඇත.

# රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යටතේ නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

27

- අංශය - නාගරික සංවර්ධන
- ව්‍යාපෘතියේ නම - නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- 

- පිහිටි ස්ථානය




- පිහිටීම විස්තර කිරීම

| | පළාත | දිස්ත්‍රික්කය | කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | සබරගමුව | රත්නපුර | නව නගරය | නව නගරය |

- ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුලු ඉඩම් ප්‍රමාණය – අක්කර 2
- ව්‍යාපෘති පිරිවැය – රු. මිලියන 200

- ව්‍යාපෘතියේ අදාළත්වය

රත්නපුර නගරය සබරගමුව පලාතේ පරිපාලන අගනගරය වේ. ආපදා අවදානම කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව මත නව නගරය, රත්නපුර නගරයෙන් කි.මී. 5 ක පමණ දුරකින් නිර්මාණය කර ඇති අතර බොහොමයක් පරිපාලන කටයුතු මේ වනවිට නව නගරය පාදක කරගනිමින් සිදු වේ. එහෙත්, තවදුරටත් ඇතැම් පරිපාලන ගොඩනැගිලි රත්නපුර නගරයේ ස්ථානගතව පවතින අතර පරිපාලන සේවා ලබාගැනීමට පැමිණෙන මිනිසුන්ගේ පහසුව පිණිස ඒවා නව නගරය වෙත විතැන් කිරීමේ කාලීන අවශ්‍යතාවක් මේ වනවිට නිර්මාණය වී ඇත. එමෙන්ම, රත්නපුර නගරයේ පවතින පරිපාලන කටයුතු බොහොමයක් පැරණි ගොඩනැගිලි තුළ සිදුවන අතර එම ගොඩනැගිලි සතුව වෙනත් බොහෝ නගරයන්ට අහිමි ඓතිහාසික වටිනාකම් පවතී. 2030 වසර ඉලක්ක කරගත් නගර සංවර්ධන සැලැස්මට අනුව මෙම ඓතිහාසික ගොඩනැගිලි අලුත්වැඩියා කර ආර්ථිකමය වටිනාකම් උත්පාදනය කළහැකි අවකාශයන් බවට පත් කිරීමට යෝජිත වේ. කෙසේ නමුත්, මෙම ආයතන සියල්ලම වෙන් වෙන්ව ඉදිකිරීමට තරම් ප්‍රමාණවත් අවකාශයක් නොමැති බැවින් සියලුම ආයතන එක් ස්ථානයකට ඒකරාශී කිරීම යෝග්‍යතම විසඳුම වන අතර ඒ තුළින් පරිපාලන ආයතනවල නිළධාරීන්ට මෙන්ම සේවාලාභීන්ට ද තම කාර්යයන් පහසු වනු ඇත.

එබැවින්, එම ගොඩනැගිලි තුළ ස්ථානගතව පවතින සියලු පරිපාලන කටයුතුත් ඉදිරියේදී නගරය වෙනට සංකේන්ද්‍රණය විය හැකි පරිපාලන කටයුතුත් රත්නපුර නගරයේ වෙනත් ස්ථානයන්හි පවත්නා පරිපාලන කටයුතුත් නව නගරයට විතැන් කොට එක් පරිපාලන සංකීර්ණයක් වෙනට කේන්ද්‍ර කිරීමට මෙහිදී අපේක්ෂිත ය.

- මෙම ව්‍යාපෘතිය මඟින් හිමිවන වාසි

  - පරිපාලන කටයුතු පහසු වීම
  - මනාව කළමනාකරණය කරන ලද කාර්යාල සංකීර්ණය
  - ආයතන සියල්ලටම එක වර පහසුකම් සැලසීමේ හැකියාව

- මූල්‍ය සැලැස්ම

| අංශය | රු. (මිලියන) |
|---|---|
| නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | මිලියන 200 |

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ඇත.

# ඇමුණුම්

## ඇමුණුම 01 : ජනගහන ව්‍යාප්තිය – 2017

| ග්‍රාම නිළධාරී වසම | ග්‍රා. නි. ව. අංකය | ජනගහනය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | හෙක්ටයාර් 1 කට දළ ජන ඝණත්වය |
|---|---|---|---|---|
| අන්ගම්මන | 181C | 2154 | 103.87 | 21 |
| බටුගෙදර | 180 | 1835 | 90.39 | 20 |
| දේවාලෙගාව | 151A | 1950 | 74.42 | 26 |
| ගොඩිගමුව | 152 | 2854 | 122.77 | 23 |
| කොළඳගල | 181A | 222 | 132.24 | 2 |
| කොස්පැලවින්න | 153A | 5076 | 450.28 | 11 |
| මහවල | 152C | 1346 | 38.20 | 35 |
| මිහිඳුගම | 152D | 6006 | 54.45 | 110 |
| මුද්දුව | 182A | 164 | 5.49 | 27 |
| මුද්දුව - නැගෙනහිර | 182A | 3950 | 102.66 | 38 |
| මුවගම | 182 | 2208 | 105.49 | 21 |
| නව නගරය | 153A | 3521 | 311.59 | 11 |
| රත්නපුර නගරය | 152 | 1641 | 29.01 | 57 |
| රත්නපුර නගරය - උතුර | 152E | 4596 | 86.20 | 53 |
| රත්නපුර නගරය - බටහිර | 152F | 1283 | 51.12 | 25 |
| සමගිපුර | 182C | 3002 | 75.64 | 40 |
| තිරිවානාකැටිය | 180B | 2442 | 174.22 | 14 |
| වෙරළුප | 153A | 4833 | 210.00 | 23 |
| **එකතුව (18)** | | **49083** | **2218** | **557** |

**මූලාශ්‍රය :** ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2011 දත්ත මත පදනම්ව
*ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ජනගහනය

## **ඇමුණුම 02 :** පවත්නා භූමි පරිහරණ රටාව – 2017

| භූමි පරිභෝජනය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) | මුළු භූමි ප්‍රමාණයෙන් ප්‍රතිශතය |
|---|---|---|
| නේවාසික | 951.2 | 42.90 |
| වාණිජ | 46.57 | 2.10 |
| කර්මාන්ත | 0.22 | 0.01 |
| පරිපාලන ආයතන | 88.72 | 4.00 |
| මාර්ග | 117.55 | 5.30 |
| උද්‍යාන, ක්‍රීඩා භූමි සහ විවෘත භූමි | 22.18 | 1.00 |
| ආගමික | 4.43 | 0.20 |
| නාගරික වනෝද්‍යාන,ළඳු කැලෑ | 307.85 | 13.88 |
| සුසාන භූමි | 0.22 | 0.01 |
| කුඹුරු ඉඩම් | 252.85 | 11.40 |
| ගෙවතු වගාවන් (තේ / රබර් / පොල්) | 312.73 | 14.10 |
| මිශ්‍ර භෝග / ගෙවතු වගාවන් | 26.61 | 1.20 |
| තෙත්බිම් | 11.99 | 0.50 |
| ජල මාර්ග | 66.54 | 3.00 |
| හිස් ඉඩම් | 8.02 | 0.40 |
| **එකතුව** | **2218** | **100.00** |

**මූලාශ්‍රය :** ක්ෂේත්‍ර සමීක්ෂණ 2017 - නාගරික සංවර්ධන අධිකාරිය

## ඇමුණුම 03 : වාර්ෂික වර්ෂාපතන රටාව




**මූලාශ්‍රය :** *වාරිමාර්ග දෙපාර්තමේන්තුව, රත්නපුර*

## ඇමුණුම 04 : ගංවතුර සඳහා හඳුනාගත් හේතු




**මූලාශ්‍රය :** *මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ 2006/2010 සිසුන් කණ්ඩායම රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් 2009 වසරේදී සිදු කළ ප්‍රාදේශීය අධ්‍යයනය*

**ඇමුණුම 05 :** නගර මධ්‍යය තුළ ගංවතුර ආපදාවට ලක්වන ස්ථාන




***මූලාශ්‍රය :** ස්ටුඩියෝ 5 (2017/18) - කොළඹ වාස්තු විද්‍යා පාසැල*

## **ඇමුණුම 06 :** නගර මධ්‍යයෙහි උදේ කාලයේදී පවතින රථවාහන තදබදය පිළිබඳ තොරතුරු

මුළු වාහන සංඛ්‍යාව (පෙ.ව. 7 සිට පෙ.ව. 7.30 දක්වා)




*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2017 - නාගරික සංවර්ධන අධිකාරිය*

## **ඇමුණුම 07 :** නගර මධ්‍යයෙහි දහවල් කාලයේදී පවතින රථවාහන තදබදය පිළිබඳ තොරතුරු

මුළු වාහන සංඛ්‍යාව (ප.ව. 1.30 සිට ප.ව. 2.00 දක්වා)




*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2017 - නාගරික සංවර්ධන අධිකාරිය*

**ඇමුණුම 08 :** නගර මධ්‍යයෙහි සවස් කාලයේදී පවතින රථවාහන තදබදය පිළිබඳ තොරතුරු




***මූලාශ්‍රය :** ක්ෂේත්‍ර සමීක්ෂණ 2017 - නාගරික සංවර්ධන අධිකාරිය*

## ඇමුණුම 09 : වාහන ප්‍රවාහයට අනුව රථවාහන තදබදය (නගරයට ඇතුළුවීම)




*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2017 - නාගරික සංවර්ධන අධිකාරිය*

## ඇමුණුම 10 : වාහන ප්‍රවාහයට අනුව රථවාහන තදබදය (නගරයෙන් පිටවීම)




*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2017 - නාගරික සංවර්ධන අධිකාරිය*

## **ඇමුණුම 11 :** වාහන වර්ග අනුව කොළඹ පාරේ රථවාහන තදබදය




*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2017 - නාගරික සංවර්ධන අධිකාරිය*

## **ඇමුණුම 12 :** වාහන වර්ග අනුව කරවිට පාර තුළ රථවාහන තදබදය




*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2017 - නාගරික සංවර්ධන අධිකාරිය*

## **ඇමුණුම 13 :** සැලසුම් ප්‍රදේශයේ පතල් කැණීම් ප්‍රදේශ




*මූලාශ්‍රය : මැණික් හා සවර්ණාභරණ අධිකාරිය*

**ඇමුණුම 14 :** රුවන්පුර අධිවේගී මාර්ගය පිළිබඳ තොරතුරු




*මූලාශ්‍රය : මාර්ග සංවර්ධන අධිකාරිය*

## ඇමුණුම 15 : පොදු එළිමහන් විනෝදාත්මක අවකාශ සිතියම



## **ඇමුණුම 16 :** පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් විශ්ලේෂණය




** පාර්ශවකරුවන්ගේ අදහස් පදනම් කරගනිමින් සිදු කරන ලද පරිගණක වචන විශ්ලේෂණයේ සාරාංශය.*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය*




** රත්නපුර සම්බන්ධ පුවත්පත් වාර්තා - 2017*

Art direction, layout and design by:
**Mooniak** *<mooniak.com>*

සබරගමුව පළාත් කාර්යාලය – නාගරික සංවර්ධන අධිකාරිය
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය